කාර්ය සාධන හා ප්‍රගති වාර්තාව

2023

සෞඛ්‍ය අමාත්‍යාංශය

කාර්ය සාධන හා ප්‍රගති වාර්තාව
2023

සෞඛ්‍ය අමාත්‍යාංශය

වර්තමාන

සෞඛ්‍ය අමාත්‍යාංශය

අනාගතය

ගරු. වෛද්‍ය රමේෂ් පතිරණ

සෞඛ්‍ය අමාත්‍ය

ගරු. වෛද්‍ය සීතා අරඹෙපොළ

ඖෂධ නිෂ්පාදන සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය

ගරු. සිසිර ජයකොඩි

දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය

එස්. ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත

ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය

පටුන

සෞඛ්‍ය අමාත්‍යංශය	පිටුව
1. හැඳින්වීම	01 - 05
2. 2022 -2023 වසරවල සුවිශේෂී සාක්ෂාත් කර ගැනීම්	06 - 21
3. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයතනික ව්‍යුහය	22
4. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන, ව්‍යාපාර හා වැඩසටහන්වල සාක්ෂාත් කර ගැනීම්	
4.1 රෝග මර්දන වැඩසටහන	23 - 61
4.1.1 ලාදුරු මර්දන වැඩසටහන	23 - 25
4.1.2 බරවා මර්දන වැඩසටහන	26 - 33
4.1.3 මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා	33 - 36
4.1.4 මැලේරියා මර්දන ව්‍යාපාරය	36 - 40
4.1.5 ක්ෂය රෝග හා ලය රෝග පිළිබඳ ජාතික වැඩසටහන	40 - 44
4.1.6 ජාතික පිළිකා මර්දන වැඩසටහන	45 - 49
4.1.7 එච්.අයි.වී ඒඩ්ස් නිවාරණ වැඩසටහන	49 - 53
4.1.8 ඩෙංගු මර්දන ක්‍රියාකාරකම්	53 - 56
4.1.9 නිදන්ගත වකුගඩු රෝග ඒකකය	56 - 61
4.2 සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ ආරක්ෂණය	62 - 171
4.2.1 වසංගත රෝග සේවා	62 - 64
4.2.2 මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා	65 - 91
4.2.3 සෞඛ්‍ය අධ්‍යාපන හා ප්‍රවර්ධන සේවා	91 - 96
4.2.4 මානසික සෞඛ්‍ය සේවා	96 - 103
4.2.5 බෝනොවන රෝග ඒකකය	103 - 122
4.2.6 පාරිසරික සහ වෘත්තීය සෞඛ්‍ය ඒකකය	122 - 129
4.2.7 වතු සහ නාගරික සෞඛ්‍ය සේවා	129 - 134
4.2.8 නිරෝධායන සේවා	135 - 141
4.2.9 වැඩිහිටි, තරුණ, ආබාධිත හා අභ්‍යන්තරික අවතැන්වුවන් වෙනුවෙන් සේවා	142 - 144
4.2.10 ජාතික දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ අධිකාරිය	145 - 158
4.2.11 සෞඛ්‍යාරක්ෂණ, ගුණාත්මක හා සුරක්ෂිතතා සේවාවන් සැපයීම	158 - 168
4.2.12 ආපදා සූදානම සහ ප්‍රතිචාර දැක්වීමේ අංශය	169 - 171

පිටුව

4.3 පෝෂණය 172 - 178

4.4 මුඛ සෞඛ්‍ය සේවා 178 - 180

4.5 ජාතික රුධිර පාරවිලයන සේවය 180 - 189

4.6 රසායනාගාර සේවා 189 - 216

4.6.1 වෛද්‍ය පර්යේෂණ ආයතනය 198 - 211

4.6.2 වෛද්‍ය සැපයුම් අංශය 211 - 216

5. යටිතල පහසුකම් සංවර්ධනය

5.1 ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා 217 - 221

5.2 ගොඩනැගිලි ඉදිකිරීම් 221 - 223

5.3 විශේෂිත විදේශ ආධාර ව්‍යාපෘති 223 - 224

5.4 ප්‍රවාහන 224 - 225

6. මානව සම්පත් සංවර්ධනය 226 - 230

6.1 අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ 226 - 227

6.2 ධාරිතා සංවර්ධන ඒකකය 227 - 228

6.3

6.3.1 සේවාව තුළ පුහුණු වැඩසටහන්

6.3.2 මාර්ගගත පුහුණු වැඩසටහන්

6.4 පර්යේෂණ 229 - 230

7. සංස්ථා / මණ්ඩල 231 - 248

7.1 ශ්‍රී ලංකා ඖෂධ නිෂ්පාදන සංස්ථාව 231 - 235

7.2 ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 236

7.3 විජය කුමාරණාතුංග අනුස්මරණ රෝහල 236 - 242

7.2 ශ්‍රී ජයවර්ධනපුර රෝහල 243 - 248

8. පුද්ගලික අංශයේ සෞඛ්‍ය සංවර්ධනය 249 - 252

9. ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය 252 - 258

10. දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශය 259 - 285

සෞඛ්‍ය අමාත්‍යාංශය

1. හැඳින්වීම

සෞඛ්‍ය පද්ධතියේ කාර්ය සාධනය යන්නෙන් අදහස් කරන්නේ පවතින සෞඛ්‍ය පද්ධතිය රටේ සෞඛ්‍ය තත්ත්වය සමස්ත වැඩිදියුණු කිරීමට දායක වන එක් එක් සාධක කෙතරම් දුරට සාක්ෂාත් කර ගන්නේද යන්නයි. ශ්‍රී ලංකාවේ ශක්තිමත් සෞඛ්‍ය සේවා පද්ධතියක් ඇති අතර විවිධ සෞඛ්‍ය දර්ශකවලින් කැපී පෙනෙන ප්‍රතිඵල අත්කර ගෙන ඇත. සෞඛ්‍ය තත්ත්වය සහ එහි ජනතාවට ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමට රටේ ඇති හැකියාව කෙරෙහි විවිධ සාධක බලපායි. ශ්‍රී ලංකාව එහි ආදායම් මට්ටමට සරිලන ප්‍රමාණයට වඩා ශක්තිමත් සෞඛ්‍ය ප්‍රතිඵල අත්කර ගෙන ඇත. රට අත්‍යවශ්‍ය සෞඛ්‍ය දර්ශකවලින් සැලකිය යුතු ජයග්‍රහණ ලබා ඇති අතර, එහි ජනතාව අතර ආයු අපේක්ෂාව ස්ථාවර ලෙස ඉහළ ගොස් ඇති අතර මැලේරියාව, බරවා, පෝලියෝ සහ නවජ ටෙටනස් ඉවත් කර ඇත.

සෞඛ්‍ය කාර්ය සාධනයේ ශ්‍රී ලංකාවේ සාර්ථකත්වයට දායක වන එක් ප්‍රධාන සාධකයක් වන්නේ විශ්වීය සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා එහි දැඩි කැපවීමයි. මෙම කැපවීම නිසා නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශ සඳහා ප්‍රමාණවත් ලෙස පහසුකම් සැලසීමත් සමඟ රට පුරා ඉහළ මට්ටමේ සෞඛ්‍ය සේවා ආවරණයක් ලැබී ඇත. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය ඇලෝපති, ආයුර්වේද, යුනානි සහ තවත් වෛද්‍ය ක්‍රම කිහිපයක එකට පවතින මිශ්‍රණයකින් පොහොසත් වේ. මෙම ක්‍රම අතරින් ඇලෝපති වෛද්‍ය විද්‍යාව ප්‍රමුඛ වී ඇති අතර ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවලින් බහුතරයක් සපුරාලමින් සිටී. වෙනත් බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය පද්ධතිය රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයෙන්ම සමන්විත වේ. සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පළාත් සෞඛ්‍ය සේවා පුළුල් පරාසයක ප්‍රවර්ධන, නිවාරණ, රෝග නිවාරණ සහ පුනරුත්ථාපන සෞඛ්‍ය සේවා සපයයි. ශ්‍රී ලංකාවට පුළුල් සෞඛ්‍ය සේවා ආයතන ජාලයක් ඇත.

1989 පළාත් සභා පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ ජාතික මට්ටමින් රේඛීය සෞඛ්‍ය අමාත්‍යාංශය ද පළාත් 9 සඳහා වෙනම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ද නිර්මාණය කරමින් සෞඛ්‍ය සේවාවන් බෙදා හැරිණි. සෞඛ්‍ය සේවා ප්‍රාදේශීය අධ්‍යක්ෂ (RDHS) විසිහය (26) අදාළ පළාත් අධ්‍යක්ෂ මණ්ඩලවල පළාත් සෞඛ්‍ය සැලසුම් ක්‍රියාත්මක කරයි. සෑම RDHS ප්‍රදේශයක්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ප්‍රදේශ කිහිපයකට බෙදා ඇති අතර, මෙම ඒකක ප්‍රධාන වශයෙන් නිශ්චිත ප්‍රදේශයක වැළැක්වීමේ සහ ප්‍රවර්ධන සෞඛ්‍ය සේවා සඳහා වගකිව යුතුය. රට තුළ MOH ප්‍රදේශ 354 ක් ඇත. පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලවල රෝග නිවාරණ අංශය පළාත් සෞඛ්‍ය බලධාරීන්ගේ විෂය පථයට අයත් දිස්ත්‍රික් සාමාන්‍ය, මූලික, ප්‍රාදේශීය රෝහල් සහ ප්‍රාථමික සෞඛ්‍ය සේවා ඒකක හරහා ක්‍රියාත්මක වේ.

අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු, ප්‍රාදේශීය හා ජාත්‍යන්තර සංවිධාන, සිවිල් සමාජ කණ්ඩායම් සහ සාමාන්‍ය ජනතාවගේ ප්‍රධාන රාජ්‍ය සංවිධානය ලෙස ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම සුරක්ෂිත කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. උසස් තත්ත්වයේ සෞඛ්‍ය සේවා සාධාරණ ලෙස ජනතාවට ලබාදීමේ වගකීම සෞඛ්‍ය අමාත්‍යාංශය සතු වේ.

දැක්ම

දේශයේ ආර්ථික, සාමාජීය, මානසික හා අධ්‍යාත්මික සංවර්ධනය සඳහා දායක වන සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහි කිරීම.

මෙහෙවර

ජනතා අවශ්‍යතාවයට ප්‍රතිචාර දක්වමින්, සාමූහිකව ක්‍රියා කරමින්, පරිපූර්ණ, ඉහලම මට්ටමේ, ගුණාත්මක, සමාන, ඵලදායි සහ තිරසාර සෞඛ්‍ය සේවාවක් ශ්‍රී ලංකා වාසී ජනතාවට ලබා දීම මගින්, අත්කරගත හැකි ඉහළම සෞඛ්‍ය මට්ටමට ළඟාවීම.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ උපාය මාර්ගික අරමුණු

- ✓ උපදේශනය (Advocacy),චර්යාව වෙනස් කිරීම අරමුණු කරගත් සන්නිවේදනය, සමාජ අලෙවිකරණය සහ ප්‍රජාව සේවයෙහි යෙදවීම මඟින් සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය සහ වැඩසටහන්කරණය සඳහා තාක්ෂණික සහාය ලබාදීම.
- ✓ උපදේශනය, චර්යාව වෙනස් කිරීම අරමුණු කරගත් සන්නිවේදනය සහ සෞඛ්‍ය කටයුතු සඳහා ප්‍රජාව සේවයෙහි යෙදවීම මඟින් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය ක්ෂේත්‍රය හා සම්බන්ධ වෙනත් අංශයන් විසින් මෙහෙයවනු ලබන විවිධ සෞඛ්‍ය වැඩසටහන් සඳහා සහාය ලබාදීම.
- ✓ විවිධ මට්ටමේ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම් කටයුතු ප්‍රවර්ධනයට සහාය දීම සහ පවරා ගැනීම.
- ✓ ජනමාධ්‍ය මඟින් මහජනතාව අතර සෞඛ්‍ය සත්කාර පිළිබඳ අවබෝධය වැඩි කිරීම.
- ✓ සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ චර්යා වෙනස් කිරීම අරමුණු කරගත් සන්නිවේදනය සඳහා අවශ්‍ය වන IEC/BCC උපාංග සඳහා සහාය වීම සහ සංවර්ධනය කිරීම.
- ✓ සෞඛ්‍ය ප්‍රවර්ධකයින් ලෙස කටයුතු කිරීමටත් සහ උපදේශනය, චර්යාව වෙනස් කිරීම අරමුණු කරගත් සන්නිවේදනය, සහ ප්‍රජාව සේවයෙහි යෙදවීම මඟින් නියෝජිතයින් වෙනස් කිරීම සඳහා සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව තුළ සහ ඉන් පරිබාහිරව මිනිස් බල ධාරිතාවය ඉහළ නැංවීම.
- ✓ සෞඛ්‍ය ගැටළු පාලනය කරගැනීමට හැකිවන පරිදි මහජනතාවට ඒ පිළිබඳව දැනුවත්භාවය ඇතිකර ගැනීමට මෙන්ම ඔවුන් සවිබල ගැන්වීම සඳහා තනි පුද්ගල සහ ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම.
- ✓ මහජන සෞඛ්‍ය ඉහළ නැංවීමෙහිලා සෞඛ්‍ය හා සම්බන්ධ රාජ්‍ය, රාජ්‍ය නොවන සහ ජාත්‍යන්තර ආයතන හා සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- ✓ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් කළමනාකරණය සඳහා සෞඛ්‍ය හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි කළමනාකරණ සක්‍යතාව ඉහළ නැංවීම.
- ✓ සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් අධීක්ෂණය සහ ඇගයීම සහ ඒවා විවිධ මට්ටම් වලදී අධීක්ෂණය කිරීම සඳහා පහසුකම් සැපයීම.
- ✓ ප්‍රජාවගේ චර්යාව වෙනස්වීම සහ ප්‍රජාව සේවයේ යෙදවීම සම්බන්ධ පර්යේෂණ සැලසුම් කිරීම සහ ඊට සහාය ලබාදීම.

සංවර්ධිත රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාව ප්‍රශංසනීය සෞඛ්‍ය තත්ත්වයක් හා සෞඛ්‍ය දර්ශක අත්කර ගෙන ඇත්තේ ප්‍රධාන වශයෙන් පැවති රජයන් විසින් අනුගමනය කරනු ලැබූ නිදහස් සෞඛ්‍ය හා නිදහස් අධ්‍යාපනය වැනි සමාජ ප්‍රතිපත්ති හේතුවෙනි. කෙසේ වෙතත් බෝ නොවන රෝග (NCD) සීඝ්‍රයෙන් ඉහළ යාම, ජනගහනය වයස් ගත වීමේ වේගවත් අනුපාතය හා රෝග රටාවන්හි වෙනස්වීම් සමඟ සම්බන්ධ වී ඇති ගැටළු රටේ සෞඛ්‍ය අවශ්‍යතා වෙනස් කිරීමට හේතු වී තිබේ.

2015 දී සහස්‍ර සංවර්ධන ඉලක්ක සාර්ථකව සපුරා ගත් ශ්‍රී ලංකාව, තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) සාක්ෂාත් කර ගැනීමට සිය කැපවීම ජාතික ප්‍රතිපත්තිය හා උපාය මාර්ග පෙළ ගැස්වීමෙන් තහවුරු කර ඇත. 2015 දී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ අනෙකුත් සාමාජික රටවල් 192 ක් සමඟ තිරසාර සංවර්ධනය

සහ තිරසාර සංවර්ධන ඉලක්ක 17 (SDG) සඳහා කැපවන බවට පොරොන්දු විය. තිරසර සංවර්ධන ඉලක්ක 17 න් 3 ඉලක්කය, පහත දැක්වෙන ඉලක්ක සපුරා ගැනීමත් සමඟ සහපත් සෞඛ්‍ය යහපැවැත්ම වෙනුවෙන් කැපවී ඇත.

2015 දී තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව සිය අඛණ්ඩ කැපවීම ප්‍රතිඥා දුන්නේය. මෙහි ඉලක්ක 3 සාක්ෂාත් කර ගැනීමට පහත සඳහන් ඉලක්ක සමඟ 'යහපත් සෞඛ්‍යය සහ යහපැවැත්ම' සඳහා කැපවී ඇත.

ඉලක්කය 3 - සෞඛ්‍යමත් ජීවිත තහවුරු කිරීම සහ සෑම වයස් කාණ්ඩයකටම අයත් සෑම කෙනෙකුගේම යහපත ප්‍රවර්ධනය කිරීම

3.a සුදුසු පරිදි ලෝකයේ සියළුම රටවල්වල දුම්වැටි පාලනය සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම.

3.b ප්‍රජා සෞඛ්‍ය ආරක්ෂා කිරීමට සුනම්‍යය සහ විශේෂයෙන්ම ඖෂධ ලබා ගැනීමට පහසුකම් සැලසීම සම්බන්ධව TRIPS ගිවිසුමෙහි සඳහන් සංවිධාන උපරිමයෙන්ම භාවිතා කිරීමට සංවර්ධනය වෙමින් පවතින රටවලට ඇති අයිතිය තහවුරු කරන TRIPS ගිවිසුම පිළිබඳ දෝහා ප්‍රඥප්තියට සහ ප්‍රජා සෞඛ්‍යයට අනුව පර්යේෂණ සඳහා සහාය දැක්වීම සහ සංර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මූලිකව බලපානු ලබන බෝවන හා බෝ නොවන රෝග සඳහා එන්නත්ද ඖෂධද වැඩිදියුණු කිරීම සහ අත්‍යාවශ්‍ය ඖෂධ සහ එන්නත් දැරිය හැකි මිලට ලබා දීම.

3.c සෞඛ්‍ය සඳහා යොදවන මුදල් විශාල වශයෙන් ඉහළ නැංවීම සහ සංවර්ධනය වෙමින් පවත්නා රටවල විශේෂයෙන් ඌන සංවර්ධිත රටවල සහ සංවර්ධනය වෙමින් පවත්නා කුඩා රාජ්‍ය වල සෞඛ්‍ය අංශයේ ශ්‍රම බලකාය සඳහා බඳවා ගැනීම්, සංවර්ධන කටයුතු පුහුණුවීම් කටයුතු සිදු කිරීම.

3.d පූර්ව අනතුරු ඇගවීම් සඳහා සහ ජාතික සහ ගෝලීය සෞඛ්‍ය අවධානම් තත්ත්වයන් අඩු කිරීම හා කළමනාකරණය සඳහා සියළු රටවල් වල විශේෂයෙන් සංවර්ධිත රටවල ශක්‍යතාව ඉහළ දැමීම.

ඉලක්ක

3.1 වසර 2030 වන විට සජීවී උපත් 100,000 කට ගෝලීය මානව මරණ අනුපාතය 70කට වඩා අඩු මට්ටමකට ගෙන ඒම.

3.2 සජීවී දරු උපත් 1,000කට නව ප්‍රසව මරණ අනුපාතිකය අවම වශයෙන් 12කට වඩා අඩු මට්ටමකට ගෙන ඒම සහ වයස අවුරුදු 5ට අඩු මරණ අනුපාතිකය අවම වශයෙන් සජීවී දරු උපත් 1,000කට 25කට වඩා අවම මට්ටමකට ගෙන ඒමට සියළු රටවල් අරමුණු කිරීම තුළින් වසර 2030 වන විට අලුත උපන් දරුවන්ගේ සහ වයස අවුරුදු 5ට අඩු දරුවන්ගේ වළක්වාගත හැකි මරණ සිදුවීම නතර කිරීම.

3.3 වසර 2030 වන විට ඒඩ්ස් ක්ෂය රෝගය, මැලේරියා සහ නිවර්තන කලාපීය වසංගත රෝග මුලිනුපුටා දැමීම සහ සෙංගමාලය, ජලවාහක රෝග සහ වෙනත් බෝවන රෝග මර්ධනය කිරීම.

3.4 රෝග නිවාරණය, ප්‍රතිකර්ම, මානසික සෞඛ්‍ය හා සුඛ සිද්ධිය ඉහළ නැංවීම මඟින් වසර 2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන නොමේරූ මරණ තුනෙන් එකක මට්ටමකින් පහත දැමීම.

3.5 විෂ මත්ද්‍රව්‍ය හා ශරීරයට අහිතකර මත්ද්‍රව්‍ය භාවිතය ඇතුළත්ව විෂ මත්ද්‍රව්‍ය නිවාරණය සහ ප්‍රතිකාර කටයුතු ශක්තිමත් කිරීම.

3.6 වසර 2020 වන විට රථ වාහන අනතුරු නිසා ඇතිවන ගෝලීය මරණ සහ තුවාලකරුවන් සංඛ්‍යාව අඩකින් අවම කිරීම.

3.7 පවුල් සැලසුම්, තොරතුරු අධ්‍යාපනය සහ ප්‍රජනන සෞඛ්‍ය ජාතික උපක්‍රම හා වැඩසටහන් වලට ඒකාබද්ධ කිරීම ඇතුලත්ව ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය සත්කාර සේවය සඳහා විශ්ව ප්‍රවේශය සහතික කිරීම.

3.8 මූල්‍ය අවධානම් ආරක්ෂණය ඇතුළුව විශ්වීය සෞඛ්‍ය ආවරණය ළඟාකර ගැනීම, ගුණාත්මක අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සත්කාර සේවයට සහ සියළු මහජනතාවට ආරක්ෂිත ඵලදායී සහ දැරිය හැකි අත්‍යාවශ්‍ය ඖෂධ හා එන්නත් ලබාගැනීමට කටයුතු සැලැස්වීම.

3.9 වසර 2030 වන විට අහිතකර රසායනික ද්‍රව්‍ය සහ වායුව, ජලය හා පස දූෂණය මෙන්ම අපවිත්‍රතාව නිසා ඇතිවන මරණ සඳහා රෝග සැලකිය යුතු මට්ටමකින් අඩුකිරීම.

2. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශයේ විශේෂ සිදුවීම් 2022- 2023

ජාතික සිදුවීම්

❖ *බිම්ස්ටෙක් සමූහය (*BIMSTEC)

බිම්ස්ටෙක් (BIMSTEC) යනු දකුණු සහ අග්නිදිග ආසියානු රටවල් හතකින් සමන්විත බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව සඳහා වන බංගලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, නේපාලය, ශ්‍රී ලංකාව සහ තායිලන්තය යන බෙන්ගාල බොක්ක ආශ්‍රිතව පිහිටි රටවලට අයත්. සන්ධානයකි. මෙහි මූලික ඉලක්කය වන්නේ දකුණු ආසියාවේ සහ අග්නිදිග ආසියාවේ ප්‍රදේශ යා කරමින් බෙංගාල බොක්ක ආශ්‍රිතව පිහිටි රටවල් අතර තාක්ෂණික හා ආර්ථික ක්ෂේත්‍රවල සහයෝගීතාව වර්ධනය කිරීමයි. මහජන සෞඛ්‍යය පිළිබඳ බිම්ස්ටෙක් විශේෂඥ කණ්ඩායමේ පළමු හමුව 2023 ජූලි 26 සිට 27 දක්වා දෙමුහුන් ආකාරයෙන් කොළඹදී පැවැත්විණි. සියලුම බිම්ස්ටෙක් සාමාජික රටවල නියෝජිත පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්වුණු අතර, එය විවෘත කරන ලද්දේ ගරු. සෞඛ්‍ය ඇමැති. ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා විසිනි.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම රැස්වීමේදී කලාපයේ මහජන සෞඛ්‍ය සම්බන්ධ ගැටලු රාශියක් සාකච්ඡා කළ අතර, විශේෂඥ කණ්ඩායමේ අවසන් තීරණවලට අලෙබෙන ලදි. 2023-2025 මහජන සෞඛ්‍ය පිළිබඳ බිම්ස්ටෙක් ක්‍රියාකාරී සැලැස්ම, සහ බිම්ස්ටෙක් සාමාජික රටවල් අතර වසංගත වැළැක්වීම, ඒ සඳහා ඇති සූදානම සහ අවශ්‍ය ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති ඒ සඳහා සූදානම් කිරීමේ හැකියාව සහ ශක්තිමත් කිරීම පිළිබඳව BIMSTEC ලේකම් කාර්යාලය සහ ලෝක බැංකුව අතර අවබෝධතා ගිවිසුමක් ඇති කරගන්නා ලදි.

බිම්ස්ටෙක් මහලේකම් ටෙන්සින් ලෙක්ෆෙල් සහ අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ අතර පැවති හමුවේදී සාමාජික රටවල් අතර අඛණ්ඩ සහයෝගීතාවයේ අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා කළ අතර කලාපයේ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රය තවදුරටත් සංවර්ධනය කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදි. මහජන සෞඛ්‍ය සඳහා ශ්‍රී ලංකාව දක්වන කැපවීම පිළිබඳව මහලේකම්වරයා ප්‍රශංසා කළ අතර කලාපය තුළ මෙම ක්ෂේත්‍රයේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන ලෙස ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියේය.

❖ *ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර සෞඛ්‍ය නියාමනය (International Health Regulation-IHR) මූලික හැකියාවන්හි ඒකාබද්ධ බාහිර ඇගයීම (Joint External Evaluation-JEE)*



ශ්‍රී ලංකාවේ IHR මූලික හැකියාවන් පිළිබඳ ඒකාබද්ධ බාහිර ඇගයීම (JEE) සැප්තැම්බර් 4 සිට 8 දක්වා කොළඹ හිල්ටන් හෝටලයේදී පැවැත්විණි. මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා වැළැක්වීම, හඳුනා ගැනීම සහ ප්‍රතිචාර දැක්වීම යන ශීර්ෂ යටතේ රටේ හැකියාවන් තක්සේරු කරන ලදි.

❖ *ලෝක දුම්කොළ විරෝධී දිනය සැමරීම*

ලෝක දුම්කොළ විරෝධී දිනය සැමරීම සඳහා දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (NATA) සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2020 ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ ප්‍රතිඵල නිකුත් කරන ලදී. එහි පිටපත් ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකාවේ නියෝජිතයන් වෙත භාර භාරදීම සිදුකරන ලදී.

❖ *ලෝක සෞඛ්‍ය දිනය*

අප්‍රේල් 07 වන දින ලෝක සෞඛ්‍ය දිනය වන අතර 2023 ලෝක සෞඛ්‍ය සංවිධානයේ 75 වසරක සේවාව සනිටුහන් කරන ලදි. ලෝක සෞඛ්‍ය සංවිධානය වෙත ශ්‍රී ලංකාව දක්වන ස්ථිර කැපවීම වෙනුවෙන් ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිත ආචාර්ය අලකා සිංමහත්මිය විසින් නාගසේ (Iron Wood Tree) සමරුවක් ගරු සෞඛ්‍ය අමාත්‍යතුමා වෙත පිළිගන්වන ලදි.

ජාත්‍යන්තර සිදුවීම්

❖ *ලෝක සෞඛ්‍ය සභාව (ජිනීවා)*

ලෝක සෞඛ්‍ය සභාව යනු ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) තීරණ ගැනීමේ ආයතනයයි. එය ලෝක සෞඛ්‍ය සංවිධානයේ සියලුම සාමාජික රටවල නියෝජිතයින් විසින් නියෝජනය වන අතර

විධායක මණ්ඩලය විසින් සකස් කරන ලද නිශ්චිත සෞඛ්‍ය න්‍යාය පත්‍රයක් කෙරෙහි අවධානය යොමු කරයි. 76 වැනි ලෝක සෞඛ්‍ය සමුළුවේදී, ලෝක සෞඛ්‍ය සංවිධානයේ අග්නිදිග ආසියා කලාපයට අදාළ ප්‍රමුඛතා ගැටලු සම්බන්ධයෙන් කලාපීය "එක හඬක්" (One Voice) සඳහා එකඟ වීමට රටවල නියෝජිතයින් සැසියට පෙර දින රැස්විය.

විදේශ නියෝජිතයන් සමඟ රැස්වීම

❖ *ඇමරිකානු තානාපතිවරිය හමුවීම*

ශ්‍රී ලංකාවේ ජනතාවට වඩා හොඳ සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට තාක්ෂණික සහ මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා විදේශ නියෝජිතයන් කිහිප දෙනෙකු සමඟ සාකච්ඡා පැවැත්වීය.

2023.03.17 වන දින ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපතිනි Julie Jeon Chang මහත්මිය සමඟ හමුවක් පැවැත්වූ අතර, එහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා ගතවන කාලය අවම කාල සීමාවකට ගෙන ආ බව අමාත්‍යවරයා පැහැදිලි කරන ලදි.

❖ *සීෂෙල්ස් මහ කොමසාරිස්වරිය හමුවීම*

සීෂෙල්ස් මහ කොමසාරිස්වරිය සහ ගරු සෞඛ්‍ය ඇමැති ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල. අතර හමුවක් පැවැත්වූ අතර එහිදී සංචාරක කර්මාන්තය ප්‍රධාන ආදායම් මාර්ගය වූ සීෂෙල්ස් දිවයින සහ අනෙකුත් සියලුම රටවල් මෙන්ම Covid-19 වසංගතය හේතුවෙන් විශාල පසුබෑමකට ලක්ව ඇති බව මහ කොමසාරිස්වරිය පැහැදිලි කරන ලදි.

කොවිඩ් 19 වසංගතයෙන් පසු ශ්‍රී ලංකාව ද දැඩි ආර්ථික පසුබෑමකට ලක්ව ඇති බවත් මේ වනවිට එයින් යම් ප්‍රමාණයකට යථා තත්ත්වයට පත්වෙමින් සිටින බවත් ගරු සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා මෙහිදී පැවසීය. මෙම අර්බුදය විසඳීම සඳහා බොහෝ විදේශ රටවල් ශ්‍රී ලංකාවට විවිධ ආකාරවලින් උපකාර කර ඇති බව ද අමාත්‍යවරයා අවධාරණය කළේය.

සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති, පත්වීම්, මුලපිරීම්,සංචාර සහ රැස්වීම්

❖ *රෝග නිවාරණ අංශය*

චීන රජයෙන් ලැබුණු ශ්‍රී ලංකා ජාතික රෝහලේ නව බාහිර රෝගී සංකීර්ණය ශ්‍රී ලංකාවට නිල වශයෙන් භාරදීම 2023.04.25 දින සිදු විය.

ඊට අදාළ ගිවිසුම් ලිපි හුවමාරුව අමාත්‍යවරයා සහ චීන තානාපතිවරයා අතර සිදු වූ අතර, මේ සමඟ පසුගිය වසරේ චීන රජය විසින් ශ්‍රී ලංකාවට ලබාදුන් ඖෂධ සහ වෛද්‍ය උපකරණ සම්බන්ධ ලිපිගොනු හුවමාරුව ද මෙහිදී සිදු විය. .



❖ *ජපානයෙන් උපකරණ පරිත්‍යාග කිරීම*

බිලියන 1.76 පමන වටිනා උපකරණ 2022.10.27 දින පරිත්‍යාගයක් ලෙස ජපානයෙන් ලැබුනි.එයට සී.ටී. (CT) ස්කෑන් යන්ත්‍රයක්, ඇන්ජියෝග්‍රැෆි (Anigography) යන්ත්‍ර දෙකක් සහ බහු පරාමිති මොනිටර යන්ත්‍ර (Multi-parameter Monitors) 09ක් ද ඇතුළත් විය.

❖ ***2023.08.13 දින අවිස්සාවේල්ල දිස්ත්‍රික් රෝහලේ ඔක්සිජන් නිෂ්පාදනාගාරය විවෘත කිරීම.***

UNICEF සංවිධානය විසින් අරමුදල් සපයන ලද සහ Foresight Engineering-Access විසින් ඉදිකරන ලද ඔක්සිජන් නිෂ්පාදනාගාරය පිහිටුවීම රුපියල් මිලියන 300 ක වියදමින් සිදුකරන ලදි.

❖ ***පළාත් සෞඛ්‍ය සමුළුව***

2023.06.07 දින නාරාහේන්පිට රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ පැවති පළාත් සෞඛ්‍ය සමුළුවට සියලුම පළාත් නියෝජනය කරමින් පළාත් ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන්, පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් සහ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් සහභාගි වූහ.

❖ ***අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම***

2023.06.30 සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සහ සෞඛ්‍ය ආයතනවල පවතින ගැටලු හඳුනාගැනීමේ අරමුණින් අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම ගරු සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

ප්‍රධාන රෝහල්වල මෙන්ම ප්‍රාදේශීය රෝහල්වල වෛද්‍යවරුන්, හෙද හෙදියන් සහ අනෙකුත් කාර්ය මණ්ඩල හිඟය සහ ඇතැම් රෝහල්වල සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව සාකච්ඡා කෙරිණි. පවතින ආර්ථික අර්බුදය හමුවේ මුදල් කළමනාකරණය කර ගනිමින් ගැටලු නිරාකරණය කර ගැනීම පිළිබඳව ද මෙහිදී සාකච්ඡා කෙරිණි. ස්වස්තා නව දත්ත පද්ධතියේ තාක්ෂණික ගැටලු කඩිනමින් අවසන් කර සේවාවට එක් කරන ලෙස සෞඛ්‍ය අමාත්‍යවරයා මෙහිදී ඉල්ලා සිටියේය. රෝහල්වල පවතින එම්.ආර්.අයි. (MRI), සී.ටී.(CT) Scan වැනි වෛද්‍ය උපකරණ සම්බන්ධ ගැටළු නිරාකරණය කර ඒවා කඩිනමින් රෝගී සත්කාරක සේවයට එක් කිරීමට අවධානය යොමු කරන ලෙස ද සෞඛ්‍ය අමාත්‍යවරයා බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේය.

❖ *අම්පාර දිස්ත්‍රික් මහ රෝහලේ හි දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාව*

අතිරේක ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලයේ දී අම්පාර දිස්ත්‍රික් මහ රෝහලහි දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡාවක් පැවැත්විනි.

❖ *සැලසුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (PMIS) සංවර්ධනය කිරීම*

සෞඛ්‍ය අමාත්‍යාංශයේ කළමනාකරණ සංවර්ධන සහ සැලසුම් ඒකකය **(MDPU)** විසින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා සහ සංවර්ධන හවුල්කාර සයන්ස් ලැන්ඩ් අයි.ටී. **(IT)** වෙතින් තාක්ෂණික සහ මූල්‍ය සහාය ඇතිව සැලසුම් කළමනාකරණ තොරතුරු පද්ධතියක් **(PMIS)** සංවර්ධනය කරන ලදී. **2023** ඔක්තෝම්බර් **2** වන දින **PMIS** නිල එළිදැක්වීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත මහතා, ශ්‍රී ලංකාවේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිත ආචාර්යය අලකා සිං මහත්මිය , අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) වෛද්‍ය ලක්ෂිමි සෝමතුංග මහත්මිය සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), වෛද්‍ය ටී.එල්.සී. එස්. ශ්‍රීධරන් යන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදුවිය. සැලසුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය අදියර වශයෙන් සංවර්ධනය කර ඇති අතර ක්‍රියාත්මක කරන ලද පළමු අදියර මගින් මධ්‍යම මට්ටමේ අදාළ බලධාරීන්ගේ සමාලෝචනය සහ අනුමැතිය සඳහා සෞඛ්‍ය ආයතන විසින් යෝජනා ඉදිරිපත් කිරීමෙන් ආරම්භ වන අතර එය සමස්ත

ව්‍යාපෘතියම ආවරණය කරයි. තවද ව්‍යාපෘති ප්‍රගතිය, මූල්‍ය විශ්ලේෂණය, දර්ශක පාදක ඇගයීමට අදාල තොරතුරු විශ්ලේෂණය කිරීම හා බෙදා හැරීම සඳහා වූ හැකියාවන්ද එයට ඇතුලත් වේ.

නිවාරණ අංශය

❖ *ලෝක දුම්කොළ විරෝධී දිනය*

ලෝක දුම්කොළ විරෝධී දිනය සැමරීමේ වැඩසටහනක් 2023.05.31 දින පැවැත්විණි. ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර සහතිකපත් ප්‍රදානය කිරීම ද මෙහිදී සිදු විය.

❖ *ඇපලෝ රෝහල් සමූහය ශ්‍රී ලංකාවේ උපකාරක අංකයක් නිවේදනය කිරීම*

ඇෆ්රෝ ඒෂියා (Afro-Asia) හි විශාලතම පුද්ගලික අංශයේ ඒකාබද්ධ සෞඛ්‍ය සේවා සපයන්නා වන ඇපලෝ රෝහල් (Apollo Hospitals) සමූහය ශ්‍රී ලංකාව තුළ උපකාරක දුරකථන අංකයක් ප්‍රකාශයට පත් කළේය. හෙල්ප්ලයින් අංකය මගින් රෝගීන් සහ වෛද්‍යවරුන් Med Connect නියෝජිතයින් වෙත සම්බන්ධ කරන අතර Apollo Hospitals හි විශාල වෛද්‍ය සම්පත් එකතුවට පහසු ප්‍රවේශයක් මෙමගින් ලබා දෙයි.

ගරු. සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා මෙම අවස්ථාවට එක්වෙමින් ප්‍රකාශ කළේ විශේෂයෙන්ම බෝවන රෝග ව්‍යාප්තවීම සහ වසංගතය හේතුවෙන් ඇතිවී තිබෙන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින් සෞඛ්‍ය සේවාවේ සහයෝගී ප්‍රයත්නයන් ඉතා වැදගත් බවයි. මෙහිදී අමාත්‍යවරයා ප්‍රකාශ කළේ ඉන්දීය සහ ශ්‍රී ලංකා වෛද්‍ය නිලධාරීන්ට සහයෝගයෙන් කටයුතු කිරීමට වැඩි අවස්ථා තිබිය යුතු බවත් එවැනි මුලපිරීම් සඳහා රජය සහාය දක්වන බවත්ය.

සෞඛ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධනය

❖ *නව බඳවා ගැනීම්*

2022.10.31 දින නවක වෛද්‍යවරුන් 1367 දෙනෙකුට සීමාවාසික පුහුණුව ආරම්භ කිරීම සඳහා පත්වීම් ලිපි ප්‍රදානය කරන ලදී. එසේ පත් කරන ලද වෛද්‍යවරුන් මුළු දිවයිනම ආවරණය වන පරිදි අනුයුක්ත කරන ලදී.

❖ *නව වෛද්‍ය නිලධාරීන් පත් කිරීම*

2023.04.21 දින නව වෛද්‍යවරුන් 1320ක් පත් කරන ලදී. ඔවුන් දිවයින පුරා රෝහල්වලට අනුයුක්ත කෙරෙන අතර වෛද්‍ය විද්‍යාලවලට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 5000 දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

❖ *පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් පත් කිරීම*

2023.05.16 දින නව පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් 222ක් පත් කරන ලදී. ඉන් 49ක් රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල්වලටත් තවත් 173ක් පළාත් සභා යටතේ පවතින ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසවලට සහ රෝහල්වලටත් අනුයුක්ත කෙරේ.

❖ *හෙද සිසුන්ට පුහුණුව සඳහා පත්වීම් ලිපි ලබා දීම*

2023.07.10 දින හෙද සිසුන් 3315 දෙනෙකුට පුහුණුව සඳහා පත්වීම් ලිපි ලබා දෙන ලදී.

❖ ***2022 සැප්තැම්බර් 1 සිට 2023 සැප්තැම්බර් 30 දක්වා තෝරාගත් කාර්ය මණ්ඩල කාණ්ඩවල නව පත්වීම් ලබාදීම***

කාණ්ඩය	පත් කිරීම් සංඛ්‍යාව
විශේෂඥ වෛද්‍ය නිලධාරීන්	304
වෛද්‍ය නිලධාරීන්	2724
හෙද නිලධාරීන්	65
වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පීන්	238
පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියන්	222
මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු	12
විකිරණ ශිල්පීන්	54
වෘත්තීය චිකිත්සකයින්	45

❖ ***වෘත්තීය සංවර්ධනය***

2023.06.26 දින මහජන සෞඛ්‍ය හෙද නිලධාරිනියකගේ (PHNO) සමස්ත සේවය ඇගයීමේ උත්සවයක් බත්තරමුල්ල වෝටර්ස් එජ්හිදී පැවැත්විණි.

විශේෂ සිදුවීම්

2023.02.16 දින ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ ඖෂධ කර්මාන්ත ක්ෂේත්‍රයේ උපාය මාර්ගික සැලැස්ම සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්විණි. රජයේ රෝහල් පද්ධතියේ ගෙවන වාට්ටු ඇති කිරීම, දේශීය ඖෂධ නිෂ්පාදනය තවත් 40%කින් ඉහළ නැංවීම ආදී කරුණු රැසක් පිළිබඳව මෙහිදී සාකච්ඡා කෙරිණි.

2023.05.29 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ ඖෂධ මිල අඩු කිරීම සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්විණි. 2021 අගෝස්තු මාසයේ සිට 2022 අප්‍රේල් දක්වා එක්සත් ජනපද ඩොලරයේ විනිමය අනුපාතිකය ඉහළ යාම හේතුවෙන් ඖෂධ මිල 97% කින් පමණ ඉහළ ගොස් ඇත එසේ වුවද පවතින ආර්ථික ස්ථාවරත්වය සහ රුපියලේ අගය ඉහළ යෑමත් සමඟ 2023 ජුනි 15 වැනිදා සිට ක්‍රියාත්මක වන පරිදි ගැසට් නිවේදනයේ සඳහන් මිල පාලන ඖෂධ නිෂ්පාදන 60ක MRP අගය 16%කින් අඩු කිරීමට එකඟ වූ අතර, සෑම මාස තුනකට වරක් MRP සමාලෝචනය කිරීමට තීරණය කරන ලදි.

❖ *ඖෂධ සහ සෞඛ්‍ය සම්බන්ධ සංරචක නිෂ්පාදන කිරීම*

2023.01.11 දින අනුරාධපුරයේ ඔබමඩුව, ඖෂධ නිෂ්පාදන කලාපවල ඖෂධ සහ සෞඛ්‍ය සම්බන්ධ සංරචක නිපැයුම් නිෂ්පාදනය ආරම්භ කිරීමට ශ්‍රී ලාංකික ආයෝජකයින් දොළොස් දෙනෙකු ඇමෙරිකානු ඩොලර් මිලියන 100කට ආසන්න මුදලක් ආයෝජනය කිරීමට එකඟ වී ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මෙම සමාගම් සමඟ ඉදිරි මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කරනු ලැබුවේ ඔවුන්ගේ ආයෝජන සඳහා 100% ක ස්ථාවරත්වයක් සහතික කරමිනි.

මෙම උපායමාර්ගික ව්‍යාපෘතිය සඳහා පස් අවුරුදු ගිවිසුම වසර පහෙන් ඔබ්බට දීර්ඝ කරන බවත් වසර 35ක බදු කාලයක් මත ඉඩම් ලබාදීමට අමතරව ඔවුන්ට තවත් බදු ප්‍රතිලාභ ලබාදීමට සහතික වූ බවත් සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා මෙහිදී පැවසීය.

❖ *"හදවතට හදවත" (Heart To Heart) වැඩසටහන*

"හදවතට හදවත" වැඩසටහන සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ රිජ්වේ ආර්යා ළමා රෝහලේ මගපෙන්වීම සහ උපදෙස් මත ශ්‍රී ලංකාවේ හෘද රෝග ඇති ළමුන් සහ වැඩිහිටියන් සඳහා නොමිලේ ප්‍රතිකාර හා ශල්‍යකර්ම සිදු කරන වැඩසටහනකි. මඩකලපුව ශ්‍රී සත්‍ය සායි සංජීවනී විශේෂිත රෝහල විසින් හෘද රෝග සහිත ළමුන් සහ වැඩිහිටියන් සඳහා නොමිලේ සෞඛ්‍ය සේවා සහ සමාජ මෙහෙවර ප්‍රචාරය කිරීම සඳහා ප්‍රථම "හදවතින් හදවත" කථිකාවක් කොළඹ කොල්ලුපිටිය මරීනෝ බීච් හෝටලයේදී පැවැත්විණි. ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා ප්‍රධාන ආරාධිතයා ලෙස මීට සහභාගි විය. ශ්‍රී සත්‍ය සායි සංජීවනී විශේෂිත රෝහලේදී හදවත් සැත්කම් සිදු කර සුවය ලැබූ පුද්ගලයින් සඳහා සහතිකපත් ප්‍රදානය කිරීම ද සෞඛ්‍ය අමාත්‍යවරයා අතින් සිදු විය.

පරිත්‍යාග

❖ *ලයන් ඔෆ් ඉන්දියා (Lions of India) සේවා භාරය මගින් අත්‍යාවශ්‍ය ඖෂධ පරිත්‍යාග කිරීම*

2022.08.10 වන දින ශ්‍රී ලංකාවේ රෝගී ප්‍රතිකාර සේවා ශක්තිමත් කිරීම සඳහා ලයන්ස් ඔෆ් ඉන්දියා සේවා භාරය විසින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශයේ දී අත්‍යාවශ්‍ය ඖෂධ තොගයක් පරිත්‍යාග කරන ලදී.මෙම ඖෂධ තොගයේ වටිනාකම රුපියල් මිලියන 25 ක් පමණ වන අතර වර්ග රැසක ඖෂධ මෙයට අයත් වේ. මෙම අවස්ථාවට සහභාගී වූ ජාත්‍යන්තර සිංහ සමාජයේ නියෝජිතයින් ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාවේ රෝගී ප්‍රතිකාර සේවා ශක්තිමත් කිරීම සඳහා අඛණ්ඩව මෙවැනි පරිත්‍යාග සිදු කරන බවයි. මෙම පරිත්‍යාගය සම්බන්ධයෙන් සෞඛ්‍ය ලේකම් ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත මහතා ජාත්‍යන්තර සිංහ සමාජය වෙත සිය කෘතඥතාව පළ කළ අතර, දිවයින පුරා රෝහල් වෙත මෙම ඖෂධ ප්‍රමාදයකින් තොරව බෙදා හරින ලෙස වෛද්‍ය සැපයුම් අංශයට උපදෙස් ලබා දුන්නේය.

❖ *කොළඹ රීජන්සි රොටරි සමාජය මගින් අත්‍යාවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීම*

2022.09.09 දින කොළඹ රීජන්සි රොටරි සමාජය මගින් අත්‍යාවශ්‍ය ඖෂධ සහ වෛද්‍ය උපකරණ පරිත්‍යාග කිරීමක් සිදු වූ අතර, මෙයට ගිලන්රථවල රෝගීන් ප්‍රවාහනය කිරීම සඳහා අත්‍යවශ්‍ය රුපියල් මිලියන 147.06 ක් වටිනා ඖෂධ සහ උපකරණ තොගයක් ඇතුලත් විය.

❖ *පකිස්ථාන ටග්ග්‍රාෆ් (TACGRAF) සංවිධානය සහ සී.අයි.සී. (CIC) මගින් ඖෂධ පරිත්‍යාග කිරීම*

2022.09.19 දින පකිස්ථාන TACGRAF සංවිධානය සහ CIC මගින් ඖෂධ පරිත්‍යාග කිරීමක් සිදුවිය. ඒ යටතේ වකුගඩු රෝගීන් සඳහා රුපියල් ලක්ෂ 100ක් පමණ වටිනා ඖෂධ තොගයක් පරිත්‍යාග කරන ලදි.

❖ *වකුගඩු රෝගීන්ගේ පූර්ව රෝග විනිශ්චය සඳහා ජංගම රසායනාගාර බස් රථ 08ක් ලබා ගැනීම*

2022.09.26 දින චීන රජයෙන් රුපියල් මිලියන 600ක් වටිනා වකුගඩු රෝගීන්ගේ පූර්ව රෝග විනිශ්චය සඳහා ජංගම රසායනාගාර බස් රථ 08ක් පරිත්‍යාග කරන ලදි.

අනුරාධපුර, පොළොන්නරුව, වවුනියාව, අම්පාර, කුරුණෑගල, ත්‍රිකුණාමලය, මාතලේ සහ බදුල්ල දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල වෙත ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුත් මෙම අංග සම්පූර්ණ ජංගම රසායනාගාර ලබා දුනි.

❖ *රුධිර පාරවිලයන මධ්‍යස්ථානයට එලයිසා (Elisa) පරීක්ෂණ කට්ටල ප්‍රදානය කිරීම*

2022.10.13 දින ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානය වෙත රුපියල් මිලියන 45ක් වටිනා එලයිසා පරීක්ෂණ කට්ටල ප්‍රදානය කිරීමේ අවස්ථාවට ගරු සෞඛ්‍ය අමාත්‍යවරයා එක්විය. මෙම එලයිසා පරීක්ෂණය දිවයින පුරා මධ්‍යස්ථාන 17කදී සිදු කෙරේ.

❖ *රුපියල් මිලියන 55 ක් වටිනා වෛද්‍ය උපකරණ තොගයක් කටාර් රාජ්‍යයන් පරිත්‍යාග කිරීම*

2022.11.02 දින කටාර් රාජ්‍යයෙන් මානුෂීය ආධාර ලෙස රුපියල් මිලියන 55ක් වටිනා උපකරණ පරිතයාග කරන ලදි. එයට හදිසි අවස්ථාවලට භාවිකා කරනු ලබන ඇඳන් සහ වෛද්‍ය උපකරණ තොගයක් ද වේ.

❖ *පපකිස්ථාන හයින්හූන් සංවිධානයෙන් පරිත්‍යාග කිරීම*

2022.11.24 දින පාකිස්ථාන හයින්හූන් සංවිධානය විසින් තැලසීමියා රෝගීන් සඳහා ඖෂධ පරිත්‍යාග කිරීමක් සිදුවිය.

❖ ජර්මානු රජයෙන් පරිත්‍යාග කිරීම

2022.12.12 දින ජර්මානු රජයෙන් මිලියන 81ක් වටිනා ජලභීතිකා ඖෂධ ලැබී ඇත.
ජර්මානු රජයේ ආර්ථික සහයෝගිතා සහ සංවර්ධන අමාත්‍යාංශය (BMZ) යටතේ ඇති ගිට්ස් ශ්‍රී ලංකා (GIZ Sri Lanka) වැඩසටහනේ අධ්‍යක්ෂ නිකොලස් ලැමඩේ (Nicolas Lamade) මහතා විසින් ගරු සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා වෙත සෞඛ්‍ය අමාත්‍යාංශයේදී නිල වශයෙන් මෙම ඖෂධ ආධාර තොගය භාර දෙන ලදී.

❖ කොරියානු රජයෙන් පරිත්‍යාග

2023.01.17 දින කොරියානු රජය විසින් කෝටි 43ක් වටිනා ඖෂධ සහ උපකරණ පරිත්‍යාග කර ඇත. ප්‍රතිජීවක, සමේ රෝග සඳහා ඖෂධ සහ වේදනා නාශක ඇතුළත් මෙම පරිත්‍යාගය සිදු කරන ලද්දේ ද ග්‍රෝබල් ලයිෆ් ෂෙයාරින් (The Global Life Sharing) සහ වර්ල්ඩ් අන් රීච් මිෂන් (World Unreached People Mission) හි සම්බන්ධීකරණ දායකත්වයෙනි.

❖ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයෙන් (JICA) අත්‍යවශ්‍ය ඖෂධ පරිත්‍යාගයක්

2023.01.30 වන දින ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය (JICA) සහ සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව සෞඛ්‍ය අමාත්‍යාංශයේ දී ගරු සෞඛ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අත්‍යවශ්‍ය ඖෂධ භාරදීමේ උත්සවයක් පවත්වන ලදී. ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල, සෞඛ්‍ය ලේකම් එස්.ජනක ශ්‍රී චන්ද්‍රගුප්ත, අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) වෛද්‍ය සුනිල් ද අල්විස් සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෛද්‍ය අසේල ගුණවර්ධන යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගි වූහ.
ජයිකා ශ්‍රී ලංකා කාර්යාලයේ ප්‍රධාන නියෝජිත ටෙට්සුයා යමාඩා (Tetsuya Yamada) සහ ජපාන තානාපති කාර්යාලයේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ JICA ශ්‍රී ලංකා කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද මෙම අවස්ථාවට එක්ව සිටියහ. “මෙවැනි සහයෝගීතාවයෙන් ඖෂධ හිඟය පියවීමට අමාත්‍යාංශය දරන

ප්‍රයත්නයේ කොටසක් ලෙස ශ්‍රී ලංකාවේ ජනතාවට තීරණාත්මක අවස්ථාවක ජීවිතාරක්ෂක ඖෂධ මිලදී ගැනීමේදී ලබාදුන් සහයෝගය පිළිබඳව කෘතඥ වෙන බව ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා මෙහිදී පැවසීය.
රුපියල් මිලියන 104 ක ප්‍රතිජීවක සහ පෝෂණ සැපයුම් පරිත්‍යාගයක් ජපන් රජයන් කරන ලද ඉල්ලීම මත මාස 03ක් වැනි කෙටි කාලයක් තුළ මෙම ආධාර තොගය ශ්‍රී ලංකා රජයට ලැබීම විශේෂත්වයකි.

❖ *කොළඹ අක්ෂි රෝහලට අක්ෂි කාච පරිත්‍යාග කිරීමේ වැඩසටහන*

2023.04.04 දින කොළඹ අක්ෂි රෝහලට අක්ෂි කාච පරිත්‍යාගයක් කරන ලදී. මෙහිදී අක්ෂි කාච 10,000ක් පරිත්‍යාග කෙරිණි.

❖ *ඉරාන රජයෙන් ශ්‍රී ලංකාවට ඖෂධ පරිත්‍යාග කිරීම*

2023.05.04 දින ඉරාන රජයෙන් ශ්‍රී ලංකාවට ඖෂධ පරිත්‍යාග කරන ලදී. පිළිකා, හෘද රෝග, පාකින්සන් රෝගයට, අධි රුධිර පීඩනය ඇතුළු රෝග රැසකට අවශ්‍ය ඖෂධ මේ ඖෂධ අතර වේ.

❖ *UNDP අත්‍යවශ්‍ය ඖෂධ පරිත්‍යාග කිරීම*

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද පහසුකම හරහා, රට තුළ පවතින සමාජ ආර්ථික තත්ත්වය අනුව අත්‍යාවශ්‍ය ඖෂධ ලබා ගැනීම සඳහා සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පෙන්වා දී ඇති පරිදි හඳුනාගත් ඖෂධ හිඟයට පිළියම් යෙදීම සඳහා මිචලින් පදනම (Michelin Foundation) නාලිකා සහාය විය.
ගරු. සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල, මෙහිදී පැවසුවේ මෙවැනි සහයෝගීතාවයෙන් ඖෂධ හිඟය පියවීමට අමාත්‍යාංශය දරන ප්‍රයත්නයේ කොටස් කරුවෙකු ලෙස ශ්‍රී ලංකාවේ ජනතාවට තීරණාත්මක අවස්ථාවක ජීවිතාරක්ෂක ඖෂධ මිලදී ගැනීමේදී ලබාදුන් සහයෝගය පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය කෘතඥ වෙන බවයි.

❖ *සිංගප්පූරුවේ විලින් හාට්ස් (Willing Hearts) සංවිධානය විසින් පරිත්‍යාග කරන ලද ආධාර*

2023.08.21 දින සිංගප්පූරුවේ Willing Hearts සංවිධානයේ මූලික මැදිහත්වීම මත රුපියල් මිලියනයකට ආසන්න වටිනාකමකින් යුත් ආධාර සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී. ආබාධිත සහ වැඩිහිටි පුද්ගලයින් සඳහා රෝද පුටු, ගර්භනී කාන්තාවන් සඳහා උපකරණ සහ වියළි ආහාර, කුඩා ළමුන් සඳහා උපකරණ එයට ඇතුළත් විය.

❖ *සයිට් ඔෆ් ඕල් ඕස්ට්‍රේලියා (Sight for All – Australia) වෙතින් ලැබුණු අක්ෂි උපකරණ*

2023.07.14 දින Sight for All - Australia වෙතින් ලැබුණු අක්ෂි උපකරණ බෙදා දීම සිදු කරන ලදි.

❖ *චීන රජය ජංගම රසායනාගාර බස් රථ අටක් පරිත්‍යාග කිරීම*

චීන රජය විසින් ජංගම රසායනාගාර බස් රථ අටක් පරිත්‍යාග කර ඇති අතර එහි වටිනාකම රු. මිලියන 600කි. ශ්‍රී ලංකාවේ චීන තානාපති Qi Zhenhong මහතා විසින් ශ්‍රී ලංකාවේ කොළඹ ජාතික රෝහලේදී ගරු සෞඛ්‍ය අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා වෙත මෙම පරිත්‍යාගය නිල වශයෙන් භාර දෙන ලදී. මෙම ප්‍රදානය මඟින් මිල කළ නොහැකි සේවාවක් සැපයිය හැකි බව සෞඛ්‍ය අමාත්‍යවරයා පැවසීය. රට අර්බුදකාරී තත්ත්වයකට මුහුණ දී සිටින අවස්ථාවක ලොව පුරා මිත්‍ර රටවලින් අපට ලැබෙන සහයෝගය වඩාත් වැදගත් සහ කාලීන බව අමාත්‍ය කෙහෙළිය රඹුක්වැල්ල මහතා තවදුරටත් පැවසීය.

3. සෞඛ්‍ය අමාත්‍යාංශයේ ආයතනික ව්‍යුහය



4. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන, ව්‍යාපාර හා වැඩසටහන්වල සාක්ෂාත් කර ගැනීම්

4.1 රෝග මර්දන වැඩසටහන

4.1.1 ලාදුරු මර්දන වැඩසටහන

හැඳින්වීම

ලාදුරු මර්දන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ලාදුරු රෝගය සම්බන්ධ සියලුම ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු සිරස් වැඩසටහනක් ලෙස ක්‍රියා කරයි. ලාදුරු මර්දන ව්‍යාපාරය පසුගිය දශක කිහිපය තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්-මහජන සෞඛ්‍ය සේවා I (DDG - PHS I) ගේ මගපෙන්වීම යටතේ ක්‍රියාත්මක වේ. ලාදුරු මර්දන ව්‍යාපාරහි ප්‍රධාන කාර්යයන් අතර ප්‍රතිපත්ති සැකසීම, වැඩසටහන් සැලසුම් කිරීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ලාදුරු රෝගයට අදාළ තොරතුරු රැස් කිරීම සහ බෙදා හැරීම සහ රෝග පාලනය සඳහා සාක්ෂි පදනම වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂණ ඇතුළත් වේ.

1954 දී ලාදුරු මර්දන ව්‍යාපාරය සෞඛ්‍ය දෙපාර්තමේන්තුව යටතේ තවත් ව්‍යාපාර කිහිපයක් සමඟ පිහිටුවන ලදී.

ලාදුරු මර්දන ව්‍යාපාරහි අධ්‍යක්ෂක කාර්යාලය වැලිසර ද ජාතික රෝහලෙහි බාහිර රෝගී අංශයෙහි මධ්‍යම ලාදුරු සායනය (කාමර අංක 12) සහ හැඳල ලාදුරු රෝහලෙන් සමන්විත වේ.

දැක්ම

ලාදුරු වලින් තොර ශ්‍රී ලංකාවක්.

මෙහෙවර

රෝගය සම්ප්‍රේෂණය කිරීම නැවැත්වීම, අපකීර්තිය අවම කිරීම, ලාදුරු රෝගයෙන් පීඩාවට පත් වූ සියලුම පුද්ගලයින් සඳහා පිරිවැය-ඵලදායී ගුණාත්මක ලාදුරු සේවාවන් ක්‍රියාත්මක කිරීම සහ පීඩාවට පත් වූවන්ට සාධාරණ ජීවන තත්ත්වයක් සහතික කිරීම සඳහා එවැනි සේවාවන් පවත්වාගෙන යාම.

අරමුණු

පොදු අරමුණ 1: ඒකාබද්ධ ලාදුරු සේවා ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම

පොදු අරමුණ 2: ඒකාබද්ධ සක්‍රීය සිද්ධි හඳුනාගැනීම් සමඟින් ලාදුරු වැළැක්වීම පරිමාණය කිරීම

පොදු අරමුණ 3: ලාදුරු රෝගය සහ එහි සංකූලතා කළමනාකරණය කිරීම සහ නව ආබාධ වැළැක්වීම

පොදු අරමුණ 4: අපකීර්තියට එරෙහිව සටන් කිරීම සහ මානව හිමිකම්වලට ගරු කිරීම සහතික කිරීම

2022 වසර ජයග්‍රහණ/විශේෂ සිදුවීම්

- ලාදුරු රෝගය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා LIFE Sri Lanka සමාජ අලෙවිකරණ ව්‍යාපාරය 2023 අගෝස්තු 16 වැනි දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ශ්‍රවණාගාරයේදී දියත් කරන ලදී.
- ළමුන් සහ දෙමාපියන් අතර දැනුවත්භාවය වැඩි කිරීම සඳහා තෝරාගත් දිස්ත්‍රික්ක පහක ලාදුරු රෝගය පිළිබඳ පාසල් ළමුන් අතර චිත්‍ර තරගයක් පවත්වන ලදී.
- ලාදුරු රෝගය පිළිබඳ දැනුම ප්‍රබෝධමත් කිරීම සඳහා දිස්ත්‍රික් ලාදුරු මර්දන කණ්ඩායම සඳහා පුහුණු සැසියක් පවත්වන ලදී.
- තෝරාගත් දිස්ත්‍රික්කවල ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- මඩකලපුව දිස්ත්‍රික්කයේ විශේෂ ලාදුරු මර්දන වැඩසටහනක් පවත්වන ලදී.

- 2017 වර්ෂයේදී හඳුනාගත් ලාදුරු රෝගීන්ගේ ආශ්‍රිතයින් පරීක්ෂා කිරීම සඳහා අධි අවදානම් දිස්ත්‍රික්කවල ලාදුරු රෝගීන්ගේ ආශ්‍රිතයින් පරීක්ෂා කිරීම ආරම්භ කරන ලදී.
- ප්‍රති-ක්ෂුද්‍ර ජීවී ප්‍රතිරෝධක protocol නිර්මාණය කරන ලදී.
- ආශ්‍රිතයින් පරීක්ෂා කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) සංවර්ධනය කරන ලදී.
- Pictogram පාසල් වෛද්‍ය පරීක්ෂණ සඳහා භාවිතා කිරීමට ප්‍රතිනිර්මාණය කරන ලදී.

පසුගිය වසර 5හි කාර්ය සාධන ප්‍රවණතාවය (2018-2022)

පසුගිය වසර පහ තුළ කාර්යක්ෂමතා දර්ශකය



වාර්තා වූ නව රෝගීන් ගණන 2018-2022



ලාදුරු රෝගීන් අලුතින් හඳුනා ගැනීමේ නව ප්‍රවණතා ප්‍රතිශතය 2018-2022



MB ප්‍රතිශතයේ ප්‍රවණතාවය 2018-2022



ළමා ලාදුරු රෝගීන් හඳුනා ගැනීමේ ප්‍රතිශතය 2018-2022



හඳුනා ගන්න අවස්ථාවේ දෙවන ශ්‍රේණියේ අභාදිතතා සහිත රෝගීන්ගේ ප්‍රතිශතයේ ප්‍රවනතාවය 2018-2022

4.1.2 බරවා මර්දන වැඩසටහන

හැඳින්වීම

බරවා මර්දන ව්‍යාපාරය යනු ශ්‍රී ලංකාවෙන් වසා පද්ධතිය ආශ්‍රිත බරවා රෝගය තුරන් කිරීම සඳහා වගකිව යුතු මහජන සෞඛ්‍ය ආයතනයයි. 2016 දී මහජන සෞඛ්‍ය ගැටලුවක් ලෙස බරවා රෝගය ලංකාවෙන් ඉවත් කරන ලදී. දැන් මෙම වැඩසටහන පශ්චාත් රෝග ආවේක්ෂණ අවදියේ පසුවන වන අතර ශ්‍රී ලංකාවේ නිරිතදිග වෙරළ තීරයේ රෝග ආවේණික දිස්ත්‍රික්ක අටක දැනටත් කීට විද්‍යාත්මක, පරපෝෂිත හා රෝග නිරීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කෙරේ.

දැක්ම

බරවා රෝගයෙන් තොර ශ්‍රී ලංකාවක්

මෙහෙවර

බරවා රෝගය තුරන් කිරීම සහ එම තුරන් කිරීම තිරසරව පවත්වා ගැනීම, නිරීක්ෂණ වැඩි දියුණු කිරීම, සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ ප්‍රජාව සවිබල ගැන්වීමෙන් විදවීම් හා ආබාධිත තත්ත්වයන් වළක්වා ගැනීම.

පොදු අරමුණු

- 2030 වන විට ශ්‍රී ලංකාවේ බැන්ක් රොෆ්ටියන් බරවා රෝගය සම්ප්‍රේෂණය නතර කිරීම
- 2030 වන විට ශ්‍රී ලංකාවේ බරවා රෝගය ආසාදනය හේතුවෙන් අවයව ඉදිමීමේ රෝග තත්ත්වයේ වාර්තා වීම අඩු කිරීම

විශේෂිත අරමුණු

- 2030 වන විට 0% බැන්ක් රොෆ්ටියන් ක්ෂුද්‍ර පණු අනුපාතය කරා ළඟා වීම සඳහා පරපෝෂිත නිරීක්ෂණ හා පාලන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම
- 2030 වන විට බැන්ක් රොෆ්ටියන් බරවා රෝගය පතුරන මදුරුවන් ආසාදනය වීමේ දෛශිකයේ අනුපාතය 0% කරා ළඟා වීම සඳහා කීට විද්‍යාත්මක නිරීක්ෂණ සහ දෛශික පාලන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම
- 2030 වන විට බරවා රෝගය හේතුවෙන් වාර් තා වන නව අවයව ඉදිමීමේ රෝගීන් ගේ සංඛ්‍යාව 50% කින් අඩු කිරීම
- සුළු ඉදිමුම් තත්ත්වයන් අලි කකුල් තත්ත්වය දක්වා වර්ධනය වීම වැළැක්වීම සහ රෝගාබාධ කළමනාකරණ සේවා වැඩි දියුණු කිරීම මගින් බලපෑමට ලක්වූ පුද්ගලයින්ගේ ආබාධ වැළැක්වීම

2022 දී ජයග්‍රහණ / විශේෂ සිදුවීම්

- බරවා රෝග ආවේණික දිස්ත්‍රික්ක අටෙහිම සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ කාරියක්ෂමතාව වර්ධනය කිරීමේ වැඩසටහන් සම්පූර් ණ කිරීම.

- බරවා රෝග ආවේණික සහ ආවේණික නොවන දිස්ත්‍රික්ක 20 ක මහජන සෞඛ්‍ය කාර් ය මණ්ඩලයේ කායක්ෂමතාව වර්ධනය කිරීමේ වැඩසටහන සම්පූර්ණ කිරීම.

- සියලුම බරවා රෝග ආවේණික දිස්ත්‍රික්කවල සහ AFC මූලස්ථානයේ රෝගාබාධ කළමනාකරණ සහ ආබාධිත වැළැක්වීමේ සායන සඳහා සහභාගී වන නව අවයව ඉදිමුණු රෝගීන්ගේ දැනුම වර්ධනය කිරීමේ වැඩසටහන් සම්පූර්ණ කිරීම.

- බරවා රෝග ආවේණික නොවන දිස්ත්‍රික්ක නවයක සෞඛ්‍ය කාර්යය මණ්ඩලයේ කායක්ෂමතාව වර්ධනය කිරීමේ වැඩසටහන සම්පූර්ණ කිරීම.

- බස්නාහිර පළාතේ මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ නිලධාරීන් සඳහා මෘදු නිපුණතා සංවර්ධනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

- ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහාය ඇතිව බරවා රෝගය තුරන් කිරීමේ වැඩසටහනේ භාහිර ඇගයීම අවසන් කරන ලදී.

- වව්නියාව ප්‍රාදේශීය මැලේරියා මර්දන නිලධාරීන්ගේ සහාය ඇතිව වව්නියාව යුද හමුදා කඳවුරක විශේෂ රාත්‍රී රුධිර පටල වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.
- බරවා රෝගය සඳහා සංක්‍රමණිකයන් පරීක්ෂාව ජාත්‍යන්තර සෞඛ්‍ය ඒකකය හරහා සහ වැඩ කරන ස්ථාන සක්‍රීයව පරීක්ෂා කිරීම හරහා අඛණ්ඩව සිදු කරන ලදී.
- ප්‍රාදේශීය ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයේ සහභාගීත්වයෙන් සියලුම ආවේණික දිස්ත්‍රික්ක වල වාර්ෂික දිස්ත්‍රික් සමාලෝචන සමඟ හොඳම ප්‍රායෝගික ක්‍රියාකාරකම් බෙදාගැනීමේ සැසි නවයක් සහ බරවා මර්දන මූලස්ථානයේ දී එක් සැසිවාරයක් පවත්වන ලදී.
- එක් තාක්ෂණික උපදේශක කණ්ඩායම් රැස්වීමක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.
- අන්තර්ජාලය පදනම් කරගත් රෝග ආවේක්ෂණ පද්ධතියක් සකස් කිරීම

අඛණ්ඩ සංවර්ධන ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තු ගත පිරිවැය	භෞතික ප්‍රගතිය 31.12.2022	මූල්‍ය ප්‍රගතිය 31.12.2022
GOSL			
රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම	4.00	සම්පූර්ණකර ඇත	1.39
රසායනාගාර උපකරණ ක්‍රමාංකනය (සේවා ගාස්තු)	0.50	සම්පූර්ණකර ඇත	0.35
කීට විද්‍යාත්මක නිරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍යයන් හා උපකරණ සැපයීම	4.20	සම්පූර්ණකර ඇත	0.15
බරවා රෝගය (TAG) තුරන් කිරීමේ තත්ත්වය පවත්වා ගැනීම සඳහා තාක්ෂණික මාර්ගෝප දේශය	0.05	සම්පූර්ණකර ඇත	0.04
ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරීන් (RMO) සමඟ මාසික හා කාර්තු සමාලෝචන රැස්වීම් 8+ 4	0.13	සම්පූර්ණකර ඇත	0.06
ISO සහතික කළ පරපෝෂිත විද්‍යාගාරය සංවර්ධනය කිරීම	1.00	අරමුදල් නොමැතිකම නිසා අර්ධ වශයෙන් සම්පූර් ණ කර ඇත	0.14
WHO			
ප්‍රාදේශීය බරවා රෝග මර්දන නිලධාරී කණ්ඩායම් අතර හොඳම ප්‍රායෝගික ක්‍රියාකාරකම් බෙදා හදා ගැනීම (වැඩසටහන් 09)	0.71	වැඩසටහන් 9 ක් සම්පූර්ණකර ඇත	0.60
දේශීය පුහුණුව - බරවා රෝග ආවේණික නොවන දිස්ත්‍රික් සෞඛ්‍ය කාර් ය මණ්ඩලයේ ක්ෂමතා වර්ධනය -2 වසර	2.00	වැඩසටහන් 9 ක් සම්පූර්ණකර ඇත	1.12
දේශීය පුහුණුව - බරවා රෝග ආවේණික දිස්ත්‍රික් සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ක්ෂමතා වර්ධනය -2 වසර	1.80	වැඩසටහන් 8 ක් සම්පූර්ණකර ඇත	0.79
බරවා රෝගීන් සඳහා ඉදිමුණු කකුල් රැක බලා ගැනීමේ පුහුණු වැඩසටහනක්	0.90	වැඩසටහන් 9 ක් සම්පූර්ණකර ඇත	0.60
තුරන් කිරීමේ ඉලක්ක කරා ළඟා වීම සඳහා සාක්ෂි මත පදනම් වූ උපාය මාර් ග සැකසීමට පහසුකම් සැලසීම සඳහා වසංගත රෝග, ආර්ථික, කීට විද්‍යාත්මක සහ පරපෝෂිත ඇගයීම තුළින් සමස්ත බරවා රෝග නිවාරණ වැඩසටහන් ඇගයීම	6.60	සම්පූර්ණකර ඇත	0.66

පසුගිය වසර 5 කාර් ය සාධන ප්‍රවණතාව

පරපෝෂිත නිරීක්ෂණ

ප්‍රාදේශීය වෛද්‍ය නිලධාරී / ෆයිලේරියාසිස් පාලනයේ අධීක්ෂණය යටතේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සහ රසායනාගාර කාර්ය මණ්ඩලය විසින් පරපෝෂිත නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. භාවිතා කරන ප්‍රධාන රෝග විනිශ්චය ක්‍රමය වන්නේ රාත්‍රී රුධිර පටලයයි. ක්ෂුද්‍ර පණු අනුපාතය (එකතු කරන ලද සියල්ලෙන් ධනාත්මක සාම්පලවල ධන ප්‍රතිපල ප්‍රතිශතය) සහ ක්ෂුද්‍ර පණු ඝනත්වය (රුධිරයේ මිලි ලීටරයක ඇති සාමාන්‍ය ක්ෂුද්‍ර පණු සංඛ්‍යාව) රට තුළ සම්ප්‍රේශනයට බාධා කිරීමේ ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා භාවිතා කරන දර්ශක වේ.

2016-2022 අතර කාලය තුළ සක්‍රීය ආසාදන සහිත සමස්ත රෝගීන් 909 ක් වාර් තා විය. මෙම සංඛ්‍යාවට ශ්‍රී ලංකාවේ සංක්‍රමණික ශ්‍රම බලකායේ ධනාත්මක රෝගීන්ද ඇතුළත් වේ. රූප සටහන 1 හි දැක්වෙන්නේ 2016-2023 දක්වා ස්වදේශික රෝගීන් සහ සංක්‍රමණිකයින්ගේ විශේෂ අනුව ක්‍රියාකාරී ආසාදන සහිත රෝගීන් සංඛ්‍යාවයි.



රූපය 1. විශේෂ සහ වාර්තා වන රෝගීන් කාණ්ඩය අනුව රෝගීන් ගණන 2016-2022

රූපසටහන 1 පශ්චාත් වලංගු කිරීමේ අවධියේදී දේශීය ක්ෂුද්‍ර පණු ධනාත්මක රෝගීන්ගේ අඩුවීමක් පෙන්නුම් කරයි. තවද, දේශීය රෝගීන්ගේ නිරීක්ෂණය කරන ලද අඩුවීම ක්‍රමයෙන් සංක්‍රමණික රෝගීන් විසින් ප්‍රතිස්ථාපනය කරන බව පෙන්නුම් කරයි. ධනාත්මක රෝගියාගේ දත්ත විශ්ලේෂණය කිරීමෙන් දේශීය රෝගීන්ට සාපේක්ෂව සංක්‍රමණිකයන් අතර සංඛ්‍යානමය වශයෙන් සැලකිය යුතු ඉහළ ක්ෂුද්‍ර පණු අනුපාතයක් (මධ්‍යන්ය වෙනස = 3.36, $p<0.001$) සහ ක්ෂුද්‍ර පණු ඝනත්වය (මධ්‍යන්ය වෙනස = 367.98, $p<0.01$) පෙන්නුම් කළේය.

භූගෝලීය ව්‍යාපෘති පැහැදිලිව පෙන්නුම් කරන්නේ වයඹ පළාතේ හැර ආවේණික ප්‍රදේශ තුළ පවා රෝගීන් වෙරළබඩ දේශසීමාවට පමණක් සීමා වී ඇති බවයි.

රූපසටහන 2 2016-2022 සිට සිදු කරන ලද මුළු පරීක්ෂණ සංඛ්‍යාවට සාපේක්ෂව ක්ෂුද්‍ර පණු අනුපාතයේ ප්‍රවණතා පෙන්නුම් කරයි.

රූපසටහන 2 2016-2022 සිට සිදු කරන ලද මුළු පරීක්ෂණ සංඛ්‍යාවට සාපේක්ෂව ක්ෂුද්‍ර පණු අනුපාතයේ ප්‍රවණතා පෙන්නුම් කරයි.



රූපය 2. ආවේණික දිස්ත්‍රික්කවල වසර අනුව ක්ෂුද්‍ර පණු අනුපාතය

බරවා රෝගය තුරන් කිරීමේ වර් තමාන රධාන උපාය මාර්ගයක් වන කීට විද්‍යාත්මක නිරීක්ෂණ මඟ පෙන්වන පරපෝෂිත නිරීක්ෂණ සමඟ ක්ෂුද්‍ර පණු අනුපාතයේ පැහැදිලි අඩුවීමක් පෙන්නුම් කරයි. COVID-19 ගෝලීය වසංගතය සමඟ රාත්‍රී රුධිර පටල පරීක්ෂා කිරීමේ වැඩසටහනට බාධා එල්ල වූ බැවින්, 2020 සහ 2021 කාලය තුළ රුධිර පටල පරීක්ෂා කිරීමේ විශාල අඩුවීමක් දක්නට ලැබුණි. මෙය 2021 දී ක්ෂුද්‍ර පණු අනුපාතය ඉහළ යාමට අහිතකර ලෙස බලපෑවේය. නමුත් 2022 දී තිරගත කිරීමේ අනුපාතය වැඩි කරන ලදී.

2017 දී සංක්‍රමණිකයින් බරවා රෝගය සඳහා පරීක්ෂා කිරීම ආරම්භ කරන ලද අතර, එහිදී සංක්‍රමණිකයින් විශාල සංඛ්‍යාවක් වැඩ සැකසුම් තුළ පරීක්ෂා කිරීම සහ අභ්‍යන්තර සෞඛ්‍ය ඇගයීමේදී පරීක්ෂා කිරීම තුළින් බරවා රෝගය සඳහා පරීක්ෂා කරනු ලැබේ. 2022 වර්ෂයේ දී රාත්‍රී රුධිර රූගත කිරීම් මගින් රෝගීන් 34 දෙනෙකු ධනාත්මක බව හඳුනාගෙන ඇත (රූපය 3).



රූපය 3. 2017-2022 සිට සංක්‍රමණික රුධිර පටල පරීක්ෂා කිරීම

Entomological surveillance

ශ්‍රී ලංකාවේ බරවා රෝගය සම්ප්‍රේෂණය සඳහා වගකිව යුතු දෛශික දෙකම සඳහා කීට විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ; කියුලෙක්ස් ක්වින්කේෆැසියාටස් සහ මැන්සෝනියා මදුරු විශේෂ. වැඩිහිටි කියුලෙක්ස් මදුරුවන් එකතු කරනු ලබන්නේ මදුරු උගුල් හෝ ගෘහස්ථ එකතු කිරීමෙනි.

වැඩිහිටි මැන්සෝනියා මදුරුවන් ගව ඇමක් යොදන දැල් උගුල් සහ ගෘහස්ථ එකතු කිරීම හරහා එකතු කරනු ලැබේ. සියලුම ගෘහස්ථ අතින් එකතු කරන ලද මදුරුවන් සහ මදුරු උගුල හෝ ගව ඇමක් සහිත දැල් උගුලේ අනුපාතය එකතු කරන ලද මදුරුවන් ක්ෂුද්‍ර පණුවන් හෝ කීට අවධීන් දෘශ්‍යමාන කිරීම සඳහා විච්ඡේදනය කරනු ලැබේ. එක් එක් උගුලෙන් එකතු කරන ලද කියුලෙක්ස් මදුරුවන් සහ ගව ඇමක් සහිත දැල් උගුල තුළ එකතු කරන ලද එක් එක් උප විශේෂවලින් මැන්සෝනියා මදුරුවන්ගේ 25 ක් එකතු කර පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව මගින් පරපෝෂිත DNA ජානමය වශයෙන් හඳුනා ගැනීමට භාජනය වේ.

විච්ඡේදනය කරන ලද මදුරුවන්ගේ සොයාගැනීම් ආසාදිත හා බෝවන මදුරු අනුපාත ගණනය කිරීම සඳහා භාවිතා කරනු ලැබේ පරපෝෂිත මානව සමීක්ෂණ දෛශික සමීක්ෂණවල ධනාත්මක සොයාගැනීම් මත පදනම්ව ආරම්භ කරනු ලැබේ. රූප සටහන 4 සහ 5 වසර අනුව එක් එක් ආවේණික දිස්ත්‍රික්කයේ ආසාදිත අනුපාත සහ ආසාදන අනුපාත පෙන්නුම් කරයි.

ආසාදිත අනුපාතය යනු ඕනෑම පරපෝෂිත අවධියක් සඳහා ධනාත්මක මදුරුවන්ගේ ප්‍රතිශතයයි. ආසාදන අනුපාතය යනු බෝවන අවධියේ (L3) කීටයන් සඳහා ධනාත්මක මදුරුවන්ගේ ප්‍රතිශතයයි.

පරපෝෂිත අවධීන් සඳහා මදුරු ධනාත්මක බව කුරුණෑගල හැර අනෙකුත් සියලුම ආවේණික දිස්ත්‍රික්කවල අඛණ්ඩව පවතී.



රූපය 4. 2016-2022 දක්වා විච්ඡේදනය කරන ලද මුළු මදුරුවන් හා සසඳන විට මදුරුවන්ගේ ආසාදිත හා ආසාදන අනුපාතය

ගාල්ල සහ මාතර යන ප්‍රදේශවල බෝවන මදුරුවන්ගේ ඉහළ ප්‍රතිශතයක් දක්නට ලැබෙන අතර එය මෙම දිස්ත්‍රික්කවල වැඩි රෝගීන් ප්‍රමාණයකට අනුකූල වේ.

රෝගාබාධ කළමනාකරණය

බරවා රෝග නිදන්ගත සංකූලතා සරල අවයව ඉදිමුම් තත්ත්වයක සිට අලි කකුල් තත්වයක් දක්වා විහිදේ. මෙම ඉදිමුම් රෝගීන්ට අලි කකුල් තත්වයක් දක්වා වර්ධනය වීම වැළැක්වීම සඳහා සමීප පසු විපරමක් අවශ්‍ය වේ. රෝගාබාධ කළමනාකරණ වැඩසටහන අවයව ඉදිමුම් රෝගීන් හඳුනා ගැනීම සහ සේවා සැපයීම කෙරෙහි අවධානය යොමු කරයි. රූප සටහන 5 වසර අනුව ආවේණික දිස්ත්‍රික්කවල රෝගාබාධ කළමනාකරණ සායනවල ලියාපදිංචි හා පසු විපරම් කරන ලද නව හා පසුකාලීන පසුවිපරම් ගණන පෙන්නුම් කරයි.



රූපය 5. රෝගාබාධ කළමනාකරණ සායනවල අවයව ඉදිමුම් රෝගීන් ගේ පසුකාලීන පසුවිපරම් සංඛ්‍යාව සහ නව ලියාපදිංචිය.

සාමාන්‍යයෙන් වසරකට බරවා රෝග ආවේණික දිස්ත්‍රික්කවල රෝගාබාධ කළමනාකරණ සායනවල ලියාපදිංචි නව අවයව ඉදිමුම් රෝගීන් ගණන 643 කි. රෝගාබාධ කළමනාකරණ සායන සඳහා සාමාන්‍ය පසු විපරම් චාරිකා වසරකට 8068 ක් විය. 2020-2021 කාලය තුළ රට තුළ COVID-19 ව්‍යාප්තිය හේතුවෙන් පසු විපරම් චාරිකා වල අඩුවීමක් දක්නට ලැබුණි.

රෝගීන්ගෙන් බහුතරයක් මුල් අවධියේ (82%) රෝගාබාධ සායනයට ඉදිරිපත් වේ. රෝගීන්ගෙන් බහුතරයක් (42%) වයස අවුරුදු 41-60 අතර වයස් කාණ්ඩයේ වන අතර පිරිමි අතර ව්‍යාප්තිය තරමක් ඉහළ ප්‍රමුඛතාවයක් (53%) පෙන්නුම් කළේය.

ආවේණික නොවන සමීක්ෂණ

බරවා රෝගය සඳහා ආවේණික නොවන දිස්ත්‍රික්ක 17 ක් ඇත. ආවේණික නොවන ප්‍රදේශවල කීට විද්‍යාත්මක හා පරපෝෂිත සමීක්ෂණ 2017 දී ආරම්භ කරන ලදී. මෙම දිස්ත්‍රික්කවල ආවේණික නොවන බව තහවුරු කිරීමේ අරමුණින් මෙය ආරම්භ කරන ලදී.

එතැන් පටන් දිස්ත්‍රික්ක නවයක් (රත්නපුර, මොණරාගල, ත්‍රිකුණාමලය, කෑගල්ල, මහනුවර, මන්නාරම, අනුරාධපුරය, අම්පාර සහ බදුල්ල) (වගුව 1) සමීක්ෂණ වලින් ආවරණය කර ඇත. බරවා රෝගය සම්ප්‍රේරේෂණය තක්සේරු කිරීම සඳහා ආවේණික නොවන දිස්ත්‍රික්කවල තෝරාගත් MOH ප්‍රදේශවල PHI ප්‍රදේශ එකක් හෝ දෙකක් හඳුනාගන්නා ලදී. අතීත වාර්තා, භූගෝලීය අවදානම් (ආවේණික දිස්ත්‍රික්කවලට යාබදව), නාගරීකරණය සහ ජනගහනය සංක්‍රමණය වීම මත පදනම්ව දිස්ත්‍රික්ක වලට ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

රඹුක්කන, ඇඹිලිපිටිය, ත්‍රිකුණාමලය සහ මුතූර් MOH යන ප්‍රදේශවල බරවා මදුරු ප්‍රතිඵල පෙන්නුම් කළ ද සිදු කරන ලද සියලු මානව සමීක්ෂණ සෘණාත්මක විය.

2023 සඳහා සැලසුම් කර ඇති විශේෂ සංවර්ධන කටයුතු

"ශ්‍රී ලංකාවේ ආවේණික ප්‍රදේශයක පශ්චාත් රෝග අවෙක්ෂණ කාලය තුළ නිරන්තර බැක්ටීරියන් බරවා රෝගය හඳුනා ගැනීම සඳහා වර්තමාන පරපෝෂිත ශිල්පීය ක්‍රමවල ඵලදායීතාවය" පිළිබඳ කළුතර විශේෂ සමීක්ෂණයක්

- කුරුණෑගල සම්ප්‍රේරේෂණ ඇගයීම් සමීක්ෂණය
- බෘජියානු බරවා රෝගය පාලනය කිරීම සඳහා සතුන් නිරීක්ෂණ සහ සතුන්ට ප්‍රතිකාර කිරීම හඳුන්වා දීම
- ධනාත්මක රෝගීන් සිටින ප්‍රදේශවල සහ සංක්‍රමණිකයන් සිටින වැඩබිම් වල මහා පරිමාණ ඖෂධ ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- ක්ෂේත්‍ර නිලධාරීන් අතර මෘදු නිපුණතා වර්ධනය කිරීම සඳහා සේවාකාලීන පුහුණු වැඩසටහන් පැවැත්වීම

4.1.3 මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා

හැඳින්වීම

ශ්‍රී ලංකාව තුළ මානව සහ සත්ව ජලභීතිකා රෝගය වැලැක්වීමත් අනෙකුත් සතුන් මඟින් බෝවන රෝග පාලනයත් සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ පිහිටුවා ඇති මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවයට ජාතික වගකීමක් පවරා ඇත. ජලභීතිකාව හා ජැපනීස් එන්සෙපලයිටිස් යනු ශ්‍රී ලංකාවේ ප්‍රජාව කෙරෙහි බලපාන ප්‍රධාන වෛරස් රෝග දෙකක් වන අතර මේවා සතුන් මඟින් බෝවීම සිදුවේ.

ජලභීතිකාව පතුරවන ප්‍රධාන මූලය වන්නේ සුනඛයන්ය. එමෙන්ම ශ්‍රී ලංකාව තුල මානව ජලභීතිකාව සඳහා ප්‍රධාන සම්ප්‍රේෂණ කරුවා වන්නේ ද සුනඛයන්ය. එලෙසම මොළයේ උන හෙවත් ජැපනීස් එන්සෙපලයිටිස් රෝගය පැතිරවීමට මූලික වන්නේ ඌරන් ය.

දැක්ම

මාරාන්තික ජලභීතිකාව හා වෙනත් සතුන් මඟින් බෝවන රෝග වලින් සිදු වන අකර්මණ්‍යතාවලින් මහජනයා උපරිම වශයෙන් ආරක්ෂා කිරීමට සහතික කිරීම.

මෙහෙවර

පළාත් සෞඛ්‍ය සේවාවන් සම්බන්ධ ඉහල ආවරණයකට ළඟා වීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නියම කර ඇති ජලභීතිකා මර්දන ක්‍රමෝපායයන් අධීක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පහසුකම් සැපයීම

අරමුණු

01. වර්ෂ 2025 වන විට සුනඛයන් මඟින් බෝවන මිනිස් ජලභීතිකා රෝගය තුරන් කිරීම සඳහා සිදු කරනු ලබන ජලභීතිකා පාලන ක්‍රියාකාරකම් අධීක්ෂණය ශක්තිමත් කිරීම.
02. සුනඛයන් එන්නත් කිරීමේ ප්‍රමාණය වැඩි කිරීම් සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමග සහයෝගීතාවයකින් හා සන්නිවේදනාත්මකව කටයුතු කිරීම.
03. සත්ව ජලභීතිකාව සහ බල්ලන් සපාකෑම පිළිබඳව ආවේක්ෂණ වැඩි දියුණු කිරීම.

2022 දී ජයග්‍රහණ/විශේෂ සිදුවීම්

01. සිංහ සමාජය හා එක්ව ලෝක ජලභීතිකා දිනය නිමිත්තෙන් පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් ජා ඇල ප්‍රදේශයේ දී පැවැත්වීම.
02. වගකීමෙන් සුරතලුන් ඇති කිරීමේ වැදගත්කම පිළිබඳව ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම.
03. වන්ධ්‍යාකරණ සේවාව සහිත ජංගම එන්නත් සායනයක් පැවැත්වීම.

ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තු මුදල (රු.මි)	භෞතික ප්‍රගතිය 2022.12.31	මූල්‍ය ප්‍රගතිය 2022.12.31 (රු.මි)
සුනඛයින් වන්ධ්‍යාකරණය	68.9	ගැහැණු සුනඛයින් 30408 වන්ධ්‍යාකරණය කරන ලදී	74.269
ප්‍රජා නායකයන් හරහා ජලභීතිකා රෝගය පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම.	0.175	වැඩසටහන් 06 පවත්වන ලදී	0.222
ජලභීතිකා රෝග පශ්චාත් නිරාවරණ ප්‍රතිකාර පිලිබඳ සේවා පුහුණුව සහ නව චක්‍රලේඛය හඳුන්වා දීම	0.2	වැඩසටහන් 03	0.123
දිස්ත්‍රික් ජලභීතිකා මර්දන ම.සෞ.ප. වරුන් හා පශු එන්නත් ක්ෂේත්‍ර සහකාරවරුන් හට සේවා පුහුණු වැඩසටහන් පැවැත්වීම	0.39	වැඩසටහන් 12	0.302
ලෝක ජලභීතිකා දිනය අනුස්මරණය සඳහා වූ ජාතික වැඩසටහන	0.5	දැනුවත් කිරීමේ බැනර් 400 මුද්‍රණය	0.493
ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම (ජාතික හා දිස්ත්‍රික් මට්ටම්)	0.1	01 (මාර්ගගත ක්‍රමයට)	-
කාර්යාලයීය උපකරණ මිළට ගැනීම	4.6	ජාතික උපාමාර්ගික සැලැස්ම මුද්‍රණය සඳහා මූලික ගෙවීම් සිදු කිරීම	0.198
එකතුව	**75**		**75.607**

පසුගිය වසර 5 තුළ කාර්ය සාධනය

සුනඛ එන්නත්කරණය

	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි
2018	62368	40445	31127	8659	4063	6076
2019	0	0	0	1265	78378	103269
2020	107148	97239	71127	7131	66769	120890
2021	115377	99664	114349	82495	64164	67009
2022	110248	101117	128126	98700	96051	123365

	ජූලි	අගෝස්තු	සැප්තැම්බර්	ඔක්තෝම්බර්	නොවැම්බර්	දෙසැම්බර්
2018	0	0	0	0	0	499
2019	147893	115418	114819	122794	102850	105644
2020	113022	129190	147245	142983	138019	128024
2021	95839	89455	93149	130819	113357	118265
2022	57236	125376	121371	110058	96718	60501



ජලභීතිකා පාලනය සහ වැලැක්වීමේ ක්‍රියාකාරකම් වලට එරෙහිව මානව ජලභීතිකා ප්‍රවණතාවය 1972-2022



පසුගිය වසර 5 තුල සුනඛ වන්ධ්‍යාකරණ දත්ත



2023 වර්ෂය සඳහා සැලසුම් කර ඇති විශේෂ සංවර්ධන කටයුතු

1. තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක ඒකාබද්ධ සුනඛ සපාකෑම් කළමනාකරණය පිලිබඳ වැඩසටහන් පැවැත්වීම
2. වෛද්‍ය පර්යේෂණ ආයතනය හා වනජීවී දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව ජලභීතිකා වෛරසයේ ජාන අනුක්‍රමය නිර්ණය

4.1.4 මැලේරියා මර්දන ව්‍යාපාරය

දැක්ම

මැලේරියාවෙන් තොර ශ්‍රී ලංකාවක්

මෙහෙවර

දැඩි ආවේක්ෂණ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම, අංග සම්පූර්ණ රෝග ප්‍රතිකාර සේවය, රෝග පැතිරීමක් සඳහා පෙර සූදානම, විදේශ ගතවන්නන් හා අවදානම් කණ්ඩායම් සඳහා අවශ්‍ය තොරතුරු ලබාදීම හා මැලේරියාව නැවත ප්‍රතිස්ථාපනය වැලැක්වීම සඳහා ක්ෂණිකව ක්‍රියාකාරි වීම යන කර්තව්‍යයන් උදෙසා විස්තීරණ සැලැස්මක් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

මැලේරියා මර්දන ව්‍යාපාරයේ අරමුණු

1. මැලේරියාව යලි ස්ථාපිත වීම වැලැක්වීම.
2. මැලේරියා මරණ ශුන්‍ය තත්වයේ පවත්වා ගැනිම.

2022 හා 2023 වසර වල අත්පත් කරගත් ප්‍රධාන ජයග්‍රහණ

- ශ්‍රී ලංකාව තුළ මැලේරියාව සම්ප්‍රේෂණයෙන් තොර තත්වය 2022 වසර තුළ හා 2023 අගෝස්තු මාසය දක්වා කාලය තුළ පවත්වාගත හැකි විය. 2016 දී ශ්‍රී ලංකාවෙන් මැලේරියාව තුරන් කරන ලද අතර රට තුළ සම්ප්‍රේෂණයෙන් අසාදිත වූ අවසාන රෝගියා 2012 දී වාර්තා විය.

- 2022 වර්ෂයේදී විදේශගතව සිටියදී අසාදනය වී පැමිණි රෝගීන් 37ක් ද 2023 අගෝස්තු මාසය වන විට 35ක් ද වාර්තා විය. මේ රෝගීන්ගෙන් බහුතරය අප්‍රිකානු රටවල සිට පැමිණි අය වූහ. රටතුළ පැතිරීමක් මේ කිසිදු රෝගියෙකුගෙන් සිදු නොවිය.
- සෑම විටම මැලේරියා මර්දන ඖෂධ අවශ්‍ය ප්‍රමාණ වලින් පවත්වා ගන්නා ලදී. මැලේරියා ප්‍රතිකාර සහ වලක්වා ගැනීම සඳහා අවශ්‍ය ඖෂධ, වෙනත් අවශ්‍යතා, පුහුණු සැසි සහ මාර්ගෝපදේශ සැකසීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ආදී සියල්ල සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුග්‍රහය ලැබිණි.
- මැලේරියාව සහිත රටකට පිටත්ව යන සෑම අයෙකුටම අපහසුවකින් තොරව වැලක්වීමේ ඖෂධ නිකුත් කරන ලදී.
- බේරුවල, රත්නපුර, ගාල්ල ආදී මැණික් ව්‍යාපාර සඳහා විදේශ ගතවන්නන් බහුලව සිටින ප්‍රදේශ වලට මුලිකත්වය දෙමින් රට පුරා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. වෛද්‍ය වෘත්තිකයන්ගේ මැලේරියාව දැනුම වර්ධනය කිරීම සඳහා කෙටි පණිවුඩ, වැඩසටහන් (20ක්) මාර්ගගත සැසි ආදිය අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. නීති විරෝධී සංක්‍රමණ උත්සාහයන් නිතර වාර්තා වන, රෝග වාහක මදුරුවන්ද වැඩි වශයෙන් දක්නට ලැබෙන උතුරු ප්‍රදේශයට ද මෙහිදී අවධානය යොමු කරන ලදී .
- මැලේරියා මර්දන මූලස්ථානයේ දත්ත පද්ධතිය වඩා ශක්තිමත් කරන ලද අතර විවිධ ක්‍රම ඔස්සේ ලැබෙන අවදානම් කණ්ඩායම් පිළිබඳ තොරතුරු ප්‍රාදේශීය මැලේරියා මර්දන වෛද්‍ය නිලධාරීන් වෙත බෙදා හරිනු ලබන්නේ තම ප්‍රදේශයේ සිටින අවදානම් කණ්ඩායම් හඹායාම වඩාත් පහසු කරවීම සඳහාය. Whatsapp කණ්ඩායම් මඟින්ද අවදානම් කණ්ඩායම් පිළිබඳ පසුවිපරම් (විශේෂයෙන් ත්‍රිවිධ හමුදා කණ්ඩායම්) සිදු කෙරේ.
- 2022 ලෝක මැලේරියා දිනයට සමගාමීව මාධ්‍ය සාකච්ඡාවක් සහ “PROMIS (Prevention of Re-establishment of Malaria in Sri Lanka) Initative” නම් වූ සමාජ මාධ්‍ය ව්‍යාපාරය දියත් කරන ලද අතර සෞඛ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් ෆේස් බුක් පෝස්ට් හා යූ ටියුබ් වීඩියෝ තරගාවලියක්ද පවත්වන ලදී. මාධ්‍ය සාකච්ඡා දෙකක් සහ වෙනත් විවිධ මාධ්‍ය වැඩසටහන් වලට මැලේරියා මර්දන ව්‍යාපාරය 2023 වසරේදී දායක විය.
- සංචාරකයන් (දේශීය හා විදේශීය) ගේ මැලේරියාව පිළිබඳ දැනුවත් බව වැඩි කිරීම සඳහා බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ඩිජිටල් පැනලයක් ස්ථාපිත කරන ලද අතර යාපනය ගුවන් තොටුපලටද ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර බෝට්ටු සේවයේ ගමන් ගන්නා අය වෙනුවෙන්ද මෙබඳු ඩිජිටල් පැනල ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ.
- මැලේරියාව වැලක්වීමේ ඖෂධ ලබා ගන්නන් උදෙසා google පෝරමයක් ක්‍රියාත්මක වේ. දිවයින පුරා ස්ථාන වල ඖෂධ තබා ඇති ප්‍රමාණ අධීක්ෂණය සඳහාද ක්‍රමවේද සකසා ඇත. වාර්තා වන සියළු රෝගීන්ගේ ප්‍රතිකාර, ආවේක්ෂණ ක්‍රියාවලි ආදියද මාර්ගගත ක්‍රමයට අධීක්ෂණය කෙරෙනු ලැබේ.
- රුධිර පටල පරීක්ෂණ ක්‍රියාවලියේ තත්වය ඉහල නැංවීම උදෙසා ලේ බැංකු කාර්ය මණ්ඩල සඳහා රුධිර පටල සැකසීම පිළබඳ පුහුණු සැසි (25ක්) , NCAM - මැලේරියා සඳහා ජාතික නිපුණතා ඇගයීම් (5ක්), ECAM- මැලේරියා රුධිර පටල පරීක්ෂණ සඳහා බාහිර නිපුණතාඇගයීම් (1ක්) NAAT & QA වැඩසටහන් 2ක්, මහජන සෞඛ්‍ය ක්ෂේත්‍රනිලධාරීන් සහ මහජන සෞඛ්‍ය රසායනාගාර කාර්ය මණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් (2ක්) හා ක්ෂණික රෝග විනිශ්චය පරීක්ෂණ කට්ටල සඳහා පුහුණු කිරීම් පවත්වන ලදී.
- වාර අවසාන සමාලෝචනය සහ 2023-2027 සඳහා ජාතික උපාය මාර්ගික සැලැස්ම (National Strategic Plan for Prevention of Re-establishment of Malaria) සකස් කිරීම නිම කිරීම නිම කරන ලදී .
- රෝග ප්‍රතිකාර සඳහා වන මාර්ගෝපදේශ 2023 වසරේදී යාවත්කාලීන කරන ලදී.
- තාක්ෂණික සහයක කමිටු (TSG) රැස්වීම්, රෝගී සමාලෝචන රැස්වීම්, මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් හා අර්ධ වාර්ෂික කීට විද්‍යා සමාලෝචන රැස්වීම් හා ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් මැලේරියාව යලි ස්ථාපිත වීම වැළක්වීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කරන ලදී .

- 2022 වසරේදී ලීෂ්මානියාසිස් (Leishmaniasis) රෝග වැළක්වීම හා මර්දනය ද මැලේරියා **මර්දන** ව්‍යාපාරය වෙත පවරන ලදී. ලීෂ්මානියාසිස් රෝග පාලනය සඳහා ජාතික උපාය මාර්ගික සැලැස්ම පිළියෙල කිරීම ආරම්භ කර ඇත.

Improving the quality of malaria microscopy

Public announcement at Beruwala Gem market

Screening of gem traders

Galle District stakeholder meeting

Matale District stakeholder meeting

Training of Regional Malaria Officers

Awareness for Sri Lanka Netball Team

Malaria Day 25th April 2023 Addressing

Screening of refugees from Myanmar Media

Stakeholder meeting for leishmaniasis at AMC Headquarters

Field visits in Kurunegala for Leishmaniasis activities

Director, Global Malaria Programme and Regional Advisor/ Malaria, SEARO visited Anti Malaria Campaign Headquarters

ප්‍රධාන කාර්ය සාධක නිර්ණායක		ප්‍රගතිය			
		2022 සඳහා ඉලක්කය	2020	2021	2022
1	දේශීයව සම්ප්‍රේෂණය වූ මැලේරියා රෝගීන් ගණන	0	0	0	0
2	මැලේරියා මරණ ගණන	0	0	0	0
3	මැලේරියාව දැයි සැක සහිත රෝගීන්ගෙන් මැලේරියා රුධිර පරීක්ෂාවට භාජනය වූ ප්‍රතිශතය	100%	100%	100%	100%
4	පැය 24 ක් තුල දැනුම් දෙනු ලැබූ මැලේරියා රෝගීන්ගේ ප්‍රතිශතය	100%	100%	100%	100%
5	දැනුම් දීමෙන් පසුව දින 2 ක් ඇතුළත පරීක්ෂණ ක්‍රියාවලියට භාජනය කරන ලද රෝගීන්ගේ ප්‍රතිශතය	100%	100%	100%	100%
6	තහවුරු වූ රෝගීන්ගෙන් ජාතික ප්‍රතිකාර මර්ගෝපදේශ වලට අනුව පළමු පෙළ මැලේරියා ප්‍රතිකාර ලබා දෙන ලද රෝගීන්ගේ ප්‍රතිශතය	100%	100%	100%	100%

*** සියලුම ඉලක්ක 2022 වසර තුළදී සපුරන ලදී .*

4.1.5 ක්ෂය රෝග හා ලය රෝග පිළිබඳ ජාතික වැඩසටහන

දැක්ම

ක්ෂය රෝගය සහ වෙනත් ශ්වසන ආශ්‍රිත රෝග වලින් තොර ශ්‍රී ලංකාවක්

මෙහෙවර

ක්ෂය රෝගයෙන් තොර ශ්‍රී ලංකාවක් ඇති කිරීම සඳහා කැපවීමෙන් රටේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම, රට තුළ ක්ෂය රෝග හා වෙනත් ශ්වසන ආශ්‍රිත රෝග පාලනය කිරීමේ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, සම්බන්ධීකරණය හා අධීක්ෂණය කිරීම.

හැඳින්වීම

ක්ෂය රෝග පාලනය සහ ළය රෝග පිළිබඳ ජාතික වැඩසටහන (NPTCCD) යනු දිස්ත්‍රික් ළය සායන හරහා ක්‍රියාත්මක වන, රට තුළ ක්ෂය රෝග මර්දන කටයුතු නියාමනය සඳහා වන ජාතික මට්ටමේ සංවිධානයයි. NPTCCD දිස්ත්‍රික් මට්ටමේ කාර්ය මණ්ඩලයට සම්බන්ධීකරණය සහ තාක්ෂණික මගපෙන්වීම සහ රෝගීන් සඳහා කිසිදු බාධාවකින් තොරව හොඳ තත්ත්වයේ රෝග විනිශ්චය සහ ප්‍රතිකාර සේවා සැපයීම සහතික කිරීම සඳහා සහාය ලබා දේ. මීට අමතරව, NPTCCD විසින් ක්‍රියාත්මක කරන ලද රෝග වැළැක්වීමේ සේවාවන්ට හඳුනාගත් අධි අවදානම් කණ්ඩායම් අතර ක්ෂය රෝග වැළැක්වීමේ ප්‍රතිකාරය දිගටම කරගෙන යාමට සහාය වීම, සහ ක්ෂය රෝගය පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය සහ සෞඛ්‍ය ප්‍රවර්ධන හැසිරීම් වැඩිදියුණු කිරීම ඇතුළත් වේ.

ක්ෂය රෝගීන් සඳහා ප්‍රතිකාර සේවා සැපයීම ප්‍රධාන වශයෙන් දිස්ත්‍රික් ළය සායන 26 ක්, දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ සහ මූලික රෝහල, මුල්ලරියාවේ ශාඛා ළය සායන දෙකක් සහ ස්වසන රෝග පිළිබඳ ජාතික රෝහල හරහා ප්‍රධාන වශයෙන් සපයනු ලැබේ. වැලිසර ජාතික ක්ෂය රෝග විමර්ශන රසායනාගාරය, ගාල්ල, රත්නපුර, යාපනය සහ මහනුවර අතරමැදි සංස්කෘතික රසායනාගාර (, දිස්ත්‍රික් ළය සායන රසායනාගාර (26) සහ දිවයිනේ ඇති අන්වීක්ෂීය මධ්‍යස්ථාන 160 කට අධික ප්‍රමාණයක් හරහා රෝග විනිශ්චය සේවා සපයනු ලැබේ.

අරමුණු

1. 2021 සිට 2025 දක්වා කාලය තුළ ළමුන් 600ක් ඇතුළුව වාර්ෂිකව ඖෂධ සංවේදී ක්ෂය රෝග 10,000ක් සොයාගෙන සාර්ථකව ප්‍රතිකාර කිරීම
2. 2021 සහ 2025 අතර සෑම වසරකම, ක්ෂය රෝග වැළැක්වීමේ ප්‍රතිකාර (TPT) සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන් 11,600ක් සාර්ථකව ප්‍රතිකාර කිරීම
3. පුද්ගලික අංශය ක්ෂය රෝග නිර්ණය කිරීම සහ රැකවරණය සඳහා නිසි ලෙස නියැලෙනු ඇති අතර, 2025 අවසානය වන විට, දැනුම් දෙන සියලුම සිද්ධීන්ගෙන් 30% ක් පුද්ගලික අංශයෙන් යොමු කරනු ඇත.
4. සෑම තරාතිරමකම ක්ෂය රෝග පාලන ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම ශක්තිමත් කිරීම
5. ක්ෂය රෝගය පිළිබඳ මෙහෙයුම් පර්යේෂණ අධ්‍යයනයන්හි ගුණාත්මකභාවය සහ ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩි කිරීම
6. ක්ෂය රෝග ක්‍රියාකාරකම් සංවිධානය කිරීම සහ කළමනාකරණය සහ පාලනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීම

2022 වසර තුලදී ලබා ගත් ජයග්‍රහණ / විශේෂ සිදුවීම්

රෝගීන් මුල් අවදියේදීම හඳුනා ගැනීම සහ ප්‍රතිකාර කිරීම

- බන්දනාගාර රැඳවියන්, මත් ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වුවන්, වයස්ගත පුද්ගලයන් ආදී අධි අවදානම් කාණ්ඩ ඉලක්ක කරගනිමින්, දිස්ත්‍රික්ක මට්ටමින්, ක්ෂය රෝගය සඳහා පිරික්සුම් පරීක්ෂණ සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- තවද සෞඛ්‍ය ආයතන වලට යාමට නොහැකිව, රෝගාතුරව සහ වයස්ගතව
- නිවෙස්වලට වී සිටින පුද්ගලයන්ගෙන් සෙම සාම්පල එකතු කර ක්ෂය රෝගය සඳහා පරීක්ෂා කරවීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කිරීම.
- ලය රෝග සායනවල සේවයේ නිරත කාර්යමණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම.
- ක්ෂය රෝග මර්දන වෛද්‍ය නිලධාරින් සඳහාද , හෙද නිලධාරිනියන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරුන් සඳහාද වෙන් වශයෙන්, පස් දින පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ලෝක සෞඛ්‍ය සංවිධානයේ අනුග්‍රහයෙන් 2022 වසරේ නොවැම්බර් මාසයේදී ජාතික ක්ෂය රෝග විමර්ශන රසායනාගාරය පාදක කරගනිමින් රසායනාගාර පුහුණු වැඩසටහනක් පවත්වන ලද අතර එය අවසනදී නිරීක්ෂණ සහ නිර්දේශ ඇතුලත් වාර්තාවක් ද ලබා දෙන ලදී
- ක්ෂය රෝග පරීක්ෂා කටයුතු ක්‍රමවත්ව සහ අඛණ්ඩව කරගෙන යාමට අවශ්‍ය විද්‍යාගාර උපකරණ, පරිභෝජන ද්‍රව්‍ය Gene X pert කාට්‍රිජ් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව යමින් මිලදී ගැනීම.
- තත්වය සහතික කරන ලද ක්ෂය රෝග මර්දන ඖෂද නියමිත ප්‍රමාණ වලින් ප්‍රසම්පාදනය ක්‍රමවේද ඔස්සේ මිලදී ගැනීම මගින් 2022 වසර පූරා අඛණ්ඩ ඖෂද සැපයුමක් තහවුරු කිරීම.
- වතු කම්කරුවන් අතර රෝගී සමූහ (peer groups) ස්ථාපනය කිරීම මගින් වතු ජනතාව අතර ක්ෂය රෝග පිරික්සුම් පරීක්ෂණ සහ ප්‍රතිකාර සඳහා යොමු වීමේ නැඹුරුව වැඩි කරගැනීමට කටයුතු කිරීම.
- නිදන්ගත ක්ෂය රෝගය සඳහා ප්‍රතිකාර කිරීම දිවයින පුරා ස්ථාපිත කිරීමේ අරමුණින්, නිදන්ගත ක්ෂය රෝගය සඳහා ප්‍රතිකාර කිරීම සම්බන්දයෙන් සකස් කරන ලද මාර්ගෝපදේශයන් පිළිබඳව වෛද්‍යවරුන් දැනුවත් කිරීම සිදු කරන ලදී.

සෞඛ්‍ය අධ්‍යාපනය සහ ප්‍රවර්ධනය

- ක්ෂය රෝග ප්‍රතිකාර විධිමත් කිරීම සහ තහවුරු කිරීමේ අරමුණින් ක්ෂය රෝගය ඇති බව තහවුරු කල පුද්ගලයන්ගේ ජංගම දුරකථන අංක ලබාගෙන සායන දින දන්වා sms පණිවිඩ යැවීමේ වැඩසටහනක් ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම
- ක්ෂය රෝගය සම්බන්දව නව තාක්ෂණික දැනුම SMS පණිවිඩ හරහා වෛද්‍යවරුන් වෙත යැවීම මගින් වෛද්‍යවරුන් ක්ෂය රෝගය සම්බන්දව යාවත්කාලීන කිරීම

- ප්‍රජාව අතර ක්ෂය රෝගය පිළිබඳව දැනුම වර්ධනය කිරීමේ අරමුණින් සෞඛ්‍ය ප්‍රවර්ධන පත්‍රිකා, පෝස්ටර්, බැනර් යනාදිය පෞද්ගලික වෛද්‍ය සේවා ආයතන අතර බෙදා හැරීම
- ලෝක ක්ෂය රෝග දිනය නිමිති කොට ගෙන ජාතික මට්ටමේ වැඩසටහන් සංවිධානය කිරීම. මෙහිදී පාසල් වල සිසු සිසුවියන් ගේ සහභාගීත්වයෙන් "ක්ෂය රෝගය තුරන් කරමු" යන මාතෘකාව ඔස්සේ චිත්‍ර තරඟයක් ද පැවැත් වූ අතර ජයග්‍රාහකයන්ට ත්‍යාග සහ සහතික පත් ද ප්‍රධානය කරන ලදී.

ක්ෂය රෝග මර්දන කටයුතු අධීක්ෂණය සහ නියාමනය

- ප්‍රාදේශීය මට්ටමින් සිදුවන ක්ෂය රෝග මර්දන කටයුතු අධීක්ෂණය කිරීමේ සඳහා අධීක්ෂණ චාරිකා සංවිධානය කිරීම සහ දිස්ත්‍රික් ක්ෂය රෝග මර්දන වෛද්‍ය නිලධාරීන්ගේ සමාලෝචන රැස්වීම් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම.
- ක්ෂය රෝගය නිසා සිදුවිය හැකි මරණ අවම කර ගැනීමේ අරමුණින් ජාතික මට්ටමේ හා ප්‍රාදේශීය මට්ටමින් "ක්ෂය රෝග මරණ පිළිබඳ සමාලෝචන රැස්වීම් " සංවිධානය කරන ලදී. මෙහිදී ක්ෂය රෝගය නිසා සිදුවන මරණ සංඛ්‍යාව අවම කර ගැනීමට අනුගමනය කල යුතු පියවර පිළිබඳව පුළුල් ලෙස සාකච්චා කරන ලදී.
- ක්ෂය රෝග මර්දන සහ ලය රෝග පිළිබඳ ජාතික වැඩසටහන යටතේ දැනට සංවර්දන ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක නොවේ. රටේ පවතී ආර්ථික දුෂ්කරතා හේතුවෙන් 2023 වසර සඳහාද එවැනි ව්‍යාපෘති කිසිවක් සැලසුම් කර නැත.

පසුගිය අවුරුදු 5 ක කාර්ය සාධන ප්‍රවණතාවය

උපකාරක දත්ත (ප්‍රස්ථාර)

රූපය 1: ඇස්තමේන්තුගත ක්ෂය රෝග (නව සහ නැවත ඇතිවීම) සහ දැනුම් දුන් රෝගීන් සංඛ්‍යාව අතර පරතරය



රූපය 2: රෝගීන් හඳුනාගැනීමේ ප්‍රවණතාව 2005-2021



රූපය 3: 2020 දී දිස්ත්‍රික් තුල ක්ෂය රෝගීන්ගේ ව්‍යාප්තිය



රූපය 4: නව හා පෙර ප්‍රතිකාර කළ ක්ෂය රෝගීන්ගේ ප්‍රතිකාර අවසානයේ තත්වය



ප්‍රතිකාර සාර්ථකත්වය - ප්‍රවනතාවය



4.1.6 ජාතික පිළිකා මර්දන වැඩසටහන

ජාතික පිළිකා පාලන වැඩසටහන

සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින ජාතික පිළිකා මර්දන වැඩසටහන (NCCP) සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනෙකුත් ඒකක සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ සමඟ සහයෝගයෙන් ශ්‍රී ලංකාවේ පිළිකා වැළැක්වීම සහ පාලනයට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.

සෞඛ්‍ය ලේකම්ගේ මූලිකත්වයෙන් හෙබි 'පිළිකා වැළැක්වීම සහ පාලනය පිළිබඳ ජාතික උපදේශක කමිටුව' විසින් මෙරට පිළිකා වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීම සිදු කෙරේ. පිළිකා පාලන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම '2020-2024 ශ්‍රී ලංකාවේ පිළිකා වැළැක්වීම සහ පාලනය පිළිබඳ ජාතික උපායමාර්ගික සැලැස්ම' ට අනුව සිදු කෙරේ.

දැක්ම

" වළක්වාගත හැකි පිළිකා අවම වූ, පිළිකා නිසා අති වන ආබාධිත තත්වයන් හෝ පීඩාවන් අල්පවූ ගුණාත්මකවූ ඉහළ ජීවත් වීමේ හැකියාවක් සහිත මිනිසුන්ගෙන් අනූනවූ රටක් "

මෙහෙවර

පිළිකා හේතුකාරක මර්දනය හා එයට විරුද්ධව සටන්කිරීම හා පිළිකා කල් ඇතිව හඳුනාගැනීමේ ක්‍රමවේදයන් සුරක්ෂිත කිරීම මගින් පිළිකා ඇතිවීම අවම කිරීමත්, සාක්ෂි මත පදනම් වූ ප්‍රවේශයක් තුළින් රෝග නාශක ප්‍රතිකාරයේ සිට හා ජීවිතයේ අවසාන භාගය දක්වා සැමට එක සේ විවරවූත් පරිපූර්ණවූත් අඛන්ඩ සාත්තු සේවයක් ලබාදීම සහතික කිරීම.

අරමුණු

1. ප්‍රජා සහභාගීත්වය සහිත ශක්තිමත් ඒකාබද්ධ, සම්බන්ධීකරණයකින් යුක්ත , බහු-ආංශික, බහු-විනයකින් යුතු ජාතික වැඩසටහනක් මඟින් පිළිකා වැළැක්වීම සහ පාලනය සඳහා ජාතික ප්‍රතිචාරය වේගවත් කිරීමට ඉහළ මට්ටමේ දේශපාලන නායකත්වයක්, උපදේශනයක් සහ පාලනයක් ලබාගැනීම
2. ජීවිත කාලය පුරාවට බලපෑ හැකි අවදානම් සාධක සහ නිර්ණායක අධ්‍යයනය කිරීමෙන්, පිළිකා ඇතිවීම පූර්ව ප්‍රාථමිකව හා ප්‍රාථමිකව වැළැක්වීම
3. වැඩිදියුණු කළ සෞඛ්‍ය සාක්ෂරතාව ඔස්සේ පිළිකා කල් ඇතිව හඳුනා ගැනීම (screening) සහ පිළිකාවක මුල්ම අවධියේදී රෝග විනිශ්චය (early diagnosis) ලබාදීම සහතික කිරීම, පිළිකා ඉක්මණින් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය සේවාවන්වල සුලබතාවය ඇතිකිරීම සහ ඉක්මන් ප්‍රතිකාර සහ රැකවරණය සහතික කිරීම සඳහා සුදුසු සම්බන්ධතා ඇතිකිරීම
4. පිළිකා රෝග විනිශ්චය, ප්‍රතිකාර සහ සත්කාර පහසුකම් සඳහා තිරසාර හා සාධාරණ ප්‍රවේශයක් සහතික කිරීම
5. පිළිකා රෝගීන් හට සෞඛ්‍ය සේවාවන් සැපයෙන සියළු ආයතන මට්ටමින් සහ ප්‍රජා මට්ටමින් ඔවුන්ගේ දිවි ගලවා ගැනීම, පුනරුත්ථාපනය සහ සහන සත්කාර උදෙසා පහසුකම් ලබාගතහැකි බව, ඒ සඳහා ප්‍රවේශය සහතික කිරීම සහ ඔවුන්ගේ පවුල්වලට සහ රැකවරණ දෙන්නන්ට සහාය වීම
6. ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ පිළිකා පාලන ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල ඇගයීමට නිවැරදි හා කාලෝචිත දත්ත සැපයීම සඳහා පිළිකා තොරතුරු පද්ධති සහ නිරීක්ෂණ ශක්තිමත් කිරීම
7. පිළිකා වැළැක්වීමට සහ පාලනයට ඒ ආශ්‍රිත සොයාගැනීම් පර්යේෂණ සහ භාවිතය සඳහා යොදාගැනීම ප්‍රවර්ධනය කිරීම.

2022 වර්ෂය තුළ ප්‍රධාන ජයග්‍රහණ

ප්‍රාථමික වශයෙන් පිළිකා වැළැක්වීම

1. තහවුරු කරන ලද මානව පිළිකා කාරක හඳුනා ගෙන ඒ පිළිබද දැනුම ප්‍රජාව වෙත බෙදා හැරීම සඳහා සෞඛ්‍ය සේවකයින් බලගැන්වීමට සැලැස්මක් සකස් කරන ලදී.
2. 'ලෝක පිළිකා දිනය' පෙබරවාරි 4 වැනිදා ද, 'ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා සැමරුම් දිනය' ජූලි 27 වැනිදා ද සැමරීම උදෙසා කටයුතු කරන ලෙස සියලුම සෞඛ්‍ය සේවා ආයතනවලට උපදෙස් දෙන ලදී.
3. දිවයින පුරා දිස්ත්‍රික් කේන්ද්‍රස්ථානවලදී පිළිකා වැළැක්වීම සහ පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණුකරවීමේ වැඩසටහන් (TOT) පවත්වන ලදී.

පිළිකා කල්තියා හඳුනා ගැනීම

1. බහුලව පවතින පිළිකා තත්ව (පියයුරු, මුඛ, ගැබ්ගෙල, මහා බඩවැලේ සහ ගල නාලයේ පිළිකා) සඳහා බලපාන චර්යාත්මක අවදානම් සාධක හඳුනා ගැනීම පිළිබඳව පොත් පිංචක් සකස් කර බෙදා හරින ලදී.
2. පිළිකා කල්තියා හඳුනා ගැනීම හා ප්‍රතිකාර පමා වීම අවම කරවීමේ අරමුණින් පිළිකා කල්තියා හඳුනාගැනීමේ මධ්‍යස්ථාන (CEDC) හතරක් පළාත් හතරක ස්ථාපනය කරන ලදී.
3. පියයුරු පිළිකා කල්තියා හඳුනා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා අන්තර්ක්‍රියාකාරී වෙබ් අඩවියක් නිර්මාණය කරන ලදී.

පියයුරු පිළිකා පිළිබඳ දැනුවත් කිරීමේ මාසය වන ඔක්තෝබර් මාසය තුළදී පහත සඳහන් ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

1. විවිධ අංශවල කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
2. විවිධ මාධ්‍ය ජාලා ඔස්සේ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම.
3. පුවත්පත් ලිපි පළකිරීම.
4. පියයුරු පිළිකා කල්තියා හඳුනා ගැනීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය බලමුලු ගැන්වීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සනින් යුත් චක්‍රලේඛය බෙදා හැරීම

වතු ජනාවාසවල ස්වයං-මුඛ පරීක්ෂණ සහ පරීක්ෂණ වැඩසටහන් සඳහා පහසුකම් සපයන්නන් ලෙස සෞඛ්‍ය නොවන ස්වේච්ඡා සේවකයන් හඳුනා ගන්නා ලදී.

OPMD සඳහා පසු විපරම් කිරීම විධිමත් කිරීම සඳහා OPMD සායනික වාර්තාව හඳුන්වා දෙන ලදී.

රෝග විනිශ්චය සහ ප්‍රතිකාර

- විකිරණ ආරක්ෂණ මාර්ගෝපදේශය පිළිබඳව විකිරණ ශිල්පීන් සහ භෞතික විද්‍යාඥයින් පුහුණු කිරීම සහ "විකිරණ ආරක්ෂණ නිලධාරීන් සඳහා යොමුකිරීමේ කොන්දේසි (TOR)" පිළිබඳ විකිරණ ආරක්ෂණ නිලධාරීන් පුහුණු කිරීම සිදු කරන ලදී.
- පියයුරු සායන සඳහා මෙහෙයුම් මාර්ගෝපදේශ සකස් කරන ලදී
- මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා විස්තීර්ණ පියයුරු පිළිකා සත්කාර පුහුණුව උතුරු මැද පළාතේ (අනුරාධපුර සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක), මධ්‍යම පළාතේ සහ උතුරු පළාතේ පවත්වන ලදී.
- මඩකලපුව ශික්ෂණ රෝහලේ Manual Method of Immunostaining Procedure ස්ථාපිත කිරීම
- දිවා ප්‍රතිකාර මධ්‍යස්ථාන (ශික්ෂණ රෝහල අනුරාධපුර, උතුරු කොළඹ ශික්ෂණ රෝහල රාගම, ශික්ෂණ රෝහල කුරුණෑගල, දිස්ත්‍රික් මහ රෝහල අවිස්සාවේල්ල) සඳහා multipara monitors, සිරින්ජ පොම්ප, ඉන්ෆියුෂන් පොම්ප ආදිය මිලදී ගැනීම.

පිළිකා රෝගීන් සඳහා දිවි ගලවා ගැනීමේ සහ සහන සත්කාර සේවා

- විවිධ පැතිකඩ ඔස්සේ මාර්ගෝපදේශ සහ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) සකස් කරන ලදී (සහන සත්කාර සේවා සැපයීම , ගිලන ගිමන්හල් සත්කාර ආයතන කළමනාකරණය සහ ප්‍රාථමික සත්කාර සඳහා වූ ආයතන මට්ටමින් සැලසෙන සහන සත්කාර සේවා)
- බාහිරව සැපයෙන ඔක්සිජන් මත යැපෙන රෝගීන් (hypoxic patients) සඳහා ගෘහස්ථව ඔක්සිජන් සැපයීම සඳහා ප්‍රමිතිගත යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට මාර්ගෝපදේශ සකස් කරන ලදී
- විවිධ මට්ටමේදී සිදුකල හැකි සහන සත්කාර සඳහා හවුල් සත්කාර ආකෘතියක් සංවර්ධනය කර නියමු කටයුතු මධ්‍යම පළාතේ මහනුවර දිස්ත්‍රික්කය තුළ ආරම්භ කරන ලදී
- සෞඛ්‍ය සේවකයින් සහ සහන සත්කාර පිළිබඳ අවිධිමත් සත්කාරකයින් සඳහා පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් සහ ධාරිතාවය ගොඩනැගීමේ වැඩමුළු පවත්වන ලදී.

පිළිකා ලියාපදිංචි කිරීම සහ පර්යේෂණ

- 2020 වර්ෂය දක්වා ජාතික පිළිකා සිද්ධි දත්ත (incidence data) ප්‍රකාශයට පත් කර ඇත
- දිස්ත්‍රික් මහ රෝහල නුවරඑළිය, දිස්ත්‍රික් මහ රෝහල කෑගල්ල, දිස්ත්‍රික් මහ රෝහල අවිස්සාවේල්ල, දිස්ත්‍රික් මහ රෝහල හම්බන්තොට, සහ දිස්ත්‍රික් මහ රෝහල මොනරාගල සඳහා රෝහල් පාදක කරගත් පිළිකා ලේඛන සකස් කරන ලදී.
- ව්‍යාධි විද්‍යාව / රක්ත විද්‍යාව හා මුඛ ව්‍යාධි විද්‍යාවට අදාල විද්‍යාගාරවල භාවිතය සඳහා 'WHO වර්ගීකරණයේ පිළිකා' (WHO Blue Book Series) බෙදා හැරීම
- පිළිකා වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා මහජන සෞඛ්‍ය වැදගත්කමක් ඇති පර්යේෂණ ප්‍රමුඛතාවයන් අදාල පාර්ශ්වකරුවන්ගේ උපදේශන හරහා හඳුනාගෙන එම අවසන් ලැයිස්තුව ජාතික පිළිකා මර්දන වඩසටහනෙහි වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

පසුගිය වසර පහේ කාර්ය සාධන ප්‍රවණතා*

ප්‍රාග්ධන වියදම්

මූල්‍ය ප්‍රභවය	2018	2019	2020	2021	2022
GOSL	11,217,404.65	25,179,466.15	11,392,294.34	6,314,247.16	7,771,334.01
WHO	27,036.87	1,845,539.11	664,915.63	8,019,625.22	5,920,393.24
World Bank	14,538,182.09	128,195.00	28,203,025.30	43,458,521.82	6,922,500.00
එකතුව	**25,782,623.61**	**27,153,200.26**	**40,260,235.37**	**57,792,394.20**	**20,614,227.25**

2023 සඳහා සැලසුම් කර ඇති විශේෂ ක්‍රියාකාරකම්

ප්‍රාථමිකව පිළිකා වැළැක්වීම

- ලෝක පිළිකා දිනය සහ ලෝක හිස සහ ගෙල ආශ්‍රිත පිළිකා දිනය වෙනුවෙන් මාධ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම, රාජ්‍ය ආයතන වෙත චක්‍රලේඛ නිකුත් කිරීම

- පිළිකා වැළැක්වීම සහ පාලනය පිළිබඳ තොරතුරු, අධ්‍යාපනය සහ සන්නිවේදනය සඳහා අවශ්‍ය මාධ්‍යයන් සැකසීම සහ මුද්‍රණය කිරීම
- ශ්‍රී ලංකාවට අදාළව තහවුරු කරන ලද පිළිකා කාරක පිළිබඳ ඇට්ලස් සැකසීම සහ ප්‍රකාශයට පත් කිරීම

පිළිකා කල් ඇතිව හඳුනා ගැනීම

- පියයුරු පිළිකා දැනුවත් කිරීමේ මාසය වෙනුවෙන් පියයුරු පිළිකා කල් ඇතිව හඳුනා ගැනීම ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සම්මන්ත්‍රණ පැවැත්වීම සහ රාජ්‍ය ආයතන වෙත ඊට අදාල චක්‍රලේඛ නිකුත් කිරීම
- පූරව මුඛ පිළිකා (OPMD) සහ මුඛ පිළිකා කල්තියා හඳුනා ගැනීම සඳහා වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවත්වීම
- පිළිකා කල්තියා හඳුනාගැනීමේ මධ්‍යස්ථාන දෙකක් (CEDC) පිහිටුවීම
- පිළිකා කල්තියා හඳුනා ගැනීමට අදාළ තොරතුරු, අධ්‍යාපනය සහ සන්නිවේදනය සඳහා අවශ්‍ය මාධ්‍යයන් IEC සැකසීම

පිළිකා රෝග විනිශ්චය සහ ප්‍රතිකාර

- නව පියයුරු සායන පිහිටුවීම සහ අදාල කායී මණ්ඩල පුහුණුව (ශික්ෂණ රෝහල කුලියාපිටිය, දිස්ත්‍රික් මහ රෝහල මීගමුව, දිස්ත්‍රික් මහ රෝහල හලාවත, දිස්ත්‍රික් මහ රෝහල කළුතර, මූලික රෝහ පානදුර, මූලික රෝහල හොරණ)
- මඩකලපුව ශික්ෂණ රෝහලෙහි Immuno Histochemistry රසායනාගාරයක් ස්ථාපිත කිරීම

දිවි ගලවා ගැනීමේ සහ සහන සත්කාර සේවා

- සෞඛ්‍ය සේවා වෘත්තිකයන් සඳහා දිවි ගලවා ගැනීමේ රැකවරණ සත්කාර පිළිබඳ අත්පොතක් සකස් කිරීම සහ ඒ පිළිබඳ වැඩමුළුවක් පැවැත්වීම
- නිවෙස් පදනම් කරගත් සහන සත්කාර සේවාවන් පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් (අවිධිමත් සත්කාරක සේවා සපයන්නන් පිළිබඳ පුහුණුව)
- ලෝක සහන සත්කාර දිනය සැමරීම
- සහන සත්කාරයේ හොඳම භාවිතයන් පිළිබඳ අත්දැකීම් බෙදාගැනීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම

පිළිකා ලියාපදිංචි කිරීම සහ පර්යේෂණ

- පිළිකා ලියාපදිංචි කිරීමේ ජාතික ලේඛනය මුද්‍රණය කිරීම - 2020 සහ 2021
- මහජන සෞඛ්‍යයට අදාල වූ හා ඒ පිළිබඳ වැදගත්කමක් ඇති පිළිකා පර්යේෂණ පිළිබඳ පර්යේෂණ ප්‍රමුඛතා උත්පාදනය කිරීම

පිළිකා පාලන ක්‍රියාකාරකම්වල නායකත්වය සහ සම්බන්ධීකරණය

- පිළිකා වැළැක්වීම සහ පාලනය පිළිබඳ ජාතික උපදේශක කමිටු රැස්වීම් පිළිබඳ කාර්තුමය (ත්‍රෛමාසික) රැස්වීම් සම්බන්ධීකරණය කිරීම
- පළාත් සහ දිස්ත්‍රික් මට්ටමින් පිළිකා පාලන ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා පළාත් පිළිකා පාලන සමාලෝචන රැස්වීම් පැවැත්වීම

Annual Review of Breast Clinic Programme – 2022



Hands on capacity building programmes for dental and medical practitioners on early detection of Oral Potentially Malignant Disorders (OPMD) and Oral Cancer

4.1.7 ජාතික ලිංගාශ්‍රිත රෝග/ඒඩ්ස් පාලන වැඩසටහන (NSACP)

හැඳින්වීම

2022 වසර අවසන් වන විට, ජාතික **ලිංගාශ්‍රිත** රෝග/ඒඩ්ස් මර්දන වැඩසටහන (NSACP) දිවයින පුරා පූර්ණ කාලීන **ලිංගාශ්‍රිත** රෝග සායන 41 ක ක්‍රියාත්මක වන අතර, ශාඛා **ලිංගාශ්‍රිත** රෝග සායන 28 කින් සමන්විත වේ.

දැක්ම

නව **HIV** ආසාදන**,** වෙනස් කොට සැලකීම් සහ ඒඩ්ස් ආශ්‍රිත මරණ වලින් නිදහස් රටක්

මෙහෙවර

නව **HIV** සහ ලිංගිකව සම්ප්‍රේරේෂණය වන ආසාදන වැලැක්වීම සහ පුළුල් සත්කාර සහ ප්‍රතිකාර සේවා සැපයීම**.**

ඉලක්කය

2025 වන විට AIDS අවසන් කිරීම

ප්‍රධාන කාර්යයන්

- HIV වසංගතයට ජාතික ප්‍රතිචාරය සම්බන්ධීකරණය කිරීම.
- HIV වැළැක්වීමේ මැදිහත්වීම් සිදු කිරීම.
- ලිංගාශ්‍රිත රෝග සහ එච්.අයි.වී වැළැක්වීම සඳහා සක්‍රීය පරිසරයක් නිර්මාණය කිරීමට උපකාර කිරීම.
- ලිංගිකව සම්ප්‍රේරේෂණය වන ආසාදන, ලිංගික දුර්වලතා සහ ලිංගික සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා සායනික සේවා සැපයීම.
- HIV ආසාදිත සහ පීඩාවට පත් වූ පුද්ගලයින් සඳහා ප්‍රතිකාර සහ රැකවරණය සැපයීම.

- ලිංගාශ්‍රිත රෝග සහ HIV රෝග විනිශ්චය සහ කළමනාකරණය සඳහා රසායනාගාර සේවා සැපයීම.
- ලිංගාශ්‍රිත රෝග සහ HIV වැළැක්වීම සඳහා කොන්ඩම් ප්‍රවර්ධනය.
- ලිංගාශ්‍රිත රෝග සහ HIV සඳහා උපදේශන සේවා සැපයීම.
- මවගෙන් දරුවාට HIV සහ syphilis සම්ප්‍රේරේෂණය වීම වැළැක්වීම.
- සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සහ ධාරිතාව ගොඩනැගීම.
- එච්අයිවී සහ ලිංගාශ්‍රිත රෝග නිරීක්ෂණ සිදු කිරීම.
- ලිංගාශ්‍රිත රෝග සහ එච්.අයි.වී පිළිබඳ පර්යේෂණ සිදු කිරීම.
- ලිංගාශ්‍රිත රෝග සහ එච්.අයි.වී සේවාවන් අධීක්ෂණය සහ ඇගයීම සිදු කිරීම.

2022 දී ප්‍රධාන ජයග්‍රහණ/විශේෂ සිදුවීම්

2022 වසර තුළ සමස්ත කාර්ය සාධනය

1. ඒඩ්ස් වසංගත ආකෘතිය නව දත්ත සමඟ යාවත්කාලීන කරන ලද අතර රට සඳහා නව ඇස්තමේන්තු ආකෘතිය හරහා සම්ප්‍රේරේෂණය කරන ලදී.
2. සියලු පෙර සේවා සහ සේවා කාලය තුළ පුහුණුවීම් පවත්වනු ලැබුවේ දෙමුහුන් රැස්වීම් ක්‍රමවල එකතුවකිනි.
3. ඉලෙක්ට්‍රොනික තොරතුරු කළමනාකරණ පද්ධතිය (EIMS), ඉලෙක්ට්‍රොනික රෝගී වාර්තා පද්ධතිය දැනට දිවයිනේ සායන 28ක් අතර ක්‍රියාත්මක වේ.
4. ප්‍රතිසංස්කරණය කරන ලද know4sure.lk වෙබ් අඩවිය වැඩි දියුණු කර ඇති අතර ළඟා නොවූ ප්‍රධාන ජනගහනය වෙත ළඟා වීමට භාවිතා කරයි. තෝරාගත් ලිංගාශ්‍රිත රෝග සායන KP ඒකකවල අන්තර් ප්‍රචාරක මැදිහත්වීම නිරීක්ෂණය කිරීම සඳහා ඔන්ලයින් අවුට්රීච් සේවකයින් ස්ථානගත කර ඇත.
5. නිවාරණ තොරතුරු කළමනාකරණ පද්ධතිය (PIMS) ස්ථාපිත කර ඇති අතර, 'සම වයසේ මිතුරන් විසින් මෙහෙයවන ප්‍රධාන ජනගහන HIV වැළැක්වීමේ වැඩසටහන' කළමනාකරණය කරයි. PIMS දැනට ලිංගාශ්‍රිත රෝග සායන KP ඒකක අටක (8) ක්‍රියාත්මක වන අතර කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක සමඟ FPA මැදිහත්වීම යටතේ අධි-තීව්‍රතා ආකෘතිය යටතේ ක්‍රියාත්මක වේ.
6. අතත්‍ය මැදිහත්වීම් හඳුන්වා දී ඇති අතර ප්‍රධාන ජනගහන මැදිහත්වීම් තුළට ඇතුළත් කරන ලදී.
7. කොළඹ, ගම්පහ, රාගම, අනුරාධපුර, යාපනය සහ හම්බන්තොට දිස්ත්‍රික්ක ලිංගාශ්‍රිත රෝග සායනවල නියමු කොට ක්‍රියාත්මක කරන ලද HIV සඳහා පූර්ව නිරාවරණ රෝග නිවාරණය (PrEP). කොළඹ සහ ගම්පහ පිහිටි රාජ්‍ය නොවන සංවිධාන පදනම් කරගත් ප්‍රජා සායනවල ප්‍රජා පෙරටුගාමී සේවාවන් පිරිනමනු ලැබේ.
8. HIV ස්වයං-පරීක්ෂාව රට තුළ විශාල කර ඇති අතර ඔන්ලයින්, සහ ස්වයං-පරීක්ෂණ කට්ටල ලබා දීම සඳහා ක්ෂණික ඇමතුම් පාදක පද්ධතියක් තවදුරටත් වැඩිදියුණු කර ඇත.
9. HIV ස්වයං පරීක්ෂණ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) සංවර්ධනය කරන ලදී.
10. HIV පිළිබඳ දැනුම සහ ආකල්ප, ප්‍රධාන ජනගහනය, HIV සේවා සැපයීමට බලපාන නීති සහ ශ්‍රී ලංකාවේ පොලිස් නිලධාරීන් අතර එවැනි නීති පිළිපැදීම" HIV සම්බන්ධ පොලිස් නිලධාරීන්ගේ වර්තමාන මට්ටමේ දැනුම, ආකල්ප සහ භාවිතයන් හඳුනාගැනීම සඳහා පවත්වන ලදී.
11. මත්ද්‍රව්‍ය ප්‍රතිරෝධී සේවා ආයතනය රට තුළ ස්ථාපිත කිරීම සඳහා පූර්ව ඖෂධ ප්‍රතිරෝධ නිරීක්ෂණ සිදු කරන ලදී. රටපුරා පීඑල්එච්අයිවී රෝගීන් අතර මාස තුනක් ඇතුළත අලුතින් හඳුනාගත් පැහැර හැරීම් පිළිබඳ සමීක්ෂණය අවසන් කර ඇත.
12. වාර්ෂික වාර්තාව 2021 සංවර්ධනය කරන ලද අතර, සබැඳි අනුවාදය සියලුම පාර්ශවකරුවන් වෙත බෙදා හරින ලද අතර අන්තර්ජාලය හරහා ප්‍රකාශයට පත් කරන ලදී. (http://www.aidscontrol.gov.lk/images/publications/annual_reports/2021/Anual_report_2021_online_version_final.pdf)

13. රෝහල් 18 ක HIV පරීක්ෂණය සමාලෝචනය කරන ලද අතර HIV පරීක්ෂාව ඉහළ නැංවීම සඳහා පුහුණු කරන ලද කාර්ය මණ්ඩලය 875 කි.
14. දිස්ත්‍රික්ක 14 ක එච්.අයි.වී පරීක්ෂණ සඳහා පුහුණු කරන ලද ශාරීරික යෝග්‍යතා සේවකයන් ප්‍රජා මූලික පරීක්ෂාව වැඩි කර ඇත.
15. HIV/ලිංගාශ්‍රිත රෝග පිළිබඳ සමාජ චර්යා වෙනස්වීම් සන්නිවේදනය සහ උපදේශනය සඳහා සකස් කරන ලද මාර්ගෝපදේශ.
16. HIV/ලිංගාශ්‍රිත රෝග සත්කාර සඳහා සෞඛ්‍ය සේවකයින් සඳහා සංශෝධිත පුහුණු මොඩියුල.
17. 2024 දී මවගෙන් දරුවා තුරන් කිරීමේ වැඩසටහනේ මීළඟ නැවත වලංගු කිරීම සඳහා සූදානම් වීම සඳහා දිවයින පුරා දිස්ත්‍රික් සමාලෝචන සහ නැවුම් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
18. මවගෙන් දරුවාට HIV සහ සිපිලිස් ආසාදනය සම්ප්‍රේෂණය වීම තුරන් කිරීම පිළිබඳ නැවත ඇගයීමක් ශ්‍රී ලංකාව සඳහා WHO ගෝලීය වලංගු කිරීමේ කමිටුව විසින් සිදු කරන ලදී.
19. ජාතික ප්‍රධාන ජනගහන ක්‍රියාකාරී සැලැස්ම ශ්‍රී ලංකාව, 2022 සංවර්ධනය කරන ලදී.
20. ශ්‍රී ලංකාව තුළ HIV මත්ද්‍රව්‍ය ප්‍රතිරෝධී පරීක්ෂාව ස්ථාපිත කරන ලදී.
21. ප්‍රධාන ජනගහනය සඳහා වූ විස්තීරණ සත්කාර සේවා පැකේජය තවදුරටත් පුළුල් කරන ලදී. බොහෝ දිස්ත්‍රික්කවල ප්‍රජා මූලික පරීක්ෂණ හඳුන්වා දී විශාල කර ඇත. මාසික සමාලෝචන නිතිපතා පවත්වන ලදී. කාර්ය මණ්ඩල වැටුප් සහ දිරි දීමනා දේශීය අරමුදල් යොදා ගනිමින් අඛණ්ඩව ගෙවන ලදී.
22. කොම්පඤ්ඤවීදියේ ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථානයේ විස්තීර්ණ හානි අවම කිරීමේ සේවා පැකේජය තවදුරටත් පුළුල් කරන ලදී. ඉඳිකටු සහ සිරින්ජ හුවමාරු සේවා දියත් කරන ලදී, හෙපටයිටිස් C ප්‍රතිකාර වැඩසටහන ආරම්භ කරන ලදී.
23. 2022-2024 සඳහා ගෝලීය අරමුදල් ප්‍රදානය ලබා ගැනීම සහ 2022 ක්‍රියාකාරකම් සැලැස්ම යටතේ සියලු මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම සඳහා රටේ යෝජනාව ඉදිරිපත් කිරීමේදී වැඩසටහන සාර්ථක විය. මීට අමතරව, රටේ ආර්ථික තත්ත්වය සහ Covid 19 සහන අරමුදලේ කුඩා කොටසක් හේතුවෙන් හදිසි තත්ත්වය කළමනාකරණය කිරීම සඳහා NSACP යෝජනා ඉදිරිපත් කර හදිසි ආධාර ලබා ගැනීමට සාර්ථක විය. අර්බුදය තුළ ART සහ අනෙකුත් සෞඛ්‍ය භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීමේදී හදිසි සහාය ප්‍රයෝජනවත් විය.
24. ප්‍රදාන ව්‍යුහය වෙනස් කරන ලදී, NSACP ප්‍රධාන ලබන්නා (PR) වන අතර පවුල් සැලසුම් සංගමය (FPA) උප ලබන්නා (SR) බවට පත් විය. නව මැදිහත්වීම් හඳුන්වා දී විශාල කර ඇත.
25. මෙම වැඩසටහන 2022 සඳහා ප්‍රගති යාවත්කාලීන කිරීම සහ මුදල් ගෙවීමේ ඉල්ලීම සාර්ථකව ඉදිරිපත් කරන ලදී. ප්‍රධාන ජනගහන විශේෂිත දර්ශක බොහොමයක කැපී පෙනෙන දියුණුවක් ලබා ගැනීමට වැඩසටහනට හැකි විය. වැළැක්වීමේ වැඩසටහන්, සහ HIV පරීක්ෂණ දර්ශක සමඟ මිනිසුන් ළඟා වේ.
    a. ප්‍රජා PrEP සේවාවන් හරහා 200කට ආසන්න පිරිසක් PrEP සඳහා ආරම්භ කරන ලද අතර, හෙපටයිටිස් C ඇති බවට හඳුනාගෙන ඖෂධ එන්නත් කරන පුද්ගලයින් 95 දෙනෙකුගෙන් 70 දෙනෙකු හෙපටයිටිස් C සඳහා ප්‍රතිකාර ආරම්භ කරන ලදී.
    b. පොලිස් මූලස්ථානයේ අපරාධ කොට්ඨාශයේ සහාය ඇතිව ඉඳිකටු සිරින්ජ හුවමාරු සේවා දියත් කිරීමට පෙර උසස් පොලිස් නිලධාරීන් 200 කට ආසන්න පිරිසක් වෙනුවෙන් පෙනී සිටියහ.
26. පළමු වරට HIV රෝග නිර්ණය කිරීම් විශාල සංඛ්‍යාවක් 2022 දී සිදු විය. KP ප්‍රමුඛ මැදිහත්වීම් හරහා රෝගීන් 70 කට වැඩි සංඛ්‍යාවක් හඳුනාගෙන ඇත්තේ කොළඹ සහ ගම්පහ ප්‍රදේශ වලිනි.
27. රාජ්‍ය නොවන සංවිධානය විසින් මෙහෙයවන ප්‍රධාන ජනගහන මැදිහත්වීම් සඳහා අඛණ්ඩ දේශීය සොයාගැනීම් ඉල්ලීම සඳහා 2022 අග භාගයේදී කැබිනට් පත්‍රිකාවක් කෙටුම්පත් කරන ලදී.

පසුගිය වසර 5 කාර්ය සාධන ප්‍රවණතාවය

ප්‍රධාන කාර්ය සාධන දර්ශකය

දර්ශකය	2017	2018	2019	2020	2021	2022
HIV ආසාදිතයන් සංඛ්‍යාව - අලුතින් හඳුනාගෙන ඇති	285	350	439	363	411	518
ART ප්‍රතිකාරය මත HIV සමඟ ජීවත්වන පුද්ගලයින් සංඛ්‍යාව	1299	1574	1846	2166	2402	2802
මවගෙන් දරුවාට සම්ප්‍රේෂණය වීම හේතුවෙන් HIV ආසාදිත ළමුන් සංඛ්‍යාව - වසංගතය ආරම්භ වූ දා සිට සමුච්චිත	84	86	86	88	90	90
EMTCT සේවා ලැබූ HIV ආසාදිත කාන්තාවන්ගේ ප්‍රතිශතය	100%	100%	100%	100%	100%	100%
HIV ආසාදිත කාන්තාවන්ට උපන් HIV ආසාදිත බිළිඳුන්ගේ ප්‍රතිශතය	0	0	0	0	0	0
EMTCT සේවා ලබා ගත් HIV ආසාදිත කාන්තාවන්ට උපත ලද HIV ආසාදිත ළදරුවන් සංඛ්‍යාව	0	0	0	0	0	0
EMTCT සේවාවන් ලබා නොගත් HIV ආසාදිත කාන්තාවන්ට උපන් HIV ආසාදිත ළදරුවන් සංඛ්‍යාව	0	0	0	0	0	0
දැනට ප්‍රතිවෛරස් ප්‍රතිකාර ලබා ගනිමින් HIV සමඟ ජීවත් වන පුද්ගලයින්ගේ ප්‍රතිශතය (NSACP දත්ත)	36.98 %	44.53%	51%	51.72 %	66.59 %	67.98 %
ආසාදිත නොවන ජනගහනය 1,000කට නව HIV ආසාදන සංඛ්‍යාව (NSACP දත්ත)	0.01	0.01	0.01	0.01	0.01	0.01

2022 වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලට එරෙහිව මූල්‍ය ජයග්‍රහණ

මූල්‍ය ප්‍රභවය	විස්තරය	අරමුදල් වෙන් කිරීම (LKR)	අරමුදල් භාවිතය(LKR)
1. ප්‍රාග්ධන වියදම			
සෞඛ්‍ය අමාත්‍යාංශය	ගොඩනැගිලි ඉදිකිරීම	20,000,000.00	1,798,947.51
	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (PH)1	10,000,000.00	6,651,584.00
	සේවා ගිවිසුම	1,163,573.64	1,163,573.64
	උප එකතුව	**31,163,573.64**	**9,614,105.15**
UNFPA	උපදේශන වැඩමුළු, උපදේශන වැඩසටහන්, ප්‍රකාශනය මුද්‍රණය කිරීම	750,000.00	750,000.00
WHO	උපදේශන වැඩමුළු, සහ සමාලෝචන රැස්වීම්. පුහුණු මොඩියුලය	304,204,638.03	303,499,000.89
GFATM	මානව සම්පත්(HR)	95,152,040.24	54,313,918.58
	ගමන් සම්බන්ධ වියදම් (TRC)	26,778,854.20	13,042,553.32
	බාහිර වෘත්තීය සේවා (EPS)	104,726,990.37	8,164,177.28
	සෞඛ්‍ය නිෂ්පාදන - ඖෂධ නොවන(HPNP)	154,675,778.58	74,747,363.55
	සෞඛ්‍ය නිෂ්පාදන - උපකරණ(HPE)	12,887,856.49	2,780,143.00
	ප්‍රසම්පාදන සහ සැපයුම් දාම කළමනාකරණ පිරිවැය (PSM)	54,553,874.40	26,168,049.29
	යටිතල පහසුකම් (INF)	39,628,291.90	450,086.00

	සෞඛ්‍ය නොවන උපකරණ (NHE)	158,135,095.87	15,173,740.65
	සන්නිවේදන ද්‍රව්‍ය සහ ප්‍රකාශන(CMP)	5,240,741.34	2,647,342.64
	ප්‍රතිවෛරස් ඖෂධ	177,773,040.00	48,596,849.55
	කාර්යාලය ආශ්‍රිත වියදම්	2,534,543.17	103,923.93
	වක්‍ර හා පොදු කාර්ය පිරිවැය	603,604,258.61	15,215,214.55
	උප එකතුව	**1,435,691,365.19**	**261,403,362.34**
මුළු ප්‍රාග්දන වියදම්		**1,470,365,222.91**	**1,771,809,576.86**
2. පුනරාවර්තන වියදම්			
සෞඛ්‍ය අමාත්‍යාංශය	පුද්ගලික වැටුප්	169,807,200.25	170,870,927.73
	ගමන් වියදම්	372,800.00	284,110.00
	සැපයුම්	5,942,500.00	4,441,004.41
	නඩත්තු වියදම්	3,500,000.00	1,624,969.77
	සේවා	10,530,000.00	15,006,716.02
	මාරුවීම්	1,361,000.00	309,128.93
	ප්‍රතික්‍රියාකාරක	24,177,575.87	23,955,991.72
	පුහුණු දීමනා	14,500,000.00	12,630,430.40
	ප්‍රති වෛරස් ඖෂධ	47,717,138.22	47,717,138.22
මුළු පුනරාවර්තන වියදම්		**277,908,214.34**	**277,908,214.34**
මුලු එකතුව (LKR)		**1,748,273,437.25**	**2,049,717,791.20**

2023 සඳහා සැලසුම් කර ඇති විශේෂ සංවර්ධන කටයුතු

1. ප්‍රධාන ජනගහනයට විශේෂයෙන්ම පිරිමින්, කාන්තා ලිංගික ශ්‍රමිකයින් සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවන් සමඟ ලිංගිකව එක්වන පිරිමින්ට අතථ්‍ය HIV සේවාවන් පුළුල් කිරීම.
2. ප්‍රධාන ජනගහනයට විශේෂයෙන් පිරිමින්, කාන්තා ලිංගික ශ්‍රමිකයින් සහ සංක්‍රාන්ති ලිංගික ප්‍රජාවන් සමග ලිංගිකව එක්වන පිරිමි සාමාජිකයින්ට පූර්ව නිරාවරණ රෝග නිවාරණ (PrEP) සේවාවන් පරිමාණය කිරීම.

4.1.8 ඩෙංගු මර්දන ක්‍රියාකාරකම්

හැඳින්වීම

වසර 2023 ජුනි 15 වන විට ඩෙංගු රෝගීන් 44,100ක් දිවයිනෙන් වාර්තා වී ඇත. මෙයින් 50%ක් වාර්තා වී ඇත්තේ බස්නාහිර පළාතෙනි. මහනුවර, කුරුණෑගල, ගාල්ල, රත්නපුර, කෑගල්ල, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යනාදී අනෙකුත් අවදානම් එක් එක් දිස්ත්‍රික්ක වලින් වාර්තා වන්නේ 8%ට වඩා අඩු ප්‍රතිශතයකි.

දැක්ම

ශ්‍රී ලංකාව තුළ ඩෙංගු රෝගය හේතුවෙන් ඇතිවන සෞඛ්‍ය, ආර්ථික සහ සමාජීය බලපෑම් අවම තත්වයෙන් පවත්වා ගැනීම

මෙහෙවර

පාර්ශවකරුවන් ගේ සම්බන්ධීකරණයෙන් සහ තිරසාර ප්‍රයත්නයන් තුළින් ඩෙංගු ආවේණිකත්වය වඩා හොඳින් පාලනය කිරීම සහ වසංගත තත්වයන් වැළැක්වීම සඳහා, සෑම මට්ටමක ම සැලසුම් කිරීම, පුරෝකථනය කිරීම සහ කලින් හඳුනාගැනීම පිළිබඳ ශක්‍යතාව ප්‍රශස්ත මට්ටමක පවත්වා ගැනීම

අරමුණු

- වසර 2023 වන විට ඩෙංගු රෝගීන්, ජනගහනයෙන් ලක්ෂයකට 100 දක්වා අඩු මට්ටමට සාක්ෂාත් කර ගැනීම
- වසර 2023 වන විට රෝගී මරණ අනුපාතය 0.1% ට වඩා අඩු කිරීම සහ පවත්වා ගැනීම

2022 දී ජයග්‍රහණ/විශේෂ සිදුවීම්

ඕස්ට්‍රේලියාවේ මොනෑෂ් විශ්ව විද්‍යාලයේ ලෝක මදුරු වැඩසටහන සමඟ එක්ව දියත් කරන ලද වොල්බැකියා (Wolbachia) පර්යේෂණ ව්‍යාපෘතියේ නියමු අධ්‍යනය අවසන් කරන ලද අතර ඇගයීම් අවධිය ආරම්භ කොට ඇත. ඉදිරි වර්ෂ වලදී මාස 06කට වරක් මදුරුවන් පිළිබඳ දත්ත එකතු කොට ඒවා තුල Wolbachia බැක්ටීරියාව අඩංගු වීම පිළිබඳ දත්ත රැස් කෙරේ.

ii.පොලිසිය, ත්‍රිවිධ හමුදාව සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයෙන් අධි අවදානම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී ප්‍රදේශ ආවරණය වන පරිදි විශේෂ මදුරු මර්දන වැඩසටහන් හතරක් ක්‍රියාත්මක කරන ලදී.

iii. රෝගීන් ප්‍රතිකාර කිරීමේ ක්‍රමවේදය ශක්තිමත් කිරීම සඳහා රෝගීන් හට බහුල වශයෙන් ප්‍රතිකාර කරන රෝහල් තුලවෛද්‍යවරුන් (198) සහ හෙද කාර්යය මණ්ඩලය (289) සඳහා පුහුණුව ලබා දීම.

iv. වසර 2020 දී පැවති ඩෙංගු මරණ අනුපාතය 0.12% සිට 0.09% දක්වා අඩු කිරීමට හැකි වීම.

vi. ජාතික ඩෙංගු මර්දන ඒකකයේ පරිපාලනය යටතේ පුළුල් වෙබ් පාදක ඩෙංගු රෝග ආවේක්ෂණ පද්ධතිය සම්පූර්ණ කරන ලදි.

vii අන්තර්ජාතික පර්යේෂණ හා නවෝත්පාදන සම්මන්ත්‍රණය පැවැත්වීම.

පසුගිය වසර 5 කාර්ය සාධන ප්‍රවණතාවය



** මරණ අනුපාතිකය - වසරකට වැඩි කාලයක් ඩෙංගු රෝගය වැළඳී ඇති බවට හඳුනාගත් සියලුම පුද්ගලයන් අතර ඩෙංගු රෝගයෙන් මිය යන පුද්ගලයන්ගේ අනුපාතය.*

රූපය 1: 2001 සිට 2021 දක්වා වාර්ෂික ඩෙංගු රෝගීන් වාර්තා කිරීම සහ මරණ අනුපාතය*

Table: Special Mosquito Control Summary 2022

Premise	No. of premises visited	No. of potential premises	%	No. of premises with larvae	%	Number corrected	%	Notices Issued	Legal Actions
Houses	241,636	63,739	26.4	9,626	3.9	53,517	72.9	7,257	822
Schools	**606**	**371**	**61.2**	**129**	**21.3**	346	69.2	37	4
Other Edu. institutes	**429**	**135**	**31.5**	**40**	**9.3**	135	77.1	17	2
Government Institutes	**834**	**284**	**34.1**	**106**	**12.7**	250	64.1	44	3
Private Institutes	7,123	1,890	26.5	353	4.9	1,375	61.3	324	86
Factories	**517**	**252**	**48.7**	**78**	**15.1**	138	41.8	71	18
Construction Sites	**1,796**	**873**	**48.6**	**194**	**10.8**	601	56.3	154	21
Religious Places	**993**	**502**	**50.6**	**187**	**18.8**	449	65.2	51	0
Public Places	**464**	**186**	**40.1**	**56**	**12.1**	132	54.6	22	4
All the other places	2,102	512	24.3	58	2.7	462	81.1	96	1
Total	**256,500**	**68,744**	**26.8**	**10,827**	**4.2**	**57,405**	**72.1**	**8,073**	**961**

Table: National Level Key Performance Indicators from 2019 to 2023

Table 1: National Level Indicators Key Performance Indicators	Progress				
	2019	2020	2021	2022	2023 (till June)
Dengue Incidence (per 100,000 population)	481.81	141.52	162.14	345.74	441.9
Dengue Case Fatality Rate (%)	0.15	0.11	0.08	0.09	0.06
Premise Index for *Aedes* Mosquito	9.8	8.7	9.2	9.3	8.8



රූපය 2: 2016-2021 ඩෙංගු රෝගීන් සතිපතා වාර්තා කිරීම

2023 සඳහා සැලසුම් කර ඇති විශේෂ සංවර්ධන ක්‍රියාකාරකම්

i වෙබ් පාදක ඩෙංගු රෝග ආවේක්ශන පද්ධතිය අවසන් කොට එහි නියමු ව්‍යාපෘතිය සහ දීප ව්‍යාප්ත අවසන් කිරීම.
ii. කීට විද්‍යා සමීක්ෂණ දත්ත වාර්තා කිරීම සඳහා වෙබ් පාදක ජංගම යෙදුම සකස් කර අවසන් කිරීම
iii. ඩෙංගු වෛරස් අධ්‍යනය සඳහා අණුක රසායනාගාරයක් පිහිටුවීම

4.1.9 ජාතික වකුගඩු රෝග නිවාරණ සහ පර්යේෂණ ඒකකය

හැඳින්වීම

ජාතික වකුගඩු රෝග නිවාරණ සහ පර්යේෂණ ඒකකය (NRDPRU) 2015 දී පිහිටුවන ලද්දේ වකුගඩු රෝගය වැළැක්වීමට සහ නිදන්ගත වකුගඩු රෝග (CKD) / නිදන්ගත වකුගඩු රෝගය නොදන්නා සම්භවයක් ඇති (CKDu) රෝගීන්ට සේවා සැපයීම සඳහාය.

දැක්ම

දකුණු ආසියානු කලාපයේ වකුගඩු රෝග පිළිබඳ නිවාරණ සහ ප්‍රතිකාර සේවා සහ පර්යේෂණ සඳහා තාක්ෂණික සහ සැපයුම් ආධාර සැපයීමේ විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය වීම

මෙහෙවර

ශ්‍රී ලංකාවේ වකුගඩු රෝග සඳහා නවීනතම වැළැක්වීමේ ප්‍රතිකාර, සුව කිරීමේ සත්කාර සහ පර්යේෂණ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික සහ සැපයුම් සහාය ලබා දීම.

අරමුණු

- වකුගඩු රෝග නිවාරණ සත්කාර සඳහා තාක්ෂණික සහ සැපයුම් සහාය ලබා දීම
- වකුගඩු රෝග සුව කිරීමේ ප්‍රතිකාර සඳහා තාක්ෂණික සහ සැපයුම් සහාය ලබා දීම

- වකුගඩු රෝග පර්යේෂණ කටයුතු සඳහා තාක්ෂණික සහ සැපයුම් සහාය ලබා දීම
- නිදන්ගත වකුගඩු රෝග (CKD) රෝගීන්ගේ ජීවන තත්ත්වය සහ සමාජ සත්කාර වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැපයීම

2022 සහ 2023 දී ප්‍රධාන ජයග්‍රහණ

- CKD/CKDu ස්ථානීය සත්කාරක ස්ථාන පිරික්සුම් පද්ධතිය ස්වයංක්‍රීය කිරීම

CKD/CKDu ප්‍රජා මූලික පරීක්ෂණ වැඩසටහන් පැවැත්වීමේදී අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම සඳහා රුධිර හා මුත්‍රා සාම්පල ක්ෂේත්‍රයෙන් එකතු කර රෝහල් රසායනාගාර වෙත ප්‍රවාහනය කෙරේ. පරීක්ෂණ ධනාත්මක ප්‍රතිඵල පසුව රෝහල් රසායනාගාරයේ සිට අදාළ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී (MOH) ප්‍රදේශයට යවනු ලබන අතර මහජනතාව සමඟ බොහෝ ගැටුම්කාරී තත්ත්වයන් ඇති කරමින් දින කිහිපයක ප්‍රමාදයක් ඇති කරයි. MOH කාර්යාලයේ මහජන සෞඛ්‍ය කාර්යමණ්ඩලය පසුව අවම ප්‍රමාදයන් සහිතව ඒවා භාර දීමට දැඩි උත්සාහයක් දරන අතර ධනාත්මක පරීක්ෂණ වාර්තාවල හිමිකරුවන් සොයනු ඇත. පරීක්ෂණ වැඩසටහනක් සම්පූර්ණ කිරීමෙන් පසු සාමාන්‍යයෙන් සහභාගිවන්නන්ට ප්‍රතිඵල ලැබීමට සති දෙක සිට හතරක් ගතවේ. ධනාත්මක පරීක්ෂණ ප්‍රතිඵලයක් ඇති අයට පමණක් පරීක්ෂණ වාර්තාව ලැබෙනු ඇත. MOH හට ඒවා සොයා ගැනීමට නොහැකි බැවින් සැලකිය යුතු පරීක්ෂණ ධනාත්මක පරීක්ෂණ වාර්තා අනුපාතයකට ඔවුන්ගේ වාර්තා නොලැබේ. එබැවින් වාර්තාවක් නොලැබෙන අය අනිවාර්යයෙන්ම ඔවුන් සෘණාත්මක බව පෙන්නුම් නොකරයි. එසේම පරීක්ෂණ සෘණාත්මක පුද්ගලයන්ට කිසිදු වාර්තාවක් නොලැබෙන බැවින් ඔවුන් පරීක්ෂණ වැඩසටහනකට සහභාගි වූ බව පෙන්වීමට ඔවුන් සතුව සාක්ෂි නොමැත. තවද ධනාත්මක රෝග පවුල් ඉතිහාසයක් ඇති CKD/CKDu රෝගය සමඟ ප්‍රතිඵල සෘණාත්මක ලෙස පරීක්ෂා කරන අයට ඊළඟ පරීක්ෂණ සැසිය තීරණය කිරීමට වාර්තාවක් නොලැබේ. තවද පරීක්ෂණ ප්‍රතිඵල ලැබීම ප්‍රමාද වීම හේතුවෙන් හඳුනාගත් රෝගීන් අවශ්‍ය ප්‍රතිකාර සඳහා රෝහල් වෙත පැමිණීමට අධෛර්යමත් වේ. මෙම සම්පූර්ණ ක්‍රියාවලිය සඳහා ආයතන කිහිපයක වාහන කිහිපයක් නිරන්තරයෙන් ඉහළ පහළ ධාවනය වේ. එබැවින් ප්‍රධාන CKDu බලපෑමට ලක් වූ දිස්ත්‍රික්ක 16 ක ප්‍රවාහනය සඳහා ඉන්ධන තීරණාත්මක ප්‍රශ්නයක් බවට පත් වී වත්මන් ආර්ථික අර්බුදය තුළ පරීක්ෂණ වැඩසටහන් පැවැත්වීම නතර කර ඇත. ඉහත ගැටළු මඟහරවා ගැනීම සඳහා ජාතික මට්ටමේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික වකුගඩු රෝග නිවාරණ සහ පර්යේෂණ ඒකකය විසින් ස්ථානීය සත්කාරක ස්ථාන, ලේ සහ මුත්‍රා විශ්ලේෂණ උපකරණ හඳුන්වා දී ඇත.

- ස්ථානීය සත්කාරක ස්ථාන (**Point-of-care (POC)**)
  - ස්ථානීය සත්කාරක ස්ථාන පරීක්ෂණය යනු පුද්ගලයා පරීක්ෂා කරන විශේෂිත සායනික දත්ත සහ පරාමිතීන් ලබා ගැනීමයි.
  - ස්ථානීය සත්කාරක ස්ථාන රෝග විනිශ්චය උපකරණය යනු සායනික මෙන්ම සම්පත්-සීමිත සැකසුම් තුළ සිටින පුද්ගලයින්ගේ විශේෂිත සායනික තොරතුරු ලබා ගැනීමට භාවිතා කරන උපකරණයකි.
  - "ආයතනයෙන් පිටත සිටුවම්" තුළ ස්ථානීය සත්කාරක උපකරණ භාවිතා කළ හැක. ඔවුන් බොහෝ ආකාරයේ වෛද්‍ය පරීක්ෂණ සඳහා ඉක්මන් ප්‍රතිචාර ලබා දෙයි.
  - සාම්ප්‍රදායික සායනික රෝග විනිශ්චය ක්‍රියාපටිපාටිය සඳහා ඉහළ මට්ටමේ සහ මිල අධික උපකරණ අවශ්‍ය වේ, මෙහෙයුම් සහ ප්‍රතිඵල අර්ථ නිරූපණය සඳහා ප්‍රවීණ කාර්මිකයෙකු, දිගු කාලයක් යනාදිය අවසානයේ එය වෙහෙසකර සහ මිල අධික කරයි. ස්ථානීය සත්කාරක ස්ථාන උපාංග භාවිතයෙන් මේ සියල්ල පහසුවෙන් වළක්වා ගත හැකිය.
- හල් රසායනාගාර වෙත සාම්පල යැවීමට අවශ්‍ය නොවන බැවින් මෙම නව ක්‍රමය මඟින් පරීක්ෂණ ප්‍රතිඵල ක්ෂේත්‍රයේ සිටින පුද්ගලයාට වහාම ලබා දිය හැකිය. මෙමගින් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය මහජනතාව සමඟ නැවත නැවත රැස්වීම් පැවැත්වීම සහ ප්‍රජාව වෙත නැවත නැවත පැමිණීම වැළැක්විය හැකිය. මෙමගින් නිත්‍ය දෛනික රෝහල් පරීක්ෂණයට සෘජුවම සම්බන්ධ වී සිටින රසායනාගාරවල කාර්ය භාරය සෘජුවම අඩු කරනු ඇත. මෙම ස්ථානීය සත්කාරක උපාංග ක්‍රියාත්මක කිරීමට දක්ෂ කාර්ය මණ්ඩලයක් සහ නඩත්තුවක් අවශ්‍ය නොවන බැවින් තවදුරටත් පිරිවැය ඉතිරි කර ගත හැක. මිනිත්තු 3 ක් ඇතුළත රුධිර විශ්ලේෂණයේ පරාමිතීන්

12 ක් සිදු කිරීම සඳහා තනි කාට්‍රිජ් සඳහා ආසන්න වියදම ආසන්න වශයෙන් රු. 1,690/= ක් වන අතර පරාමිති 14 කින් යුත් මුත්‍රා විශ්ලේෂණය සඳහා මෙය රු. 70/= ක් වන අතර මෙම සියලු පරීක්ෂණ පැවැත්වීම සඳහා තනි පුද්ගල පිරිවැය රු. 15,000/= පුද්ගලික අංශයේ ප්‍රතිඵල ලබා ගැනීමට අවම වශයෙන් පැය කිහිපයක්වත් අවශ්‍ය වේ.

- **ස්ථානීය සත්කාරක රුධිර විශ්ලේෂණ උපකරණ සහ මුත්‍රා විශ්ලේෂක ලබා දීම මගින් CKD පරීක්ෂණ වැඩසටහන් මහජනයා සමඟ අඩු සම්බන්ධතා පැවැත්වීම සහ WHO විසින් මෙහෙයවනු ලබන COVID-19 තත්ත්වය තුළ අවම වශයෙන් හැසිරවීම සඳහා උපකාරී වී ඇත.** දුරස්ථව පවා ප්‍රවේශ විය හැකි ඩිජිටල් දත්ත සමුදායන් වෙත සෘජුවම දත්ත මාරු කිරීමට මෙම උපකරණ සතුව WiFi ඇත. මුද්‍රිත වාර්තා CKD/CKDu පරීක්ෂණ වැඩසටහන්වලට සහභාගී වන සියලුම දෙනාට වහාම ලබා දෙන අතර ධනාත්මක පරීක්ෂණ වාර් තා ඇති අය වහාම ළඟම ඇති රෝහල වෙත යොමු කරනු ලැබේ. සෘණාත්මකව පරීක්ෂා කරන අය ඔවුන්ගේ අතීත වෛද්‍ය සහ පවුල් ඉතිහාසය අනුව සුදුසු නැවත පරීක්ෂණයක් නැවත සැලසුම් කරති.

රූපය 01: Point of Care රුධිර විශ්ලේෂක පරීක්ෂා කිරීම

ඩයලිසිස්, බද්ධ කිරීම් සහ වකුගඩු ඒකක සඳහා පොන්ට් ඔෆ් කෙයාර් විමර්ශන සේවා සැපයීම මෙම ආර්ථික අර්බුදය තුළ මහජනතාවට ඉමහත් ප්‍රතිලාභයක් ලබා දෙනු ඇත. තොරතුරු සංඛ්‍යාංක දත්ත ගබඩාවල ගබඩා කර ඇති බැවින් වෛද්‍යවරුන්ට දුරස්ථව ප්‍රවේශ විය හැක. මිනිත්තු 5කට අඩු කාලයකදී ප්‍රතිඵල නිකුත් වන බැවින් වත්මන් ආර්ථික අර්බුදකාරී තත්ත්වය තුළ මෙය භාවිතා කළ යුතු ලාභදායී ක්‍රමයකි. උපකරණ නිතිපතා නඩත්තු කිරීම අවශ්‍ය නොවේ, තත්ත්ව පාලනයේ දිගු ක්‍රියා පටිපාටි සැලකිය යුතු ලෙස කෙටි කර ඇත, ප්‍රතිඵල සෘජුවම රෝගියාගේ තොරතුරු පද්ධතියට ග්‍රහණය කර ඇති අතර උපකරණ ක්‍රියාත්මක කිරීමට පුහුණු ශ්‍රමය (වෛද්‍ය රසායනාගාර කාර්මික ශිල්පී වැනි) අවශ්‍ය නොවේ.

- **නවීනතම CKD/CKDu ජංගම පරීක්ෂණ රසායනාගාර අටක් ආරම්භ කිරීම**

චීන රජය විසින් නවීනතම CKD/CKDu ජංගම පරීක්ෂණ රසායනාගාර අටක් පරිත්‍යාග කරන ලදී. ප්‍රජා පාදක CKD/CKDu පරීක්ෂාව දිගටම කරගෙන යාම සඳහා මෙම ජංගම විද්‍යාගාර CKDu ඉතා ආවේණික ප්‍රදේශවලට (අනුරාධපුර, වවුනියාව, කුරුණෑගල, ත්‍රිකුණාමලය, අම්පාර, මාතලේ, බදුල්ල සහ නව වකුගඩු රෝහල පොළොන්නරුව RDHS කාර්යාල) වෙත භාර දෙන ලදී. මෙම ජංගම විද්‍යාගාර COVID-19 ඇතුළු ඕනෑම අවස්ථාවක අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීමට ද භාවිතා කළ හැක. මෙම ජංගම රසායනාගාර සඳහා අවශ්‍ය රසායනික ප්‍රතික්‍රියාකාරක මිලදී ගැනීම සඳහා ජාතික වකුගඩු රෝග නිවාරණ හා පර්යේෂණ ඒකකය වාර්ෂිකව ප්‍රතිපාදන ලබා දෙනු ඇත.

රූපය 02: ජංගම CKD/CKDu Screening Laboratories

- **පීකිං විශ්ව විද්‍යාලයේ පළමු රෝහල සහ චීන විද්‍යා ඇකඩමිය සමඟ ඒකාබද්ධ පර්යේෂ ණ අධ්‍යයනයේ දත්ත එකතු කිරීම අවසන් කිරීම**

ශ්‍රී ලංකාව තුළ නිදන්ගත වකුගඩු රෝගය (CKDu) කල් ඇතිව හඳුනාගැනීම සඳහා නවමුත්‍රා ජෛව සලකුණු ඇගයීම පිළිබඳ ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යයනයේ දත්ත රැස්කිරීමේ කොටස මැදවච්චිය, පදවිය, මැදිරිගිරිය සහ බොරලැස්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සාර්ථකව නිම කරන ලදී.

චීන විද්‍යා ඇකඩමිය සමඟ කරන ලද සහයෝගිතා අධ්‍යයනයන්හි සොයාගැනීම් පහත පරිදි වේ.

ජල නියැදීම: නොගැඹුරු ළිං 311ක්, නල ළිං 21ක් සහ උල්පත් දෙකක් ඇතුළත් ජල මූලාශ්‍ර 334ක් නිය

රූපය 10: ජල මූලාශ්‍රය නියැදීම

ග්ලයිෆොසේට්, බැර ලෝහ සහ අකාබනික මූලද්‍රව්‍ය පාංශු හා ජලය පිළිබඳ විමර්ශනයකදී හෙළි විය

1. Ca-HCO3 වර්ගයේ භූගත ජලය NCP හි නොගැඹුරු භූගත ජලය (82% සහ 59.4%) සහ ගැඹුරු භූගත ජලය (66.7% සහ 58.3%) පිළිවෙළින් තෙත් සහ වියළි කාල දෙකෙහිම ආධිපත්‍යය දරයි.

2. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ භූගත ජලයේ ගුණාත්මකභාවය අනුරාධපුර දිස්ත්‍රික්කයට වඩා හොඳ මට්ටමක පවතී
3. අධික වාෂ්පීකරණ අනුපාතය හේතුවෙන් තෙත් සමයට සාපේක්ෂව වියළි කාලවලදී භූගත ජලයේ ගුණාත්මක භාවය සුළු පහත වැටීමක් පෙන්නුම් කරයි.
4. CDKu ප්‍රදේශවල කැල්සියම් සහ සෝඩියම් ඉහළ සාන්ද්‍රණයක්
5. උතුරු ප්‍රදේශයේ F-, Cl- සහ Br- ඉහළ සාන්ද්‍රණයක්
6. ජල සාම්පලවල ග්ලයිෆොසේට් සහ එහි පරිවෘත්තීය හඳුනාගෙන නොමැත

වකුගඩු හානියට ග්ලයිෆොසේට් වල බලපෑම පිළිබඳ ගවේෂණ අධ්‍යයනයෙන් තහවුරු වූයේ ග්ලයිෆොසේට්, අධික උෂ්ණත්වය සහ තද ජලය යන මේ සියල්ල වකුගඩු ආබාධ ඇතිවීමේ අවදානම වැඩි කිරීමට බලපාන බවයි.

රූපය 11: සති 36 කට පසු වකුගඩු වල පටක පරීක්ෂණය



කාර්ය සාධන දර්ශක

CKDu බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල CKD/CKDu පරීක්ෂාව පිළිබඳ වාර්ෂික ආවරණය
CKDu බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල CKD/CKDu සිතියම්ගත කිරීමේ වාර්ෂික ආවරණය
සපයන ලද නව ආරක්ෂිත පානීය ජල පද්ධති ගණන
පෙරිටෝනියල් ඩයලිසිස් ලබා ගන්නා CKD/CKDu රෝගීන් සංඛ්‍යාව (CAPD සහ APD)
පෙරිටෝනියල් ඩයලිසිස් සඳහා සංවර්ධනය කරන ලද වකුගඩු ඒකක සංඛ්‍යාව රක්තපාතය ලබා ගන්නා CKD/CKDu රෝගීන් සංඛ්‍යාව
වකුගඩු බද්ධ කරන CKD/CKDu රෝගීන් සංඛ්‍යාව සඳහා සංවර්ධනය කරන ලද රෝහල් සංඛ්‍යාව
වකුගඩු බද්ධ කිරීම සඳහා සංවර්ධනය කරන ලද රෝහල් ගණන

ප්‍රධාන කාර්ය සාධන දර්ශක	ප්‍රගතිය		
	2021	**2022**	**2023 Q1 සහ Q2**
CKDu බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල **CKD/CKDu** පරීක්ෂාව පිළිබඳ වාර්ෂික ආවරණය	82,841 කි	68,234 කි	39511
NRDPU විසින් පරීක්ෂා කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව	673	3280	4652
CKDu බලපෑමට ලක් වූ දිස්ත්‍රික්කවල **CKD/CKDu** සිතියම්ගත කිරීමේ වාර්ෂික ආවරණය	5,026 කි	908	351
පරිතාන කාන්දුකරණය සිදු කරන වකුගඩු ඒකක ගණන (උපකරණ, මානව සම්පත් ධාරිතා ගොඩනැගීම ආදිය)	12	12	12
නව රුධිර කාන්දුකරණය ලබා ගන්නා **CKD/CKDu** රෝගීන් සංඛ්‍යාව	4,806 කි	5,124 කි	7439
ක්‍රියාකාරී රුධිර කාන්දුකරණ යන්ත්‍ර සංඛ්‍යාව	593	673	612
රුධිර කාන්දුකරණ ඒකක ගණන	79	85	86
වකුගඩු බද්ධ කිරීම සිදුකරන රෝහල් ගණන (උපකරණ, මානව සම්පත්, ධාරිතා ගොඩනැගීම ආදිය)	9	10	11

4.2 සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ ආරක්ෂණය

4.2.1 වසංගත රෝග සේවා

හැඳින්වීම

1959 වසරේ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහායෙන් ස්ථාපනය කරන ලද, සෞඛ්‍ය අමාත්‍යංශයේ වසංගත රෝග විද්‍යා අංශය, එදා-මෙදා තුර බෝවන රෝග ආවේක්ෂණය හා පාලනය පිළිබඳ ජාතික මධ්‍යස්ථානය ලෙස ජාතික මෙහෙවරක් ඉටු කරයි.

දැක්ම

සෞඛ්‍ය සම්පන්න ශ්‍රී ලංකාවක් තුල සෞඛ්‍ය සම්පන්න ජනතාවක්

මෙහෙවර

රෝගාබාධ පාලනයෙන් හා වැළැක්වීමෙන් ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය ප්‍රවර්ධනය කිරීම

අරමුණු

1. බෝවන රෝග ආවේක්ෂණය, පාලනය හා වැළැක්වීම පිළිබඳ වගවීම
2. ව්‍යසන හා හදිසි අවස්ථාවල දී රෝග පාලන කටයුතු හා හදිසියේ මතුවන රෝග විමර්ශනය
3. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන පිළිබඳ කේන්ද්‍රීය ආයතනය
4. ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහන හා බෝවන රෝග පාලනය පිළිබඳ ක්‍රියාකාරකම් හා සම්බන්ධ කටයුතු ගැන සෞඛ්‍ය කාර්යමණ්ඩල හා වෛද්‍ය පශ්චාද් උපාධිධාරීන් පුහුණු කිරීම
5. රෝගාබාධ වැළැක්වීම, පාලනය හා ළමා ප්‍රතිශක්තිකරණ වැඩසටහන පිළිබඳ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානය

2022 වර්ෂයේදී අත්කර ගත් ප්‍රධාන ජයග්‍රහණ හා විශේෂ සිදුවීම්

- ශ්‍රී ලංකාව තුළ බෝවන රෝග නිරීක්ෂණය සහ පාලනය සඳහා වගකිව යුතු ප්‍රමුඛතම තාක්ෂණික ආයතනය ලෙස වසංගත රෝග විද්‍යා අංශයට, කොවිඩ් -19 වසංගතය 1, 2 සහ 3 වන රැල්ල පාලනය කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යංශයට සාර්ථකව මග පෙන්වන ලදී.
- 2022.12.31 වන විට කොරෝනා රෝගීන් ශ්‍රී ලංකාව තුළින් 671,891 ක් වාර්තාවී තිබූ අතර මරණ 16,817 ක් වාර්තා වී තිබුණි. රෝග පාලන කටයුතු වල අරමුණ වූයේ තවදුරටත් රෝගය පැතිරී යාම වැළැක්වීම සහ රෝගය හේතුවෙන් සිදුවන මරණ අඩු කිරීමයි.
- වයස අවු: 20 ට වැඩි සියළුම පුද්ගලයින් සඳහා බූස්ටර් මාත්‍රාව ලෙස ෆයිසර් මාත්‍රාව ලබාදෙන ලදී. අවුරුදු 12 ට වැඩි පාසල් දරුවන් සඳහා ප්‍රධාන වශයෙන් පාසල් මූලික වැඩසටහනක් ලෙස ෆයිසර් එන්නත ලබා දෙන ලදී. රෝහල් වලින් මෙන්ම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල වලින් ද සේවාවන් ලබා දෙන ලදී. දෙවන බූස්ටර් මාත්‍රාව ලෙස ෆයිසර් මාත්‍රාව ලබාදීම 2022 මැයි මස සිට ආරම්භ කරන ලදී.
- 2022 වසර අවසානයේදී, පුද්ගලයන් 17,137,342 කට අවම වශයෙන් කොවිඩ් එන්නත් මාත්‍රා එකක්වත් ලබා දී තිබූ අතර පුද්ගලයන් 14,768,419 ක් සිය ප්‍රාථමික එන්නත්කරණය සම්පූර්ණ කර තිබුණි. පළමු බූස්ටර් මාත්‍රාව පුද්ගලයන් 8,247,788 සහ පුද්ගලයන් 203,396 ක් දෙවන බූස්ටර් මාත්‍රාව ලබාගෙන තිබුණි. කොවිඩ් 19 එන්නත්කරණය ඒ සඳහාම කැපවූ මහජන සෞඛ්‍ය සේවා කණ්ඩායමක් මගින් රෝග නිවාරණ අංශයේ සහ ත්‍රිවිධ හමුදාවේ ද සහය ඇතිව සිදුකරන ලදී.
- 2022 වර්ෂයේ අවසාන භාගයේදී වයස අවු: 5 දරුවන් සහ ගර්භනී මව්වරුන් යෙදා ගනිමින් හෙපයටයිටිස් බී සමීක්ෂණයක් ජාතික මට්ටමින් සිදුකරන ලදී.

දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති විස්තර

අනු අංකය	ව්‍යාපෘති විස්තරය	ඇස්තමේන්තු මුදල (රුපියල් මිලියන)	2022.12.31 දිනට භෞතික ප්‍රගතිය	2022.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන)
	ශ්‍රී ලංකා රජය			
1.1	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මට්ටමින් ලෙප්ටොස්පයිරෝසිස් රෝගය පාලනය කිරීම සහ වැළැක්වීම	2	දිස්ත්‍රික් සමාලෝචන සැලසුම් කර තිබූ නමුත් රටේ පැවති ඉන්ධන හිඟ'ය හේතුවෙන්	0

			සම්පූර්ණ කිරීමට නොහැකි විය.	
1.2	ලෙප්ටොස්පයිරෝසිස් පාලනය කිරීම සහ වැළැක්වීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම		ජනමාධ්‍ය ප්‍රචාරණ කටයුතු සඳහා කැඳවූ මිළ ගණන් වෙන්කරන ලද මිළ ගණන් වලට වඩා වැඩිවූ නිසා ක්‍රියාත්මක කළ නොහැකි විය.	0
1.3	තොරතුරු අධ්‍යාපනය හා සන්නිවේදන ද්‍රව්‍ය සකස් කිරීම හා මුද්‍රණය කිරීම - සිංහල හා දෙමළ භාෂාවෙන් පෝස්ටර් සහ පත්‍රිකා		පැවති ලිපිද්‍රව්‍ය වල හිග'ය හේතුවෙන් මුද්‍රණ ආයතන වලින් මිල කැඳවුම් ලබා ගැනීමට නොහැකි විය.	0
2	**ව්‍යාප්තික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ සහ පෝලියෝ සරම්ප රුබෙල්ලා සහ නව ජන්ම රුබෙල්ලා රෝගවලින් තොර තත්වය පවත්වාගැනීම ආවේක්ෂණය කිරීම තක්සේරු කිරීම**			
2.1	රෝහල් තුළ සහ වෙනත් ආයතන තුළ සරම්ප, රුබෙල්ලා හා පෝලියෝ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ සමාලෝචන පැවැත්වීම		රැස්වීම් 5 ක් සැලසුම් කර තිබූ නමුත් ඉහත දක්වන ලද හේතු නිසා සම්පූර්ණ කිරීමට නොහැකි විය.	0
2.2	රෝහල් තුළ සහ වෙනත් ආයතන තුළ සරම්ප, රුබෙල්ලා හා පෝලියෝ පිළිබඳ උපදේශන කමිටු රැස්වීම් පැවැත්වීම	1.6	රැස්වීම් 3 ක් සැලසුම් කර තිබූ නමුත් ඉහත දක්වන ලද හේතු නිසා සම්පූර්ණ කිරීමට නොහැකි විය.	0
2.3	පෝලියෝ සරම්ප/රුබෙල්ලා සහ නව ජන්ම රුබෙල්ලා තුරන් කිරීම පිළිබඳ වූ ජාතික සහතික කිරීමේ කමිටුව		රැස්වීම් 3 ක් සැලසුම් කර තිබූ නමුත් ඉහත දක්වන ලද හේතු නිසා සම්පූර්ණ කිරීමට නොහැකි විය.	0
2.4	ජාතික පෝලියෝ විශේෂඥ කමිටුව හා උපදේශක කමිටු රැස්වීම		රැස්වීම් 3 ක් සැලසුම් කර තිබූ නමුත් ඉහත දක්වන ලද හේතු නිසා සම්පූර්ණ කිරීමට නොහැකි විය.	0
3	**උසස් ගුණාත්මක හා ආරක්ෂිත එන්නත්කරණ වැඩපිළිවෙලක් සඳහා ව්‍යාප්තික ප්‍රතිශක්තිකරණ වැඩසටහන හා එන්නතින් පසු අතුරු ආබාධ ‘ඊපෂ* තක්සේරු කිරීම**			
3.1	ඉහළ ප්‍රතිශක්තිකරණ ආවරණ පවත්වා ගැනීම සඳහා සෞඛ්‍ය කර්යමණ්ඩල උදෙසා පැවැත්වෙන ව්‍යාප්තික ප්‍රතිශක්තිකරණ වැඩසටහන (EPI) හා එන්නත්කරණයෙන් වැළකිය හැකි රෝග (VPD) පිළිබඳ සමාලෝචන හා පුහුණු වැඩසටහන්	0.73	සැලසුම් කරන ලද වැඩසටහන් 34 සම්පූර්ණ කරන ලද වැඩසටහන් 8	6%
3.2	එන්නත්කරණයෙන් පසු අතුරු ආබාධ (ඊපෂ) පිළිබඳ දිස්ත්‍රික්ක සමාලෝචන රැස්වීම් පැවැත්වීම			0
3.3	එන්නත්කරණයෙන් පසු අතුරු ආබාධ (AEFI) පිළිබඳ හේතු තක්සේරු පිළිබඳ විශේෂ සමාලෝචන කමිටුව			0
3.4	ජාතික ප්‍රතිශක්තිකරණ වැඩසටහනේ මධ්‍යම මට්ටමේ කළමනාකරණය පිළිබඳ මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා උපදේශන රැස්වීම්			0
	ඩෙංගු - රට තුළ මී උණ හා ලීෂ්මේනියාසිස් පාලනය සහ වැළැක්වීම ශක්තිමත් කිරීම සඳහා සමාලෝචන රැස්වීම් සහ උපදේශන රැස්වීම් පැවැත්වීම			
4.1	අධි අවදානම් සහිත දිස්ත්‍රිමක්කවල මී උණ පිළිබඳ සමාලෝචන රැස්වීම් පැවැත්වීම	0.5	සැලසුම් කරන ලද වැඩසටහන් 4 සම්පූර්ණ කරන ලද වැඩසටහන් 4	100%
4.2	ලෙප්ටොස්පයිරෝසිස් පිළිබඳ මාර්ගෝපදේශ සංවර්ධන කමිටුව	0	රැස්වීම් 2 ක් සැලසුම් කර තිබූ නමුත් ඉහත දක්වන ලද	0

	සමග උපදේශන රැස්වීම් පැවැත්වීම		හේතු නිසා සම්පූර්ණ කිරීමට නොහැකි විය.	
4.3	කුරුළු උණ පිළිබඳ කාර්තුක ජාතික කමිටු රැස්වීම්	0.5	සැලසුම් කරන ලද වැඩසටහන් 3 සම්පූර්ණ කරන ලද වැඩසටහන් 1	33%
4.4	ජාතික වසංගත වැඩපිළිවෙල යාවත්කාලීන කිරීම	0	සැලසුම් කරන ලද වැඩසටහන් 4 සම්පූර්ණ කරන ලද වැඩසටහන් 0	0
4.5	අධි අවදානම් සහිත දිස්ත්‍රික්කවල ලීෂ්මනියාසිස් පිළිබඳ සමාලෝචන රැස්වීම් පැවැත්වීම	0	සැලසුම් කරන ලද වැඩසටහන් 4 සම්පූර්ණ කරන ලද වැඩසටහන් 0	0
4.6	වෛරස් හෙපටයිටිස් පාලනයල වැළැක්වීම සඳහා ජාතික උපායමාර්ගික සැලැස්මක් සකස් කිරීම සඳහා උපදේශන රැස්වීම් පැවැත්වීම	0	**අරමුදල් ලැබී නැත**	0
4.7	ගර්භනී මව්වරුන් හා අවු:5 දරුවන් යොදා ගනිමින් හෙපටයිටිස් බී රෝගය පිළිබඳ ජාතික සමීක්ෂණය පැවැත්වීම 2022	2.1	සමීක්ෂණය සම්පූර්ණ කරන ලදී	100%
4.8	මානව පැපිලෝමා වෛරසය මගින් අවු: 20 - 70 අතර පුරුෂයින් අතර ඇතිකරන පිළිකා තත්වයන් සමීක්ෂණය හා විවිධ වැළැක්වීමේ උපායමාර්ග වල ඵලදායිතාවය	0	සැලසුම් කරන ලද උපදේශක වැඩසටහන් 7 සම්පූර්ණ කරන ලද වැඩසටහන් 0	0

පසුගිය 6 වසර තුල කාර්යසාධන ප්‍රවණතාව

පසුගිය 6 වසර තුල දිවයිනේ ආහාර හා ජල මූල රෝග ප්‍රවණතාව

වසර	වෛරස් හෙපටයිටිස්	අතිසාරය / පාචනය	ටයිපොයිඩ්
2016	884	2932	548
2017	321	1734	339
2018	294	1756	304
2019	352	1699	190
2020	245	875	138
2021	198	326	65

4.2.2 මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා

හැඳින්වීම

පවුල් සෞඛ්‍ය කාර්යාංශය යනු රට තුළ ප්‍රජනක සෞඛ්‍ය, මාතෘ සෞඛ්‍ය, අලුත උපන් සෞඛ්‍ය, තරුණ සෞඛ්‍ය, ළමා සෞඛ්‍ය, පවුල් සැලසුම් සහ කාන්තා සායන වැඩසටහන් ප්‍රතිපත්ති සැලසුම් කිරීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම සඳහා වගකිව යුතු සෞඛ්‍ය අමාත්‍යාංශයේ මධ්‍යම සංවිධානයයි.

මෙම කාර්යභාරය තුළ කාර්යාංශය පරිශ්‍රයේ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සහ මඟ පෙන්වීම ලබා දෙන අතර ජාත්‍යන්තර නියෝජිතායතන මගින් අරමුදල් සපයන විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. මෙම කාර්යාංශය මගින් වර්තමාන සහ අනාගත අභියෝගවලට මුහුණ දීම සඳහා සේවා සැපයීම ප්‍රශස්ත කිරීම සඳහා විද්‍යාත්මක සාක්ෂි මත පදනම්ව මාතෘ හා ළමා සෞඛ්‍ය සේවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට අඩිතාලම දමයි. ශ්‍රී ලංකා රජය පවුල් සෞඛ්‍ය කාර්යාංශයේ සමස්ත කාර්යයන් සඳහා අරමුදල් සපයයි. කෙසේ වෙතත්, සම්පූර්ණ අයවැය අවශ්‍යතාවයෙන් කොටසක් විවිධ ව්‍යාපෘති ක්‍රියාකාරකම් ලෙස බාහිර සම්පත් (එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන) මගින් පරිපූරණය කරගනු ලැබේ.

වසර 2030 වන විට තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාව කැපවී සිටී. පවුල් සෞඛ්‍ය කාර්යාංශය මාතෘ සහ ළමා සෞඛ්‍ය සේවා සඳහා වගකිව යුතු කේන්ද්‍රීය ආයතනය වන අතර, එහි ජයග්‍රහණ අධීක්ෂණය කරමින් ඉලක්ක 3 - (යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම) සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළේය.

දැක්ම

සියලුම කාන්තාවන්, ළමුන් සහ ඔවුන්ගේ පවුල්වල ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය විභවයන් ප්‍රශස්ත කර ඇති ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැගීම.

මෙහෙයුම

සංස්කෘතිකමය වශයෙන් පිළිගත හැකි සහ පවුල් හිතකාමී පසුබිමක් තුළ විස්තීර්ණ, තිරසාර, සාධාරණ සහ ගුණාත්මක මාතෘ සහ ළමා සෞඛ්‍ය සේවාවන් ආධාරක, සැපයීම තුළින් සියලුම කාන්තාවන්ගේ, දරුවන්ගේ සහ පවුල්වල සෞඛ්‍ය මට්ටම ඉහළම මට්ටමට ළඟා කර ගැනීමට දායක වීම.

ප්‍රතිපත්ති ඉලක්ක

ඉලක්කය **1** - කාන්තාවන්ගේ සහ ඔවුන්ගේ සහකරුවන්ගේ සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රශස්ත සෞඛ්‍ය සම්පන්නව ගැබ් ගැනීමට සහ එය ජීවිත කාලය පුරාම පවත්වා ගැනීමට.

ඉලක්කය **2** - ගර්භණීභාවය, දරු ප්‍රසූතිය සහ පශ්චාත් ප්‍රසව කාලය තුළ ගුණාත්මක සත්කාර සැපයීම තුළින් මවට සහ අලුත උපන් බිළිඳාට ආරක්ෂිත ප්‍රතිඵලයක් සහතික කිරීම.

ඉලක්කය **3** - ගුණාත්මක සත්කාර සැපයීම හරහා පෙර ජන්ම හා නවජ රෝගාබාධ සහ මරණ අවම කිරීම සහතික කිරීම.

ඉලක්කය **4** - ප්‍රශස්ත රැකවරණයක් ලබා දීම තුළින් වයස අවුරුදු පහට අඩු සියලුම දරුවන්ට ජීවත් වීමට සහ ඔවුන්ගේ වර්ධනයට සහ සංවර්ධනය සඳහා සම්පූර්ණ විභවයන් කරා ළඟා වීමට හැකියාව ලබා දීම.

ඉලක්කය **5** - වයස අවුරුදු **5** සිට **9** දක්වා ළමුන් සහ නව යොවුන් වියේ දරුවන් හිතකර සහ සම්පත්දායක ශාරීරික හා මනෝ සමාජීය පරිසරයක් තුළ වර්ධනය හා සංවර්ධනය සඳහා ඔවුන්ගේ සම්පූර්ණ හැකියාවන් අවබෝධ කර ගැනීම සහතික කිරීම.

ඉලක්කය **6** - විශේෂ අවශ්‍යතා ඇති දරුවන්ට සමාජයේ ඵලදායී සාමාජිකයන් ලෙස ක්‍රියා කිරීම සඳහා ඔවුන්ගේ මානසික, කායික සහ සමාජීය හැකියාවන් ප්‍රශස්ත ලෙස වර්ධනය කර ගැනීමට හැකියාව ලබා දීම.

ඉලක්කය **7** - අනපේක්ෂිත ගැබ් ගැනීම් වළක්වන අතරම ප්‍රශස්ත පරතරයක් ඇතිව අපේක්ෂිත දරුවන් සංඛ්‍යාවක් ඇති කර ගැනීමට සියලුම ජෝඩුවලට හැකියාව ලබා දීම.

ඉලක්කය **8 -** ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සමානාත්මතාවය සහතික කරමින් පිරිමින්ගේ සහ කාන්තාවන්ගේ ප්‍රජනක සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම.

ඉලක්කය **9 -** උසස් තත්ත්වයේ **MCH** සේවා සැපයීම සඳහා ජාතික, පළාත්, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය මට්ටමේ සෞඛ්‍ය කළමනාකරුවන් ප්‍රතිචාර දක්වන බව සහ වගවීම සහතික කිරීම.

ඉලක්කය **10-** තීරණ ගැනීමට සහාය වීම සඳහා ගුණාත්මක තොරතුරු උත්පාදනය කරන **MCH** වැඩසටහන ඵලදායී ලෙස අධීක්ෂණය කිරීම සහ ඇගයීම සහතික කිරීම.

ඉලක්කය **11 - MCH** හි ප්‍රතිපත්ති සහ භාවිතය සඳහා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම.

ඉලක්කය **12 -** මාතෘ සහ ළමා සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සඳහා පුද්ගලයන්, පවුල් සහ ප්‍රජාවන් අතර තිරසාර හිතකර හැසිරීම් සහතික කිරීම.

FHB හි 2022/2023 ජයග්‍රහණ සහ විශේෂ සිදුවීම්

පවුල් සෞඛ්‍ය කාර්යාංශය (FHB) විසින් 2022-2023 වසර තුළ 2 වන කාර්තුව දක්වා සිදු කරන ලද ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

පවුල් සැලසුම් වැඩසටහන

- **පවුල් සැලසුම් සේවා සඳහා උපත් පාලන භාණ්ඩ ප්‍රසම්පාදනය කිරීම**
  ඵලදායි ජාතික පවුල් සැලසුම් වැඩසටහනක් සඳහා අවශ්‍යතා ඇති සියලුම දෙනාට උපත් පාලන නිෂ්පාදන ලබා ගැනීම අත්‍යවශ්‍ය වේ. අත්‍යවශ්‍ය උපත් පාලන ද්‍රව්‍ය රජයේ මුදලින් ලබාගෙන 2022 සහ 2023 පළමු සහ දෙවන කාර්තුව තුළ සියලුම දිස්ත්‍රික්කවලට බෙදා හරින ලදී.
- ආර්ථික අර්බුදය සහ සාමාන්‍ය ප්‍රසම්පාදනය ක්‍රියාවලියේ සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් පවුල් සැලසුම් වැඩසටහන සඳහා උපත් පාලන ද්‍රව්‍යවල හිඟයක් ඇති විය. රටට අත්‍යවශ්‍ය වූ හදිසි අවශ්‍යතාවයට ප්‍රතිචාරයක් ලෙස පවුල් සැලසුම් සංගමය, PSL, UNFPA, Global Fund, PSL සහ Baur විසින් උපත් පාලන ද්‍රව්‍ය පරිත්‍යාග කරන ලදී.
- කොවිඩ් අභියෝග සහ රටේ ආර්ථික අර්බුදය මධ්‍යයේ වුවද දිස්ත්‍රික්කවල උපත් පාලන ද්‍රව්‍ය පවතින බව සහතික කිරීමෙන් උපත් පාලන ව්‍යාප්ති අනුපාතය 2021 දී 57.7% සිට 2022 දී 59.4% දක්වා ඉහළ නැංවීමට දායක විය
- **ගුණාත්මක පවුල් සැලසුම් සේවාවක් සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ධාරිතා ගොඩනැගීම:**
  මහනුවර සහ බදුල්ල දිස්ත්‍රික්කවල සහ බත්තරමුල්ල MOH ප්‍රදේශයේ අභ්‍යන්තර ගර්භාෂ උපාංග ඇතුළත් කිරීම් සහ ඉවත් කිරීම් පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් සමඟ පවුල් සැලසුම් සේවා පිළිබඳ ස්ථානීය පුහුණුවීම් පවත්වන ලදී. කාර්ය මණ්ඩල සාමාජිකයින් 150 දෙනෙකු පුහුණු කරන ලදී.

  පවුල් සැලසුම් ඒකකය මගින් වෛද්‍ය නිලධාරීන් 30 දෙනෙකු සඳහා ප්‍රජනක සෞඛ්‍ය සහ පවුල් සැලසුම් පිළිබඳ දින 3ක වැඩමුළු දෙකක් පවත්වන ලදී.

  ප්‍රජනක සෞඛ්‍ය සහ පවුල් සැලසුම් පිළිබඳ දින 2 ක වැඩමුළු පහක් පවත්වන ලද අතර පවුල් සැලසුම් පිළිබඳ උපදේශනය පිළිබඳව මහජන සෞඛ්‍ය හෙද සහෝදරියන් (PHNS) 71 දෙනෙකු පුහුණු කරන ලදී. පවුල් සැලසුම් ක්‍රම පිළිබඳව IUD ආකෘති මත ප්‍රායෝගික පුහුණුව මගින් 2022 සහ 2023 රෝගීන් 30 සඳහා පුහුණු කරන ලදී. 2022 සැප්තැම්බර් 19 වන දින බදුල්ල දිස්ත්‍රික් MOHs සහ MOs සඳහා RH සහ FP පිළිබඳ මාර්ගගත පුහුණුවක් සිදු කරන ලදී.

සියලුම දිස්ත්‍රික්කවල RMSD කාර්ය මණ්ඩලය සඳහා ලොජිස්ටික් කළමනාකරණය පිළිබඳ වැඩමුළුවක් ද සිදු කරන ලද අතර eRHMIS වෙබ් මත පදනම් වූ උපත් පාලන තොග ආකෘතිය (1158) පිළිබඳ ඔවුන් යාවත්කාලීන කරන ලදී.

- 2022 අප්‍රේල් මාසයේදී පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේදී 'තරුණ අයගේ මානසික සෞඛ්‍යයේ වැදගත්කම' පිළිබඳ, ලෝක ළදරු, ළමා සහ නව යොවුන් මානසික සෞඛ්‍ය දිනය සැමරීම සඳහා ළමුන් සහ ඔවුන්ගේ දෙමාපියන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

දැනට පවතින සංවර්ධන ව්‍යාපෘති විස්තර

ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තු පිරිවැය (මිලියන)	2022.12.31 වන විට භෞතික ප්‍රගතිය	2022.12.31 වන විට මූල්‍ය ප්‍රගතිය (මිලියන)
1. මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ මානසික ආබාධ වැළැක්වීම			
1.1 ළදරු, ළමා, නව යොවුන් වියේ මානසික සෞඛ්‍ය දිනය	0.02	පේරාදෙණිය සිරිමාවෝ බණ්ඩාරනායක විශේෂිත ළමා රෝහලේදී එක් වැඩසටහනක් පවත්වන ලදී	0.018
1.2. රැස්වීම් පැවැත්වීම පුද්ගලික මානසික සෞඛ්‍ය සේවා සඳහා මාර්ගෝපදේශ සැකසීම සඳහා උපදේශන රැස්වීම	0.166	පෞද්ගලික සෞඛ්‍ය අංශය සමඟ එක් උපදේශන රැස්වීමක් පවත්වන ලදී	0.038
රාජකාරි ලැයිස්තු සහ රැකියා විස්තරය සංවර්ධනය කිරීම සඳහා උපදේශන රැස්වීම් - මානසික සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරි **(MO/MH)** හා මානසික සෞඛ්‍ය කේන්ද්‍රස්ථාන වෛද්‍ය නිලධාරි **(MO/MH -FP)**		මානසික සෞඛ්‍ය පිළිබඳ වෛද්‍ය නිලධාරි හා මානසික සෞඛ්‍ය කේන්ද්‍රස්ථාන වෛද්‍ය නිලධාරි රාජකාරි ලැයිස්තු පිළිබඳ එක් රැස්වීමක් පවත්වන ලද	

ප්‍රචණ්ඩත්වය වැළැක්වීම පිළිබඳ උපදේශන රැස්වීම්		ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සම්බන්ධයෙන් රැස්වීම් දෙකක් පවත්වන ලදී	
මානසික සෞඛ්‍යය පිළිබඳ ජාතික කමිටු රැස්වීම (NCMH) පැවැත්වීම - කාර්තුමය		NCMH - රැස්වීම් දෙකක් පවත්වන ලදී	
ජාතික මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තිය එළිදැක්වීම		ප්‍රතිපත්තිය දියත් කරන ලදී	
1.3 මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම - උපදේශක ප්‍රජා වෛද්‍යවරුන් සඳහා මූලික පුහුණුව	0.034	ප්‍රතිපාදන ලැබී නැත	0
1.4 සකස් කිරීම සහ මුද්‍රණය කිරීම **I.** මානසික සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ නාමාවලිය **II.** සියදිවි නසාගැනීම් වැළැක්වීමේ උපායමාර්ගික සැලැස්ම **III.** පාරිභෝගික සහ සත්කාරක මාර්ගෝපදේශය	0.15	I. මානසික සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ නාමාවලිය - කෙටුම්පත අවසන් කර ඇත - පිරිවැය වැඩි වී ඇති බැවින් මුද්‍රණය සඳහා තවත් අරමුදල් ඉල්ලා සිටීමේ ක්‍රියාවලියේ දී. II. සියදිවි නසාගැනීම් වැළැක්වීමේ උපායමාර්ගික සැලැස්ම - අවසන්. III. පාරිභෝගික සහ සත්කාරක මාර්ගෝපදේශය - අවසන් කර ඇත	0
1.5. සෞඛ්‍ය අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය සඳහා සේවා ස්ථාන මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන - **Happy @ work**	0.021	වැඩසටහන් පහක් පවත්වන ලදී	0.02
2. යටිතල පහසුකම් සහ මානව සම්පත් සංවර්ධනය			
2.1. කුරුණෑගල ශික්ෂණ රෝහල - මානසික සෞඛ්‍ය ඒකකය ප්‍රතිසංස්කරණය කිරීම (1926 සේවාව සැපයීම සඳහා)	2	වැඩ නිම කර ඇත, වවුචර PSSP වෙත යවන ලදී.	2
2.2. කඳාන ප්‍රාදේශීය රෝහල- දිගුකාලීන ඒකකය ප්‍රතිසංස්කරණය කිරීම.	5	වැඩ නිම කර ඇත.	5
2.3. රාගම ළමා මානසික සෞඛ්‍ය ඒකකය ප්‍රතිසංස්කරණය කිරීම සහ ඉදිකිරීම	7	වැඩ ආරම්භ කර ඇත.	7
2.4. ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම / පිහිටුවීම (12) - සැලසුම් කිරීම / සංවේදන රැස්වීම යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ සැපයුම් ප්‍රසම්පාදනය - මධ්‍යස්ථාන 8 ක් (පොල්පිතිගම ඇතුළුව) පිහිටුවීම.	4	ප්‍රතිපාදන ලැබී නැත.	0
2.5. පශ්චාත් සීමාවාසික MO/MH - දිශානති වැඩසටහන සහ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන මොඩියුලය පුහුණු කිරීම.	0.07	වැඩ නිම කර ඇත. (කාණ්ඩ දෙකක් සඳහා)	0.052

2.6. මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ මානසික සෞඛ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතිය **(MHMIS)** පිළිබඳ **MO/MH (FP)** පුහුණු කිරීම.	0.6	වැඩ නිම කර ඇත.	0.475
2.7. ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථානවලට අනුයුක්ත කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.	0.305	MOH දිවුලපිටියේ එක් වැඩසටහනක් පවත්වන ලදී.	0.026
2.8. මානසික රෝග කල්තියා හඳුනා ගැනීම, වළක්වා ගැනීම සහ මානසික සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාථමික සෞඛ්‍ය සේවාවේ වෛද්‍ය නිලධාරීන්ගේ ධාරිතාව ගොඩනැගීම.	0.074	තෙදින වැඩසටහන ගම්පහ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේදී පවත්වන ලදී.	0.074
2.9. මානසික සෞඛ්‍යය පිළිබඳ ප්‍රජා මනෝචිකිත්සක හෙදියන්ගේ ධාරිතාව ගොඩනැගීම	0.6	සම්පූර්ණ කරන ලදී.	0.42
2.10. ආක්‍රමණ කළමනාකරණය පිළිබඳ මානසික සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.	0.03	පානදුර මූලික රෝහල, මිනුවන්ගොඩ මූලික රෝහල, රත්නපුර ශික්ෂණ රෝහල යන ස්ථානවල වැඩසටහන් තුනක් පවත්වන ලදී.	0.06
2.11. සියදිවි නසාගැනීම් වැළැක්වීම - ප්‍රජාව සමඟ ප්‍රථමයෙන් සම්බන්ධ වන හඳුනාගත් නිලධාරීන් සඳහා පුහුණුව	0.9	වැඩසටහන් 12 ක් පවත්වන ලදී (සැලසුම් කළ වැඩසටහන් 25)	0.33
2.12. උපදේශක මනෝ වෛද්‍යවරුන් සඳහා ධාරිතා ගොඩනැගීමේ පුහුණුව	0.7	සම්පූර්ණ කරන ලදී.	0.36
2.13. මීගමුව **DGH** හි වෛද්‍ය නිලධාරීන් පුහුණු කිරීම - මනෝ සමාජීය ගැටළු කළමනාකරණය පිළිබඳ **MOs** හි ධාරිතා ගොඩනැගීමේ පුහුණුව	0.02	සම්පූර්ණ කරන ලදී.	0.03
2.14. පුහුණුකරුවන්ගේ පුහුණුකරුවන් (කාන්තා සහ ළමා කටයුතු සමාජ සවිබල ගැන්වීමේ කාර්ය මණ්ඩලය) මානසික යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන	1.3	සම්පූර්ණ කරන ලදී.	0.61
2.15. මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ක්‍රියාකාරී අංශ පිළිබඳව කාර්ය මණ්ඩලය පුහුණු කිරීම - මිනුවන්ගොඩ මූලික රෝහල	0.03	සම්පූර්ණ කරන ලදී.	0.02
2.16. **1926** උපකාරක මාර්ගයෙන් මානසික සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා නැවුම් පුහුණුව	0.6	ප්‍රතිපාදන ලැබී නැත.	0
3. සියදිවි නසාගැනීම් වැළැක්වීම			
3.1. සියදිවි නසාගැනීම් වැළැක්වීම - විශේෂඥ කමිටු රැස්වීම් පැවැත්වීම	0.045	සියදිවි නසාගැනීම් වැළැක්වීමේ විශේෂඥ කමිටු රැස්වීම් හයක් පැවැත්විණි	0.002

3.2. උපකාරක මාර්ග සංසදය - ජාතික මානසික සෞඛ්‍ය උපකාරක සංසදය පැවැත්වීම, ජාතික තරුණ සේවා සභාව (NYSC) සමඟ රැස්වීම	0.01	එක් ජාතික මානසික සෞඛ්‍ය උපකාරක රැස්වීමක් පැවැත්විණි. NYSC සමඟ උපදේශක රැස්වීමක් පවත්වන ලදී.	0
3.3. ඉහළ මාධ්‍ය නිලධාරීන් සමඟ උපදේශන ව්‍යාපාරය	0.04	සිදු නොකෙරේ, 2023 සඳහා සැලසුම් කරනු ලැබේ	0
4. මද්‍යසාර ඇතුළු ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සහ පාලනය කිරීම			
කිසිදු ක්‍රියාකාරකමක් කර නැත	-	-	-
5. ජාතික මානසික සෞඛ්‍ය වැඩසටහන අධීක්ෂණය සහ ඇගයීම			
5.1. මානසික සෞඛ්‍ය සමාලෝචන (ජාතික/පළාත්/දිස්ත්‍රික්) සහ ක්ෂේත්‍ර චාරිකා සඳහා සහභාගී වී පැවැත්වීම	0.5	යාපනය, මුලතිව්, හම්බන්තොට, කල්මුණේ, මොණරාගල, අම්පාර, රත්නපුර, ගම්පහ, පුත්තලම, කුරුණෑගල, අනුරාධපුර, ගාල්ල, මහනුවර යන ස්ථානවල සමාලෝචන පැවැත් වූ අතර මඩකලපුව, කෑගල්ල, කිලිනොච්චි, පොල්පිතිගම, ගනේවත්ත යන ප්‍රදේශවල ක්ෂේත්‍ර චාරිකා පැවැත්වීය.	0.12
6. අපස්මාරය සහ අනෙකුත් ස්නායු ආබාධ			
6.1. අපස්මාරය සහ අනෙකුත් ස්නායු ආබාධ කළමනාකරණය සඳහා උපාය මාර්ගික රාමුවක් සංවර්ධනය කිරීම	0.015	සැලැස්ම සකස් කිරීම සම්බන්ධයෙන් රැස්වීම් දෙකක් පැවැත්විණි	0

පසුගිය අවුරුදු 5 ක කාර්ය සාධන ප්‍රවණතාවය



රූපය 1- ශ්‍රී ලංකාවේ 2017-2022 කාලය තුළ සියදිවි නසාගැනීම් අනුපාත



රූපය 2 - ශ්‍රී ලංකාවේ 2017-2022 කාලය තුළ රෝහල් ගතවීම් මත පදනම්ව මානසික ආබාධ ඇතිවීමේ ප්‍රවණතාව



රූපය 3 – 2015- 2019 කාලය තුළ තෝරාගත් ස්නායු ආබාධවල ප්‍රවණතාවය

2023 සඳහා සැලසුම් කර ඇති විශේෂ සංවර්ධන කටයුතු

- ජාතික මානසික සෞඛ්‍ය ප්‍රතිපත්තිය 2020-2030 පළාත් මට්ටමින් ක්‍රියාත්මක කිරීම
- මානසික සෞඛ්‍ය සේවා සපයන්නන්ගේ නාමාවලිය සංවර්ධනය කිරීම
- පාරිභෝගික සේවා මාර්ගෝපදේශ සංශෝධනය කිරීම
- උපදේශකයින් සඳහා කුසලතා බෙදාගැනීමේ වැඩසටහන්
- මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය පුහුණු කිරීම "මනෝහාරි වැඩසටහන"
- නින්දවූර්, නාවිතන්වේලි, චෙන්කලඩි, පට්ටිපලෙයි, බුත්තල, සියඹලාණ්ඩුව, ආණමඩුව යන MOH කාර්යාලවල ප්‍රජා සෞඛ්‍ය මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම/ ස්ථාපිත කිරීම
- ප්‍රජාව සමඟ ප්‍රථමයෙන් සම්බන්ධ වන හඳුනාගත් නිලධාරීන් (පොලිස් නිලධාරීන්, AGA කාර්ය මණ්ඩලය, පුහුණුකරුවන්, තරුණ නිලධාරීන්, මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, තාක්ෂණික සහායකයින්, උපදේශකයින්, ඖෂධවේදීන්, අධ්‍යාපන නිලධාරීන් - ගුරුවරුන් ආදී) සඳහා සියදිවි නසාගැනීම් වැළැක්වීම පිළිබඳ පුහුණුව- කුරුණෑගල, කල්මුණේ, මඩකලපුව සහ කෑගල්ල යන ප්‍රදේශවල දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලදී.
- සියදිවි නසාගැනීම් වැළැක්වීම පිළිබඳ කෘෂි රසායන අලෙවි තාක්ෂණික සහකාර පුහුණුව
- 'මානසික ආබාධ සහිත පුද්ගලයන් ඇගයීම, රෝග විනිශ්චය සහ කළමනාකරණය' පිළිබඳ ප්‍රාථමික වෛද්‍ය සේවා ආයතනවල වෛද්‍ය නිලධාරීන්ගේ දිස්ත්‍රික් මට්ටමේ පුහුණුව.
- ක්ෂේත්‍ර අධීක්ෂණය සමඟ දිස්ත්‍රික් මානසික සෞඛ්‍ය සමාලෝචන
- 'පාසල් දරුවන්ගේ මානසික යහපැවැත්ම වැඩිදියුණු කිරීම' පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම
- මානසික සෞඛ්‍ය පිළිබඳ පශ්චාත් සීමාවාසික වෛද්‍ය නිලධාරීන් සඳහා පුහුණුව
- මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය පිළිබඳ උපදේශක ප්‍රජා වෛද්‍යවරුන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීම
- මනෝ චිකිත්සක සමාජ සේවකයින් සඳහා ධාරිතා ගොඩනැගීම පිළිබඳ පුහුණුව

4.2.5 බෝ නොවන රෝග ඒකකය

දැක්ම

බෝ නොවන රෝග, මරණ සහ ආබාධිතයන්ගෙන් බරක් නොවන රටක්

මෙහෙවර

නිදන්ගත හා උග්‍ර බෝ නොවන රෝග (NCDs) හේතුවෙන් රෝගාබාධ, මරණ සහ ආබාධිත වල වැළැක්විය හැකි සහ වළක්වා ගත හැකි බර අඩු කිරීමට දායක වීම සහ ජනගහනය සෞඛ්‍ය, යහපැවැත්ම සහ ඵලදායිතාව සහ බෝ නොවන රෝග පිළිබඳ ඉහළම ප්‍රමිතීන්ට ළඟා වීම සහතික කිරීම. රටේ සමාජ ආර්ථික සංවර්ධනයට තවදුරටත් බාධාවක් නොවේ.

හැඳින්වීම

බෝ නොවන රෝග පාලනය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් බෝ නොවන රෝග යටතට පැමිණේ. එයට අධ්‍යක්ෂ මණ්ඩල තුනක් ඇත: බෝ නොවන රෝග අධ්‍යක්ෂ මණ්ඩලය, ජාතික පිළිකා පාලන හා වැළැක්වීමේ අධ්‍යක්ෂ මණ්ඩලය, මානසික සෞඛ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය.

බෝ නොවන රෝග අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය සාධනය

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාව තුළ බෝ නොවන රෝග (NCDs) පෙර නොවූ විරූ වර්ධනයක් පෙන්නුම් කර ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස සැලකිය යුතු රෝගාබාධ, මරණ සහ ආබාධිත තත්ත්වයන් ඇති වී තිබේ. 2016 වසරේ සිදු වූ සියලුම මරණවලින් 80%කට වඩා NCD හේතුවෙන් සිදු වූ අතර, හෘද වාහිනී රෝග (CVDs) 34%ක් ලෙස මරණ සඳහා ප්‍රධානතම හේතුව වන අතර, පිළිකා (14%), දියවැඩියාව (9%) සහ නිදන්ගත ශ්වසන රෝග (8%) ලෙස වේ. 1980 ගණන්වල සිට ශ්‍රී ලංකාවේ මරණ සඳහා ප්‍රධානතම හේතුව ලෙස රුධිර සංසරණ පද්ධතියේ රෝග පවතින අතර දියවැඩියා රෝගය හේතුවෙන් සිදුවන මරණවල ක්‍රමානුකූල වැඩිවීමක් දක්නට ලැබේ. ඇස්තමේන්තු කර ඇති පරිදි රට තුළ බෝ නොවන රෝග වලින් සෑම වසරකම පුද්ගලයින් 120 000 අකාලයේ මිය යයි. වයස අවුරුදු 30 ත් 70 ත් අතර NCD හේතුවෙන් මරණයට පත්වීමේ සම්භාවිතාව 17% ක් වන අතර, කාන්තාවන්ගේ 13% ට සාපේක්ෂව පිරිමින් තුළ සම්භාවිතාව 22% කි.

රෝගාබාධ සම්බන්ධයෙන් ගත් කල, හෘදයාබාධ හා දියවැඩියා රෝගය හේතුවෙන් රෝහල් ගතවීම් පසුගිය දශක දෙක තුළ ස්ථාවර වැඩිවීමක් පෙන්නුම් කරයි. දියවැඩියාවෙහි ව්‍යාප්තිය වසර ගණනාවක් පුරා වැඩිවන ප්‍රවණතාවක් පෙන්නුම් කරන අතර, පූර්ව දියවැඩියාව ද එවැනිම ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි, බහුතරයක් අනාවරණය කර නොමැත (2). STEPS සමීක්ෂණයට අනුව, වැඩිහිටියන් හතරෙන් එකක් පමණ අධි රුධිර පීඩනයෙන් පෙළෙන අතර වැඩිහිටි ජනගහනයෙන් 14% දියවැඩියා රෝගීන් වේ.

2007 - 2016 සඳහා වන සෞඛ්‍ය ප්‍රධාන සැලැස්ම මගින් බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම ප්‍රමුඛ මැදිහත්වීමක් ලෙස හඳුනාගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයේ විශේෂිත NCD ඒකකයක් පිහිටුවීමට හැකි වූ අතර, බිම් මට්ටම දක්වා බෝ නොවන රෝග කළමනාකරණය සහ වැළැක්වීම සඳහා තාක්ෂණික මගපෙන්වීම් ලබා දෙන ලදී.

බෝ නොවන රෝග හා සම්බන්ධ සියලුම වැඩ අත්‍යවශ්‍යයෙන්ම බහුආංශික වන අතර බෝ නොවන රෝග ප්‍රතිපත්තිය (නවතම 2022) සහ බහුආංශික ක්‍රියාකාරී සැලැස්මක් (නවතම 2023 - 2028) මගින් ආවරණය කෙරේ.

2030 වන විට පහත සඳහන් ඉලක්ක සපුරා ගැනීම ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි

(*2015 දත්ත මූලික අගයන් ලෙස භාවිතා කරයි.)

1. හෘද වාහිනී රෝග, පිළිකා, දියවැඩියා හෝ නිදන්ගත ශ්වසන රෝග වලින් නොමේරූ මරණ අනුපාතය 33% සාපේක්ෂ අඩු කිරීම
2. ප්‍රමාණවත් නොවන ශාරීරික ක්‍රියාකාරකම් වල පැතිරීම 15% සාපේක්ෂ අඩු කිරීම
3. මත්පැන් භාවිතය 20% සාපේක්ෂ අඩු කිරීම

4. ලුණු/සෝඩියම් සාමාන්‍ය ජනගහන පරිභෝජනයෙහි 15% සාපේක්ෂ අඩු වීම
5. වයස අවුරුදු 15 ට වැඩි පුද්ගලයින්ගේ වර්තමාන දුම්කොළ භාවිතයේ ව්‍යාප්තිය 30% කින් සාපේක්ෂ අඩු වීම
6. රුධිර පීඩනය වැඩිවීමේ ව්‍යාප්තිය 25% කින් සාපේක්ෂ අඩු වීම
7. තරබාරුකම සහ දියවැඩියාව වැඩිවීම නතර කිරීම.
8. ආහාර පිසීමේ මූලික මූලාශ්‍රය ලෙස ඝන ඉන්ධන (දැව, බෝග අවශේෂ, වියලන ලද ගොම, ගල් අඟුරු සහ අඟුරු) භාවිතා කරන කුටුම්භවල අනුපාතය 50% කින් සාපේක්ෂ අඩු කිරීම
9. හෘදයාබාධ සහ ආඝාත වැළැක්වීම සඳහා 50% සුදුසුකම් ලත් පුද්ගලයින් ඖෂධ ප්‍රතිකාර සහ උපදේශනය (රුධිර සීනි මට්ටම පාලනය ඇතුළුව) ලබා ගැනීම.
10. රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ප්‍රධාන බෝ නොවන රෝග සඳහා ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය වන සාමාන්‍ය ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය ඖෂධ සහ දැරිය හැකි මිලකට සහ මූලික තාක්ෂණය 80%ක් ලබා ගත හැකි වීම.

1. උපදේශනය, හවුල්කාරිත්වය සහ නායකත්වය

පහත රූපයේ දැක්වෙන්නේ පාර්ශවකරුවන්ගේ මැදිහත්වීමේ යාන්ත්‍රණයයි.



උපදේශනය සහ හවුල්කාරිත්වය යටතේ පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

● බෝ නොවන රෝග සඳහා වන තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම 2023 ජනවාරි 20 වන දින අදාළ වෘත්තීය විද්‍යාලවල අදාළ පාර්ශවකරුවන් සමඟ පැවැත්විණි.

● බෝ නොවන රෝග වැළැක්වීමේ සහ පාලනයේ දිස්ත්‍රික් ප්‍රගතිය ඇගයීම සඳහා මාසික NCD සමාලෝචන ප්‍රායෝගිකව පවත්වන ලදී.

● 2022 සඳහා වාර්ෂික බෝ නොවන රෝග සමාලෝචනය 2023 අප්‍රේල් 3 වන සහ 4 වන දින වල පවත්වන ලදී.

● බෝ නොවන රෝග සඳහා වන ජාතික උපදේශක මණ්ඩලය 2023 අප්‍රේල් 26 වන දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී. මෙම රැස්වීමේදී යහපත් කාන්තා සායනය සහ සුවදිවී මධ්‍යස්ථාන(HLC) ඒකාබද්ධ කිරීම සහ පෞද්ගලික වෛද්‍ය වාර්තා (PMR) හි සිදු කළ යුතු සංශෝධන සහ වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කරන ලදී.

● මෙහෙයුම් කමිටු රැස්වීම් තුනක් 2022 දී සහ දෙකක් 2023 දී මේ දක්වා පවත්වන ලදී.

● බෝ නොවන රෝග සභා රැස්වීම් 2022 දී ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද අතර බෝ නොවන රෝග සභා රැස්වීම 2023 සැප්තැම්බර් මාසයේදී පැවැත්වීමට සැලසුම් කර ඇත.

● දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග සහ ප්‍රාදේශීය ප්‍රජා සෞඛ්‍ය විශේෂඥ වෛද්‍යවරුන් (Regional CCPs) සඳහා WHO හි තාක්ෂණික සහ මූල්‍ය සහාය ඇතිව උපදේශනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. WHO අග්නිදිග ආසියානු කලාපයේ බෝ නොවන රෝග බලපෑම් සමාකරණ මෙවලම මෙම වැඩසටහනේදී හඳුන්වා දෙන ලදී.

පාර්ශවකරුවන් සමඟ රැස්වීම

● ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සාකච්ඡාවක් සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ දී ක්‍රීඩා හා ව්‍යායාම ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරුන්ගේ සහභාගීත්වයෙන් අධ්‍යාපන සහ සේවා ස්ථාන සැකසීම් සඳහා වන ජාතික මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම පිළිබඳ පැවැත්විණි.

● පවුල් සෞඛ්‍ය කාර්යාංශය, විෂන් 2030 ව්‍යාපෘතිය සහ පාසල් වයසේ ළමුන්ගේ දෘෂ්ටි පරීක්ෂණ ආරම්භ කිරීමේ බෝ නොවන රෝග ඒකකය සමඟ උපදේශන රැස්වීම් පවත්වන ලදී.

● කලාප අධ්‍යක්ෂ කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව විනාඩි 20 ක උදෑසන ව්‍යායාම වැඩසටහන සතියකට දෙවතාවක් පුනර්ජීවනය කිරීම පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයට සාර්ථක ලෙස උපදෙස් දෙනු ලැබේ (Ref ED/9/15/02/02). පාසල් ළමුන් අතර ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා දෙමාපියන් සහ නායකයින් වෙනුවෙන් පෙනී සිටීම සඳහා වීඩියෝ සහ පෝස්ටර් බෙදා හැරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ හවුල්කාරිත්වයක් ස්ථාපිත කරන ලදී.

● සියලුම රාජ්‍ය ආයතනවල කෙටි ව්‍යායාම විරාම ක්‍රියාත්මක කිරීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට උපදෙස් දෙනු ලැබිණි.

● බෝ නොවන රෝග වැළැක්වීම සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීම සඳහා බහු අංශයේ පාර්ශවකරුවන් (සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන අංශයේ පාර්ශවකරුවන්) බලමුලු ගැන්වීම සඳහා උපදේශක රැස්වීම් තුනක් සංවිධානය කරන ලදී. මෙම රැස්වීම්වල ප්‍රධාන අරමුණු වූයේ බෝ නොවන රෝග වැළැක්වීම සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සහ උපාය මාර්ග දැනුවත් කිරීම සහ සාමාන්‍ය හා අර්බුදකාරී අවස්ථාවන්හිදී ප්‍රජාවන් අතර පෝෂණ ප්‍රවර්ධන ක්‍රියාමාර්ග සම්බන්ධීකරණය කිරීමයි. මෙම උපදේශන රැස්වීම් පැවැත්වීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය මූල්‍ය ආධාර ලබා දුන්නේය.

● රාජ්‍ය ආයතනවල බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම සඳහා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම සඳහා, නිල රැස්වීම් සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර මෙනු පිළිබඳ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට සහ රැකියා ස්ථාන වල පවත්වාගෙන යන ආපනශාලාවල “බත් පිසීමේදී ලුණු එකතු නොකිරීම” උපාය මාර්ගය අනුගමනය කිරීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමඟ හවුල්කාරිත්වයක් ඇති කර ගන්නා ලදී.මෙම කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් සියලුම රාජ්‍ය ආයතන වෙත චක්‍රලේඛයක් (ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක- 08/2023) නිකුත් කරන ලදී.

● ලෝක තරබාරුකම පිළිබඳ දිනය මේ වසරේ මාර්තු 4 වන දින සමරනු ලැබුවේ වෙනස්වන ඉදිරිදර්ශන: තරබාරුකම ගැන කතා කරමු යන තේමාවෙනි. සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝනොවන රෝග අධ්‍යක්ෂක මණ්ඩලය අන්තරාසර්ග විද්‍යා හා හෘද රෝග විද්‍යාල සමඟ සහයෝගයෙන් මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම සහ ජන මාධ්‍ය සෞඛ්‍ය අධ්‍යාපන සැසි හරහා ප්‍රජාව දැනුවත් කිරීම මෙන්ම කරුණු පත්‍රිකා සහ ඉදිරිපත් කිරීම් සකස් කිරීම සහ බෙදා හැරීම සිදු කරන ලදී. තවද, ප්‍රජා මට්ටමේ දැනුවත් කිරීම් සහ පරීක්ෂණ වැඩසටහන් ක්ෂේත්‍ර මට්ටමේ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ රෝහල් කාර්ය මණ්ඩලය විසින් සියලුම දිස්ත්‍රික්ක වල වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග සමඟ සහයෝගයෙන් පවත්වන ලදී.

● ලෝක අධි රුධිර පීඩනය පිළිබඳ දිනය සහ ලුණු දැනුවත් කිරීමේ සතිය ගෝලීය ප්‍රජාව විසින් වාර්ෂිකව පිළිවෙළින් 2023 මැයි 17 සහ 15 සිට 21 දක්වා සමරනු ලැබේ. මෙම ගෝලීය අනුස්මරණයට

සමගාමීව සෞඛ්‍ය අමාත්‍යාංශයේ බෝ නොවන රෝග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශ්‍රී ලංකා අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාලය සහ ශ්‍රී ලංකා වෛද්‍ය පෝෂණ සංගමය සමඟ එක්ව මාධ්‍ය නාලිකා හරහා මාධ්‍ය හමුවක්, වෙබ් අඩවියක් සහ උපදේශනයක් පවත්වන ලදී. මීට අමතරව, මහජනතාව දැනුවත් කිරීම සඳහා ත්‍රිභාෂාවෙන් කරුණු පත්‍රිකා සකස් කර බෙදා හරින ලදී. මෙම සමරුවලට සමගාමීව ප්‍රජා මට්ටමින් අධි රුධිර පීඩනය සහ ලුණු අඩු කිරීමේ උපාය මාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

● ලෝක සෞඛ්‍ය සංවිධානයේ අරමුදල්වලින් "ශ්‍රී ලංකාවේ දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම සඳහා මාර්ගෝපදේශය" පිටපත් 900 ක් මුද්‍රණය කරන ලදී. ඒවා වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග හරහා සෑම දිස්ත්‍රික්කයකටම සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වෙත බෙදා හරින ලදී. මෙම මාර්ගෝපදේශය සවිස්තරාත්මක විස්තරයක් ඇත

දුම්කොළවලින් තොර කලාපයක් පිහිටුවීමේ ක්‍රියාවලියේ ආරම්භක උපදේශනයේ සිට ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ ඇගයීම දක්වා. පිටු 37කින් යුත් ලේඛනයට රාජ්‍ය ආයතන, රෝහල් සහ සෞඛ්‍ය පහසුකම් සහ අධ්‍යාපන ආයතනවල දුම්කොළ භාවිතය තහනම් කිරීමට අදාළ රෙගුලාසි සහ චක්‍රලේඛ ද ඇතුළත් වේ.

නුගේගොඩ පොදු ප්‍රවාහන මාධ්‍ය දුම්කොළවලින් තොර කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම



*වවුනියාව **MOH** කාර්යාලය **TFZ** ලෙස ප්‍රකාශයට පත් කිරීම / කොළඹ දිස්ත්‍රික්කවල **TFZ** ප්‍රකාශ කිරීම*

● මැයි 31 වෙනිදා ලෝක දුම්කොළ විරෝධී දිනය සමරන ලදී. බෝ නොවන රෝග අධ්‍යක්ෂක මණ්ඩලය සම්පත් පුද්ගලයින් තිදෙනෙකු සමඟ සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේදී මාධ්‍ය හමුවක්

පවත්වන ලදී. කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ප්‍රජා වෛද්‍ය අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය වෛද්‍ය මනුජ පෙරේරා මහතා දුම්කොළ සහ දුම් රහිත දුම්කොළ යන දෙඅංශයේම භාවිතයේ ව්‍යාප්තිය සහ බර පිළිබඳව කතා කළේය. දුම්කොළ භාවිතයේ සෞඛ්‍යයට අහිතකර බලපෑම් පිළිබඳව වැලිසර ජාතික ශ්වසන රෝග පිළිබඳ රෝහලේ නියුතු වෛද්‍ය වසන්ත ගුණසිංහ මහත්මිය අදහස් දැක්වූවාය. ඇය දුම්කොළ භාවිතයේ සියලුම අවයව හා පද්ධතිමය බලපෑම්, ශ්වසන රෝග පමණක් නොව සඳහන් කළාය. කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මනෝ වෛද්‍ය අංශයේ ප්‍රධානී ආචාර්ය චතුරි සුරවීර දුම්පානය නතර කිරීමේ මනෝවිද්‍යාත්මක පැතිකඩ සහ දුම්පානය නතර කිරීමට වෛද්‍ය උපකාර ලබා ගන්නා පුද්ගලයන්ට ඇති සම්පත් පිළිබඳව අවධාරණය කළේය. මාධ්‍ය හමුවට සමගාමීව, වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග විසින් ලෝක දුම්කොළ නිවාරණ දිනය (WORLD NO TOBACCO DAY) සැමරීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ ක්‍රියාකාරකම් කිහිපයක් සංවිධානය කරන ලදී. TFZ 100 ක් ප්‍රකාශයට පත් කිරීමේ ක්‍රියාවලිය රට පුරා ආරම්භ කරන ලදී.

2. සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ අවදානම් අවම කිරීම

● ළමුන් අතර ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා පවතින රෙගුලාසි ක්‍රියාත්මක කිරීමේ සන්නිවේදන ව්‍යාපාරයක් දියත් කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. මෙම සන්නිවේදන ව්‍යාපාරය සඳහා සකස් කරන ලද වීඩියෝ සහ පෝස්ටර් ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා ඉහළ නිලධාරීන්, ගුරුවරුන් සහ දෙමාපියන් වෙනුවෙන් පෙනී සිටිනු ඇත.

● ජීවන රටාවට ශාරීරික ක්‍රියාකාරකම් ඇතුළත් කිරීමේ වැදගත්කම සහ ප්‍රායෝගික ක්‍රම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රජාව සහ සේවා ස්ථාන සැකසීම් ඉලක්ක කර ගනිමින් සමාජ මාධ්‍ය සහ ඩිජිටල් පුවරු හරහා ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සන්නිවේදන ව්‍යාපාරයක් (වීඩියෝ සංවර්ධනය කිරීම) සැලසුම් කිරීම සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීමක් පවත්වන ලදී.

රැස්වීමේදී කෙටි ව්‍යායාම විවේකයක්

● අප්‍රේල් මාසයේ Move More මාසය සැමරීම සිදු කරන ලදී. මෙම මාසය තුළ සියත, ශක්ති, ටීවී 1, සිරසටීවී, ශ්‍රද්ධා ටීවී / රේඩියෝ: ලක්විරු එෆ් එම් /මව්බිම ඔස්සේ ජනමාධ්‍ය ඔස්සේ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර අප්‍රේල් මාසයේ ඩේලි එක්ස්ප්‍රස් පුවත්පත් ලිපි පළ විය. අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා ක්‍රීඩා වෛද්‍ය සංගමයේ පාර්ශවකරුවන් සමඟ මාධ්‍ය සාකච්ඡා

දෙකක් පවත්වන ලදී. වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග හි මගපෙන්වීම ඇතිව සෞඛ්‍ය සම්පන්න ජීවන රටා මධ්‍යස්ථාන සහ සේවා ස්ථානවල නව ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන් ආරම්භ කරන ලදී.

උපදේශක ප්‍රජා වෛද්‍යවරයා ශක්ති රූපවාහිනියේ කතා කරයි

මාධ්‍ය වැඩසටහනකදී ප්‍රජා වෛද්‍ය විද්‍යාව පිළිබඳ රෙජිස්ට්‍රාර්

● බෝ නොවන රෝග අධ්‍යක්ෂක මණ්ඩලයේ මගපෙන්වීම ඇතිව ජාතික පිළිකා මර්දන වැඩසටහනේ සහ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන් ආරම්භ කරන ලදී.

● මුදල් හා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය බෝනොවන රෝග අධ්‍යක්ෂක මණ්ඩලයේ මගපෙන්වීම යටතේ පසුගිය වසරේ ආරම්භ කළ ඔවුන්ගේ වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරයි.

රාජ්‍ය පරිපාලනයේ ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන ආරම්භ කිරීම

● සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් සහ ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සන්නිවේදන ව්‍යාපාරය දියත් කිරීම

පාසල් දරුවන් අතර සෞඛ්‍ය සම්පන්න ආහාර සහ ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මූල්‍ය රෙගුලාසි වෙනුවෙන් පෙනී සිටීමේ සන්නිවේදන ව්‍යාපාරයක් 2023 මාර්තු 3 වන දින දියත් කරන ලදී. සෞඛ්‍ය සම්පන්න ආහාර ප්‍රවර්ධනය පිළිබඳ පෝස්ටර් තුනක් සහ කෙටි වීඩියෝ (ත්‍රෛභාෂා) පහක් දියත් කර සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කර අදාළ පාර්ශවකරුවන් සමඟ බෙදා ගන්නා ලදී.

දුම්කොළවලින් තොර ජීවන රටාවක් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රජා දැනුවත් කිරීමේ ව්‍යාපාර පවත්වන ලදී.

පොළොන්නරුවේ සිසුන් විසින් පවත්වනු ලබන දුම්කොළ විරෝධී ව්‍යාපාරයේ වීදි නාට්‍යයකට සහභාගී වූ සිසුන්

3. බෝ නොවන රෝග සහ ඒවායේ අවදානම් සාධක කල්තියා හඳුනා ගැනීම සහ කළමනාකරණය කිරීම සඳහා සෞඛ්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම

● නේවාසික දින 5ක වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග ධාරිතාව ගොඩනැගීම සහ මාර්ගෝපදේශ පුහුණුව 2023 පෙබරවාරි 27 සිට මාර්තු 3 දක්වා SLIDA හිදී සාර්ථකව පවත්වන ලදී. පුහුණු වැඩසටහන දේශන, අන්තර් ක්‍රියාකාරී සැසි සහ කණ්ඩායම් වැඩ සමඟින් නිදන්ගත බෝ නොවන රෝග සහ අනතුරු වැළැක්වීම යන අංශ දෙකෙන්ම සමන්විත විය. පූර්ව පරීක්ෂණය සහ පශ්චාත් පරීක්ෂණය අනුව, වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග පිළිබඳ දැනුම වැඩි දියුණු වී ඇත.

● බෝ නොවන රෝග පරීක්ෂණ සහ කළමනාකරණ මාර්ගෝපදේශ පුහුණුව මාර්තු 29 දින කිලිනොච්චිය සහ මුලතුව් දිස්ත්‍රික්කයේ අභ්‍යන්තර වෛද්‍ය විද්‍යාලයේ සහයෝගීතාව ඇතිව සිදු කරන ලදී.

● අධ්‍යාපනික සැකසුම් (පෙර පාසල්, පාසල් සහ උසස් අධ්‍යාපන ආයතන) සහ සේවා ස්ථානවල ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ මාර්ගෝපදේශ අනුකමිටුවල අදාළ පාර්ශවකරුවන්ගේ එකඟතාවයෙන් අවසන් කරන ලදී.

● බෝ නොවන රෝග පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය මගින් 2023 ජනවාරි 18 වැනි දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී බෝ නොවන රෝග වැළැක්වීමේ සහ පාලන ක්‍රියාකාරකම්වල යෙදී සිටින පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ කේන්ද්‍රස්ථාන සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) වැඩසටහන පවත්වන ලදී. බෝ නොවන රෝග ඒකකය. ToT වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ බෝ නොවන රෝග වැළැක්වීම සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර

වේලක් ප්‍රවර්ධනය කිරීම සඳහා බෝ නොවන රෝග වල පළාත් සහ ප්‍රාදේශීය උපදේශක ප්‍රජා වෛද්‍යවරුන් සහ වෛද්‍ය නිලධාරීන්ගේ ධාරිතාව ගොඩනැගීමයි. මෙම පුහුණු වැඩසටහන සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් පිළිබඳ පුහුණු අත්පොත මත පදනම් වූ අතර ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතනවල සුව දිවි මධ්‍යස්ථාන කාර්ය මණ්ඩලය පුහුණු කිරීම,සහ ඔවුන්ගේ පෝෂණ තත්ත්වය සහ කළමනාකරණය පිලිබඳ කෙටි තක්සේරුවක් අනුගමනය කරමින් සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් පරිභෝජනය කිරීම පිළිබඳව තම සේවා දායකයන්ට උපදෙස් දීම සඳහා අවශ්‍ය තාක්ෂණික අංශ සහ කුසලතා ආවරණය කරන ලදී.

- කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කවල සෞඛ්‍ය සම්පන්න ජීවන රටා මධ්‍යස්ථානවල මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ වෛද්‍ය නිලධාරීන් පුහුණු කිරීමේදී ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය පිළිබඳ තාක්ෂණික මාර්ගෝපදේශ ලබා දෙන ලදී.
- ප්‍රාථමික සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් තුනක් බස්නාහිර පළාතේ දිස්ත්‍රික්ක තුන තුළ පවත්වන ලදී. කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කවල සෞඛ්‍ය සම්පන්න ජීවන රටා සායනවල සිටින සියලුම වෛද්‍ය නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය හෙද නිලධාරීන් කෙටි සෞඛ්‍ය හා පෝෂණ තත්ත්වය තක්සේරුවකින් පසු සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ගැනීම සඳහා තම සේවාදායකයින්ට උපදෙස් දීමට පුහුණු කරන ලදී. පුහුණු අන්තර්ගතය සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සම් පදම් කිරීමේ අත්පොත මත පදනම් විය. මෙම පුහුණුවීම් සඳහා මූල්‍ය ආධාර ලබා දුන්නේ ලෝක සෞඛ්‍ය සංවිධානය විසිනි

● සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාථමික සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා පුහුණු අත්පොත මුද්‍රණය කිරීම සහ බෙදා හැරීම



ප්‍රාථමික සෞඛ්‍ය සේවා සපයන්නන් සඳහා සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ පුහුණු අත්පොත්වල පිටපත් එක් දහස් පන්සියයක් ලෝක ආහාර වැඩසටහනේ මූල්‍ය ආධාර මත මුද්‍රණය කරන ලදී. මෙම පුහුණු අත්පොත සැලසුම් කර ඇත්තේ ප්‍රධාන පුහුණුකරුවන් (පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ උපදේශක ප්‍රජා වෛද්‍යවරුන්, බෝ නොවන රෝග පිළිබඳ වෛද්‍ය නිලධාරීන් - වෛද්‍ය නිලධාරී -බෝ නොවන රෝග, සහ රෝහල් වල බෝ නොවන රෝග වෛද්‍ය නිලධාරීන්) හට සුවදිවි මධ්‍යස්ථාන වලට අනුබද්ධ ප්‍රාථමික සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය පුහුණු කිරීමට, සුව

දිවි මධ්‍යස්ථාන වලට පැමිණෙන ප්‍රජාවට සෞඛ්‍ය සම්පන්න ආහාර වේලක් පිලිබඳ ප්‍රවර්ධනය කිරීමට භාවිතා කිරීමටය.

කොළඹ, ගම්පහ, කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල සෞඛ්‍ය සම්පන්න ජීවන රටා මධ්‍යස්ථානවල සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය සඳහා පුහුණුකරුවන්ගේ වැඩසටහන් එක්දින පුහුණුව සඳහා බෝනොවන රෝග අධ්‍යක්ෂක මණ්ඩලය පහසුකම් සලසා ඇත. මෙම මුලපිරීම සැලසුම් කර ඇත්තේ වෛද්‍ය නිලධාරීන් සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් අතර උපදේශන සහ මැදිහත්වීමේ කුසලතා වර්ධනය කිරීම සඳහා වන අතර එමගින් මිනිසුන්ට දුම්පානය නතර කිරීම සඳහා කෙටි මැදිහත්වීමක් කිරීමට ඔවුන්ට හැකි වේ. මෙම පුහුණු වැඩසටහන් මගින් පුහුණුකරුවන් 53 දෙනෙකු බිහි විය. ද්‍රව්‍ය සහ පුහුණු මාර්ගෝපදේශ කලින් බෙදා ගන්නා ලදී. පුහුණුවේ කොටසක් ලෙස භූමිකා නාට්‍ය, කණ්ඩායම් සාකච්ඡා සහ අන්තර් ක්‍රියාකාරී සැසි පවත්වන ලදී. ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීම සහ ක්ෂණික ප්‍රතිචාරය සතුටුදායක වූ අතර මුදලට වටිනාකමක් පෙන්නුම් කළේය.

4. නිරීක්ෂණ, අධීක්ෂණය, ඇගයීම සහ පර්යේෂණ

● 2023 ජූනි 8 වන දින සුවදිවි සායන අධීක්ෂණ චාරිකාවක් සුවදිවි සායන කාර්යයේ හිඩැස් හඳුනා ගැනීමට සහ ප්‍රගතිය සඳහා දෙල්කඳ සුවදිවි සායන වෙත සිදු කරන ලදී.

● පුත්තලම දිස්ත්‍රික්කයේ සුවදිවි සායන සමාලෝචනයට බෝනොවන රෝග ඒකකයේ සැලසුම් අංශයේ උපදේශක සහ වෛද්‍ය නිලධාරියෙක් සහභාගී විය. ගැටළු සහිත ක්ෂේත්‍ර කිහිපයක් හඳුනාගෙන ඇත.

● පුත්තලම දිස්ත්‍රික්කයේ බෝනොවන රෝග සමාලෝචනයට සැලසුම් අංශයේ උපදේශක සහ වෛද්‍ය නිලධාරියෙකු සහභාගී විය.

● ජූනි මස 16 වැනි දින අධීක්ෂණ චාරිකාවක් කෑගල්ල ප්‍රදේශයේ සිදු කරන ලද අතර සුවදිවි සායන ආයතන තුනක නිරීක්ෂණ චාරිකාවක් සිදු කරන ලදී.

● දිස්ත්‍රික් මට්ටමින් පවත්වනු ලබන වැඩසටහන් බෝනොවන රෝග පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන් සංවර්ධනය කරන ලද Google Sheets හරහා නිරන්තර යාවත්කාලීන කිරීම් හරහා අධීක්ෂණය කරන ලදී.

● 2022 වසරේ බෝනොවන රෝග අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආරම්භ කරන ලද ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන නිරීක්ෂණය කිරීම සඳහා 2023 මැයි මාසයේදී, බෝ නොවන රෝග අධ්‍යක්ෂ මණ්ඩලයේ කණ්ඩායමක් ජාතික පිළිකා පාලන වැඩසටහනට පැමිණියහ.

● බෝනොවන රෝග අධ්‍යක්ෂක මණ්ඩලය යටතේ කේන්ද්‍රස්ථාන පුහුණු කරන ලද ආයතනවල WhatsApp වැනි සමාජ මාධ්‍ය භාවිතයෙන් සේවා ස්ථාන සැකසීම් වල ශාරීරික ක්‍රියාකාරකම් වැඩසටහන් නිරීක්ෂණය කරන ලදී.

බෝනොවන රෝග හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජාතික පිළිකා මර්දන වැඩසටහන හි අධීක්ෂණ වැඩසටහන

විශේෂ ව්‍යාපෘති

Resolve to Save Lives මගින් ලබා දුන් ව්‍යාපෘතිය.

2020 දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (බෝ නොවන රෝග) කාර්යාලයට අධි රුධිර පීඩනය කළමනාකරණය කිරීම සඳහා සරල ප්‍රොටෝකෝල සංවර්ධනය කිරීම සහ රෝගීන් පසු විපරම් කිරීම සඳහා සෞඛ්‍ය තොරතුරු පද්ධතියක් ඒකාබද්ධ කිරීම සඳහා 'ජීවිත සුරැකීමට විසඳුම්' වෙතින් පර්යේෂණ ප්‍රදානයක් ලැබුණි. මෙම ව්‍යාපෘතිය 2022 ජනවාරි මස සිට කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රාථමික සත්කාර රෝහල් 3 ක නියමු ලෙස ක්‍රියාත්මක කරන ලදී. 2023 අප්‍රේල් මාසයේදී මෙම ව්‍යාපෘතිය කළුතර දිස්ත්‍රික්කයේ තවත් ප්‍රාථමික සත්කාර රෝහල් 11 ක් දක්වා ව්‍යාප්ත කරන ලදී.

ජයග්‍රහණ

- අධි රුධිර පීඩනය කළමනාකරණය සඳහා සරල ප්‍රොටෝකෝලයක් සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.
- චලංගු රුධිර පීඩන උපාංග, android දුරකථන සහ රූපවාහිනී (සෞඛ්‍ය අධ්‍යාපනය සඳහා) ව්‍යාපෘති රෝහල් වෙත සපයන ලදී.
- ජීවන රටාව වෙනස් කිරීම සහ අධි රුධිර පීඩන කළමනාකරණ මාර්ගෝපදේශ පිළිබඳව සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
- උපදේශන මාර්ගෝපදේශය සංවර්ධනය වෙමින් පවතින අතර එය 2023 දී ක්‍රියාත්මක කෙරේ.
- පාරිභෝගික තෘප්තිමත් සමීක්ෂණය සහ සායනික විගණනය නියමු රෝහල්වල සිදු කරන ලද අතර හොඳ ප්‍රතිචාරයක් පෙන්නුම් කරයි.
- දැනට සියලුම පහසුකම් සාමාන්‍ය රුධිර පීඩන පාලන අනුපාතය 58% ක් වන අතර මඟ හැරුණු පැමිණීම් අනුපාතය 13% ක් පමණි.

STEPS සමීක්ෂණය 2021

හැඳින්වීම

STEP surveillance යනු රටක බෝනොවන රෝග තත්ත්වය තක්සේරු කිරීමේදී භාවිතා කරන නිරීක්ෂණ යාන්ත්‍රණයකි. බෝනොවන රෝග අවදානම් සාධක නිරීක්ෂණ සඳහා STEPwise ප්‍රවේශය ජනගහනය පදනම් කරගත් ජාතික සමීක්ෂණයක් වන අතර, රට තුළ බෝනොවන රෝග හි බර තීරණය කිරීම සඳහා ජනගහනය අතර දැනටමත් ස්ථාපිත අවදානම් සාධක පිළිබඳ දත්ත ලබා ගැනීම අරමුණු කරයි. මෙම සමීක්ෂණය අනුක්‍රමික ක්‍රියාවලියක් වන අතර එහිදී සම්මුඛ පරීක්ෂක විසින් පරිපාලනය කරන ලද ප්‍රශ්නාවලියක් හරහා බෝනොවන රෝග අවදානම් සාධක පිළිබඳ ප්‍රධාන තොරතුරු ලබා ගැනීමෙන් සමීක්ෂණය ආරම්භ කරනු ලැබේ, පසුව මානවමිතික මිනුම් ලබාගෙන පසුව ජෛව රසායනික විශ්ලේෂණය සඳහා රුධිර සාම්පල ලබා ගනී. මෙම සමීක්ෂණය සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ අධ්‍යයනයට සහභාගී වූවන්ගේ පවුල්වල සමාජ-ජනවිකාස දත්ත, මානවමිතික මිනුම්, මුත්‍රා සාම්පල එකම සැකසුමක එකතු කර සායන පසුබිමක රුධිර සාම්පල ලබා ගැනීමයි.

කොවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් සමීක්ෂණය 2021 සහ 2022 දී සිදු කරන ලද අතර දත්ත විශ්ලේෂණය සහ වාර්තා ලිවීම 2023 දී අවසන් කරන ලදී. කරුණු පත්‍රිකාව 2021 STEPS සමීක්ෂණයේ ප්‍රධාන සොයාගැනීම් සපයයි.

වයස අවුරුදු 18-69 දක්වා වැඩිහිටියන්ගේ ප්‍රතිඵල (95% විශ්‍රම්භ ප්‍රාන්තරය සහිතව)	ගැහැණු පිරිමි දෙපාර්ශවයම	පිරිමි	ගැහැණු
1 පියවර දුම්කොළ භාවිතය			
දැනට දුම්වැටි භාවිතා කරන්නන්ගේ ප්‍රතිශතය	**14.1%** (13.0– 15.3)	**30.2%** (27.9– 32.4)	**0.2%** (0.0– 0.4)
දැනට දිනපතා දුම්වැටි භාවිතා කරන්නන්ගේ ප්‍රතිශතය	**10.0%** (9.0-11.0)	**21.3%** (19.3-23.4)	**0.1%** (0.0-0.2)
දැනට දුම් රහිත දුම්කොළ භාවිතා කරන්නන්ගේ ප්‍රතිශතය	**17.5%** (16.2-18.8)	**30.3%** (28.0-32.6)	**6.4%** (5.4-7.3)
දැනට දිනපතා දුම් රහිත දුම්කොළ භාවිතා කරන්නන්ගේ ප්‍රතිශතය	**10.9%** (9.9-11.9)	**19.7%** (17.7-21.6)	**3.2%** (2.5-3.9)
දැනට දුම්කොළ භාවිතා කරන්නන්ගේ ප්‍රතිශතය (දුම්වැටි/ දුම් රහිත දුම්කොළ)	**26.2%** (24.7-27.7)	**48.9%** (46.4-51.5)	**6.5%** (5.5-7.4)
දැනට දිනපතා දුම්කොළ භාවිතා කරන්නන්ගේ ප්‍රතිශතය (දුම්වැටි/ දුම් රහිත දුම්කොළ)	**18.5%** (17.3-19.8)	**36.0%** (33.6-38.4)	**3.4%** (2.6-4.1)
කොටිනින් 200 පරීක්ෂණය (මුත්‍රා වල නිකොටින් අන්තර්ගත වීම) ධනාත්මක වූ ප්‍රතිශතය	**27.3%** (25.6-28.9)	**47.6%** (44.9-50.3)	**9.9%** (8.5-11.4)
දැනට දිනපතා දුම්වැටි භාවිතා කරන්නන්			
දුම් පානය ආරම්භ කළ සාමාන්‍ය වයස (අවුරුදු)	**20.6** (20.0-21.1)	**20.5** (19.9-21.0)	--
දිනපතා දුම්පානය කරන්නන් අතරෙන් නිෂ්පාදිත සිගරට් භාවිතා කරන ප්‍රතිශතය	**70.5%** (65.7-75.3)	**70.9%** (66.1-75.7)	--
දිනකට භාවිතා කරන නිෂ්පාදිත සිගරට් සංඛ්‍යාවේ මධ්‍යන්‍යය (නිෂ්පාදිත සිගරට් භාවිතා කරන්නන් විසින්)	**3.7** (3.4-4.1)	**3.7** (3.4-4.1)	--
1 පියවර මධ්‍යසාර භාවිතය			
ජීවිත කාලය පුරාම මධ්‍යසාර භාවිතා නොකළ ප්‍රතිශතය	**65.1%** (63.4-66.7)	**34.2%** (31.7-36.6)	**91.9%** (90.7-93.1)
පසුගිය මාස 12 තුල මධ්‍යසාර භාවිතා නොකළ ප්‍රතිශතය	**8.2%** (7.4-9.1)	**11.5%** (10.1-12.9)	**5.4%** (4.4-6.3)

දැනට මධ්‍යසාර භාවිතා කරන ප්‍රතිශතය (පසුගිය දින 30 තුල මධ්‍යසාර භාවිතා කළ)	20.7% (19.5-22.0)	43.3% (40.9-45.6)	1.2% (0.7-1.6)
දැනට අධික ලෙස මධ්‍යසාර භාවිතා කරන ප්‍රතිශතය (පසුගිය දින 30 තුල එක් වරකදී සම්මත මධ්‍යසාර ඒකක 6ක් හෝ ඊට වැඩියෙන් භාවිතා කළ)	7.1% (6.2-7.9)	15.1% (13.3-16.8)	0.3% (0.1-0.5)
1 පියවර ආහාරය			
සාමාන්‍ය සතියක පළතුරු ආහාරයට ගත් දින ගණනේ මධ්‍යන්‍යය	3.4 (3.4-3.5)	3.4 (3.3-3.5)	3.5 (3.4-3.6)
සාමාන්‍යයෙන් දිනක් තුල ආහාරයට ගත් ගත් සම්මත පළතුරු ප්‍රමාණයේ මධ්‍යන්‍යය	1.2 (1.2-1.3)	1.2 (1.2-1.3)	1.3 (1.2-1.3)
සාමාන්‍ය සතියක එළවළු ආහාරයට ගත් දින ගණනේ මධ්‍යන්‍යය	6.5 (6.5-6.6)	6.5 (6.4-6.5)	6.6 (6.5-6.6)
වයස අවුරුදු 18-69 දක්වා වැඩිහිටියන්ගේ ප්‍රතිඵල (95% විශ්‍රම්භ ප්‍රාන්තරය සහිතව)	ගැහැණු පිරිමි දෙපාර්ශවයම	පිරිමි	ගැහැණු
සාමාන්‍යයෙන් දිනක් තුල ආහාරයට ගත් ගත් සම්මත එළවළු ප්‍රමාණයේ මධ්‍යන්‍යය	3.3 (3.2-3.5)	3.3 (3.2-3.4)	3.4 (3.2-3.5)
සාමාන්‍යයෙන් දිනක් තුල ආහාරයට ගත් ගත් සම්මත ප්‍රමාණ 5 කට අඩු සංඛ්‍යාවක් ආහාරයට ගත් ප්‍රතිශතය	67.8% (66.1-69.6)	68.1% (65.7-70.5)	67.6% (65.5-69.7)
ආහාර ගැනීමට වහාම පෙර හෝ ආහාර ගන්නා අතරතුර හැම විටම හෝ බොහෝ විට ආහාරයට ලුණු හෝ ලුණු සහිත සෝස් එක් කරන ප්‍රතිශතය	3.5% (2.8-4.2)	3.4% (2.6-4.3)	3.6% (2.8-4.4)
හැම විටම හෝ බොහෝ විට ලුණු අධික, සකස් කළ ආහාර කෑමට ගන්නා ප්‍රතිශතය	8.2% (7.2-9.2)	8.1% (6.7-9.4)	8.3% (7.2-9.5)
බත් පිසින විට එයට ලුණු එක් කරන ප්‍රතිශතය	55.3% (53.7-56.9)	57.8% (55.6-60.1)	53.1% (51.1-55.1)
එක් පුද්ගලයෙක් දිනකට භාවිතා කරන ලුණු ප්‍රමාණයේ මධ්‍යන්‍යය (ග්‍රෑම්) (ජනගහනයේ පැය 24 ක ලුණු භාවිතය ගණනය කිරීම සඳහා සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් එම අවස්ථාවේදීම ලබා ගත් මුත්‍රා සාම්පලයක සෝඩියම් සහ ක්‍රියැටිනින් ප්‍රමාණය යොදා ගෙන කවසාකි සමීකරණය අනුව ගණනය කරන ලදී)	14.2 (14.0-14.4)	15.1 (14.8-15.4)	13.5 (13.3-13.7)
එක් පුද්ගලයෙක් දිනකට භාවිතා කරන ලුණු ප්‍රමාණයේ මධ්‍යන්‍යය (ග්‍රෑම්)	8.5 (8.5- 8.6)	9.7 (9.5- 9.8)	7.6 (7.5- 7.7)

(ජනගහනයේ පැය 24 ක ලුණු භාවිතය ගණනය කිරීම සඳහා සමීක්ෂණයට සහභාගීවූවන්ගෙන් එම අවස්ථාවේදීම ලබා ගත් මුත්‍රා සාම්පලයක සෝඩියම් සහ ක්‍රියැටිනින් ප්‍රමාණය යොදා ගෙන ඉන්ටසෝල්ට් සමීකරණය අනුව ගණනය කරන ලදී)			
1 පියවර ශාරීරික ක්‍රියාකාරකම්			
ශාරීරික ක්‍රියාකාරකම් වල අඩුවෙන් යෙදෙන (සතියකට මිනිත්තු 150 කට වඩා අඩුවෙන් මධ්‍යම තිව්‍රතාවයෙන් ශාරීරික ක්‍රියාකාරකම් හෝ සමාන ක්‍රියාකාරකම් වල යෙදෙන) ප්‍රතිශතය*	34.8% (33.1-36.4)	24.2% (22.1-26.3)	43.9% (41.8-46.0)
සාමාන්‍යයෙන් දිනකට ශාරීරික ක්‍රියාකාරකම් වල යෙදෙන වෙලාවේ මධ්‍යස්ථය (මිනිත්තු) (අන්තර්චාතුර්ථික අන්තරය සමඟ)	64.3 (2.9-257.1)	154.3 (21.4-385.7)	30.0 (0.0-130.0)
ඉහල තිව්‍රතාවයෙන් ශාරීරික ක්‍රියාකාරකම් වල නොයෙදෙන ප්‍රතිශතය	73.4% (71.8-74.9)	55.4% (53.0-57.9)	88.9% (87.6-90.2)
විනෝදය සඳහා ශාරීරික ක්‍රියාකාරකම් වල නොයෙදෙන ප්‍රතිශතය	87.2% (86.1-88.4)	82.2% (80.2-84.2)	91.6% (90.5-92.7)

* අඩු ශාරීරික ක්‍රියාකාරකම් යන්නෙහි අර්ථ දැක්වීම් සඳහා ගෝලීය ශාරීරික ක්‍රියාකාරකම් ප්‍රශ්නාවලිය විශ්ලේෂණ මාර්ගෝපදේශය (https://www.who.int/teams/noncommunicable-diseases/surveillance/systems-tools/physical-activity-surveillance) හෝ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සෞඛ්‍ය සඳහා ශාරීරික ක්‍රියාකාරකම් සඳහා වූ ගෝලීය නිර්දේශ (https://www.who.int/news-room/fact-sheets/detail/physical-activity) බලන්න.

-- : අර්ථවත් අගයක් ලබා දීම සඳහා සංඛ්‍යාව ප්‍රමාණවත් නොවේ

වයස අවුරුදු 18-69 දක්වා වැඩිහිටියන්ගේ ප්‍රතිඵල (95% විශ්‍රම්භ ප්‍රාන්තරය සහිතව)	ගැහැණු පිරිමි දෙපාර්ශවයම	පිරිමි	ගැහැණු
1 පියවර ගැබ් ගෙල සහ පියයුරු පිළිකා සඳහා පරීක්ෂාව			
වයස අවුරුදු 30 – 49 දක්වා වයස් වල කාන්තාවන්ගෙන් කෙදිනක හෝ ගැබ් ගෙල පිළිකා සඳහා පරීක්ෂා කර ගත් ප්‍රතිශතය			40.2% (37.3-43.1)
වයස අවුරුදු 35 – 45 දක්වා වයස් වල කාන්තාවන්ගෙන් කෙදිනක හෝ ගැබ් ගෙල පිළිකා සඳහා පරීක්ෂා කර ගත් ප්‍රතිශතය			51.7% (48.0-55.4)
වයස අවුරුදු 30 – 49 දක්වා වයස් වල කාන්තාවන්ගෙන් කෙදිනක හෝ පියයුරු වල ඇති ගැටිති සොයා ගැනීම සඳහා ස්වයං පියයුරු පරීක්ෂාව සිදු කර ඇති ප්‍රතිශතය			36.6% (33.9-39.2)

2 පියවර භෞතික මිනුම්			
ශරීර ස්කන්ධ දර්ශකයේ මධ්‍යන්‍යය (kg/m^2)	**24.2** **(24.0-24.3)**	**23.1** **(22.9-23.3)**	25.1 (24.8-25.3)
අධි බර සහිත ප්‍රතිශතය (ශරීර ස්කන්ධ දර්ශකය **25** kg/m^2 ට සමාන හෝ වැඩි)	**39.4%** **(37.9-40.9)**	**30.0%** **(27.7-32.3)**	47.6% (45.5-49.6)
ස්ථූලතාවය සහිත ප්‍රතිශතය (ශරීර ස්කන්ධ දර්ශකය 30 kg/m^2 ට සමාන හෝ වැඩි)	**11.0%** **(10.0-12.0)**	**6.3%** **(5.1-7.4)**	15.2% (13.6-16.7)
වයස අවුරුදු 18-69 දක්වා වැඩිහිටියන්ගේ ප්‍රතිඵල (95% විශ්‍රම්භ ප්‍රාන්තරය සහිතව)	ගැහැණු පිරිමි දෙපාර්ශවයම	පිරිමි	ගැහැණු
සාමාන්‍ය ඉන වට ප්‍රමාණය (cm)		**85.3** **(84.6-86.0)**	86.4 (85.8-87.1)
සංන්‍යස්ත පීඩනයේ මධ්‍යන්‍ය (රසදිය මිලිමීටර්), අධි රුධිර පීඩනය සඳහා දැනට ප්‍රතිකාර ලබා ගන්නා අය ද ඇතුලත්ව	**128.5** **(127.9-129.2)**	**130.3** **(129.4-131.3)**	127.0 (126.1-127.9)
වින්‍යස්ත පීඩනයේ මධ්‍යන්‍ය (රසදිය මිලිමීටර්), අධි රුධිර පීඩනය සඳහා දැනට ප්‍රතිකාර ලබා ගන්නා අය ද ඇතුලත්ව	**80.5** **(80.1-81.0)**	**81.9** **(81.3-82.6)**	79.3 (78.8-79.9)
රුධිර පීඩනය වැඩි අයගේ ප්‍රතිශතය (සංන්‍යස්ත පීඩනය රසදිය මිලිමීටර් 140 ට සමාන හෝ වැඩි සහ/හෝ වින්‍යස්ත පීඩනය රසදිය මිලිමීටර් 90 ට සමාන හෝ වැඩි හෝ දැනට අධි රුධිර පීඩනය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා)	**34.8%** **(33.3-36.3)**	**35.8%** **(33.4-38.2)**	34.0% (32.0-35.9)
සමස්ත ජනගහනයෙන් දැනට අධි රුධිර පීඩනය තිබේ යැයි රෝග නිශ්චය කර ඇති ප්‍රතිශතය (ස්වයං වාර්තා කළ)	**18.6%** **(17.4-19.7)**	**15.1%** **(13.5-16.7)**	21.6% 20.1-23.2)
රුධිර පීඩනය වැඩි අය හෝ දැනට වැඩි රුධිර පීඩනය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා අය අතුරෙන් රුධිර පීඩනය වැඩි යැයි අළුතින් හඳුනා ගත් ප්‍රතිශතය	**54.7%** **(52.0-57.4)**	**62.0%** **(58.1-65.8)**	48.1% (44.7-51.5)
රුධිර පීඩනය වැඩි අය හෝ දැනට වැඩි රුධිර පීඩනය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා අය අතුරෙන් රුධිර පීඩනය පාලනය වී ඇති ප්‍රතිශතය	**14.1%** **(12.3-15.9)**	**10.7%** **(8.4-13.0)**	17.3% (14.7-19.9)
වැඩි රුධිර පීඩනය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා අය අතුරෙන් රුධිර පීඩනය පාලනය වී ඇති ප්‍රතිශතය	**39.1%** **(35.2-43.0)**	**37.2%** **(30.7-43.7)**	40.3% (35.3-45.4)
වැඩි රුධිර පීඩනය (සංන්‍යස්ත පීඩනය රසදිය මිලිමීටර් 140 ට සමාන හෝ වැඩි සහ/හෝ වින්‍යස්ත පීඩනය රසදිය මිලිමීටර් 90 ට සමාන හෝ වැඩි හෝ	**63.9%**	**71.2%**	57.2%

දැනට අධි රුධිර පීඩනය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා) සහිත අය අතුරින් දැනට ප්‍රතිකාර ලබා නොගන්නා ප්‍රතිශතය	**(61.4-66.4)**	**(67.7-74.7)**	(53.9-60.5)
3 පියවර ජෛවරසායනික මිනුම්			
නිරාහාර රුධිර ග්ලූකෝස් අගයේ මධ්‍යන්‍යය **[mg/dl]** (දැනට රුධිර ගත ග්ලූකෝස් මට්ටම අධික වීම සඳහා ප්‍රතිකාර ලබන්නන්ද ඇතුළුව)	**104.0** **(102.4-105.6)**	**103.1** **(100.9-105.4)**	104.8 (102.7-106.8)
පහත නිර්ණායක අනුව වැඩි නිරාහාර රුධිර ග්ලූකෝස් අගයකට අවදානම සහිත ප්‍රතිශතය •ශිරා ගත රුධිර ප්ලාස්මාවේ ග්ලූකෝස් ප්‍රමාණය **6.1 mmol/L (110 mg/dl)** ට සමාන හෝ වැඩි සහ **7.0 mmol/L (126 mg/dl)** ට වඩා අඩු •කේශනාලික ගත රුධිරයේ ග්ලූකෝස් ප්‍රමාණය **5.6 mmol/L (100 mg/dl)** ට සමාන හෝ වැඩි සහ **6.1 mmol/L (110 mg/dl)** ට අඩු	**13.0%** **(11.7-14.2)**	**12.8%** **(10.9-14.6)**	13.1% (11.6-14.7)
නිරාහාර රුධිර ග්ලූකෝස් ප්‍රමාණය වැඩි අයගේ ප්‍රතිශතය දැනටමත් හඳුනාගෙන ඇති සහ අලුතින් හඳුනාගත්: ශිරා ගත රුධිර ප්ලාස්මාවේ ග්ලූකෝස් ප්‍රමාණය **126 mg/dl** ට සමාන හෝ වැඩි හෝ දැනට අධික රුධිරගත ග්ලූකෝස් සඳහා ප්‍රතිකාර ලබා ගන්නා වයස අවුරුදු 18-69 අතර අය	**14.6%** **(13.5-15.8)**	**14.5%** **(12.7-16.4)**	14.7% (13.2-16.2)
සමස්ත ජනගහනයෙන් දැනට දියවැඩියාව තිබේ යැයි රෝග නිශ්චය කර ඇති ප්‍රතිශතය (ස්වයං වාර්තා කළ)	**13.9%** **(12.9- 14.8)**	**13.4%** **(11.9- 14.9)**	14.3% (13.1- 15.5)
රුධිර ග්ලූකෝස් ප්‍රමාණය වැඩි අය හෝ දැනට වැඩි රුධිර ග්ලූකෝස් ප්‍රමාණය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා අය අතුරෙන් රුධිර ග්ලූකෝස් ප්‍රමාණය වැඩි යැයි අළුතින් හඳුනා ගත් ප්‍රතිශතය	**38.4%** **(34.1-42.7)**	**39.8%** **(33.0-46.6)**	37.2% (31.9-42.4)
රුධිර ග්ලූකෝස් ප්‍රමාණය වැඩි අය හෝ දැනට වැඩි රුධිර ග්ලූකෝස් ප්‍රමාණය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා අය අතුරෙන් වැඩි රුධිර ග්ලූකෝස් ප්‍රමාණය පාලනය කිරීම සඳහා ප්‍රතිකාර ලබා නොගන්නා ප්‍රතිශතය	**49.1%** **(44.7-53.5)**	**53.2%** **(46.6-59.8)**	45.6% (40.2-51.1)
අධි රුධිර පීඩනය සහ අධි රුධිර ග්ලූකෝස් ප්‍රමාණය යන රෝග දෙකම සහිත ප්‍රතිශතය	**8.6%** **(7.7-9.6)**	**8.5%** **(6.9-10.0)**	8.7% (7.5-9.9)
පූර්ණ රුධිර කොලෙස්ටරෝල් අගයේ මධ්‍යන්‍යය **[mg/dl]** (දැනට ඉහල කොලෙස්ටරෝල් මට්ටම පාලනය කිරීම සඳහා ප්‍රතිකාර ලබන්නන්ද ඇතුළුව)	**187.2** **(185.6- 188.8)**	**182.0** **(179.8-184.3)**	191.7 (189.7- 193.7)
පූර්ණ රුධිර කොලෙස්ටරෝල් ප්‍රමාණය වැඩි අයගේ ප්‍රතිශතය (පූර්ණ රුධිර කොලෙස්ටරෝල් ප්‍රමාණය	**48.7%**	**42.7%**	54.0%

5.0 mmol/L හෝ **190 mg/dl** ට වැඩි හෝ දැනට ඉහල කොලෙස්ටරෝල් මට්ටම පාලනය කිරීම සඳහා ප්‍රතිකාර ලබන්නන්)	**(46.8- 50.6)**	**(40.0- 45.4)**	(51.6- 56.4)
පූර්ණ රුධිර කොලෙස්ටරෝල් ප්‍රමාණය වැඩි අයගේ ප්‍රතිශතය (පූර්ණ රුධිර කොලෙස්ටරෝල් ප්‍රමාණය **6.2 mmol/L** හෝ **240 mg/dl** ට වැඩි හෝ දැනට ඉහල කොලෙස්ටරෝල් මට්ටම පාලනය කිරීම සඳහා ප්‍රතිකාර ලබන්නන්) ශ්‍රී ලංකා මාර්ගෝපදේශය වන **240 mg/dl** ක පූර්ණ රුධිර කොලෙස්ටරෝල් ප්‍රමාණය නිර්ණායකය ලෙස ගෙන	**19.0%** **(17.5-20.4)**	**15.6%** **(13.6-17.7)**	21.8% (20.0-23.7)
හෘදකන්තුකවාහිනී රෝග සඳහා අවදානම			
වයස අවුරුදු **40-69** අතර සිටින, මීළඟ වසර **10** තුල හෘදකන්තුකවාහිනී රෝග ඇතිවීමේ අවදානම **20%** ට සමාන හෝ වැඩි හෝ දැනටමත් හෘදකන්තුකවාහිනී රෝග වැළඳී ඇති ප්‍රතිශතය**	**14.2%** **(12.8- 15.8)**	**16.9%** **(14.6- 19.6)**	11.8% (10.1- 13.8)
සංයුක්ත අවදානම් සාධක වල සාරාංශය			
• දැනට දිනපතා දුම් පානය කරන • දිනකට පලතුරු සහ එළවළු සම්මත ප්‍රමාණ 5 කට අඩු • ශාරීරික ක්‍රියාකාරකම් වල අඩුවෙන් යෙදෙන	• අධි බර (ශරීර ස්කන්ධ දර්ශකය **25 kg/m²** ට සමාන හෝ වැඩි) • රුධිර පීඩනය වැඩි (සංන්‍යස්ත පීඩනය රසදිය මිලිමීටර් 140 ට සමාන හෝ වැඩි සහ/හෝ විනාස්ත පීඩනය රසදිය මිලිමීටර් 90 ට සමාන හෝ වැඩි හෝ දැනට අධි රුධිර පීඩනය සඳහා ප්‍රතිකාර ලබා ගන්නා)		
වයස අවුරුදු 18-69 දක්වා වැඩිහිටියන්ගේ ප්‍රතිඵල (95% විශ්‍රම්භ ප්‍රාන්තරය සහිතව)	ගැහැණු පිරිමි දෙපාර්ශවයම	පිරිමි	ගැහැණු
ඉහත අවදානම් සාධක එකක්වත් නොමැති අයගේ ප්‍රතිශතය	**8.6%** **(7.6- 9.6)**	**9.5%** **(787- 11.1)**	7.8% (6.7- 9.0)
වයස අවුරුදු 11 සිට 44 අතර ඉහත අවදානම් සාධක තුනක් හෝ ඊට වැඩියෙන් ඇති ප්‍රතිශතය	**18.2%** **(16.5- 19.9)**	**18.9%** **(16.1- 21.6)**	17.6% (15.6- 19.7)
වයස අවුරුදු 45 සිට 69 අතර ඉහත අවදානම් සාධක තුනක් හෝ ඊට වැඩියෙන් ඇති ප්‍රතිශතය	**36.3%** **(34.1- 38.5)**	**31.4%** **(28.1- 34.7)**	40.5% (37.7- 43.2)
වයස අවුරුදු 18 සිට 69 අතර ඉහත අවදානම් සාධක තුනක් හෝ ඊට වැඩියෙන් ඇති ප්‍රතිශතය	26.5% (25.1- 28.0)	24.6% (22.4- 26.7)	28.2% (26.4- 30.0)

*** මීළඟ වසර 10 තුල හෘදකන්තුකවාහිනී රෝග ඇතිවීමේ අවදානම 20% ට සමාන හෝ වැඩි ලෙස අර්ථ දක්වා ඇත්තේ වයස, ගැහැණු-පිරිමි බව, රුධිර පීඩනය, දුම් බීමේ තත්ත්වය (දැනට දුම් පානය කරන), පූර්ණ කොලෙස්ටරෝල් ප්‍රමාණය සහ කලින් රෝග නිර්ණය කරන ලද දියවැඩියාව යන නිර්ණායක මතය.*

*වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර **STEPS** සමීක්ෂණයේ සම්බන්ධීකාරක වන සෞඛ්‍ය අමාත්‍යාංශයේ, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (බෝ නොවන රෝග) වෛද්‍ය එස්.සී. වික්‍රමසිංහ මහත්මිය, **scwickrama@gmail.com** වෙත යොමු වන්න.*

අනතුරු නිවාරණය සහ කළමනාකරණ ඒකකයේ කාර්ය සාධනය, බෝනොවන රෝග අධ්‍යක්ෂක මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය.

බෝනොවන රෝග අධ්‍යක්ෂ මණ්ඩලයේ අනතුරු නිවාරණය සහ කළමනාකරණ ඒකකය විසින් ශ්‍රී ලංකාව බහු-ආංශික ක්‍රියාකාරී සැලැස්මේ (MSAP) සඳහන් උපාය මාර්ග හතරක් මත පදනම්ව ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

උපායමාර්ගය 1: උපදේශනය, හවුල්කාරිත්වය සහ නායකත්වය

a) අදාළ පාර්ශවකරුවන් සහ උපදේශකයින් (පළාත් සහ දිස්ත්‍රික්) සහ වෛද්‍ය නිලධාරී - බෝනොවන රෝග සඳහා පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා අනතුරු වැළැක්වීම පිළිබඳ බහු-ආංශික ක්‍රියාකාරී සැලැස්ම (MSAP) හඳුන්වාදීම පිළිබඳ උපදේශක රැස්වීම් නවයක් පවත්වන ලදී.

- 1 වන ප්‍රදේශය - මාර්ග ආරක්ෂාව
- 2 වන ප්‍රදේශය - දියේ ගිලීමේ ආරක්ෂාව
- 3 වන ප්‍රදේශය - නිවසේ ආරක්ෂාව
- 4 වන ප්‍රදේශය - සේවා ස්ථානයේ ආරක්ෂාව
- 5වන ප්‍රදේශය - වැඩිහිටි ආරක්ෂාව
- 6 වන ප්‍රදේශය - පශ්චාත් සිදුවීම් රැකවරණය
- 7 වන ප්‍රදේශය - අධීක්ෂණය සහ ඇගයීම
- 8වන ප්‍රදේශය - ළමා ආරක්ෂාව

මීට අමතරව, HDC හිදී, අනතුරු නිවාරණය සහ කළමනාකරණය සඳහා බහු ආංශික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව පළාත් සහ දිස්ත්‍රික් වෛද්‍ය පරිපාලකයින් ද දැනුවත් කරන ලදී.

b). අනතුරු නිවාරණය ගැනීම සහ මාධ්‍යවේදීන් සඳහා ප්‍රථමාධාර පිළිබඳ එක්දින උපදේශන වැඩමුළුව පවත්වන ලදී.

උපායමාර්ගය 2: සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ අවදානම් අවම කිරීම

2.1 - මාර්ග ආරක්ෂාව

පහත ක්‍රියාකාරකම් ආවරණය කරන ලදී.

a) අදාළ සම්බන්ධ තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් (TWG) රැස්වීම පැවැත්විණි
b) සෞඛ්‍ය අමාත්‍යාංශය, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව (IRCSL) සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව (NCRS) අතර මාර්ග අනතුරු ආශ්‍රිත දත්ත හුවමාරු කිරීම ස්ථාපිත කරන ලදී.
c) පාසල් සිසුන් අතර හිස්වැසුම් ප්‍රවර්ධනය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීමට ආරම්භ කරන ලදී.
d) ඈ මාර්ග අනතුරු වැළැක්වීමේ ජාතික උපාය මාර්ගය(මාර්ග අනතුරු) ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. ඒ නිසා ජාතික උපාය මාර්ගය සකස් කිරීමට සාකච්ඡා ආරම්භ කරන ලදී.
e) ගෝලීය මාර්ග ආරක්ෂණ සතිය සමරනු ලැබූ අතර දැනුවත් කිරීම සඳහා සමාජ මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී.
f) යහපත් සමරිතානුවන් සඳහා ආධාරක පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මාර්ග අනතුරු හි ප්‍රතිවිපාක අවම කිරීම සඳහා තීරණාත්මක ලෙස හඳුනාගෙන ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රැස්වීම් කිහිපයක් පවත්වන ලද අතර, අනතුරු අංශ පාර්ශ්වකරුවෙකු ලෙස සහභාගී විය.
g) මාර්ග අඩවිවල නීතිවිරෝධී මත්ද්‍රව්‍ය භාවිතය සඳහා රියදුරන් පරීක්ෂා කිරීම පිළිබඳ තාක්ෂණික උපදෙස් සැපයීම සඳහා අනතුරු අංශ ක්‍රියාකාරීව බහු රැස්වීම්වලට සහභාගි විය (මාර්ග අඩවි පරීක්ෂණ පරීක්ෂණය).

2.2 - දියේ ගිලීමේ ආරක්ෂාව

a) දියේ ගිලීම හා සම්බන්ධ අනතුරු අවම කිරීම සඳහා තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් (TWG) රැස්වීම අදාළ පාර්ශවකරුවන් සමඟ පැවැත්විණි.
b) ප්‍රාදේශීය ප්‍රජාවන්ගේ සහ සංවිධානවල සහාය ඇතිව දියේ ගිලීමේ අවදානම් ප්‍රදේශවල ප්‍රදර්ශනය කිරීමට දැන්වීම් පුවරු නිර්මාණය කර ඇත.
c) දියේ ගිලීම සම්බන්ධ දත්ත හුවමාරු කිරීමේ යාන්ත්‍රණයක් සංවර්ධනය කිරීමට ආරම්භ කරන ලදී.
d) කෘත්‍රිම හා ස්වභාවික තටාක අතර බෙදා ගැනීමට වැදගත් ලියවිල්ලක් ලෙස තටාක ප්‍රමිතීන් වර්ධනය කිරීම හඳුනා ගැනේ. එබැවින් එය ආරම්භ කරන ලදී.
e) දියේ ගිලීමෙන් සිදුවන හානිය අඩු කර ගැනීම සඳහා දියේ ගිලීම වැළැක්වීම සඳහා ජාතික උපාය මාර්ගයක් අවශ්‍ය වේ. මේ අනුව, උපාය මාර්ග සංවර්ධනය කිරීමට කටයුතු ආරම්භ විය.

2.3 - නිවසේ ආරක්ෂාව

a) රටේ වස විස නිවාරණ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ජාතික විෂ මධ්‍යස්ථානය සමඟ රැස්වීම් පැවැත්විණි.
b) මහජන සෞඛ්‍ය පශු වෛද්‍ය සේවා අධ්‍යක්ෂ මණ්ඩලය (PHVS) සමඟ එක්ව සත්ව දෂ්ට කිරීම් වැළැක්වීම සඳහා ජාතික උපාය මාර්ගයක් සකස් කිරීමට පියවර ගන්නා ලදී.
c) වැටීම් හේතුවෙන් සිදුවන අනතුරු වැඩිහිටියන් අතර සුලභ වන අතර වැටීම වැළැක්වීමේ උපාය මාර්ගයක් සහ වැඩිහිටි ආරක්ෂණ පිරික්සුම් ලැයිස්තුවක් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් තරුණ, වැඩිහිටි සහ ආබාධිත අධ්‍යක්ෂක (YED) සමඟ රැස්වීමක් පවත්වන ලදී.

උපාය 3: පශ්චාත් සිදුවීම් රැකවරණය

a) ප්‍රථමාධාර මාර්ගෝපදේශ සකස් කිරීම අදාළ පාර්ශවකරුවන් සමඟ ආරම්භ කරන ලදී.
b) අදාළ පාර්ශවකරුවන් සමඟ ප්‍රථමාධාර විෂය මාලාවක් සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදී.
c) ප්‍රාථමික සත්කාර කම්පන කළමනාකරණ මාර්ගෝපදේශ සංවර්ධනය කිරීම අදාළ පාර්ශවකරුවන් සමඟ ආරම්භ කරන ලදී.
d) බෝනොවන රෝග කාර්යාංශයේ සහ බෝනොවන රෝග අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්ය මණ්ඩලය සඳහා ප්‍රථමාධාර පුහුණුව පවත්වන ලදී.
e) මාධ්‍යවේදීන් සඳහා ප්‍රථමාධාර පුහුණුව පැවැත්විණි.

උපායමාර්ගය 4: නිරීක්ෂණ, අධීක්ෂණය, ඇගයීම සහ පර්යේෂණ (SMER)

a) මරණ පරීක්ෂණ සහ සමාලෝචන පුහුණුව (DIRT) රට පුරා පහත දිස්ත්‍රික්කවල පවත්වන ලදී (Onsite පුහුණුව) - (1. කොළඹ 2. ගම්පහ 3. කළුතර 4. කුරුණෑගල 5. පුත්තලම 6. අනුරාධපුරය 7. පොළොන්නරුව 8. යාපනය 9. කිලිනොච්චිය 10. වව්නියාව 11. මන්නාරම 12. මුලතිව් 13. ගාල්ල 14. මාතර 15. හම්බන්තොට 16. රත්නපුර 17. කෑගල්ල 18. මහනුවර)
b) ජාතික අනතුරු ආවේක්ෂණ පද්ධතිය (NISS) ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කරන ලදී.
c) ගුඩ් ඉන්ටර්න් වැඩසටහන හරහා අනතුරු වළක්වා ගැනීම සම්බන්ධයෙන් සීමාවාසික නිවාස නිලධාරීන් පුහුණු කිරීම පුහුණු කිරීමේ ක්‍රමයක් ලෙස හඳුනාගෙන අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා කරන ලදී.
d) අනතුරු වැලැක්වීම සහ නිරීක්ෂණ සම්බන්ධයෙන් හෙද සිසුන් පුහුණු කරන ලෙස සියලුම හෙද පාසල්වලින් ඉල්ලා සිටියේය.

e) NISS සම්බන්ධ ක්‍රියාකාරකම් අධීක්ෂණය ද්විතීයික සහ තෘතීයික සත්කාර රෝහල් කිහිපයක සිදු කරන ලදී.

මූල්‍ය ප්‍රගතිය

වර්ෂය	ප්‍රතිපාදන (රු.)	වියදම (රු.)
2018	2,286,973,000.00	1,315,677,642.35
2019	1,617,100,000.00	811,034,812.26
2020	395,161,957.00	145,213,386.87
2021	384,500,000.00	193,688,176.58
2022	93,000,000.00	22,862,051.99

4.2.6 පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය

හැඳින්වීම

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික පාරිසරික සෞඛ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රස්ථානය වන්නේ පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය ඒකකයයි.

ජාතික පාරිසරික සෞඛ්‍ය වැඩසටහනට අනෙකුත් අදාළ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් පාරිසරික සෞඛ්‍ය ගැටලු කළමනාකරණය කිරීම ඇතුළත් වේ. සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය පාරිසරික සෞඛ්‍ය යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ජාතික වැඩසටහනකි.

මෙම වැඩසටහන ජාතික මට්ටමින් පාරිසරික සහ වෘත්තීය සෞඛ්‍ය ඒකකය මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් මට්ටමේ වෛද්‍ය නිලධාරී (පරිසර හා වෘත්තීය සෞඛ්‍ය) ගේ අධීක්ෂණය යටතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (PHI), සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් (MOH) සමඟ එක්ව බිම් මට්ටමින් ක්‍රියාත්මක වේ.

දැක්ම

පාරිසරික සෞඛ්‍ය අවදානම්වලින් තොර නිරෝගී ශ්‍රී ලංකාවක්

මෙහෙවර

පාරිසරික සෞඛ්‍ය සේවා සැපයීම තුළින් සෞඛ්‍ය සම්පන්න පරිසරයක් නිර්මාණය කරමින් සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම

- පාර්ශ්වකරුවන් සමඟ පෙනී සිටීම, සහයෝගයෙන් කටයුතු කිරීම සහ හවුල් වීම
- සෞඛ්‍ය කාර්ය මණ්ඩලය ප්‍රවර්ධනය කිරීම සහ සහාය දීම
- ඔවුන්ගේ ප්‍රජාවන් සඳහා නායකත්වය දීමට මිනිසුන් බල ගැන්වීම

අරමුණු

ජාතික පාරිසරික සෞඛ්‍ය වැඩසටහනේ අරමුණු පහත පරිදි වේ.

- පාරිසරික සෞඛ්‍ය හා සම්බන්ධ වගකීම් දරන විවිධ අංශවල සහ පාර්ශ්වකරුවන්ගේ කාර්යක්ෂම සම්බන්ධීකරණය සහ සහයෝගීතාව සක්‍රීය කරන ආයතනික රාමුවක් සැකසීම
- පාරිසරික සෞඛ්‍ය සේවා සැපයීම සඳහා ඵලදායී ආයතනික ධාරිතාවක් සහතික කිරීම
- අපේක්ෂිත වෙනසක් සඳහා කාර්යක්ෂම නියෝජිතයන් සහ උත්ප්‍රේරකරණයේ දායකයන් බවට පත්වීම සඳහා පාරිසරික සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ධාරිතාව ශක්තිමත් කිරීම
- පාරිසරික සෞඛ්‍යය පිළිබඳ පරිපූර්ණ සහ ඒකාබද්ධ සැලසුම්කරණයට පහසුකම් සැලසීමේ අරමුණින් හවුල්කාරිත්ව ප්‍රවේශයක් අනුගමනය කිරීම
- ඵලදායී පාරිසරික සෞඛ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා පහසුකම් සැලසීම
- ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ පාරිසරික සෞඛ්‍යය සවිබල ගැන්වීම හරහා ස්වකීය සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා දායක වීම

ජයග්‍රහණ/විශේෂ සිදුවීම්

1. දිස්ත්‍රික් මට්ටමින් සෞඛ්‍ය ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ 'පුහුණුකරුවන් පුහුණු කිරීමේ' වැඩමුළුවක් පවත්වන ලදී.

යුනිසෙෆ් අරමුදල් යටතේ සෞඛ්‍ය ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා 'පුහුණුකරුවන් පුහුණු කිරීමේ' වැඩමුළු පහක් පවත්වා ඇත. සෑම දිස්ත්‍රික්කයකම රේඛීය අමාත්‍යාංශ රෝහල්, සියලුම මූලික රෝහල්, ප්‍රාදේශීය රෝහල් වශයෙන් සෞඛ්‍ය සේවා කාර්ය මණ්ඩලය තෝරා ගන්නා ලදී.

	වැඩමුළුව පැවැත්වෙන ස්ථානය	වැඩමුළු සංඛ්‍යාව	පුහුණු කළ පුහුණුකරුවන් සංඛ්‍යාව
1	කෑගල්ල	01	35
2	බදුල්ල	01	55
3	මාතලේ	01	35
4	පුත්තලම දිස්ත්‍රික්කය	01	35
5	නුවරඑලිය	01	35

කෑගල්ලේ වැඩමුළුව

බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩමුළුව

මාතලේ දිස්ත්‍රික්කයේ වැඩමුළුව

පුත්තලම දිස්ත්‍රික්කයේ වැඩමුළුව

2. පළාත් මට්ටමේ සෞඛ්‍ය ආයතන වල අපද්‍රව්‍ය තක්සේරු කිරීම සහ එක් එක් පළාත සඳහා (පළාත් 9) පළාත් මට්ටමේ සෞඛ්‍ය ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් සකස් කර ඇත.

බස්නාහිර පළාත සඳහා පළාත් ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේ දෙවන වැඩමුළුව සහ ඉතිරි පළාත් අටෙන් වැඩමුළු දෙක බැගින් 2023 වසරේ පළමු මාස හතර තුළ පවත්වන ලදී.

කසළ කළමනාකරණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සෞඛ්‍ය ආරක්ෂණ සැකසුම් සඳහා "HCWM පිළිබඳ ජාතික ක්‍රියාකාරී සැලැස්ම" මත පදනම්ව පළාත් සෞඛ්‍ය ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණ (HCWP) ක්‍රියාකාරී සැලසුම් සකස් කරන ලදී.

Workshop to develop Sabaragamuwa Provincial Action Plan

*Workshop **to develop Uva Provincial Action Plan***

Workshop to develop North Western Provincial Action Plan

Workshop to develop Northern Provincial Action Plan

Workshop to develop Central Provincial Action Plan

3. ජලය , සනීපාරක්ෂාව, පවිත්‍රතාවය සහ කසළ කළමනාකරණය පිළිබඳ තක්සේරුවේ (WASH) කසළ කළමනාකරණය නිර්ණායකය සඳහා සම්මත (validation) කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී - 2023 මාර්තු 21.

ජලය , සනීපාරක්ෂාව, පවිත්‍රතාවය සහ කසළ කළමනාකරණය පිළිබඳ තක්සේරු කිරීමේ (WASH) සමීක්ෂණය සෞඛ්‍ය අමාත්‍යාංශයේ පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය ඒකකය විසින් 2022 වර්ෂයේදී WASH හිට් මෙවලම භාවිතයෙන් පවත්වන ලදී. එය සංරචක දෙකකින් (ප්‍රමාණාත්මක හා ගුණාත්මක) සමන්විත වූ අතර, අවසානයේ දත්ත විශ්ලේෂණය කරන ලදී. 2023 දී අවසන් සමීක්ෂණ වාර්තාව වෙනුවෙන් දත්ත සම්මත කිරීමේ (validation) සඳහා වැඩමුළු දෙකක් පවත්වා ඇත.

4. COVID අපද්‍රව්‍ය තක්සේරු කිරීම සඳහා සම්මත කිරීමේ වැඩමුළුවක් පවත්වන ලදී - 2023 මාර්තු 22

ශ්‍රී ලංකාවේ COVID-19 එන්නත් ආශ්‍රිත සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණය තක්සේරු කිරීම සඳහා 2022 දී සෞඛ්‍ය අමාත්‍යාංශයේ පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය ඒකකය විසින් සමස්ත ලංකා සමීක්ෂණයක් පවත්වන ලදී. එය කාණ්ඩ දෙකකින් (ප්‍රමාණාත්මක හා ගුණාත්මක) සමන්විත වූ අතර 2023වර්ෂයේදී අවසාන සම්මත කිරීම සඳහා දත්ත විශ්ලේෂණය කරන ලදී. සමීක්ෂණ වාර්තාව අවසන් කිරීම සඳහා දත්ත සම්මත කිරීම (validation) සඳහා වැඩමුළු දෙකක් පවත්වා ඇත.

5. සෞඛ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියට (HMIS) WASH දර්ශක ඒකාබද්ධ කිරීම සඳහා WASH ප්‍රමිතීන් සහ අධීක්ෂණ දර්ශක සංවර්ධනය කිරීම.

2022 දී පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය ඒකකය විසින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා පහසුකම්වල ජලය , සනීපාරක්ෂාව, පවිත්‍රතාවය සහ කසළ කළමනාකරණය පිළිබඳ තක්සේරුවේ (WASH) තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු අධ්‍යයනය කරන ලදී. දිවයින පුරා ගුණාත්මක හා ප්‍රමාණාත්මක තක්සේරු කිරීම් සිදු කරන ලදී. අනාගතයේ දී සෞඛ්‍ය සේවා ආයතනවල ජලය , සනීපාරක්ෂාව, පවිත්‍රතාවය සහ කසළ කළමනාකරණය පිළිබඳ තක්සේරු කිරීම (WASH) වැඩිදියුණු කිරීම සඳහා WASH ප්‍රමිති සහ අධීක්ෂණ දර්ශකවල වැදගත්කම දත්ත විශ්ලේෂණය මගින් පෙන්නුම් කරන ලදී. එබැවින්, WASH දර්ශක සෞඛ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියට (HMIS) ඒකාබද්ධ කිරීම සඳහා WASH ප්‍රමිතීන් සහ අධීක්ෂණ දර්ශක සංවර්ධනය කිරීම සඳහා මූලික සාකච්ඡා සඳහා වැඩමුළු දෙකක් පවත්වන ලදී.

6. සෞඛ්‍ය ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා වූ ජාතික මෙහෙයුම් කමිටුවේ සිව්වන රැස්වීම 2023 අගෝස්තු මාසයේදී පවත්වන ලද අතර රාජ්‍ය අංශයේ සෞඛ්‍ය ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණයේ පවතින ප්‍රධාන ගැටලු විසඳීම සඳහා වැදගත් තීරණ ගන්නා ලදී.

සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති

ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය	2022.12.31 වන විට භෞතික ප්‍රගතිය	2022.12.31 වන විට මූල්‍ය ප්‍රගතිය
1. WASH තක්සේරුව සඳහා දත්ත විශ්ලේෂණය සහ වාර්තා ලිවීම - යුනිසෙෆ් අරමුදල් යටතේ)2022-2023)	LKR 315,000. 00	100%	90%
2. සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා HCWM(සෞඛ්‍ය ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණය) පිළිබඳ පුහුණු වැඩසටහන් - යුනිසෙෆ් අරමුදල් යටතේ)2022-2023)	LKR 2,550,244.30	100%	100%
3. පළාත් මට්ටමේ HCW (සෞඛ්‍ය ආයතනවල අපද්‍රව්‍ය) තක්සේරුවක් පැවැත්වීම සහ පළාත් මට්ටමේ සෞඛ්‍ය ආරක්ෂණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම - යුනිසෙෆ් අරමුදල් යටතේ)2022 - 2023)	LKR 4,671,364.29	100%	88.8%
4. එන්නත් ආශ්‍රිත අපද්‍රව්‍ය තක්සේරු කිරීම සඳහා දත්ත විශ්ලේෂණය සහ වාර්තා ලිවීම - යුනිසෙෆ් අරමුදල් යටතේ)2022-2023)	LKR 270,000 .00	100%	80%
5. සෞඛ්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියට) HMIS) ඇතුලත් කිරීමට වොෂ් ප්‍රමිතීන් සහ අධීක්ෂණ දර්ශක සංවර්ධනය කිරීම - යුනිසෙෆ් අරමුදල් යටතේ)2022-2023)	LKR 779,900 .00	100%	80%

6.WASH සහ COVID-19 අපද්‍රව්‍ය තක්සේරු කිරීම සඳහා වලංගු කිරීමේ වැඩමුළු පැවැත්වීම - යුනිසෙෆ් අරමුදල් යටතේ)2022 - 2023)	LKR 1,058,469.60	100%	100%

2023 වර්ෂයේ ඉදිරි මාස හය සඳහා සැලසුම් කර ඇති විශේෂ සංවර්ධන ක්‍රියාකාරකම්

- සෞඛ්‍ය සේවා ආයතන පිළිබඳ ජලය , සනීපාරක්ෂාව, පවිත්‍රතාවය සහ කසළ කළමනාකරණය පිළිබඳ තක්සේරු කිරීමේ (WASH) වාර්තාව සකස් කිරීම
- COVID-19 එන්නත් සම්බන්ධ සෞඛ්‍ය ආයතන වල අපද්‍රව්‍ය කළමනාකරණ සමීක්ෂණය පිළිබඳ අවසන් වාර්තාව සකස් කිරීම
- ජලය , සනීපාරක්ෂාව, පවිත්‍රතාවය සහ කසළ කළමනාකරණය පිළිබඳ තක්සේරු කිරීමේ (WASH) ප්‍රමිතීන් පිළිබඳ වාර්තාව සකස් කිරීම

ජාතික වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන

හැඳින්වීම

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කේන්ද්‍රස්ථානය වන්නේ පාරිසරික හා වෘත්තීය සෞඛ්‍ය ඒකකයයි. ජාතික වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන සියලු වෘත්තීන්හි සිටින සියලුම සේවකයන්ගේ සෞඛ්‍යය ප්‍රවර්ධනය කිරීම ඉලක්ක කරයි. ජාතික වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන සැලසුම් කිරීම, සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ඒකකය වගකිව යුතුය.

- එය වෘත්තීය සෞඛ්‍ය පිළිබඳ සෞඛ්‍ය අමාත්‍යාංශයේ මහජන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, රෝග නිවාරණ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මෙන්ම අනෙකුත් කාර්ය මණ්ඩල කාණ්ඩවල ධාරිතා ගොඩනැගීමේ වගකීම දරයි.
- මෙම ඒකකය වෘත්තීය සහ ඒ ආශ්‍රිත පාරිසරික සෞඛ්‍ය ගැටළු සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සහ පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවල නිරත වේ.
- මීට අමතරව, සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජාතික වෘත්තීය සෞඛ්‍ය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී එම ඒකකය කම්කරු අමාත්‍යාංශය වැනි අනෙකුත් වැදගත් පාර්ශවකරුවන් සමඟ සම්බන්ධ වේ.

මෙම වැඩසටහන ජාතික මට්ටමින් වෘත්තීය සෞඛ්‍ය ඒකකයේ මගපෙන්වීම සහ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් මට්ටමේ වෛද්‍ය නිලධාරී (පරිසර හා වෘත්තීය සෞඛ්‍ය) ගේ අධීක්ෂණය යටතේ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් (PHI), සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් (MOH) සමඟ එක්ව බිම් මට්ටමින් ක්‍රියාත්මක වේ.

දැක්ම

ශ්‍රී ලංකාවේ තිරසාර සංවර්ධනයට දායක වන සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක්

මෙහෙවර

සියළු සේවකයන්ට සාධාරණ වූ සහ සේවක හිතකාමී පසුබිමක් තුළ විස්තරාත්මක, තිරසාර, සාධාරණ සහ ගුණාත්මක වෘත්තීය සෞඛ්‍ය සේවා සැපයීම තුළින් සියලුම සේවකයන්ගේ ඉහළම සෞඛ්‍ය මට්ටම් ළඟා කර ගැනීමට දායක වීම.

අරමුණු

ජාතික වෘත්තීය සෞඛ්‍ය වැඩසටහනේ අරමුණු පහත පරිදි වේ.

- සියලුම වෘත්තීන්හි සේවකයින් අතර ඉහළම සෞඛ්‍ය මට්ටම ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම
- සේවා පරිසරය සහ සේවා තත්ත්වයන් නිසා ඇතිවන අහිතකර සෞඛ්‍ය ප්‍රතිඵල වළක්වා ගැනීම
- රැකියාවේ අවදානම් වලින් සේවකයින් ආරක්ෂා කිරීම
- සේවා පරිසරය කම්කරුවන්ට අනුවර්තනය කිරීම
- කම්කරුවන්ගේ සෞඛ්‍යය සහ යහපැවැත්ම වැඩිදියුණු කිරීම

ජයග්‍රහණ

1. පුහුණු කිරීම් සහ දැනුවත් කිරීම්

සේවකයින්, කළමනාකරුවන් සහ සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා සේවා ස්ථානවල සෞඛ්‍ය සහ ආරක්ෂාව පිළිබඳ විවිධ අංශ පිළිබඳව පුළුල් පුහුණු වැඩසටහන් සංවර්ධනය කර බෙදා හැරීම.

- රසායනික ද්‍රව්‍ය, පරිසරය සහ සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්
- SPHII/SPHII-D සඳහා පුහුණුව

රසායනික නිරාවරණය වැනි විශේෂිත උපද්‍රව පිළිබඳ විශේෂිත පුහුණුවක් ලබා දීම

- රසදිය සහ රසදිය අඩංගු අපද්‍රව්‍ය ,ශබ්ද කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන්
- උසස් ඩිප්ලෝමා පාඨමාලා වල මහජන සෞඛ්‍ය පරීක්ෂක අභ්‍යාසලාභී සිසුන් සඳහා වෘත්තීය සෞඛ්‍යය පිළිබඳ පුහුණුව (HDip.PH), වෘත්තීය සෞඛ්‍යය පිළිබඳ දේශන - කඩුගන්නාව, කුරුණෑගල, කළුතර සහ ගාල්ල යන ප්‍රදේශවලදී පැවැත්වීම.

2. සේවා ස්ථාන තක්සේරු කිරීම්

උපද්‍රව සහ අවදානම් හඳුනා ගැනීම සඳහා නිතිපතා සේවා ස්ථාන ඇගයීම් සිදු කිරීම සම්බන්ධයෙන් විශේෂඥ මගපෙන්වීම් ලබා දෙන ලදී. මෙයට භෞතික, රසායනික, ජීව විද්‍යාත්මක සහ මනෝ සමාජීය සාධක ඇතුළත් වේ.

4.2.7 වතු සහ නාගරික සෞඛ්‍ය

හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වතු හා නාගරික අංශවල අවදනමට ලක්විය හැකි ජනගහනයේ සෞඛ්‍ය තත්වය වැඩි දියුණු කිරිම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය තුළ වන ජාතික කේන්ද්‍රස්ථානය වේ. වතු ජනගහනය සහ නාගරික අඩු ආදයම්ලාභී ජනගහනය ශ්‍රී ලංකාවේ ජනගහනයේ අවදනමට ලක්විය හැකි ජනගහන දෙවර්ගයයි .

දිලිදු තත්වයේ නිවාස සහ සනීපාරක්ෂාව මෙන්ම නීරෝගීභාවය අපේක්ෂාවෙන් අනුගමනය කරනු ලබන නොදියුණු චර්යාවන් සහ භාවිතයන් ඇතුළු දුර්වල සමාජ ආර්ථික සාධක හේතුවෙන් ඔවුන් අවදනමට ලක්විය හැකියැයි සැලකේ. උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ඒකකය ප්‍රධාන වශයෙන් වතු සෞඛ්‍ය සහ නාගරික සෞඛ්‍යය යන උප කොටස් දෙක යටතේ ක්‍රියාක්මක වේ.

දැක්ම

සෞඛ්‍ය සම්පන්න ඵලදායී සහ සවිබල ගැන්වූ වතු හා නාගරික ජනගහනයක් සහිත ශ්‍රී ලංකාවක් බිහි කිරිම.

මෙහෙවර

යටිතල පහසුකම් මානව සම්පත් සහ සාධාරණ සේවා සැපයුම සංවර්ධනය කිරීම හරහා සෞඛ්‍ය සේවාවන් වැඩි දියුණු කිරීම සහ වතු සහ නාගරික ප්‍රජාවන් එම සෞඛ්‍ය සේවාවන් භාවිතා කිරීම වර්ධනය කිරීම මඟින් ජාතික දර්ශකවලට සමාන කළ හැකි සෞඛ්‍ය තත්ත්වයක් කරා ලගාවනු පිණිස වතු හා නාගරික ප්‍රජාවන්හි සෞඛ්‍ය විෂමතා අවම කිරීම සඳහා පුළුල් වැඩ පිළිවෙලක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම.

අභිමතාර්ථය

සමස්ත සෞඛ්‍යය සහ සෞඛ්‍ය සේවාවන් වැඩි දියුණු කිරීම මඟින් වතු සහ නාගරික අඩු ආදයම්ලාභී ජනගහනයේ ජීවන තත්ත්වය උසස් කිරීම.

අරමුණු

වතු සෞඛ්‍යය

1 ඉලක්ක ගත මැදිහත්වීම් සිදු කිරීම සහ සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන් සමඟ සහයෝගීත්වයෙන් කටයුතු නිරීම හරහා මූලික සෞඛ්‍ය ආරක්ෂණ සේවාවන් සැපයීම මඟින් වැවිලි ප්‍රජාවන් සහ අනෙකුත් ප්‍රජාවන් අතර සෞඛ්‍යය සම්බන්ධයෙන් පවතින පරතරය අවම කිරීම මඟින් වැවිලි ප්‍රජාවන්ගේ සෞඛ්‍යය තත්ත්වය වැඩිදියුණු කිරීම.

2 වැවිලි කළමනාකාරීත්වය සහ ප්‍රාදේශීය මහජන සෞඛ්‍ය කාර්යමණ්ඩලය අතර යහපත් සන්නිවේදන පද්ධතියක් ඇති කිරීම හරහා සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ වැවිලි ප්‍රජාව සවිබල ගැන්වීම සඳහා වන සියලුම ජාතික සෞඛ්‍ය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම තුලින් රජය විසින් සපයනු ලබන ප්‍රතිකාරක සහ නිවාරණ සේවා වැවිලි ප්‍රජාවට ලබා ගත හැකි බවට පත් කිරීම.

3 සියලුම වතු සෞඛ්‍ය ආයතන සෞඛ්‍ය අමාත්‍යාංශය යටතට පවරා ගැනීම සහ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට අනුතුලව වතු අංශයේ ප්‍රජාවන්ට සේවා ලබා ගත හැකි තත්වයක් ඇති කිරීම.

නාගරික සෞඛ්‍ය

1 නාගරික අංශය තුල සම්බන්ධීකරණයක් සහිතව ප්‍රාථමික සෞඛ්‍ය සේවාවන් සැපයීම සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා මහ නගර සභා සහ නගර සභා අතර සහයෝගීත්ව හවුල්කාරීත්වය සංවර්ධනය කිරීම සහ ශක්තිමත් කිරීම.

2 ශක්තිමත් නාගරික සෞඛ්‍ය පාලනයක් සඳහා නාගරික සෞඛ්‍යයට අදලව ව්‍යවස්ථා විධිමත් කිරීම.

3 සියළු ප්‍රතිපත්ති තුල සෞඛ්‍ය සහතික කිරීම සඳහා නාගරික සැලසුම්කරණයට සහ සංවර්ධනයට අදල සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන අංශවල ප්‍රධාන පාර්ශවකරුවන් සමඟ සහයෝගීත්ව හවුල්කාරීත්වය සංවර්ධනය.

4 සෞඛ්‍ය ප්‍රවර්ධනයෙහිලා සහ ප්‍රමුඛ අයහපත් සෞඛ්‍ය ප්‍රතිපල වැලැක්වීමේලා නාගරික ප්‍රජාවන් සහ ප්‍රධාන පාර්ශවකරුවන් සවිබල ගැන්වීම සහ යෙදවීම.

5 නාගරික අංශයෙහි ප්‍රමුඛ සෞඛ්‍ය ඉලක්ක සාක්ෂාත් කර ගැනීම නිතිපතා අධීක්ෂණය සහ ඇගයීම.

2022 වර්ෂයෙහි වතු අංශය තුල අත්කර ගත් ජයග්‍රහණ / විශේෂ අවස්ථා

1. වතු අංශය තුල කොවිඩ් වැලැක්වීමේ ක්‍රියාකාරකම්

පිළිබඳව වතු නිවාස සහ ප්‍රජා යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන්නන් (PCCF) සහ ප්‍රජා ශක්ති නිළධාරින් පුහුණු කරන ලදී. වැවිලි ප්‍රජා සන්නිවේදන

පහසුකම් සපයන්නන් (PSO) දිස්ත්‍රික්ක එකොළහක දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි වතු අංශයේ ජනතාව සමඟ කටයුතු කරයි. වතු කලාප හතක් පුරා විසුරුණු වතු තුල පිහිටි ප්‍රජා මධ්‍යස්ථාන හතලිස් හතරක ප්‍රජාශක්ති නිළධාරීන් රාජකාරි කරනු ලැබේ.

එම කලාපවල වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන්නන් 194 ක් අතරින් එකසිය හැටහය දෙනකු පමණ සහ ප්‍රජා ශක්ති නිළධාරින් 93 ක් අතුරින් නිළධාරින් 81 දෙනෙකු පමණ අපගේ සෞඛ්‍ය අධ්‍යාපන නිළධරින් විසින් පුහුණු කරන ලදී.

කොවිඩ් සුදනම කාර්තුමය වශයෙන් නිරීක්ෂණය කිරිමට : ක්ෂේත්‍ර වාරිකා තුල * සහ එය වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරින් සහ වතු අධිකාරීන් සමඟ සාකච්ජා කිරිම සඳහා වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සලසන්නන් හට පිරික්සුම් ලයිස්තුවක් (Checklist) ලබා දෙන ලදී.ප්‍රජා මධ්‍යස්ථාන කරන පැමිණෙන නව යොවුන් සහ තරුණ කණ්ඩායම් වෙත පණිවිඩ ගෙන යාම මෙමවැවිලි ප්‍රජා සන්නිවේදනපහසුකම් සලසන්නන් වෙතින් අපේක්ෂා කෙරිණි.එමෙන්ම යුනිසෙන් සංවිධානයේ මූල්‍ය සහයෝගය සහිතව කොවිඩ් 19 වැලැක්වීම පිළිබඳ වැවිලි ප්‍රජා සන්නිවේදන පහසුකම් සපයන්නන් සහ ප්‍රජා ශක්ති නිළධාරින් සඳහා අත් පොතක් ,අවදනම් දැනුම්දීමේ දැන්වීම් පුවරුවක් සහ හඬපට නිර්මාණය කරන ලදි.

2 මූල්‍ය සාක්ෂරතා වැඩ සටහන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ සහයෝගීත්වයෙන් යුතුව සියලුම දිස්ත්‍රික්කයන් තුළ වතු අංහයේ ප්‍රජාව සඳහා 2022 ජනවාරි සිට සැප්තැම්බර් මස දක්වා මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ හැකියා වර්ධනවැඩ සටහන් (capacity building programmers) පවත්වන ලදී.මෙම වැඩ සටහන් (ඉන්ධන අර්බුධය හේතුවෙන්) අතථ්‍ය වේදිකාව (virtual platform) ඔස්සේ පවත්වන ලදී. නුවරඑළිය, මහනුවර,මාතලේ ,රක්නපුර,කෑගල්ල,ගාල්ල,මාතර,කළුතර සහ කොළඹ දිස්ත්‍රික්ක තුළ තෝරා ගත් සෞඛ්‍ය සේවකයින් 60 ක් සඳහා (අතථ්‍ය වේදිකාව ඔස්සේ) පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහනක් ක්‍රියාත්මක කරන ලදී.මෙම වැඩසටහනෙහි අරමුණ වූයේ මූල්‍ය කළමනාකරණය පිළිබඳව මහජන සෞඛ්‍යකාර්ය මණ්ඩලයේ හැකියාව වර්ධනය කිරිම වේ. එමඟින් ඔවුන්ට අවදනමට ලක්විය හැකි වතු ප්‍රජාවගේ ගැටලු හඳුනා ගැනීමටත් ඒ සම්බන්ධයෙන් සහායවීමට සහ මාර්ගෝපදේශයක් සැපයීමට හැකි වනු ඇත.

3. වතු ආශ්‍රිතව මධ්‍යසාර, දුම්කොළ සහ අනෙකුත් මත් ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම

තෝරා ගත් දිස්ත්‍රික්කවල සෞඛ්‍ය සේවකයින් සඳහා හැකියා වර්ධන වැඩ සටහන් පැවැත්වීම සඳහා මධ්‍යසාර හා මත් ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානහි (ADIC) සහයෝගීත්වය සහිතව ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අනුග්‍රහකත්වය ලබා දෙන ලදී. වැවිලි සෞඛ්‍ය සේවකයින් සඳහා හැකියා වර්ධන වැඩසටහන් 7 ක් පවත්වන ලද අතර මහජන සෞඛ්‍ය අංශයේ ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සඳහා පුහුණුකරන්නන් පුහුණුකිරීමේ වැඩසටහන් 8 ක් පවත්වන ලදී. මධ්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානයහි (ADIC) සහයෝගීත්වයෙන් යුතුව පසු විපරම් වැඩ සටහන්ද සැලසුම් කරන ලදී.

4. පාසැල් මුඛ සෞඛය ප්‍රවර්ධන ක්‍රියාකාරකම් සහ මුඛ පිළිකා සඳහා පරීක්ෂා කිරීමේ වැඩ සටහන්

සෑම වතු කලාපයකිනිම ස්වේච්ජා සේවකයින් හඳුනා ගැනීමටවතු මානව සම්පත් වැවිලි භාරය (PHDT) සහය ලබා දෙන ලදී. පුහුණු වැඩ සටහන් පැවැත්වීමට හැකිවන පරිදි නම් ලැයිස්තු අදල ප්‍රාදේශිය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් වෙත ලබා දෙන ලදී

ස්වේච්ජා සේවකයින්ට වතු වල මුඛ පිළිකා සම්බන්ධයෙන් (Oral CA) පරීක්ෂා කිරීමේ වැඩ සටහන් සඳහා සහායවීමට අවසර ලබාදීම සම්බන්ධයෙන් වතු මානව සම්පත් වැවිලි භාරය සමඟ සකච්ජාවක් පවත්වන ලදී.

5. ජාතික ළමා රක්ෂණ අධිකාරිය (NCPA) සමඟ පවත්වන ලද ක්‍රියාකාරකම්

ජාතික ළමා රක්ෂණ අධිකාරියේ (NCPA) අදල නිළධාරින් සමඟ නුවරඑළිය සහ හැටන් වතු කලාපයේ ප්‍රජා ශක්ති නිළධාරින් සඳහා හැකියා වර්ධන වැඩ සටහන් පවත්වන ලදී.

මස්කෙළිය (නුවරඑළිය) සහ දැරණියගල (කෑගල්ල)සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාලයන්හි මහජන සෞඛ්‍යකාර්යමණ්ඩලය සඳහා හැකියා වර්ධන වැඩ සටහන් පවත්වන ලදී.

6ග ආර්ථික අර්බුදය සැලකිල්ලට ගනිමින් සිදු කරන ලද විශේෂ ක්‍රියාකාරකම්

ළමා සංවර්ධන මධ්‍යස්ථාන 22 ක් සඳහා ආසන්න වශයෙන් එක් මධ්‍යස්ථානයක ළමුන් 50 ක් ආවරණය වන පරිදි 2022 සැප්තැම්බර් මස සිට (2023 මැයි මස දක්වා) මාස 09 ක කාලයක් සඳහා දිවා ආහරය සැපයීම. තෝරා ගත් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරි කාර්යාල යටතේ තෝරා ගත් අසරණ ප්‍රජාව සඳහා ආහාර බාස්කට් බෙදා දෙන ලදී.

වතු අංශයේ දිවා ආහාරය නොලැබෙන පාසැල් හදුනා ගෙන එම පාසැල් ලැයිස්තුව අවශ්‍ය කටයුතු සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් මහජන සෞඛ්‍ය සේවා II වෙත යොමු කරන ලදී.

7ග ජාතික වතු මෙහෙයුම් කමිටුව

- සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන් ලැයිස්තුව හදුනා ගන්නා ලදී.
- වතු මෙහෙයුම් කමිටුවෙහි පළමු රැස්වීම මේ වන විට සැලසුම්කරමින් පවතියි.

2022 වර්ෂයේ නාගරික අංශය තුළ අත්පත් කර ගත් ජයග්‍රහණ / විශේෂ අවස්ථා

1 කොවිඩ් 19 වැලැක්වීම සඳහා කසළ එකතුකරන්නන් ඇතුළුව අධි අවධානමක් සහිත වෘත්තිය කාණ්ඩායම්වල දැනුවත්භාවය සහ නිපුණතා වැඩි දියුණු කිරීමට සහ ශ්‍රී ලංකාවේ නාගරික අංශය තුළ සාමාන්‍ය නව චර්යාවන් අනුගමනය කිරීම දිරිමත් කිරීමට කටයුතු කරන ලදී. යුනිසෙප් සංවිධානය විසින් අරමුදල් සපයන ලද වැඩ සටහන -කසළ එකතුකරන්නන් 3000 ක් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩ සටහන් සහ දැනුවත් කිරීමේ වැඩ සටහන් පවත්වන ලදී. තොරතුරු අධ්‍යාපන සංනිවේදන ද්‍රව්‍ය සකස් කර බෙදදෙන ලදි. පුහුණුවන්නන්ගේ අත්පොත හැකි කොවිඩ් උපදෙස් කාඩ් පත කොවිඩ් උපදෙස් සහිත 2022 දින දර්ශනය කසල එකතු කරනනන්ගේ කාර්යමණ්ඩලයේ දැනුම ආකල්ප සහ භාවිතයන් ඇගයීම සඳහා පූර්ව සහ පශ්චාත් දැනුම ආකල්ප සහ භාවිතය පිළිබඳ අධ්‍යනයක් සිදු කරන ලදී.

2 කොළඹ මහ නගර සභාව සහ අනෙතුත් මහ නගර සභා ප්‍රදේශවල ස්ථාපනය කරන ලද සුවතා මධ්‍යස්ථානවල කාර්යයන්

නාගරික ජනතාව අතර බෝ නොවන රෝග වැළැක්වීම සඳහා මෙන්ම සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා තොර්ගත් මහ නගර සභා සහ නගර සභා ප්‍රෙද්ශයන්හි මධාස්ථාන 30ක් පිහිටුවන ලදි. අවධානම තක්සේරු කිරීම සඳහා ප්‍රජා ශූර කණ්ඩායම් පුහුණු කිරීම අවසන් කර ඇති අතර මධ්‍යස්ථාන කාර්යයන් අධීක්ෂණය කිරීම සහ කාර්තුමය වශයෙන් සමාලෝචනය කිරීම සිදු කර ඇත.. මූල්‍ය කළමණාකරණය, ජීවන කුසලතා,මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් සමාලෝචනයන් සිදු කිරීම සහ සම්බන්ධීකරුවන් පුහුණු කිරීම සිදු කරන ලදි

3 මූල්‍ය කළමණාකරණ පැකේජයක් නිර්මාණය කිරීම-පෝෂණය ඉහළ නැංවීමේ සිවිල් ජනතා සංසදයේ (SUNPF) සහාය සහිතව මූල්‍ය කළමණාකරණ පැකේජයක් නිර්මාණය කිරීම ත්‍රෙභාෂා අත්පොත, වීඩියෝ පට දෙකක්, බිත්ති සටහන් ආදිය නිර්මාණය කර බෙදා හරින ලදි. සිරස ටීවී, සිරස ෆස්ට්, සියත ටීවී රූපවාහිනී වැඩසටහන් කිහිපයක් පවත්වන ලදි. විවිධ පාර්ශවකාර කණ්ඩායම්, සෞඛ්‍ය කාර්යය මණ්ඩල, පොලිස් දෙපාර්තමේන්තුව, ප්‍රජා නායකයින් , නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රජා සංවර්ධන නිළධාරීන්, සමෘද්ධි නිළධාරීන්, ආදින් සඳහා මුදල් කළමණාකරණය පිළිබඳව පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

4 මව් හවුල (Mother Support Group) සඳහා මුදල් කළමණාකරණ වැඩසටහන් යුනිසෙෆ් සංවිධානය මගින් මූල්‍යාධාර සපයන ව්‍යාපෘතියකි. මව් හවුලේ සාමාජිකයන් (Mother Support Group) වෙත සමීපවීම සඳහා පළාත් සහ දිස්ත්‍රික්ක මට්ටමින් පුහුණුකරුවන් ප්‍රහුණු කිරීමේ වැඩසටහන් ((TOT) කරන ලදි. මෙම වැඩසටහන් 2023 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිතය.

5 තරුණයන් සඳහා වන සෞඛ්‍ය වැඩසටහන කොළඹ දිස්ත්‍රික්කයේ තෝරාගත් අඩු ආදායම්ලාභී තට්ටු නිවාස සංකීරණයන් තුළ ජීවත් වන නාගරික තරුණ කණ්ඩායම් සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවන රටා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (GBV) වැළැක්වීම සහා මූල්‍යමය වශයෙන් ඔරොත්තුදීමේ හැකියාව පිළිබඳව හැකියා වර්ධනය කිරීම, ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් මූල්‍යධාර සපයන ලද වැඩසටහනකි. විවිධ පාර්ශවයන් සමඟ එක්ව සකසන ලද තරුණ සෞඛ්‍ය ප්‍රවර්ධන පැකේජය අවශ්‍ය පරිදි සකස් කර ගැනීම සම්බන්ධයෙන් උපදේශන රැස්වීමක් පවත්වන ලදි. මහල් නිවාස හයක තොරා ගත් තරුණ නායකයින් සඳහා දින දෙකක පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු දෙකක් පවත්වන ලදි. පුහුණු කරන ලද පුහුණු කරුවන් මගින් ඔවුන් ජීවත්වන පරිසරයන්හි දී දැනුවත් කිරීමේ සැසි හයක් පවත්වන ලදි.

6 නාගරික සෞඛ්‍ය ශක්තිමත් කිරීම සහ සෞඛ්‍ය සහ නාගරික පළාත් පාලන අතර පවත්නා සම්බන්ධය ශක්තිමත් කිරීම සඳහා තොරාගත් නාගරික ප්‍රෙද්ශයන්ගෙන් සහ නිළධාරීන්ගෙන් රැස්කරගත් දත්ත පදනම් කර ගනිමින් නීති සඳහා සංශෝධනයන් සකස් කරන ලද අතර, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් සමඟ සාකච්ඡා කිරීමට අපේක්ෂා කෙරෙයි.

7 ජාතික නාගරික සෞඛ්‍ය මෙහෙයුම් කමිටුව ස්ථාපනය කිරීම. සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන්ගේ ලැයිස්තුව හඳුනා ගන්නා ලදි. නාම යෝජනා ලැබුණි.

2023 වර්ෂය සඳහා සැළසුම් කර ඇති විශේෂ සංවර්ධන ක්‍රියාකාරකම්- වතු අංශය

වතු අංශය

1. වතු අංශය තුළ තරුණ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

වතු අංශයේ තරුණ සෞඛ්‍ය ප්‍රවර්ධන ක්‍රියාකරාකම් 2023 ජූනි මස සිට නුවරඑළිය දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලදි. එහිදී වතු සහ නාගරික සෞඛ්‍ය අංශය විසින් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධක්ෂ, දිස්ත්‍රික් ලේකම් සහ මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC), යොවුන් උපදේශන ජාලය (YAN SL) තරුණ කණ්ඩායම් සමඟ සහයෝගිතාවයෙන් කටයුතු කරන ලදි. නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික වශයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුනක් (අඹගමුව, වලපනේ, නුවරඑළිය) සහ සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී ප්‍රදේශ තුනක් (බගවන්තලාව, රාගල, කොටගල) හඳුනා ගන්නා ලදි. මාස තුනකින් සමාලෝචන කටයුතු සිදු කරනු ඇත.

2. මධ්‍යසාර දුම්කොළ සහ අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතය වැළැක්වීම සඳහා හැකියා වර්ධන වැඩසටහන් පැවැත්වීම

කෑගල්ල, ගාල්ල, සහ නුවර වතු කළාපයන්හි වතු අංශයේ වැවිලි පවුල් සුභසාධන නිලධාරීන්(PFWO) , ළමා සංවර්ධන නිළධාරීන් සහ අනෙකුත් ප්‍රජා නායකයින් සඳහා හැකියා වර්ධන වැඩසටහන් 2023 ජූනි මස සිට ආරම්භ වනු ඇත.

3. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මට්ටමින් වතු අංශයේ ක්‍රියාකාරකම් සමාලොචනය කිරීම

යක්කලමුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී ප්‍රදේශය (මාර්තු 28) , පාදුක්ක සහ හංවැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලය (අප්‍රේල් 27) වෙත ක්ෂේත්‍ර වරිකා සිදු කරන ලදි. වතු අංශයේ ප්‍රජාවට අදාළ දත්ත වෙනම ලබා ගැනීමේ ශක්‍යතාව පිළිබඳව සාකච්ඡා කරන ලදි. ඔවුන්ගේ අදහස් මත පදනම්ව ඇගයීමේ, විශ්ලේෂණය කිරීමේ සහ ක්‍රියාමාර්ග ගැනීමේ කටයුතු වෙන් වශයෙන් සිදු කරන ලෙස ඉල්ලා සිටිමින් මහජන සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් II ගේ අත්සනින් යුතු අත්සනින් යුතු ලිපියක් සකස් කර දිස්ත්‍රික්ක එකොළහි(11) සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල වෙත යොමු කරන ලදි.

4 වතු ප්‍රජාවගේ පෝෂණ තත්වය ඇගයීම සහ අදාළ පාර්ශව විසින් ඒ සම්බන්ධයෙන් සිදු කිරීමට නියමිත ක්‍රියාකාරකම්- 2023

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අරමුදල් අනුමත කිරීමෙන් අනතුරුව ඉහත ක්‍රියාකාරකම් 2023 ජූනි මස 20 වන දින සිට ආරම්භ කෙරෙනු ඇත.

මෙහි ප්‍රධාන අරමුණු දෙක (02) වනුයේ

- දිස්ත්‍රික්ක වශයෙන් ශ්‍රී ලංකාවේ වතුකරයෙහි විවිධ කාණ්ඩයන්ට අයත් ප්‍රජාවන්ගේ මානවමිතික (anthropometric) සහ ජෛව රසායනික (bio-chemical) තත්තවය තක්සේරු කිරීම සඳහා සමීක්ෂණයක් පැවැත්වීම
- සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා වතු අංශයට අදාළව තොරා ගත් සෞඛ්‍ය සහ සෞඛ්‍ය නොවන පාර්ශවකරුවන් සඳහා උපදෙස් ලබාදීම

2022වර්ෂය සඳහා සැළසුම් කර ඇති විශේෂ සංවර්ධන ක්‍රියාකාරකම්- නාගරික සෞඛ්‍ය

1 මව් හවුල සඳහා (Mother Support Group) මුදල් කළමණකරණ වැඩසටහන් යුනිසෙෆ් සංවිධානය මගින් මූලාධාර සපයන ව්‍යාපෘතියකි. මව් හවුලේ (Mother Support Group) සමාජිකයන් වෙත ලභාවීම සඳහා 2022 හි පළාත් සහ දිස්ත්‍රික්ක මට්ටමින් නිර්මාණය කරන ලද පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. මද්‍යසාර සහ මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය (ADIC), ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL), පෝෂණය ඉහළ නැංවීමේ සිවිල් ජනතා සංසදයේ (SUNPF) හි සහාය සහිතව සියළුම පළාත් ආවරණය වන පරිදි පුහුණුකරුවන් පුහුණු කිරීමේ පළාත් වැඩසටහන් පවත්වන ලදි. සියළුම දිස්ත්‍රික් වැඩසටහන් සංවිධානය කරන ලදි.

2 කොවිඩ් 19 වැළැක්වීම සඳහා සහ ශ්‍රී ලංකාවේ නාගරික අංශයේ නව සාමාන්‍ය හැසිරවීම්වලට අනුගතවීම, දිරිගැන්වීම සඳහා සෞඛ්‍ය සේවකයන් සහ කසළ එකතුකරන්නන් ඇතුළු අවධානම් සහිත වෘත්තීය කණ්ඩායම්වල දැනුවත්භාවය සහ කුසලතා ඉහළනැංවීම යුනිසෙෆ් සංවිධානය විසින් අරමුදල් සපයන ලද වැඩසටහන- 2022 වර්ෂයේදි කසළ එකතු කරන්නන්ගේ කාර්යය මණ්ඩලයෙහි දැනුම, ආකල්ප, සහ භාවිතයන් ඇගයීම සඳහා පවත්වන ලද පූර්ව සහ පශ්චාත් අධ්‍යයනය (KAP) දත්ත බෙදා හැරීම, සහ බළධාරීන්ට උපදෙස් ලබාදීම 2023 වර්ෂයේ පළමු වන කාර්තුව තුළ සිදු කරන ලදි.

3 තරුණයන් සඳහා වූ සෞඛ්‍ය වැඩසටහන- සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (GBV) වැළැක්වීම සහ මූල්‍යමය වශයෙන් ඔරොත්තුදීමේ හැකියාවට අදාළව කොළඹ දිස්ත්‍රික්කයේ තෝරා ගත් මහල් නිවාසවල පදිංචි නාගරික තරුණ කණ්ඩායම්වල හැකියා වර්ධනය කිරීම, ලෝක සෞඛ්‍ය සංවිධයනය විසින් අරමුදල් සපයන ලද ව්‍යාපෘතියකි. -මධ්‍ය කාලීන සමාලොචනය සිදුකරන ලද අතර අඩුපාඩු කිහිපයක් හඳුනා ගන්නා ලදි. ප්‍රතිශෝධිත අයවැය යටතේ අමතර හැකියා වර්ධන වැඩසටහන් දෙකක්(02) පවත්වන ලදි. අවසාන සමාලෝචනය සිදුකර අවසන් කරන ලදි.

4 සුවතා මධ්‍යස්ථානයන්ගේ කාර්යයන් අධීක්ෂණ චාරිකා සහ සමාලෝචනය කිරීම් මගින් අධීක්ෂණය කිරීමට ආපේක්ෂිත කාර්යයන් ඇගයීමට ලක් කිරීමට අපේක්ෂිතය. බොහෝ ස්ථානයන්ට අධීක්ෂණ චාරිකා සිදු කර ඇත.

4.2.8 නිරෝධායන සේවා

හැඳින්වීම

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරෝධායන ඒකකය ශ්‍රී ලංකාවේ දේශසීමාවේ සෞඛ්‍ය ආරක්ෂාව පවත්වාගෙන යාමේ ප්‍රධාන හවුල්කරුවෙකි. මෙම ඒකකයේ ප්‍රධාන වගකීම වන්නේ ජාත්‍යන්තරව පැතිරෙන රෝග හා වෙනත් මහජන සෞඛ්‍ය තර්ජන පැතිරීම සීමා කිරීම, ඒවාට ප්‍රතිචාර දැක්වීම මඟින් ජාත්‍යන්තර ගමනාගමනය සහ වෙළඳාමට බාධාවක් නොවන ලෙස පවත්වා ගැනීමයි. මෙහි කාර්ය භාර්ය වන්නේ ආරක්ෂණ ක්‍රියාමාර්ග මඟින් ජාත්‍යන්තර සංචාරකයින්, ගුවන් යානා සහ නැව් කාර්ය මණ්ඩලය සහ සාමාන්‍ය ජනතාවගේ සෞඛ්‍ය සහ යහපැවැත්ම ඇතුළු මිනිස් සෞඛ්‍යයට සිදුවන හානිය වැළැක්වීමයි.

සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිරෝධායන ඒකකය, ආරක්ෂක අමාත්‍යාංශය, රේගුව, ජෛව ආරක්ෂණය, සමුද්‍රීය හා ගුවන් ප්‍රවාහන, සත්ව සෞඛ්‍ය, රෙගුලාසි / ගිවිසුම් බලාත්මක කිරීම හා සංක්‍රමණ වගකීම් සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අනෙකුත් ඒකක ඇතුළු දේශසීමා පාලන වගකීම සහිත වෙනත් ආයතන සමඟ කටයුතු කරයි.

නිරෝධායන ඒකකය යටතේ ඇති මහජන සෞඛ්‍ය කාර්යාල වන්නේ ජාත්‍යන්තර ගුවන්තොටුපල ඇති ගුවන්තොටුපල සෞඛ්‍ය කාර්යාල (බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොල-මත්තල, යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපල, රත්මලාන ජාත්‍යන්තර ගුවන්තොටුපල), ජාත්‍යන්තර වරායන්හි පිහිටා ඇති සෞඛ්‍ය කාර්යාල (කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට සහ නොරොච්චෝල) , වෛද්‍ය පර්යේෂණ ආයතනයේ පිහිටා ඇති සහකාර වරාය සෞඛ්‍ය කාර්යාලය සහ ආගමන සෞඛ්‍ය ඒකකයන් වේ. මීට අමතරව, 2023 වසරේ කන්කසන්තුරේ වරායේ මෙහෙයුම් ආරම්භ කර ඇත.

නිරෝධායන ඒකකයේ සහකාර වරාය සෞඛ්‍ය කාර්යාලය කහ උණ, මෙනින්ගෝකොකල් මෙනින්ජයිටිස් සහ පෝලියෝ වලට එරෙහිව එන්නත් සංචාරකයින්ට ලබා දීම සිදු කරයි.

සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අන්තර්ජාතික සංක්‍රමණික සංවිධානය (IOM), නේවාසික වීසා බලපත්‍ර අයදුම්කරුවන්ගේ අභ්‍යන්තර සෞඛ්‍ය තක්සේරුවක් සිදු කර මැලේරියාව, බරවා රෝගය, ක්ෂය රෝගය සහ එච්. අයි. වී. රෝගය සඳහා හඳුනාගැනීමේ පරීක්ෂණ සිදු කරයි. එම රෝග සහිත අයදුම්කරුවන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ මහජන සෞඛ්‍ය ඒකක වෙත ප්‍රතිකාර සහ පසුවිපරම් සඳහා යොමුකිරීම සහ ඔවුන්ගේ පසු විපරම් අධීක්ෂණය, නිරෝධායන ඒකකයේ ආගමන සෞඛ්‍ය ඒකකය මඟින් සිදු කරයි.

ශ්‍රී ලංකාවේ බෝවන රෝග දැනුම් දීමේ ඉතිහාසය 19 වන සියවසේ අග භාගය ය දක්වා දිවයයි. දිවයිනේ බෝවන රෝග දැනුම් දීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 1897 දී නිරෝධායන හා රෝග වැළැක්වීමේ ආඥා පනත හඳුන්වා දී ඇත. ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR)-2005 ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකාව නීත්‍යානුකූලව බැඳී සිටී. නිරෝධායන ඒකකය යනු ශ්‍රී ලංකාවේ අන්තර්ජාතික සෞඛ්‍ය රෙගුලාසි (IHR)-2005 හි සම-ජාතික කේන්ද්‍රීය ස්ථානයකි.

දැක්ම

ජාත්‍යන්තරව රෝග පැතිරීමකින් තොරව රට පවත්වා ගැනීම.

මෙහෙවර

ජාත්‍යන්තර ගමනාගමනය හා වෙළඳාමට සැලකිය යුතු බාධාවක් නොකර ශ්‍රී ලංකාවට රෝග ඇතුළු වීම හෝ මහජන සෞඛ්‍ය අවදානම් සහිත සිදුවීම් වලින් ආරක්ෂා කිරීම, වැළැක්වීම සහ පාලනය කිරීම.

ඉලක්කය

ලෝකයේ ගමනාගමනය හා වෙළඳාමට බාධා අවම වන ආකාරයට, ජාත්‍යන්තර රෝග පැතිරීමට එරෙහිව උපරිම ආරක්ෂාව සහතික කිරීම ඉලක්ක කර ගැනීම සිදු වේ. අන්තර්ජාතික අවශ්‍යතා පිළිබඳ

මහජන සෞඛ්‍ය හදිසි අවස්ථාවක (PHEIC) හෝ එම අවස්ථා වලට තුඩු දිය හැකි තත්වයක් තුළ සූදානම් වීම සහ ප්‍රතිචාර දැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග මෙයට ඇතුළත් ය.

අරමුණු

- ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR)-2005 ට අනුකූලව ජාත්‍යන්තර ව්‍යාප්තිය හා සම්බන්ධ රෝග ඇතිවීම වැළැක්වීම සඳහා ප්‍රවේශ ස්ථාන (PoE) වන ගුවන්තොටුපළ/වරායන් ශක්තිමත් කිරීම.
- රෝග අවධානම් සහ අනෙකුත් සෞඛ්‍ය තර්ජන කාර්යක්ෂමව හඳුනාගැනීම සඳහා ප්‍රවේශ ස්ථානවල නිරීක්ෂණ ශක්තිමත් කිරීම.
- ජාතික නිරීක්ෂණ පද්ධතිය සමඟ සම්බන්ධ සෞඛ්‍ය තොරතුරු පද්ධතියක් ප්‍රවේශ ස්ථාන වල ස්ථාපිත කිරීම හා සංවර්ධනය කිරීම.
- ජාත්‍යන්තර වශයෙන් සැලකිලිමත් වන මහජන සෞඛ්‍ය හදිසි අවස්ථා (PHEIC) වලට අදාල කරුණු ඇතුළු නිරෝධායන පණතට අදාල නීතිමය රාමුව ශක්තිමත් කිරීම.
- ගෝලීය සෞඛ්‍ය ආරක්ෂණය සහ ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි {International Health Regulations (IHR)-2005} වලට අදාලව මහජන සෞඛ්‍ය සේවකයින් පුහුණු කිරීම.
- ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි (IHR)-2005 වලට අදාලව පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ලෝක සෞඛ්‍ය සංවිධානය සහ අනෙකුත් සාමාජික රටවල් සමඟ සන්නිවේදනය සහ සහජීවනය වැඩි දියුණු කිරීම.

2022 සහ 2023 මුල් භාගයේ සාර්ථකව සිදු කළ දේ සහ විශේෂ සිදුවීම්

- ප්‍රවේශ ස්ථානවල නිරෝධායන ක්‍රියාකාරකම් පිළිබඳ දැනුවත් කිරීම සහ ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි -2005 පිළිබඳව උපාධි අපේක්ෂක වෛද්‍ය සිසුන් / ආයුර්වේද වෛද්‍ය සිසුන් / උපාධි අපේක්ෂක හෙද සිසුන් සහ හෙද ඩිප්ලෝමා අභ්‍යාසලාභීන් / මහජන සෞඛ්‍ය පරීක්ෂක අභ්‍යාසලාභීන් මෙන්ම ප්‍රජා වෛද්‍ය විෂය ධාරාවේ / වෛද්‍ය පරිපාලන විෂය ධාරාව / වෛරස් විද්‍යා විෂය ධාරාව / ආපදා කළමනාකරණ ඩිප්ලෝමාව හදාරන පශ්චාත් උපාධි අභ්‍යාසලාභී වෛද්‍යවරුන් දැනුවත් කිරීමේ කාර්යයන් නිරෝධායන ඒකකය, සහකාර වරාය සෞඛ්‍ය කාර්යාලය සහ ප්‍රවේශ ස්ථානවල පිහිටි සෞඛ්‍ය කාර්යාලවල දී සිදු කරන ලදී.
- රටේ මානව සෞඛ්‍ය, සත්ව සෞඛ්‍ය, සහ පාරිසරික අංශවල ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සහභාගීත්වයෙන් 2023 පෙබරවාරි මාසයේදී ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි සහ පශු වෛද්‍ය සේවා සම්බන්ධ (IHR-PVS) National Bridging Workshop සාර්ථකව අවසන් කරන ලදී.
- මැයි මාසයේදී, ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සහයෝගීතාවයෙන් අවදානම් තක්සේරු කිරීමේ උපායමාර්ගික මෙවලම් (Strategic Tool for Assessing Risks- STAR) හඳුන්වා දීම සම්බන්ධ, දින 3 ක නේවාසික වැඩමුළුවක් විවිධ ආයතනවල පාර්ශවකරුවන් 70 කට වැඩි පිරිසකගේ සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලදී.
- 2023 සැප්තැම්බර් මාසයේ පැවැත්වීමට නියමිත ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සහයෝගයෙන් පැවැත්වීමට නියමිත ඒකාබද්ධ බාහිර ඇගයීම (Joint External Evaluation) සඳහා කටයුතු සූදානම් කිරීම.
- හම්බන්තොට වරාය සෞඛ්‍ය කාර්යාලය මඟින් වරාය පරිශ්‍රවල සිටින සියලුම සේවකයන් අරභයා මැලේරියාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සහ මත්තල ගුවන් තොටුපල සෞඛ්‍ය කාර්යාල මඟින් ආරක්ෂක නිලධාරීන්, ගිනි නිවන නිලධාරීන් සහ අනෙකුත් කාර්ය මණ්ඩලය සඳහා HIV ඒඩ්ස් පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් පවත්වන ලදී.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොල සෞඛ්‍ය කාර්යාලය මඟින් කම්කරුවන් සඳහා බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළේදී හදිසියේ ගුවන් යාත්‍රාවක් අනතුරට ලක්වීම සහ මහා පරිමාණ ජීවිත හානිවලට මුහුණ දීම සඳහා සියලුම කාර්ය මණ්ඩලයේ අවධානය යොමු කරමින් හදිසි සූදානම් කිරීමේ අභ්‍යාසයක් පැවැත්විණි.

- මත්තල ගුවන් තොටුපළ සෞඛ්‍ය කාර්යාලයේ පිරිසිදු කිරීමේ කාර්ය මණ්ඩලය ඉලක්ක කර ගනිමින් ගුවන් අපද්‍රව්‍ය කළමනාකරණය සහ ඩෙංගු බෝවීම පාලනය පිළිබඳ සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන් පවත්වන ලදී.
- කන්කසන්තුරේ වරායේ සෞඛ්‍ය නිරෝධායන පහසුකම් ආරම්භ කර ඇති අතර තෙලිප්පලෙයි සෞඛ්‍ය වෛද්‍ය සෞඛ්‍ය කාර්ය මණ්ඩලය මඟින් අවශ්‍ය අවස්ථාවලදී රාජකාරි ආවරණය කිරීමට කටයුතු යොදා ඇත.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ හදිසි අවස්ථා සඳහා අභ්‍යාස සිදු කිරීම.

දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති විස්තර

ශ්‍රී ලංකා රජයේ ආධාර යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තු පිරිවැය	භෞතික ප්‍රගතිය 2022.12.31 වන විට	මූල්‍ය ප්‍රගතිය 2022.12.31
1. සංචාරකයින් සඳහා කහ උණ එන්නත් ලබා දීම		වෛද්‍ය පර්යේෂණ ආයතනයේ පිහිටි සහකාර වරාය සෞඛ්‍ය කාර්යාලයේදී කහ උණ එන්නත් කිරීම සඳහා සංචාරකයින් 3736 දෙනෙකුට එන්නත් ලබා දෙන ලදී. එන්නත 2022 සැප්තැම්බර් සිට 2023 ජනවාරි 23 දක්වා රට තුළ නොතිබුණි.	-
2. නැව් සනීපාරක්ෂක සහතික නිකුත් කිරීම		නෞකා සනීපාරක්ෂක සහතිකය නිකුත් කිරීම සඳහා නෞකා 589ක් පරීක්ෂාවට ලක් කරන ලදී.	
කාර්ය මණ්ඩලය සඳහා සෞඛ්‍ය අධ්‍යාපන වැඩසටහන	0.1 මිලියන	BIA/simulation drill හි සිදු කරන ලද වැඩසටහනකි.	අරමුදල් භාවිතා කර නොමැත.
නිරෝධායන ඒකකයේ සමාලෝචන රැස්වීම්	0.2 මිලියන	Zoom හරහා රැස්වීම් පවත්වන ලදී.	අරමුදල් භාවිතා කර නොමැත.
IHR-2005 පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම	0.1 මිලියන	එක රැස්වීමක් පවත්වන ලදී.	රු.62,000.00

ලෝක සෞඛ්‍ය සංවිධානයේ ද්වි වාර්ෂික මූල්‍ය ප්‍රධානය 2022 - 2023

ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තු පිරිවැය	භෞතික ප්‍රගතිය 2022.12.31 වන විට	මූල්‍ය ප්‍රගතිය 2022.12.31 වන විට
1. ජාත්‍යන්තර සෞඛ්‍ය රෙගුලාසි **(IHR) -2022** පිළිබඳ රාජ්‍ය පාර්ශවයේ වාර්ෂික වාර්තාව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා උපදේශන රැස්වීම	රු.703,300.00	කාර්යය සම්පූර්ණ කරන ලදී.	රු.632,215.00

2. සෞඛ්‍ය ආරක්ෂාව සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම ඇගයීම් රැස්වීම පැවැත්වීම	රු. 779,150.00	කාර්යය සම්පූර්ණ කරන ලදී.	රු. 617,659.00

කාර්ය සාධන ප්‍රවණතා









සැලසුම් කරන ලද විශේෂ සංවර්ධන ක්‍රියාකාරකම්

- ලෝක සෞඛ්‍ය සංවිධානය සමඟ සහයෝගයෙන් ඒකාබද්ධ බාහිර ඇගයීම. (JEE)
- ඉදිරි වසර 5 සඳහා සෞඛ්‍ය ආරක්ෂාව සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- නිරෝධායන ඒකකය යටතේ ඇති සියලුම ඒකක සමඟ සමාලෝචන රැස්වීම් පැවැත්වීම.
- අලුතින් ස්ථාපිත කන්කසන්තුරේ වරායේ නිරෝධායන සේවා වැඩි දියුණු කිරීම.

විශේෂ සිදුවීම්වල ඡායාරූප

ප්‍රවේශ ස්ථානවල පුහුණු වැඩසටහන්

BIA හි හදිසි ආපදා පෙර සූදනාම් පුහුණු සැසි

BIA හි මැලේරියාව සඳහා පරීක්ෂණ

4.2.9 වැඩිහිටි, තරුණ, ආබාධිත හා අභ්‍යන්තරික අවතැන්වූවන් වෙනුවෙන් සේවා

දැක්ම සහ මෙහෙවර

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ප්‍රධාන සැලැස්මට අනුව සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම, රෝග නිවාරණය සහ සෞඛ්‍ය ප්‍රවර්ධනය තුළින් තරුණ, වැඩිහිටි සහ ආබාධිත පුද්ගලයින්ගේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම.

වැඩිහිටි සෞඛ්‍ය සත්කාර

දැක්ම

සෞඛ්‍ය සම්පන්න ක්‍රියාකාරී සහ ඵලදායී වැඩිහිටි ජනගහනයයක් ඇති කිරීම.

පොදු අරමුණු

1. වත්මන් වැඩිහිටියන්ගේ කායික, මානසික සහ සමාජීය යහපැවැත්ම වැඩිදියුණු කිරීම.
2. අනාගතයේදී සෞඛ්‍ය සේවාව වඩාත් ක්‍රියාශීලී සහ වඩා ඵලදායී වැඩිහිටි ජනගහනයක් සාක්ෂාත් කර ගැනීම.

ආබාධිත සෞඛ්‍ය රැකවරණය

දැක්ම

ආබාධිත පුද්ගලයින්ගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම.

පොදු අරමුණ

1. ආබාධිත පුද්ගලයින් සඳහා සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම.

තරුණ හිතකාමී සෞඛ්‍ය සේවා

දැක්ම

නිරෝගී සහ ඵලදායී නව යොවුන් වියේ සහ තරුණ ජනගහනයයක් ඇති කිරීම.

පොදු අරමුණ

1. යෞවන ගැටලු අවම කර ඔවුන්ගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා යෞවනයන් අතර දැනුම ආකල්ප සහ ජීවන කුසලතා වැඩිදියුණු කිරීම

2022 දී ජයග්‍රහණ

ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය රුපියල්.	2022.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය	2022.12.31 දිනට භෞතික ප්‍රගතිය(%).
<u>වැඩිහිටි</u> **01. ICOPE** (වැඩිහිටි පුද්ගලයින් සඳහා ඒකාබද්ධ සත්කාර) පිළිබඳ ප්‍රාථමික සෞඛ්‍ය වෛද්‍යවරුන් සඳහා පුහුණු වැඩසටහන - **(WHO)**	474,975.43 කි	474,975.43 කි	100
02. වැඩිහිටි පුද්ගලයින් සඳහා ඒකාබද්ධ සත්කාර පිළිබඳ හෙද නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන **(ICOPE) (WHO)**			
03. වැඩිහිටි පුද්ගලයින් සඳහා ඒකාබද්ධ සත්කාර **(ICOPE)** (දෘෂ්ටීය, ශ්‍රවණය, සංචලනය, පෝෂණ සහ මානසික සෞඛ්‍ය තත්ත්වය සඳහා වැඩිහිටියන් පරීක්ෂා කිරීම)	828675.43 කි	828675.43 කි	100
<u>ආබාධිතයි</u> **04.**දිගන (මහනුවර) පුනරුත්ථාපන ඒකකය සඳහා උපකරණ **(PSSP)**	5,000,000.00	4,055460.00 කි	81
05. RRH රාගම **(GOSL)** හි පුනරුත්ථාපන සේවාව වැඩිදියුණු කිරීම	1,000,000.00	200,000.00	20
එකතුව	**7,303,650.86 කි**	**5,559,110.86 කි**	

2023 වසරේ ජයග්‍රහණ	මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.	මූල්‍ය ප්‍රගතිය 2023.05.31 දිනට රු.	2023.05.31 දිනට භෞතික ප්‍රගතිය (%).
01. ජීවන පාඨමාලා ප්‍රවේශය **(WHO)** හරහා ක්‍රියාකාරී සෞඛ්‍ය සම්පන්න වයසට යාම පිළිබඳව ප්‍රජා නායකයින් සහ යෞවන සමාජ සාමාජිකයින් දැනුවත් කිරීම	142,045.71 කි	142,045.71 කි	100
02. මාතර දිස්ත්‍රික්කයේ **(WHO) ICOPE** පිළිබඳ හෙද නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන	217,472.86 කි	217,472.86 කි	100
03. මාතර දිස්ත්‍රික්කයේ **(WHO) ICOPE** පිළිබඳ ප්‍රාථමික සත්කාර වෛද්‍යවරුන් සඳහා පුහුණු වැඩසටහන	233,382.86 කි	233,382.86 කි	100

04. බස්නාහිර පළාතේ (WHO) ප්‍රාථමික සෞඛ්‍ය සේවා ආයතනවල ICOPE ක්‍රියාත්මක කිරීම සඳහා බහු පාර්ශ්වකරුවන්ගේ උපදේශන රැස්වීම	386,232.14 කි	386,232.14 කි	100
එකතුව	**979,133.57 කි**	**979,133.57 කි**	

2023 දී ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

විස්තර	වෙන් කිරීම රු. Mn.	වියදම රුපියල්.	ප්‍රගතිය %
<u>වැඩිහිටි</u> **01. ICOPE (වැඩිහිටි පුද්ගලයින් සඳහා ඒකාබද්ධ සත්කාර) WHO පිළිබඳ ප්‍රාථමික සත්කාර වෛද්‍යවරුන් සඳහා පුහුණු වැඩසටහන**	1,462,879.00 කි	457,412.86 කි	31
02. තෝරාගත් දිස්ත්‍රික්කයේ (WHO) රෝහල් කාර්ය මණ්ඩලය සඳහා ICOPE පුහුණුව	4,500,000.00		කෙරෙමින් පවතී
03. TH පේරාදෙණියේ වැඩිහිටි හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම **(GOSL)**	4,000,000.00		කෙරෙමින් පවතී
04.දකුණු පළාතේ වැඩිහිටි සත්කාර පිළිබඳ පර්යේෂණ **(GOSL)**	500,000.00		කෙරෙමින් පවතී
05.මාලිගාවත්ත ජාතික ICOPE පුහුණු මධ්‍යස්ථානය **(PSSP)** ඉදිකිරීම	3,000,000.00		කෙරෙමින් පවතී
<u>ආබාධිත</u> **06.** ජාතික පුනරුත්ථාපන සෞඛ්‍ය මාර්ගෝපදේශ **(WHO)** සංශෝධනය කිරීම සහ අවසන් කිරීම	1,160,005.00 කි		කෙරෙමින් පවතී
07. CSHW (PSSP) හි සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සඳහා සංඥා භාෂාව පිළිබඳ පුහුණුව	600,000.00 කි		කෙරෙමින් පවතී
<u>තරුණ</u> **08.** තරුණ ප්‍රතිපත්ති සංශෝධනය සහ තරුණයින් සඳහා සෞඛ්‍ය සම්පන්න ජීවන අත්පොත **(GOSL)**	1,000,000.00		කෙරෙමින් පවතී
එකතුව	**15,122,884.00 කි**	**457,412.86 කි**	

4.2.10 ජාතික දුම්කොළ සහ මධ්‍යසාර පිළිබඳ අධිකාරිය

දැක්ම

දුම්කොළ සහ මද්‍යසාරවලින් තොර දේශයක් සහ මහජනතාවක්

මෙහෙයුම

දුම්කොළ සහ මද්‍යසාර පාදක කොට ගත් උපද්‍රවයන්ගෙන් අපගේ සමාජය නිදහස් කරගැනීම සඳහා සියලු සමාජීය අංශ ඒකරාශී කිරීම

අරමුණු

- මහජන සෞඛ්‍ය ආරක්ෂාව සඳහා දුම්කොළ සහ මද්‍යසාර (සහ අනෙකුත් මත්ද්‍රව්‍ය) හා සම්බන්ධ පුළුල් සහ විශේෂිත ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.
- නිෂ්පාදනය, අලෙවිකරණය, ප්‍රචාරණය සහ දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත නිෂ්පාදන පරිභෝජනය පිළිබඳව ඇගයීම් සහ අධීක්ෂණය කිරීම තුළින් දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත හානි වැළැක්වීම.
- දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත නිෂ්පාදන වෙත ප්‍රවේශවීමට ඇති අවස්ථා අවම කිරීමෙන් පුද්ගලයන්, විශේෂයෙන්ම ළමුන් දුම්පානයෙන් හෝ මද්‍යසාර භාවිතා කිරීම අධෛර්යමත් කරනු ලබන විධිවිධාන සැකසීම.
- සුපිරිසිදු වාතාශ්‍රය රැක ගැනීම පිළිබඳ නීති සකස් කිරීම, සම්මත කරගැනීම, ක්‍රියාවට නැංවීම සහ ලබා ගත හැකි අවකාශ සීමා කිරීම මගින් ප්‍රජාව දුම්කොළ සහ මද්‍යසාරවලින් ආරක්ෂා කර ගැනීම.
- දුම්කොළ හා මද්‍යසාර මගින් ජනතාවට සිදු කරන හානිය වළක්වා ගැනීම සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ වැඩසටහන් ඇතුළුව වෙනත් සියලු ක්‍රියාමාර්ග උපායමාර්ග යෝජනා කිරීම හා ක්‍රියාවට නැංවීම.

ක්‍රියාකාරකම්

- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුවට උපදෙස් දීම.
- ජනමාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් සහ ප්‍රජා පාදක වැඩසටහන් මගින් සෞඛ්‍ය වර්ධනය දිරි ගැන්වීම සහ සහාය වීම.
- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර නිෂ්පාදන පරිභෝජනයෙන් උද්ගත වන හානිය අවම කර ගැනීම සඳහා උපාය මාර්ග නිර්දේශ කිරීම.
- අනීතික ඖෂධ භාවිතය වැළැක්වීම හෝ අවම කිරීම සඳහා ජාතික අන්තරායකාරී ඖෂධ පාලක මණ්ඩලය විමසා වැඩපිළිවෙල් සකස් කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නීතිමය, බදුකරණ, පරිපාලන සහ අනෙකුත් අවශ්‍ය ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම.
- ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමීක්ෂණ හා ඇගයීම් කිරීම.
- ප්‍රතිපත්තිවල ගැටලු සමීක්ෂණය කිරිම අවශ්‍ය විය හැකි පරිදි ප්‍රතිපත්තිවල යම් වෙනස්කම් ඇති කිරීමට රජයට උපදෙස් ලබාදීම.
- දුම්කොළ හා මද්‍යසාර සම්බන්ධ ගැටලු පිළබඳ පර්යේෂණ දිරිගැන්විම සහ ඊට සහාය වීම.
- දුම්කොළ නිෂ්පාදන හ මද්‍යසාර නිෂ්පාදන සැකසීම, පරිභෝජනය හ අලෙවියට අදාළ ආර්ථික, සෞඛ්‍ය හා වෙනත් ගැටලු සමීක්ෂණය කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර පාවිච්චිය හා සම්බන්ධ පර්යේෂණ පැවැත්වීම, ප්‍රවර්ධනය හා සම්බන්ධීකරණය.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙහි ලා අවශ්‍ය රාජ්‍ය හෝ රාජ්‍ය නොවන නියෝජිතායතන සහ පෞද්ගලික අංශයේ සංවිධානවල සහභාගිත්වය ලබා ගැනීම.
- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ සමීක්ෂණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාකාරී ප්‍රජා සහභාගිත්වය දිරිගැන්වීම.

- දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ පිළිබඳ අදාළ ගැටලු පිළිබඳව මහජනයාගෙන් තොරතුරු භාරගැනීම සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීමට අදාළ ආයතනවලට නිර්දේශ කිරීම.
- දුම්කොළ නිෂ්පාදන හා මද්‍යසාර නිෂ්පාදන සැකසීම හා පරිභෝජනය තුළින් උද්ගත වන හානිය අවම කිරීම සම්බන්ධයෙන්, රාජ්‍ය සහ රාජ්‍ය නොවන නියෝජිත ආයතන හා සංවිධාන විසින් කරගෙන යන සියලු කටයුතුවල සම්බන්ධිකරණ නියෝජිත ආයතනය ලෙස කටයුතු කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත සියලු විමර්ශනවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
- දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත කරුණුවලදී දේශීය, කලාපීය හා ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධීකරණය ඇති කර ගැනීම.

2022 ජයග්‍රහණ/ විශේෂ සිදුවීම් (2022 ජනවාරි 1 සිට 2022 දෙසැම්බර් 31 දක්වා)

ක්‍රියාවට නැංවූ ක්‍රියාකාරකම	ඉලක්ක කණ්ඩායම	සාධන
දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය පනත යටතේ ගනු ලැබූ නෛතික ක්‍රියාමාර්ග	මහජනතාව	• සාර දරන දුම්කොළ හා මද්‍ය 27 අංක 2006 තික අධිකාරිය පනත පිළිබඳ ජා උල්ලංඝනය කිරීමට එරෙහිව බලයලත් නිලධාරීන් සහ අධිකාරිය විසින් නෛතික .ක් ගෙන ඇත 1101 යාමාර්ගක්‍රි
ත්‍රිවිධ හමුදාවට නොමිලේ මත්පැන් සහ දුම්කොළ බෙදා හැරීම නතර කරන ලදී	ත්‍රිවිධ හමුදාව	• ත්‍රිවිධ හමුදාවට ලිපි හුවමාරු කිරීමෙන් පසු, ඔවුන්ගේ කඳවුරු තුළ දුම්කොළ සහ මද්‍යසාර නොමිලේ බෙදා හැරීම නතර කිරීමට එකඟ විය.
තම ප්‍රදේශය තුළ දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම සඳහා බලයලත් නිලධාරීන් බලගැන්වීම සඳහා පළාත් මට්ටමින් වැඩමුළු පැවැත්වීම	බලයලත් නිලධාරීන්)ම.ප.සෞ.) - රට පුරා	• දිවයින පුරා වැඩසටහන් .ක් පවත්වා ඇත10 • දුම්කොළවලින් තොර කලාප ක් 362 යාත්මක කිරීමට සැලැස්මක් සකස් කර ක්‍රි .ආරම්භ කර ඇත • දුම්කොළ අලෙවියෙන් වැළකී සිටින වෙළෙන්දන් සඳහා ඇගයීම් සහතික ක් 3000 .දිවයින පුරා වෙළෙන්දන් වෙත පිරිනැමීම • දුම්කොළවලින් තොර කලාප ස්ථාපිත කළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් වෙත ඇගයීම් සහතික .ක් පිරිනැමීම500 • මධ්‍යම සංස්කෘතික අරමුදල සමඟ එක්ව දේශීය හා විදේශීය සංචාරකයින් දැනුවත් කිරීම සඳහා දුම්කොළවලින් තොර කලාපයක් ලෙස සඳහන් කරමින් සංස්කෘතික ස්ථානවල ප්‍රවේශපත්‍රවල තොරතුරු ඇතුළත් කිරීමට උත්සාහ කර ඇත.
දුම්කොළ වගා බිම් අඩු කිරීම	පූජා ඉඩම්වල වගා කරන්නන්	• දුම්කොළ වගාව සඳහා පූජා ඉඩම් ලබා දීම වැළැක්වීමට පියවර ගන්නා ලදී.
අනුරාධපුර (මහමෙවිනා උයන) ගල්) සහ පොළොන්නරුව පුදබිම්වල (විහාරය දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම	මහජනයා	• අනුරාධපුරයේ පුවරුක් සහ 05 ක් දුම්වැටියෙන් 02 පොලොන්නරුවේ පුවරු .ප වල ස්ථාපනය කරන ලදීනිදහස් කලා • දුමෙන් තොර වීම පිළිබඳ ප්‍රජා දැනුවත්භාවය ශක්තිමත් කිරීම.
චිත්‍රපට අධ්‍යක්ෂවරුන් වෙනුවෙන් උද්දේශන රැස්වීමක් පැවැත්වීම	මාධ්‍යවේදීන්	• චිත්‍රපටවල දුම්කොළ සහ මද්‍යසාර දර්ශන පෙන්වීමෙන් මහජන සෞඛ්‍යයට සිදුවන අහිතකර බලපෑම පිළිබඳව චිත්‍රපට අධ්‍යක්ෂවරුන් දැනුවත් කිරීමට අධිකාරියට හැකි විය.

		• ඔවුන්ගේ චිත්‍රපටවල එවැනි දර්ශන නිරූපණය කිරීමෙන් සිදුවිය හැකි අධිකාරිය පනත උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ඔවුන් වෙත කරුණු ඉදිරිපත් කරන ලදී.
VNATA බලයලත් නිලධාරීන් ජංගම යෙදුම	දූ.අ.ජා.ම. පනත යටතේ බලයලත් නිලධාරීන්	• නිලධාරීන් 172 නෙකු යෙදුමෙහි ලියාපදිංචි විය . මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් – 163 පොලිස් නිලධාරීන් 03 සුරාබදු නිලධාරීන් 05 ආහාර හා ඖෂධ පරීක්ෂකවරුන් 01 • යෙදුම හරහා ලැබුණු වාර්තා ක්20 ලැබුණි. පොලිස් නිලධාරීන් 01 සුරාබදු නිලධාරීන් 01 මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් 18
VNATA මාධ්‍ය උල්ලංඝනය පිළිබඳ ජංගම යෙදුම	මහජනතාව	• උල්ලංඝනය කිරීම් **137**ක් වාර්තා වී ඇති අතර ඒවා සුරාබදු දෙපාර්තමේන්තුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව, රූපවාහිනී නාලිකා ප්‍රධානීන්, පුවත්පත් සහ ෆේස්බුක් පිටු කතුවරුන් වැනි අදාළ බලධාරීන් වෙත මෙම ප්‍රවර්ධන තහනම් කිරීම සඳහා යොමු කරන ලදී .
දූඅධිකාරියේ ආචාර ධර්ම .ජා.ම. සමාලෝචන කමිටුවක් ස්ථාපිත කිරීම	දුම්කොළ හා මද්‍යසාර ආශ්‍රිත අධ්‍යයන සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පර්යේෂකයන්	• දූඅධිකාරියේ ආචාර ධර්ම .ජා.ම. සමාලෝචන කමිටුවපර්යේෂණය සඳහා සදාචාරාත්මක අවසරය ලබා දීම සඳහා පිළිගත්, අනුමත කමිටුවක් ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පිළිගනු ලැබීය. • දූඅධිකාරියේ ආචාර ධර්ම .ජා.ම. සමාලෝචන කමිටුවසඳහා වන මාර්ගෝපදේශය ISBN අංකය, 978-955-0645-10-7 සමඟ සකස් කර ප්‍රකාශයට පත් කරන ලදී.
දුම්කොළ සහ මද්‍යසාර නැවැත්වීම සහ වැළැක්වීම පිළිබඳ උපදේශන සහතික පත්‍ර පාඨමාලාව දෙවන) .(කණ්ඩායම	දූ.අ.ජා.ම. පනත සඳහා බලයලත් නිලධාරීන්, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්, වරකාපොළ සහ බලංගොඩ රෝහල්වල සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ ජාතික යොවුන් සේනාංකයේ නිලධාරීන්	• දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා ඇති සහතිකපත් ලාභීන් 61 දෙනෙක් 1948 quit line ඇමතුම් සේවාවට දායක වෙමින් පැය 24 පුරා දින හතේම නොමිලේ සේවාව තවදුරටත් ශක්තිමත් කරයි. • උපදේශන පාඨමාලාව ඩිප්ලෝමා මට්ටම දක්වා උසස් කරන ලෙස ඉල්ලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යෝජනාවක් ඉදිරිපත් කරන ලදී . කෙටුම්පත් කරන ලද විෂය මාලාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර කාරක සභාව වෙත යොමු කරන ලදී.
ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පවත්වන ලද ශ්‍රී ලංකාවේ දුරකථන උපදේශනය පිළිබඳ අතථ්‍ය පුහුණු වැඩමුළුව	දූ.අ.ජා.ම. පනත සඳහා බලයලත් නිලධාරීන්, සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරීන්, වරකාපොළ සහ බලංගොඩ	• වැඩමුළුව අවසන් කර සහතිකය සඳහා සුදුසුකම් ලැබූ මුළු සහභාගිවන්නන් සංඛ්‍යාව 65 කි.

	රෝහල්වල සෞඛ්‍ය කාර්ය මණ්ඩලය සහ ජාතික යොවුන් සේනාංකයේ නිලධාරීන්. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, සමෘද්ධි රාජ්‍ය අමාත්‍යාංශය, ගෘහ ආර්ථිකය, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා සහ ව්‍යාපාර සංවර්ධන යන ආයතනවල නිලධාරීන් සහ නතර කිරීම සහ වැළැක්වීම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ දෙවන කණ්ඩායම සඳහා අපේක්ෂකයින් සහභාගී විය.	
ලෝක දුම්කොළ විරෝධී දින වැඩසටහන 2022 -	මාධ්‍යවේදීන්	• දුම්කොළ සහ මද්‍යසාර භාවිතයේ වත්මන් තත්ත්වය සහ දුම්කොළ හා මද්‍යසාර භාවිතය හේතුවෙන් සිදුවන පරිසර දූෂණය පිළිබඳ මෙම වැඩසටහනට සහභාගී වූ මාධ්‍යවේදීන් දෙනෙකු දැනුවත් කරන 37 .ලදී • රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සමාජ මාධ්‍ය ඔස්සේ මෙම ව්‍යාපාය දියත් කර තිබුණි.
ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය සමඟ එක්ව දුම්කොළ සහ මද්‍යසාර භාවිතය නැවැත්වීම සහ වැළැක්විය හැකි ආසක්ති උපදේශන සහතික පත්‍ර පාඨමාලාව	සෞඛ්‍ය වෘත්තිකයන්	• ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය සමඟ සහයෝගීතාවයෙන් දුම්කොළ සහ මද්‍යසාර නැවැත්වීම සහ වැළැක්වීම පිළිබඳ ඇබ්බැහි උපදේශන සහතික පත්‍ර පාඨමාලාවක් ආරම්භ වූ අතර සහතික පත්‍ර පාඨමාලාව සඳහා අපේක්ෂකයින් දෙනෙකු සහභාගී 29 විය.
දුම්කොළ හා මද්‍යසාර වැලැක්වීම හා නිවාරණය පිළිබඳ උපදේශන සහතිකපත්‍ර පාඨමාලාවේ පුහුණු උපදේශන නිලධාරීන් සඳහා සමාලෝචන රැස්වීම	පුහුණු උපදේශකයන්	• දුම්කොළ සහ මද්‍යසාර වැලැක්වීම හා නිවාරණය පිළිබඳ සහතික පත්‍ර උපදේශන පාඨමාලාවේ පුහුණු උපදේශන නිලධාරීන් 2022නොවැම්බර් වන දින පැවති 05 .රැස්වීමට සහභාගී විය
මනෝඋපදේශන 1948 දුරකථන සේවාව	ශ්‍රී ලංකාවේ දුම්කොළ හා මද්‍යසාර භාවිතා කරන්නන්	• දුරකථන සේවාව සඳහා ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව 2022 ක් වූ අතර 18,422 වර්ෂයේදී උපදේශනය සඳහා සේවාලාභීන් දෙනෙකු 3,666සේවය ලබා ගැනීම සඳහා සම්බන්ධ වන ලදී . • සිංහල භාෂාවෙන් ක් සහ දෙමළ 2500 ක් ඇතුළුව 500 භාෂාවෙන්“1948” සේවාව ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ටිකර් ක් 3000 .ණය කර ඇතනිර්මාණය කර මුද්‍ර

යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යවසාය අංශයේ ක්ෂෙත්‍ර නිලධාරින් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව	කුඩා ව්‍යවසාය අංශයට අනුයුක්ත ක්ෂෙත්‍ර නිලධාරින්	• ගම්පහ, කළුතර, කොළඹ සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල කුඩා ව්‍යවසායක අංශයට අනුයුක්ත ක්ෂේත්‍ර නිලධාරීන් දෙනෙකු 150 සාර නිවාරණය සහළ සහ මද්‍යදුම්කොළ වැලැක්වීම පිළිබඳව පුහුණු කරන ලදී.
ජාතික ගමනාගමන කොමිෂන් සභාව සමග එක්ව පැවැත්වූ දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ වැඩසටහන	ශ්‍රී ලංකාවේ බස් කොන්දොස්තරවරුන් සහ රියදුරන්	• බස් රථ රියදුරන් සහ කොන්දොස්තරවරුන් සාර හා දුම්කොළ ක් සඳහා මද්‍ය700 වැත්වීමේනැසහ වැළැක්වීමේ වැඩසටහන් පවත්වන ලදී.
සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නාත්තන්ඩියේදී සංවිධානය කරන ලද ප්‍රදර්ශනය	මහජනතාව	• දුම්කොළ හා මද්‍යසාර නිවාරණය පිළිබඳව සහභාගිකයන් දෙනෙකු දැනුවත් 578 .කරන ලදී
පාසල් පෙළපොත් තුළට දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සම්බන්ධ සෞඛ්‍ය පණිවිඩ ඇතුළත් කිරීම .	පාසල් ළමුන්	• එම පණිවිඩ පාසල් පෙළපොත්වලට ඇතුළත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යක්ෂ ජනරාල් ජාතික අධ්‍යාපන ආයතනය සමඟ රැස්වීම් මාලාවක් පවත්වන ලදී .එහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධිත පණිවිඩ සංචිතයේ සෞඛ්‍ය පණිවිඩ කිහිපයක් 10 පෙළපොතට විද්‍යාණියේ සිංහල මාධ්‍යශ්‍රේ විද්‍යාණියේ දෙමළ මාධ්‍යශ්‍රේ 11 සහ පෙළපොතට ඇතුළත් විය
අධ්‍යාපන ආයතන විසින් චක්‍රලේඛ nu යාත්මක කිරීම ක්‍ර2020/20 පිළිබඳඇගයීම . ත නිෂ්පාදනදුම්කොළ ආශ්‍රි), මද්‍යසාර සහ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතයෙන්, ප්‍රවර්ධනයෙන් සහ වෙළඳාමෙන් අධ්‍යාපන ආයතන නිදහස් කිරීම පිළිබඳ චක්‍රලේඛ අංක පන අධ්‍යා 2020/20 ජූලි 2020 ශය විසින්අමාත්‍යාං (දින නිකුත් කරන ලදී 29	අධ්‍යාපන ආයතන ප්‍රධානීන්	• ඇගයීම සඳහා දත්ත රැස් කිරීමේ මෙවලම ලෙස සිංහල සහ ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම ගූගල් පෝරමයක් සකස් කරන ලදී. • අධ්‍යාපන ආයතන සමඟ සමීක්ෂණය සිදු කිරීම සඳහා ගූගල් පෝරමයේ සබැඳි අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී.
මොණරාගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල දුම්කොළ වගාව සඳහා විකල්ප භෝග පිළිබඳව කෘෂිකර්ම නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වැඩිදියුණු කිරීමේ වැඩමුළුව.	මොණරාගල සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල කෘෂිකර්ම නිලධාරීන්	• දුම්කොළ වගාව සඳහා විකල්ප භෝග පිළිබඳව කෘෂිකර්ම නිලධාරීන්ගේ දැනුවත්භාවය සහ කුසලතා වැඩි දියුණු කිරීම, ගොවීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා කෘෂිකර්ම නිලධාරීන් හරහා ගොවීන් සමඟ ශක්තිමත් සබඳතාවක් ගොඩනඟා ගැනීම සඳහා නිලධාරීන් අතර කුසලතා සහ ආකල්ප ඉහළ නැංවීම වැඩසටහනේ අරමුණු විය.. • පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය කෘෂිකර්ම අංශයෙහි තාක්ෂණික සහාය ඇතිව වැඩසටහන පවත්වන ලදී. • වැඩමුළුව සඳහා අනුරාධපුර සහ මොණරාගල දිස්ත්‍රික්කවල කෘෂිකර්ම පර්යේෂන නිලධාරීන් දෙනෙකු සහභාගී 60 .විය

දුම්කොළ හා මද්‍යසාර නිවාරණ පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය - (NSTAP) 2022	පර්යේෂකයන්	• දුම්කොළ සහ මද්‍යසාර පාලන ක්ෂේත්‍රයේ සේවය කරන තරුණ පර්යේෂකයින් සඳහා දැනුම බෙදාගැනීමේ වේදිකාවක් සංවර්ධනය කිරීමේ අරමුණින් NSTAP 2022 පවත්වනු ලැබීයදුම්කොළ සහ . සාර භාවිතයේ ආර්ථිකමද්‍ය, සමාජීය, පාරිසරික, සෞඛ්‍යමය බලපෑම්, දුම්කොළ සහ මද්‍යසාර භාවිතය නැවැත්වීම සහ වැළැක්වීම සහ දුම්කොළ සහ මද්‍යසාර භාවිතයට අදාළ නීතිමය අංශ ඇතුළු තේමා හයක් යටතේ සාරාංශ විසි එකකින්)**21)** මෙම සමූළුව සමන්විත විය .
මාධ්‍ය ක්‍රියාකාරකම්	මහජනයා	• අධිකාරියේ නිල ෆේස්බුක් පිටුවට අනුගාමිකයින් ක්3727, අධිකාරියේ යූ ටියුබ් නාලිකාවට ග්‍රාහකයින් ක් සහ167 අධිකාරියේ ඉන්ස්ටග්‍රම් පිටුවට අනුගාමිකයින් නිල ෆේස්බුක් .ක් ඇත26 ප්‍රවේශයට අනුව, අධිකාරියේ ෆේස්බුක් පිටුව සිට 676,334 දී මසකට 2022 දක්වා පරිශීලකයින් වෙත ළඟා වී 150,000 .ඇත
චිත්‍රපටි සමාලෝචනය	මහජනතාව	• දුම්කොළ සහ මද්‍යසාර ආශ්‍රිත දර්ශන හඳුනාගැනීම සඳහා චිත්‍රපට ක් 22 ක් 11 සමාලෝචනය කරන ලද අතර ඉන් සාර සහ දුම්කොළ දර්ශන ඇතුළත් මද්‍ය කරමින්දු.අ.ජා.ම. පනත උල්ලංඝණය කර ඇති බව අනාවරණය වියයාමාර්ග නිසි ක්‍රි . සිද්ධ රැහුම් පාලක ගන්නා ලෙස ප්‍ර මණ්ඩලයට දැනුම්දුණි .
මාධ්‍ය සම්මාන උළෙල	මාධ්‍යවේදීන්	• ඩිජිටල් මාධ්‍ය අංශයෙන් ඩිජිටල් මාධ්‍ය නාලිකා අටක් සියත ටීවී), සිරස ටීවී, ටීවී දෙරණ, රූපවාහිනිය, ස්වර්ණවාහිනී, හිරු ටීවී, අයිටීඑන්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව (සඳහා සම්මාන ප්‍රදානය කරන ලද අතර සිරස රූපවාහිනී නාලිකාවේ "සිතිජය" වැඩසටහන වෙනුවෙන් විශේෂ සම්මානයක් පිරිනමන ලදී . • මුද්‍රිත මාධ්‍ය අංශයෙන් මාධ්‍යවේදීන් තිදෙනෙකු)The Morning English පත්‍රයට වැනෙසා ඇන්තනි මහත්මිය, දිනමිණ පුවත්පත සඳහා ඉන්දික පොල්කොටුව මහතා සහ වීරකේසරි දෙමළ ඊ පුවත්පත සඳහා ආර්රාම් කුමාර් . මහතාසම්මානයට (. වියපාත්‍රගුවන්විදුලි නාලිකා තුනක්)ශ්‍රීසංස්ථාව.වි.ගු.ල., වී එෆ් එම් සහ ලක්හඬ ගුවන්විදුලිය ද පිදුම් ලැබූ අතර ඔවුන්ගේ ("වෙඩිල්ල වැඩසටහන" වෙනුවෙන් ලක් එෆ් එම් වෙත විශේෂ සම්මානයක් ද පිරිනමන ලදීවිශේෂයෙන් දුම්කොළ සහ . ජාල සාර පාලනයට සමාජ මාධ්‍යමද්‍ය දක්වන දායකත්වය සම්බන්ධයෙන් ද මෙම මෙලෙස දසත .වසරේ ඇගයීමට ලක් විය

		ලංකා ෆේස්බුක් පිටුව මේ සම්බන්ධයෙන් .ඇගයීමට ලක් විය
VNATA ජනමාධය මගින් සිදුකරන උල්ලංඝනය කිරීම් පිළිබඳ ජංගම යෙදුම	මහජනතාව	• මෙම ජංගම යෙදුම හරහා වාර්තා කරන ලද මාධ්‍ය උල්ලංඝනය කිරීම් පිළිබඳව අධිකාරිය විසින් තොරතුරු රැස් කර ඇති අතර, සියලුම සන්නිවේදන මාධ්‍ය හරහා නීති විරෝධී දුම්කොළ සහ මද්‍යසාර දැන්වීම් පිළිබඳ මහජන පැමිණිලි සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත .**V NATA** මාධ්‍ය යෙදුම හරහා මහජන පැමිණිලි .ක් ලැබී ඇත 200
V NATA බලයලත් නිලධාරීන්ගේ ජංගම යෙදුම	බලයලත් නිලධාරීන්	• දු.අ.ජා.ම. පනත යටතේ බලයලත් නිලධාරීන් විසින් කරන ලද නඩු පැවරීම් පිළිබඳ තොරතුරු රැස් කිරීම සඳහා මෙම යෙදුම සකස් කරන ලදී. • 2022 වසරේදී බලයලත් නිලධාරීන් 213 ක් යෙදුමේ ලියාපදිංචි විය.
මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා දුම්කොළවලින් තොර කලාප යළි සක්‍රීය කිරීමේ වැඩසටහන	මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්	• බලයලත් නිලධාරීන් වෙනුවෙන් පළාත් වැඩමුළු නවයක් පැවැත්වූ අතර එම වැඩසටහන් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් .දෙනෙකු සහභාගි විය 681
දුම්කොළවලින් තොර කලාප පිහිටුවීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ දායකත්වය ඇගයීම	මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්	• රට පුරා දුම්කොළ වලින් තොර කලාප 230 .ගතිය සමාලෝචනය කරන ලදීක ප්‍ර • දුම්කොළ වලින් තොර කලාප නිර්මාණය කිරීමට සම්බන්ධ වූ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට උපහාර දැක්වීම.
මාතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරීන් බලගැන්වීම හරහා බිම් මට්ටමේ දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ කටයුතු ශක්තිමත් කිරීම .	රජයේ නිලධාරීන්	• ග්‍රාම නිලධාරීන් හැටපස් දෙනෙකු වැඩසටහනට සහභාගී වූ අතර දුම්කොළ සහ මද්‍යසාර නිවාරණ කටයුතුවල නිරත විය.
විශ්වවිද්‍යාල සිසුන් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ ධාරිතා වර්ධන පුහුණුව මත් ජනරාල් ශ්‍රී) ජෝන් කොතලාවල ආරක්ෂක (ලයවිශ්වවිද්‍යා	විශ්වවිද්‍යාල සිසුන්	• දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය සමඟ එක්ව සම සෞඛ්‍ය විද්‍යා පීඨයේ සිසුන් සඳහා දැනුම වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් පවත්වන ලද අතර වැඩසටහන සඳහා සිසුන් **100** කට ආසන්න පිරිසක් සහභාගි වූහ.
විශ්වවිද්‍යාල සිසුන් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන (ආයතනදේශීය වෛද්‍ය)	විශ්වවිද්‍යාල සිසුන්	• මෙම වැඩසටහන තුළින් විශ්වවිද්‍යාල සිසුන් සාර දෙනෙකු දුම්කොළ සහ මද්‍ය 150 පිලිබඳ ජාතික අධිකාරී පනත පිලිබඳ .දැනුවත් කරන ලදී
වෛද්‍ය උපාධි අපේක්ෂකයින් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය පිළිබඳ විෂයමාලා සංවර්ධනය	වෛද්‍ය උපාධි අපේක්ෂකයින්	• විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් සමන්විත දු.අ.ජා.ම. පත්කළ කමිටුව විසින් විෂය මාලාව සකස් කරන ලදී.
යෝජිත දු.අ.ජා.ම. පනත සංශෝධන පිළිබඳ සමාලෝචන රැස්වීම	දු.අ.ජා.ම. පනතට සම්බන්ධ තෝරාගත් පාර්ශ්වකරුවන්	• යෝජිත දු.අ.ජා.ම.පනත් සංශෝධන සාකච්ඡා කිරීම සඳහා සමාලෝචන රැස්වීමක් පවත්වන ලදී.

මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා උද්දේශන වැඩසටහන .	මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන්	• දුම්කොළ සහ මද්‍යසාර භාවිතයෙන් තොර මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශයට අනුබද්ධ මාතර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා උපදේශන වැඩසටහනක් දූ.අ.ජා.ම. විසින් පවත්වන ලද අතර එම වැඩසටහන සඳහා මාධ්‍යවේදීන්.නෙකු සහභාගී විය 62

2023 ජයග්‍රහණ/ විශේෂ සිදුවීම් (2023 ජනවාරි 1 සිට 2023 ජූනි 30 දක්වා)

ක්‍රියාවට නැංවූ ක්‍රියාකාරකම	ඉලක්ක කණ්ඩායම	සාධන
නෛතික ක්‍රියාමාර්ග	දුම්කොළ සහ මද්‍යසාර කර්මාන්ත	• Dunhill Switch සිගරට් වලට එරෙහිව පියවර ගන්නා ලදී .අධිකරණයේ නඩු විභාග වෙමින් පවතී. • මත්පැන් බලපත්‍රලාභී පරිශ්‍රයන් තුළ ප්‍රචාරණය නැවැත්වීමට පියවර ගැනීම.
දුම්කොළ සහ මද්‍යසාර වැලැක්වීම සහ නිවාරණය පිළිබඳ උපදේශන සහතික පත්‍ර පාඨමාලාව තුන්වන) (කණ්ඩායම	සෞඛ්‍ය වෘත්තිකයන් සහ දුම්කොළ සහ මද්‍යසාර නිවාර්ණය සඳහා උනන්දුවක් දක්වන අනෙකුත් කණ්ඩායම්	• දුම්කොළ සහ මද්‍යසාර වැළැක්වීම සහ නිවාර්ණය සඳහා වන උපදේශනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ තුන්වන කණ්ඩායම සාර්ථකව අවසන් කර ඇත . මෙම වැඩසටහනට න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික කුසලතා යන දෙකම ඇතුළත් වූ අතර, දුම්කොළ සහ මද්‍යසාර භාවිතය සම්බන්ධ අභියෝගවලට ඵලදායි ලෙස ආමන්ත්‍රණය කිරීමට අවශ්‍ය ප්‍රවීණතාවය සහභාගිවන්නන්ට ලබා දෙන ලදී. • අයදුම්කරුවන් 30 දෙනෙකු පාඨමාලාව සාර්ථකව නිම කරන ලදී.
දුම්කොළ සහ මද්‍යසාර නිවාරනය සහ වැළැක්වීම පිළිබඳ ආසක්ති උපදේශන සහතික පත්‍ර පාඨමාලාවේ සහතික පත්‍ර ප්‍රදානය කිරීමේ උත්සවය	සහතික පත්‍රලාභීන්	• අයදුම්කරුවන් දෙනෙකු පාඨමාලාව 24 පුරාම සුවිශේෂී කැපවීම සහවගකීමට බැඳීම පෙන්නුම් කරමින්, සියලු අවශ්‍යතා සාර්ථකව සම්පූර්ණ කරමින් සිය සහතිකපත්‍ර ලබා ගත්හසහතිකපත් . දානය කිරීමේ උත්සප්‍රවය අනුරාධපුර ශික්ෂණ රෝහල් ශ්‍රවණාගාරයේදී සංවිධානය කර තිබුණි.
මාතර දිස්ත්‍රික්කයේ පාසල් ළමුන් සහ ගුරුවරුන් සඳහා උද්දේශන වැඩසටහන	මාතර දිස්ත්‍රික්කයේ පාසල් ළමුන් සහ ගුරුවරුන් සඳහා	• මාතර දිස්ත්‍රික්කයේ තෝරාගත් පාසල් 13 13 දෙනෙකු සහ ගුරුවරුන් 79 කින් සිසුන් සාර මිකොළ සහ මද්‍යදෙනෙකු දු නිවාරණය පිළිබඳවදැනුවත් කරන ලදී. • සිසුන්ට සහ ගුරුවරුන්ට තම පාසල්වල දුම්කොළ, මද්‍යසාර සහ වෙනත් මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු පිහිටුවා නිවාරණ කටයුතු සිදු කිරීමට බල ගන්වා ඇත.
ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ (GATS) හි ප්‍රතිඵල නිකුත් කරන ලදී	මහජනතාව	• ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය යනු දී පවත්වන 2020ලද ජාතික නියෝජිත්වයක් සහිත සමීක්ෂණයකිඵය . මිතිගත සංවිධානයේ ප්‍රලෝක සෞඛ්‍ය .ණයට අනුව සිදු කරන ලදීයාන්ත්‍රගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය දුම්කොළ සහ මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය, ජනලේඛන හා සංඛ්‍යාලේඛන

		දෙපාර්තමේන්තුව සහ ලෝක සෞඛ්‍ය සංවිධානය අතර සාමූහික මුලපිරීමකි. • ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණයේ (GATS) - තිළුල නිකුත් කරන ප්‍ර 2020 වන දින කොළඹ 31 මැයි 2023 ලද්දේ සිනමන් ලේක්සයිඩ් හෝටලයේ පැවති ලෝක දුම්කොළ විරෝධී දින උත්සවයේදීය. • ගෝලීය වැඩිහිටි දුම්කොළ සමීක්ෂණය - වාර්තාවේ විධායක සාරාංශය පූජ්‍ය 2020 අලුදෙණියේසුබුති නාහිමිධාන ප්‍ර) , (විහාරාධිපති සේරුවාවිල රජ මහා විහාරය, ගරු සෞඛ්‍ය අමාත්‍ය ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල සහ වෛද්‍ය අලකා සිං ශ්‍රී) සංවිධානයේ ලංකාවේ ලෝක සෞඛ්‍ය (නියෝජිතවෛද්‍ය ඇලන් ලුඩෝවයික් - සභාපති)දු.අ.ජා.ම.) සහ අනුර කුමාර ක්ෂ ජනරාල්අධ්‍ය), ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව(වෙත බාර දෙන ලදී .
4 සිට මැයි 30 ල්අප්‍රේ 2023 දක්වා අම්බලන්ගොඩ සංඝ රාජ දර්ශන මහා විහාරයේදී ප්‍ර කුටියක් පවත්වන ලදී වෙසක්) සතිය තුළ(	අම්බලන්ගොඩ, රන්දොඹේ තරුණ හා වැඩිහිටි ප්‍රජාව	• දින පහක කාලසීමාව තුළ තරුණයන් සහ වැඩිහිටියන් එක්දහස් පන්සියයකට ආසන්න පිරිසක් ප්‍රදර්ශන කුටියට සහභාගී විය .අම්බලන්ගොඩ රන්දොඹේ ප්‍රදේශයේ ජනතාව අතර දුම්කොළ භාවිතය, දුම්පානය, දුම් රහිත දුම්කොළ භාවිතය සහ මද්‍යසාර භාවිතය පාලනය කිරීම සඳහා දුම්කොළ සහ මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් ඇති අවදානම හඳුනාගෙන එම කණ්ඩායම් වෙන වෙනම ඒක රාශී කරන ලදී .
ආනමඩුව මූලික 23 මාර්තු 2023 රෝහලේදී දුම්කොළ සහ සාර වල අහිතකර බලපෑම් මද්‍ය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රදර්ශන කුටියක් පවත්වන ලදී	මහජනතාව	• දිවා කාලයේදී ප්‍රදර්ශන කුටිය සඳහා තරුණයින් සහ වැඩිහිටියන් භාරසියයක් සහභාගී විය.
ලෝක දුම්කොළ විරෝධී 2023 දිනය සැමරීම	මහජන සෞඛ්‍ය විශේෂඥයන්, දුම්කොළ නිවාරණ ක්‍රියාකාරීන්, ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය භාවිතා කරන්නන්	• 2023 ලෝක දුම්කොළ විරෝධී දිනය සැමරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් අධිකාරියට මූල්‍යමය සහාය ලබා දෙන ලදී .එම දිනය සැමරීමේ ජාතික උත්සවය මැයි මස වන දින සිනමන් 31 ලේක්සයිඩ් හෝටලයේදී පැවැති අතර ඒ සඳහා ආචාර්යගරු .කෙහෙළිය රඹුක්වැල්ල මහතා, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ශ්‍රී ලංකා නියෝජිත සහ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා සහභාගී විය .සැමරුම් උත්සවයෙන් අනතුරුව ඉදිරි වසර දෙක සඳහා ක්ෂේත්‍ර මට්ටමේ සැලැස්මක් සකස් කිරීම සඳහා දු.අ.ජා.ම. පනතේ බලයලත් නිලධාරීන් සඳහා දෙදින උද්දේශන වැඩමුළුවක් ද පවත්වන ලදී.

		• තොරතුරුපන සහ සන්නිවේදන අධ්‍යා , නිෂ්පාදනඅටක්, සජීවිකරණ වීඩියෝ තුනක් ,සමාජ මාධ්‍ය පළක උපදෙන් ලේබල් .නිර්මාණය කරන ලදී ක් 350
මාධ්‍ය ක්‍රියාකාරකම්	මහජනතාව	• අධිකාරියේ නිල ෆේස්බුක් පිටුවෙහි අනුගාමිකයින් ක් සිටින4274අතර ෆේස්බුක් පිටු ප්‍රවේශය මසකට සහ 14458 අතර 16606විචලනය වී ඇත. • අධිකාරියේ නිල යූටියුබ් නාලිකාවට දැන් ග්‍රාහකයින් .ක් ඇත197
මනෝ උපදේශන 1948 සේවාව	ශ්‍රී ලංකාවේ දුම්කොළ සහ මද්‍යසාර භාවිත කරන්නන්	• උපදේශන සේවාව සඳහා ලැබුණු මුළු ඇමතුම් සංඛ්‍යාව 4109ක් වූ අතර 2023 වර්ෂයේ මැයි මාසය දක්වා සේවාලාභීන් 930ක් උපදේශන සේවා ලබා ගෙන ඇත.

සිදුකරමින් පවතින සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර

අංකය	ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය 2022)රු(මිලියන .	ගතියදිනට භෞතික ප්‍ර 31.12.2022	31.12.2022 දිනට මූල්‍ය ගතියප්‍ර .රු)මිලියන(
1	දුපනත .අ.ජා.ම. යාත්මක කිරීමක්‍රි	0.50	• දු.අ.ජා.ම. පනතේ සංශෝධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදීවාර්ථා වූ . යාමාර්ග ක්‍රි සියලු පැමිණිලි සඳහා .ගෙන ඇත • පැමිණිල්ලේ කරුණු ඇගයීමෙන් පසු ලැබෙන පැමිණිලිවලට එරෙහිව පියවර ගැනීම සඳහා බලයලත් නිලධාරීන් වෙත යොමු කර ඇත. • V - NATA යෙදුමෙන් පැමිණිලි 198 ලැබී ඇති අතර සියලුම පැමිණිලිවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත.	0.14
2	අධ්‍යාපන සහ පුහුණු	1.00	• දුම්කොළ සහ මද්‍යසාර නිවාරය හා නිවාරණය පිළිබඳ උපදේශන සහතික පාඨමාලාවක් (දෙවන කණ්ඩායම) පවත්වන ලද • 1948 උපදේහන සේවා දුරකථන සේවා ගාස්තු සහ බිල්පත් පියවීම් • 1948 උපදේශන සේවයේ සහතිකලත් උපදේශකයින් 84 දෙනෙකු සේවය කර ඇත. • 1948 උපදේශන සේවා වැඩසටහන හරහා පුද්ගලයින් 3666 දෙනෙකුට උපදේශන ලබා ගැනීමට හැකි විය. • අධිකාරිය විසින් පත් කරන ලද විශේෂඥ කමිටුවක සහාය ඇතිව ළමුන් සහ තරුණයින් සඳහා දුම්කොළ සහ මද්‍යසාර නිවාරණය සම්බන්ධ සෞඛ්‍ය පණිවිඩ සංවර්ධනය කරන ලදී.	1.28

			• දුම්කොළ වගාව සඳහා විකල්ප හඳුන්වා දීම සඳහා කරුණු පත්‍රිකා 1500ක් සකස් කර මුද්‍රණය කරන ලදී.	
5. වෛද්‍ය සැපයීම් කළමණාකරණය ශක්තිමත් කිරීම සඳහා 2022 වර්ෂය සඳහා ඖෂධ චිකිත්සක කමිටු (DTC) රැස්වීම් 371ක් ද 2023.05.31 දක්වා ඖෂධ චිකිත්සක කමිටු රැස්වීම් 95ක් පැවැත්වීම සඳහා අධ්‍යක්ෂ (වෛද්‍ය සැපයීම්) මගින් අදාල ආයතන වලට උපදෙස් ලබා දී අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකර කරන ලදී.
6. වාප්පු අංශය (Warf Section) 2022 වර්ෂයේදී නැවත ප්‍රතිසංවිධානය කර නව ස්ථානයක ස්ථාපිත කරන ලදී.
7. කුලී පදනම මත උප ගබඩා දෙකක් වෛද්‍ය සැපයීම් අංශය වෙත ලබාගෙන ඇති අතර එම ගබඩා වේයන්ගොඩ සහ ශ්‍රාවස්තිපුර පිහිටා ඇත.

2022 වර්ෂය තුල සංවර්ධන ව්‍යාපෘති විස්තර

1. "දිවයින පුරා සියලු පළාත්වල රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල්, පළාත් සභා යටතේ ඇති රෝහල් සහ ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශවල ඖෂධ ගබඩා වැඩිදියුණු කිරීම" ව්‍යාපෘතිය 2022 වර්ෂය තුළ සාර්ථකව සිදු කර ඇත. ඒ පිලිබඳ සාරාංශය පහත දැක්වේ.

ව්‍යාපෘති විස්තරය	2022 වර්ෂය සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි)	2022.12.31වන දිනට භෞතික ප්‍රගතිය (%)	2022.12.31වන දිනට මූල්‍ය ප්‍රගතිය (%)
දිවයින පුරා සියලු පළාත්වල රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල්, පළාත් සභා යටතේ ඇති රෝහල් සහ ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශවල ඖෂධ ගබඩා වැඩිදියුණු කිරීම.	125	88	48

2. "වෛද්‍ය සැපයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MSMIS) පුළුල් කිරීමේ" ව්‍යාපෘතිය මගින් 2022.12.31 වන විට පළාත් රෝහල් 145කට යටිතල පහසුකම් සහ MSMIS පද්ධති සම්බන්ධතාව ලබා දී ඇත.

ව්‍යාපෘති විස්තරය	2022 වර්ෂය සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි)	2022.12.31වන දිනට භෞතික ප්‍රගතිය (%)	2022.12.31වන දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි)
වෛද්‍ය සැපයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය (MSMIS) පුළුල් කිරීම.	295	30	25

2023 වර්ෂය සඳහා ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති පිලිබඳ විස්තර

ව්‍යාපෘති විස්තරය	2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන (රු.මි)	2023.06.12 දිනට භෞතික ප්‍රගතිය (%)	2023.06.12 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි)
දිවයින පුරා සියලු පළාත්වල රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති රෝහල්, පළාත් සභා යටතේ ඇති රෝහල් සහ ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශවල ඖෂධ ගබඩා වැඩිදියුණු කිරීම. (සංශෝධිත අයවැයක් සමඟ කාලය දීර්ඝ කිරීමේ අනුමැතිය සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී)	167.5	20 % (සෞඛ්‍ය ආයතන 43ක් සඳහා ප්‍රතිපාදන නිකුත් කර ඇත).	8.03

පසුගිය වසර 5 තුල වෛද්‍ය සැපයීම් කාර්ය සාධන ප්‍රවණතාවය



(2018 - 2023) අදාලව සියලුම රෝහල් වලට අදාල ජාතික ඇස්තමේන්තු වල වටිනාකම (රු.මි) ඉහත ප්‍රස්ථාරය මගින් දක්වා ඇත.



(2018 – 2023) වසර වලට අදාලව වෛද්‍ය සැපයුම්වල ජාතික නිකුත් කිරීමේ වටිනාකම (රු.මි) ඉහත ප්‍රස්ථාරය මගින් දක්වා ඇත.

2023 සඳහා සැලසුම් කර ඇති විශේෂ සංවර්ධන ක්‍රියාකාරකම්

1. "දිවයින පුරා සියලු පළාත්වල රේඛීය අමාත්‍යාංශ ආයතන, ප්‍රාදේශීය වෛද්‍ය සැපයීම් අංශ සහ මූලික රෝහල්වල ඖෂධ ගබඩා වැඩිදියුණු කිරීම" ව්‍යාපෘතියෙහි විෂය පථය සහ අයවැය සංශෝධනය කර කාලය දීර්ඝ කිරීමේ අනුමැතිය සඳහා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.
2. රජයේ රෝහල් වලට අවශ්‍ය surgical sprit සාදා ගැනීමට අවශ්‍ය alkohol ගබඩා කිරීම සඳහා අවශ්‍ය ගබඩාවක් ඉදි කිරීම.
3. වෛද්‍ය සැපයීම් අංශය සඳහා forklift තුනක්, handforks දහයක් මිලදී ගැනීමට සහ අංගොඩ උප ගබඩාව සඳහා adjustable රාක්ක පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා සැලසුම් ක්‍රියාත්මක කර ඇත.

5 යටිතල පහසුකම් සංවර්ධනය

සෞඛ්‍ය දර්ශක සහ ජනතාවගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතය සාක්ෂාත් කර ගැනීමට සහ වැඩිදියුණු කිරීමට අත්‍යවශ්‍ය වන සෞඛ්‍ය අංශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ වැදගත්කම සෞඛ්‍ය කළමනාකරුවන් විසින් හොඳින් හඳුනාගෙන ඇත. අඛණ්ඩ ආයෝජනවලින් ප්‍රතිලාභ ලබා ගනිමින්, වෛද්‍ය උපකරණ, ප්‍රවාහනය සහ ගොඩනැගිලි ඇතුළත් රටේ සෞඛ්‍ය යටිතල පහසුකම්වල ක්‍රමානුකූල දියුණුවක් වසර ගණනාවක් පුරා නිරීක්ෂණය කළ හැකිය.

ප්‍රාථමික, මූලික, සාමාන්‍ය, දිස්ත්‍රික් සහ තෘතිය යන සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සෑම තරාතිරමකම ගුණාත්මක හා කාර්යක්ෂම සේවාවක් අඛණ්ඩව සැපයීම රටෙහි වේගවත් වර්ධනයක් හා සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ. මෙම සන්දර්භය තුළ, රජය රටේ ප්‍රධාන සෞඛ්‍ය සේවා සපයන්නා ලෙස සිය කාර්යභාරය දිගටම කරගෙන යන අතර, සෞඛ්‍යය සඳහා පෞද්ගලික සෞඛ්‍ය අංශයේ ආයෝජනය වසර ගණනාවක් පුරා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ.

සෞඛ්‍ය සේවාවල ගුණාත්මක භාවය ඉහළ නැංවීමට පියවර ගන්නා අතරම සාමාන්‍ය ජනතාවගේ යහපැවැත්ම වැඩිදියුණු කිරීම සඳහා නව සෞඛ්‍ය ව්‍යාපෘති ගණනාවක් රජය තවදුරටත් අඛණ්ඩව කරගෙන යයි. ඉදිකිරීම් හැරුණු විට රජයේ සෞඛ්‍ය අංශයේ වෛද්‍ය උපකරණ පදනම වසරින් වසර වැඩිදියුණු විය.

5.1 වෛද්‍ය උපකරණ

සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශය (BES) රේඛීය අමාත්‍යාංශ රෝහල්වල වෛද්‍ය උපකරණ සැලසුම් කිරීම, ප්‍රසම්පාදනය කිරීම, ස්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම සඳහා වගකීම දරයි.

ඊට අමතරව වෛද්‍ය උපකරණ පිළිබඳ පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා BES වගකිව යුතුය.

1. ලෝකයේ නවීනතම නවීකරණය කරන ලද තාක්ෂණය සපුරාලීම සඳහා වෛද්‍ය උපකරණ සඳහා තාක්ෂණික පිරිවිතර සකස් කිරීම.
2. උසස් සහ සංවේදී ඉහළ වටිනාකම් සහිත උපකරණ සඳහා සේවා සහ ගිවිසුම් පවත්වා ගැනීම.
3. අවසාන පරිශීලකයින් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබා දීම.
4. රජයේ සහ පෞද්ගලික අංශයේ ඉංජිනේරු උපාධි අපේක්ෂකයින් සඳහා කාර්මික පුහුණුව සඳහා පහසුකම් සැපයීම.
5. වෛද්‍ය උපකරණ පිළිබඳ තාක්ෂණික විශේෂඥ දැනුම ලබා දීම

ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා අංශයට වැඩමුළු පහසුකම්, උපකරණ සඳහා ගබඩා පහසුකම් සහ අමතර කොටස් ගබඩා කිරීම සහ පරිපාලන කටයුතු ඇත.

දැනට ඉහත කාර්යයන් ඉටු කිරීම සඳහා පහත සඳහන් කාර්ය මණ්ඩලය සිටී.

තාක්ෂණික කාර්ය මණ්ඩලය		තාක්ෂණික නොවන කාර්ය මණ්ඩලය	
අධ්‍යක්ෂ	01	ගණකාධිකාරී	01
ජීව වෛද්‍ය ඉංජිනේරු	14	පරිපාලන නිලධාරීන්	01
ෆෝමන්	40	සංවර්ධන නිලධාරීන්	14
කාර්මික ශිල්පීන්	41	කළමනාකරණ සහකාරවරු	21
		වෛද්‍ය සැපයුම් සහකාර	08
		එස්.කේ.එස්	63

		රියදුරන්	13

BES පහත ලැයිස්තුගත කර ඇති රේඛීය අමාත්‍යාංශ රෝහල්වල ප්‍රාදේශීය ජෛව වෛද්‍ය ඉංජිනේරු ඒකක ව්‍යාප්ත කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී.

- අනුරාධපුර
- බදුල්ල
- මහනුවර
- යාපනය
- මඩකලපුව
- රාගම
- රත්නපුර
- කුරුණෑගල
- ඒඑච් මහරගම
- කරාපිටිය ටී.එච්
- NBC නාරාහේන්පිට

ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවා වෛද්‍ය උපකරණ ඉන්වෙන්ටරි කළමනාකරණ පද්ධතිය සඳහා වෙබ් පාදක මෘදුකාංග සංවර්ධනය කිරීම ආරම්භ කර ඇත.

දැක්ම

ජෛව වෛද්‍ය ඉංජිනේරු සේවාවන්හි විශිෂ්ටත්වයේ දකුණු ආසියානු මධ්‍යස්ථානය බවට පත්වීම.

මෙහෙයුම

ආරක්ෂාව, ගුණාත්මකභාවය, විශ්වසනීයත්වය සහ නිරවද්‍යතාවය පිළිබඳ ඉහළම ප්‍රමිතීන් සාක්ෂාත් කර ගනිමින් රටේ රජයේ රෝහල් සඳහා සුදුසු නවීන වෛද්‍ය උපකරණ තාක්ෂණයන් ලබා දීමෙන් සෞඛ්‍ය අමාත්‍යාංශයේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට සහාය වීම.

අරමුණු

1. රේඛීය අමාත්‍යාංශ රෝහල් සඳහා සුදුසු වෛද්‍ය උපකරණ නියමිත වේලාවට ලබා ගැනීම සහතික කිරීම.
2. අවශ්‍ය මට්ටමින් උපකරණ ක්‍රියාකාරී කාලය පවත්වා ගැනීම සඳහා අමතර කොටස් සහ උපාංග තිබීම සහතික කිරීම.

2022 ජයග්‍රහණ/විශේෂ සිදුවීම්

No	Name of the Equipment	Quantity	Estimated Cost (Rs.Mn)
1	Adjustable Beds	1363	95.41
2	Ambu Bags	19	7.60
3	Anesthesia Machine	2	7.64
4	Auto Clave Machine Table Top	116	39.44
5	BI PAP Machine	133	143.64
6	Blood Fluid Warmer	8	12.00
7	Blood Gas Analyzer	1	0.30
8	BP Apparatus	1520	30.40

9	BP Apparatus Digital	531	4.25
10	C PAP Machine	94	69.56
11	C PAP Machine Neonatal	7	17.50
12	Cardiac Output Monitor	2	6.5
13	Colour Doppler	1	16.00
14	Centrifuge	3	9.00
15	CRRT Machine	9	27.00
16	CT Scanner	1	160.00
17	CTG Machine	7	1.72
18	Defibrillator	75	140.63
19	Dental Chair	14	7.00
20	Digital Thermometer	114	0.35
21	Diathermy Machine	1	1.10
22	DSA Machine	1	150.000
23	ECG Recorder	165	14.85
24	Electrolyte Analyzer	1	10.00
25	Echo Cardiography	6	7.50
26	Endoscopy System	1	3.25
27	ENT Navigation System	1	30.80
28	ECT Machine	6	24.000
29	Emergency Trolley	826	66.08
30	HDU Bed	130	39.00
31	Hand Held Doppler	34	1.02
32	Hematology Analyzer	10	30.00
33	High Flow Oxygen Machine	97	82.45
34	High Pressure Sterilizer	8	84.00
35	Holmium Laser Machine	2	63.00
36	ICU Bed	55	16.50
37	Infant Warmer	33	23.10
38	Infusion Pump	276	16.56
39	Laryngoscope	81	5.84
40	Laryngoscope Video	21	16.80
41	Laser Thermometer	34	0.07
42	Light Curing Machine	10	0.75
43	Multipara Monitor ICU	17	51.00
44	Multipara Monitor WD	562	140.50
45	Nebulizer	218	5.45
46	Ophthalmoscope	38	1.90
47	OT Table	20	75.00
48	OT Lamp (Mobile)	5	20.00
49	OT Lamp (Ceiling)	18	90.00
50	Oxygen Concentrator	515	154.50
51	Phototherapy Machine	7	5.11

52	Pulse Oximeter	112	11.20
53	Pulse Oximeter Fingertip	86	0.35
54	RO Plant	19	10.64
55	Spinal Table	8	0.40
56	Spot Lamp	129	2193
57	Suction Apparatus	217	43.40
58	Syringe Pump	640	38.40
59	Ultrasound Scanner	7	175.00
60	Ultrasound Scanner Portable	56	101.92
61	Ventilator ICU	29	101.50
62	Ventilator Neonatal	2	14.00
63	Ventilator Transport	53	106.00
64	X Ray CR System	4	10.00
65	X Ray Machine Mobile	22	286.00
66	X Ray Machine Portable	29	232.00
67	X Ray Machine C Arm	4	120.00
74	X Ray Machine Static	5	250.00
Total Amount (Rs. Mn.)			**3,254.75**

දැනට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ විස්තර

ව්‍යාපෘති විස්තරය	ඇස්තමේන්තු ගත වියදම (USD)
Construction of BES Centre	1,675,153.00
Purchase of Mobile Workshop	457,721.00
Develop of web base operation and management system	569,724.00
BME Tool	2,581,150.00
Training Programs	416,253.00

පසුගිය අවුරුදු 5 කාර්ය සාධන ප්‍රවණතාවය





*ඉහත සියලු සංඛ්‍යා **2023** ජූනි **26** වන දිනට*

2023 සඳහා සැලසුම් කර ඇති විශේෂ සංවර්ධන කටයුතු

- ජංගම වැඩමුළු භාවිතයෙන් වෛද්‍ය උපකරණ ක්‍රමාංකන වැඩසටහන.
- රෝහල්වල නව ජීව වෛද්‍ය ඉංජිනේරු ඒකක ස්ථාපිත කිරීම.
- රෝහල් කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය උපකරණ පුහුණු වැඩසටහන (අවසාන පරිශීලකයින්).
- ජෛව වෛද්‍ය ඉංජිනේරු කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය උපකරණ සඳහා දේශීය තාක්ෂණික පුහුණු
  වැඩසටහන්.
- ජෛව වෛද්‍ය ඉංජිනේරු කාර්ය මණ්ඩලය සඳහා විදේශීය තාක්ෂණික පුහුණු වැඩසටහන්.

5.2 ඉදිකිරීම්

සෞඛ්‍ය පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය යටතේ පාලනය වන රෝහල් සහ ආයතනවලට අවශ්‍ය පරිදි පහත සඳහන් ක්‍රියාකාරකම්වල නඩත්තු හා සේවා සඳහා ප්‍රතිපාදන ලබා දීම සහ නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා දීම සැපයුම් අංශයේ වගකීම වේ.

සිදුකරමින් පවතින ඉදිකිරීම් ව්‍යාපෘති (දේශීය අරමුදල්)

අංකය	ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.	2022.12.31 වන විට භෞතික ප්‍රගතිය (%)	2022.12.31 (%) වන විට මූල්‍ය ප්‍රගතිය
1	කළුබෝවිල මිලේනියම් වාට්ටුව ඉදිකිරීම, පීසීයූ සහ පරිපූරක වෛද්‍ය සේවා ගොඩනැගිල්ල)පහළ මහල සහිත මහල් 9ක ගොඩනැගිල්ල(	743,011,532.50	97	82

2	මුල්ලේරියාව ජාතික ආසාත ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම)ප්‍රධාන කොටස මහල් 6 ක රෝග විනිශ්චය ගොඩනැගිල්ල(	1,111,857,808 (වැට් බද්ද නොමැතිව(	16	14
3	ඩී.සොයිසා රෝහලේ විශේෂිත මාතෘ සත්කාර ඒකකය ඉදිකිරීම)මහල් 4)(අවසන් මහල් දෙකේ අභ්‍යන්තර නිමාව විෂය පථයට අයත් නොවේ(.	249,846,290.00(වැට් සමඟ(	60	51
4	ලුනාව රෝහල වැඩිදියුණු කිරීම/ලුනාව රෝහලට මහල් 5 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම	1,035,001,317.46	35	15
5	කාසල් රෝහල අසල ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම)මහල් 17)	5,979,290,346.51 (වැට් සමඟ(	58	50
6	කාසල් රෝහලේ ප්‍රජනන ප්‍රතිකාර මධ්‍යස්ථානය ඉදිකිරීම)මහල් 2)	104,707,857.00	58	49
7	රිජ්වේ ආර්යා රෝහලේ ලිට්ල් හාර්ට් සෙන්ටර් - තට්ටු 12	2,439,784,771.58	47	24
8	හෙද පීඨය)මහල් 20) සහ නවාතැන් ගොඩනැගිල්ල -ශ්‍රී ජයවර්ධනපුර) මහල් 6)	7,171,884,000.00	13.5	7
9	මීගමුව රෝහල පුනරුත්ථාපනය කිරීම)-මහල් 6)	692,427,728.34	100	85
10	පරිපාලන ගොඩනැගිල්ල සහ දේශන ශාලා ඉදිකිරීම එන්.ටී.එස්- .කළුතර) II අදියර)(මහල් 4)	180,844,945.00	87	68
11	සීමාවාසික වෛද්‍ය නිල නිවාස ඉදිකිරීම -කළුතර (මහල් 3)	136,630,543.00	92	85
12	ගිලන් රථ ගරාජය සහ සුළු සේවක විවේකාගාරය ඉදිකිරීම -කළුතර) මහල් 3)	57,126,900.40	95	70
13	වෛද්‍ය වාට්ටු සංකීර්ණය ඉදිකිරීම -කළුතර)අදියර II) (මහල් 8)	2,817,775,920.55	49	28
14	ජල ටැංකිය ඉදිකිරීම -කළුතර) 300 ම3)	33,895,665.00	100	82
15	සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ඉදිකිරීම- පයාගල) දෙමහල්(	73,155,264.00	84	56
16	ප්‍රධාන ගොඩනැඟිල්ල ඉදිකිරීම I අදියර -ජම්බාර බැස්සවිම) බේරුවල(	355,050,256.00	100	95
17	අධ්‍යයන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම - කළුතර)මහල් 4)	714,200,000.00 (වැට් බද්ද නොමැතිව(	37	20
18	වකුගඩු රෝග ඒකකය -කරාපිටිය) මහල් 9)	884.89 මිලියන	98	71
19	මුඛ සෞඛ්‍ය ඒකකය කරාපිටිය රෝහල)මහල් 8)	997,328,772.00	41	24
20	විශේෂිත ළමා ඒකකය -කරාපිටිය) මහල් 7 සහ 14)	1,092,000,000.00	24	19
21	ආසාත ප්‍රතිකාර ඒකකය -කරාපිටිය)දෙමහල්(	68,928,561.00	95	61
22	ශල්‍ය / වෛද්‍ය ඒකක දිර්ඝ කිරිම -කරාපිටිය (මහල් 10)	690,295,793.00	49	25

23	යෝජිත දැයට කිරුළ විශේෂ සංවර්ධන ව්‍යාපෘතිය- මාතර හෙද විදුහල් දේශන ශාලාව පරිපාලන ගොඩනැගිල්ල නේවාසිකාගාරය සංවර්ධනය කිරීම.	776,000,000.00	87	72
24	වකුගඩු සත්කාර ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම - හම්බන්තොට) මහල් 4)	210,054,952.00	26	26
25	හෘද රෝග ඒකකය ඉදිකිරීම -මඩකලපුව) මහල් 4)	324,294,394.00	83	65
26	වකුගඩු සත්කාර ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම - මඩකලපුව) මහල් 6)	383,690,621.00	96	79
27	විශේෂිත ළමා වාට්ටු සංකීර්ණය)මහල් 7) (අම්පාර(	1,263,243,548.00	100	75
28	නින්දවුර් හි නව ගොඩනැගිලි සංකීර්ණය)මහල් 8 ගොඩනැගිලි 2 ක්) (නින්දවුර්(	4,163,054,280.00	19	18
29	හදිසි අනතුරු සහ හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම- යාපනය II අදියර	1,224,641,244.00	67	54
30	අධ්‍යාපන හා පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම - අනුරාධපුර	789,416,100.00	49	16
31	මාතෘ සංකීර්ණ අදියර 111(මහල් 8)(කුරුණෑගල(	914,946,853.00	98	80
32	ශල්‍යාගාර සංකීර්ණය සහ වාට්ටුව ඉදිකිරීම)මහල් 3) (හලාවත(	85,191,448.93	99	95
33	වෛද්‍ය වාට්ටු සංකීර්ණය -හලාවත) මහල් 6)	583,778,828.00	45	38
34	තැලසිමියා රෝගීන් සුව කිරීම සඳහා ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකයක් ඉදිකිරීම -මහනුවර) මහල් 7)	1,701,630,342.86	29	18
35	පිළිකා ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම -මහනුවර) මහල් 12)	1,500,000,000.00	43	35
36	වකුගඩු සත්කාර ප්‍රතිකාර ඒකකය ඉදිකිරීම)මහල් 10) බදුල්ල	668,205,622.00	18	15
37	පළාත් මහ රෝහලේ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම -බදුල්ල) මහල් 10 ක් සහ ඔන්කොලොජි තෙමහල්(	2,835,777,745.00	22	16
38	මොණරාගල දිස්ත්‍රික් රෝහලේ යෝජිත වාට්ටු සංකීර්ණය)මහල් 5)	793,000,000.00	15	10

සටහන: මූල්‍ය ප්‍රගතිය සහතික කළ බිල්පත් වලින් ලබා ගන්නා ලදි.

5.3 සුවිශේෂී විදේශ අරමුදල් සපයන් ලද ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘති විස්තරය	මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි.
1	ප්‍රාථමික සෞඛ්‍ය පද්ධති ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව)	36,440.00
2	බාහිර රෝගි සේවා සංකීර්ණය සංවර්ධනය - කොළඹ ජාතික රෝහල (ශ්‍රී ලංකා රජය - චීන රජය)	14,600.00
3	කළුතර දිස්ත්‍රික් මහ රෝහල විශේෂිත මාතෘ හා ළමා රෝහලක් ලෙස - වැඩිදියුණු කිරීම (ශ්‍රී ලංකා රජය - නෙදර්ලන්ත රජය)	5,400.00

4	හෙල්මුට් කොල් මාතෘ රෝහල ඉදිකිරීම - කරාපිටිය, ගාල්ල (ශ්‍රී ලංකා රජය - ජර්මන් රජය)	4,480.00
5	මාතෘ සහ නව උපත් සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය - මාතර දිස්ත්‍රික්කය(ශ්‍රී ලංකා රජය - කොරියානු රජය)	1275.00
6	තෝරාගත් රෝහල්වල සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීම (EXIM Bank of china)	15,292.00
7	ද සොයිසා මාතෘ රෝහල සඳහා නව උපත් සහ ප්‍රසව විමර්ශන මධ්‍යස්ථානය (එක්සත් රාජධානිය - සම්පත් බැංකුව)	830.00
8	සෞඛ්‍ය පද්ධතීන් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - ADB	10,500.00
9	ශල්‍යාගාර සහ හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම (ශ්‍රී ලංකා රජය - ඔස්ට්‍රියාව)	1,700.00
10	සෞඛ්‍ය හා වෛද්‍ය සේවා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ශ්‍රී ලංකා රජය - ජයිකා)	16,594.00
11	උතුරු පළාතේ රෝහල් සංවර්ධනය කිරීම (ශ්‍රී ලංකා රජය - නෙදර්ලන්ත රජය)	12,225.00
12	කොවිඩ් 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති පෙර සූදානම් කිරීමේ ව්‍යාපෘතිය - (ශ්‍රී ලංකා රජය - ලෝක බැංකුව)	79,614
13	ශ්‍රී ලංකාවේ ජෛව වෛද්‍ය ඉංජිනේරු අංශයේ ධාරිතාව ගොඩනැංවීම (ශ්‍රී ලංකා රජය - කොරියානු රජය)	634
14	ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාවට එරෙහිව සටන් කිරීමට ගෝලීය අරමුදල (GFATM)	1,548.00

5.4 ප්‍රවාහන ඒකකය

සෞඛ්‍ය ආයතනවල අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සපයමින් සේවා සැපයීමේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රවාහන ඒකකය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රවාහන අංශයට පහත කොටස් ඇතුලත් වේ

- සේවා ස්ථානය - මුල්ලේරියාවේ
- අලුත්වැඩියා අංශය - ජෛව වෛද්‍ය ඉංජිනේරු ඒකකයේ

සෞඛ්‍ය අමාත්‍යාංශයට අයත් ඉහත ස්ථානය පිහිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස අක්‍රමිකතා වළක්වා ගැනීමටත් වියදම් ඉතිරි කර ගැනීමටත් හැකි වී තිබේ. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාහනවල විස්තර පහත වගුවේ දක්වා ඇත.

වාහන වර්ගය	Over 2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023	Total
ගිලන් රථ	702	30	12	–	250	87	-	-	-	3	192						**1,276**
ඩබල් කැබ්	403	9	-	92	-	-	5	35	-	11	3		25		38	--	**621**
කාර්	48	-	-	5	-	-	-	-	3	-	-	2					**58**
ලොරි රථ	120	-	-	-	-	-	-	-	-	-	-			9			**129**
වෑන්	93	3	-	9	-	-	17	-	48	7	-			9			**186**
මිනි වෑන්	30	-	-	-	-	-	-	-	-	-	-						**30**
බවුසර්	9	-	-	-	-	-	-	-	-	-	-						**09**
ජීප් රථ	122	1	-	-	-	-	2	2	-	2	-						**129**
බස් රථ	76	-	-	-	-	-	-	-	-	8	5						**89**
Ref.Lorries	11	-	-	-	10	-	-	-	-	-	-						**21**
ත්‍රිරෝද රථ	53	-	-	-	-	-	-	-	-	-	-						**53**
B/C Vehicles	7	-	-	-	-	-	-	-	-	-	-						**07**
වෑන්(ජංගම)	34	-	-	-	-	-	-	-	-	-	-						**34**
X-ray වාහන	1	-	-	-	-	-	-	-	-	-	-						**01**
කෘෂ කැබ් රථ	10	-	-	-	-	-	10	-	-	-	-						**20**
යතුරු පැදි	1010	125	-	140	150	-	-	-	5	-	-						**1,430**
කුඩා ට්‍රක් රථ	-	-	-	-	-	-	-	-	-	50	-						**50**
ට්‍රැක්ටර්	2	-	-	-	-	-	-	-	-	-	-						**02**
එකතුව	**2,731**	**168**	**12**	**246**	**410**	**87**	**34**	**37**	**56**	**81**	**200**	**02**	**25**	**18**	**38**	**0**	**4,145**

6. මානව සම්පත් සංවර්ධනය

6.1අධ්‍යාපනය, පුහුණුව සහ පර්යේෂණ ඒකකය

හැඳින්වීම

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු සහ පර්යේෂණ ඒකකය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යාපන පුහුණු සහ පර්යේෂණ) යටතේ ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩල තුනක් එනම් පුහුණු, පර්යේෂණ සහ හෙද (අධ්‍යාපන) අධ්‍යක්ෂ මණ්ඩල ඇත.

දැක්ම

ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය, මානසික සහ අධ්‍යාත්මික සංවර්ධනයට දායක වන සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ ගුණාත්මක සහ සුදුසුකම් ලත් සාමාජිකයින්

මෙහෙයුම

දැනුම, දක්ෂ, කාර්යක්ෂම, ඵලදායී, රෝගීන් කේන්ද්‍ර කරගත් සහ නව්‍ය සෞඛ්‍ය කාර්ය මණ්ඩලයේ සංවර්ධනය සඳහා ශ්‍රී ලාංකේය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අධ්‍යාපනය, පුහුණු සහ පර්යේෂණ ක්ෂේත්‍රවල ප්‍රධාන තාක්ෂණික විශේෂඥතාව සහ ප්‍රධාන සැපයුම්කරු වීම, පහසුකම් සැපයීමේ කේන්ද්‍රස්ථානය වීම. සාමාජිකයින්

අරමුණු

වෛද්‍ය නිලධාරීන් සහ දන්ත ශල්‍ය වෛද්‍යවරුන් සඳහා වන මූලික උපාධි පාඨමාලා හැර අනෙකුත් සියලුම මාණ්ඩලික කාණ්ඩ සඳහා මූලික පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පුහුණුවට අදාළ තාක්ෂණික මගපෙන්වීම් සැපයීම, ප්‍රතිපත්ති සම්පාදනයේ කේන්ද්‍රස්ථානය වන්නේ අධ්‍යාපන පුහුණු සහ පර්යේෂණ ඒකකයයි. තවද, පශ්චාත් මූලික සහ සේවා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් හරහා සෞඛ්‍ය ශ්‍රම බලකායේ ධාරිතා ගොඩනැගීමේ වගකීම ඒකකය සතු වේ. මීට අමතරව, මෙම ඒකකය සෞඛ්‍ය සම්බන්ධ පර්යේෂණ සඳහා ප්‍රතිපත්ති සහ ධාරිතාව සකස් කරන අතර සේවා ස්ථාන පදනම් කරගත් පර්යේෂණ සිදු කිරීම සඳහා අදාළ නිලධාරීන්ට මූල්‍ය දීමනා ලබා දෙයි.

ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය (NIHS) ද DDG (ET&R) හි පරිපාලන සහ තාක්ෂණික අධීක්ෂණය යටතේ පවතී.

තවද, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ මානව සම්පත් ධාරිතාව ශක්තිමත් කිරීමේ අරමුණින් ET&R ඒකකය ලංකා වෛද්‍ය විද්‍යාල සභාව, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකාවේ අනෙකුත් අදාළ අධ්‍යයන සහ වෘත්තීය ආයතන සහ සංවිධාන සමඟ සම්බන්ධීකරණය කරයි.

ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ශ්‍රම බලකායේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර සංවිධාන සමඟ වැදගත් පුහුණු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ හැකියාව මෙම ඒකකය පුළුල් කර ඇත.

2022-2023 ජයග්‍රහණ / විශේෂ සිදුවීම්

- **බඳවා ගැනීම් සහ මූලික පුහුණුව**
    - **මූලික පුහුණු වැඩසටහන් සඳහා බඳවා ගැනීම**

පුහුණුව සඳහා බඳවා ගැනීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ පරිපාලන අංශ විසින් ET&R ඒකකය, සැලසුම් ඒකකය සහ මානව සම්පත් සම්බන්ධීකරණ ඒකකය සමඟ සාකච්ඡා කර තීරණය කරනු ලැබේ. 2022-2023 පුහුණු පැතිකඩ පහතින් දක්වා ඇත

2022-2023 දී සිදු කරන ලද මූලික පුහුණු වැඩසටහන් සහ උපාධිධාරීන්ගේ පැතිකඩ

අංකය	කාර්ය මණ්ඩල	2022 දී බඳවා ගත් සංඛ්‍යාව	2022 දී පුහුණුව අවසන් කළ සංඛ්‍යාව	2023 තුළ බ දවාගත් සංඛ්‍යාව (ජූනි දක්වා)	2023 දී සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව (ජූනි දක්වා)
1	හෙද නිලධාරීන් (මූලික පුහුණුව)	2614	393	3190	2607
2	වෛද්‍ය රසායනාගාරය. කාර්මික ශිල්පීන්	0	133	0	0
3	ඖෂධවේදීන්	109	191	0	51
4	භෞත චිකිත්සකයින්	0	0	0	0
5	වෘත්තීය චිකිත්සකයින්	46	51	0	0
6	විකිරණ ශිල්පීන්	54	60	0	0
7	මහජන සෞඛ්‍ය වින්නඹු මාතාවන්	993	0	0	219
8	මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්	321	304	0	0
9	සෞඛ්‍ය කීට විද්‍යා නිලධාරීන්	29	15	0	0
10	ඉලෙක්ට්‍රෝ-හෘද විද්‍යාඥයින් (ECG)	0	51	0	0
11	ඉලෙක්ට්‍රෝ-එන්සෙෆලෝග්‍රැෆ් රෙකෝඩිස්ට්	17	16	0	0
12	අක්ෂි කාර්මික ශිල්පීන්	24	18	0	8
13	දන්ත කාර්මික ශිල්පීන්	17	0	0	16
14	පාසල් දන්ත චිකිත්සකයින්	37	28	0	13
15	මහජන සෞඛ්‍ය රසායනාගාර කාර්මික	61	0	0	61
16	කෘතිම හා විකලාංග	10	0	0	7
	එකතුව	**4329**	**1260**	**3190**	**2982**

○ හෙද නිලධාරීන් සඳහා පශ්චාත් මූලික පුහුණුව

අංක සහිත 2022 -2023 දී සිදු කරන ලද පශ්චාත් මූලික පුහුණු වැඩසටහන් කාණ්ඩ පුහුණුව අවසන් කළ හෙද නිලධාරීන් සංඛ්‍යාව බඳවා ගන්නා ලදී

පුහුණු වැඩසටහන්	කාලසීමාව	බඳවාගත් අංකය		සම්පූර්ණ කර ඇත	
		2022	2023	2022	2023 ජූනි දක්වා
මනෝ චිකිත්සක හෙද පුහුණුව	මාස 6	-	100	-	
ඉගැන්වීම සහ අධීක්ෂණය	වසර 1 1/2	40	-	-	
වාට්ටු කළමනාකරණය සහ අධීක්ෂණය	වසර 1 1/2	-	-	849	
වින්නඹු මාතාවන්ගේ පුහුණුව	මාස 6	215	-	215	
මහජන සෞඛ්‍ය හෙද නිලධාරි	වසර 1 1/2 r	-	81	96	
මහජන සෞඛ්‍ය හෙද සහෝදරිය	වසර 1 1/2	-	-	116	
ප්‍රජා මනෝචිකිත්සක හෙද	මාස 6	51	-	51	
දැඩි සත්කාර හෙද	වසර 1	160	-	-	
සහන හෙද	වසර 1	33	-	-	
මහජන සෞඛ්‍ය හෙද උපදේශක	මාස 6	-	25	-	

6.2 සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවා සපයන්නන්ගේ ධාරිතාවය වර්ධනය කිරීම

අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍ය ආධාර ලබා දෙමින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සේවා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් කළමනාකරණය කිරීමේදී ET&R ඒකකය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ආයතනික අවශ්‍යතා අනුව, 2022-2023 වසර තුළ සෞඛ්‍ය ශ්‍රම බලකායේ බොහෝ කාණ්ඩවල පුහුණුව සඳහා අරමුදල් වෙන් කරන ලදී. ET&R ඒකකය අදාළ ආයතන විසින් හඳුනාගෙන ඇති පුහුණු අවශ්‍යතා මත පදනම්ව සුදුසුකම් සඳහා පුහුණු යෝජනාව සමාලෝචනය කරයි. සුදුසුකම් නිර්ණායක සපුරාලන පුහුණු වැඩසටහන් සඳහා අරමුදල් සපයන ලදී. අරමුදල් භාවිතය අධීක්ෂණය කර ඇගයීමට ලක් කෙරේ.

6.2.1 සේවා ස්ථානයේ පුහුණු වැඩසටහන

ආයතන ප්‍රධානීන්ගේ සහ වෘත්තීය සංවිධානවල ප්‍රධානීන්ගේ ඉල්ලීම් මත පදනම්ව ET&R ඒකකය විසින්ම විවිධ කාර්ය මණ්ඩල කාණ්ඩ සඳහා සේවා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් නිතිපතා සිදු කරයි.

කණ්ඩායම් පුහුණු වැඩසටහන්, භාෂා පුහුණු වැඩසටහන්, තනි පුද්ගල පුහුණු වැඩසටහන් සඳහා 2022 -2023 වසර තුළ ET&R ඒකකයෙන් අරමුදල් ලබා ගත් කාර්ය මණ්ඩලයේ සේවයේ පුහුණුවීම් සංඛ්‍යාව සහ කාණ්ඩ

සෞඛ්‍ය සේවකයින්ගේ කාණ්ඩය	සෞඛ්‍ය කාර්ය මණ්ඩල සේවා පුහුණුව - 2022			සේවා පුහුණුව - 2023		
	කණ්ඩායම් පුහුණු	තනි පුද්ගල පුහුණු	භාෂා පුහුණු	කණ්ඩායම් පුහුණු	තනි පුද්ගල පුහුණු	භාෂා පුහුණු
Consultants	48	-	-	190		
Medical Officers	902	08	-	674	06	
Principals/ Tutors		-	-	130		
Nursing Officers	2603	10	-	1046	13	
PSM categories	308	04	-	370	14	
Paramedical	502	05	-	-		
PPO/PPA/DO/HMA/MA	485	16	201	55	19	
Health Assistants	493	52	-	230	23	
Other staff	518	20	-	686	27	
Total	**5859**	**115**	**201**	**3381**		

6.2.2 වෙනත් පුහුණු වැඩසටහන්

1. මහජන සෞඛ්‍ය කළමනාකරණ සහකාර (Online moodle platform) 01 ශ්‍රේණියේ නිලධාරීන් 377 දෙනෙකු සඳහා පැය 120 ක කාර්යක්ෂමතා කඩඉම් සහතික පත්‍ර පාඨමාලාවක් පවත්වන ලදී.
2. හෙද නිලධාරීන් සහ උපදේශකයින් සඳහා සිහිකල්පනාව වැඩසටහන
3. වෛද්‍ය නිලධාරීන් සඳහා අල්ට්‍රා සවුන්ඩ් සීන් පුහුණු වැඩසටහන
4. මූලික පුහුණු වැඩසටහනේ පාසලට නව රසායනාගාර උපකරණ සඳහා ප්‍රසම්පාදනය
5. පාසල් දන්ත චිකිත්සාව සඳහා දන්ත උපකරණ ලබා ගැනීම

6. අක්ෂි තාක්ෂණය, SLSPO, පාසල් දන්ත චිකිත්සාව, EEG, ECG, PHLT සඳහා පුහුණු වැඩසටහනේ සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටි (SOP) සංවර්ධනය කරන ලදී.
7. යාවත්කාලීන කරන ලද හෙද හිටපු. වාර්තා පොත, හෙද ක්‍රියා පටිපාටිය අත්පොත, මානසික සෞඛ්‍ය සඳහා ප්‍රායෝගික පොත
8. මූලික පුහුණු පාසල්වල පුස්තකාල සඳහා මිලදී ගත් පොත (මිලියන 3ක් පමණ)

6.3 පර්යේෂණ

සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ ඒකකය ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය හා සෞඛ්‍ය ආශ්‍රිත පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා පර්යේෂණ කටයුතු සම්බන්ධීකරණය කරයි. අරමුදල් සඳහා ඒකකයට ඉදිරිපත් කරන ලද පර්යේෂණ යෝජනා සෞඛ්‍ය අමාත්‍යාංශයේ පර්යේෂණ කළමනාකරණ කමිටුව විසින් යෝග්‍ය දැයි පරීක්ෂා කර අනුමත යෝජනා සඳහා ඒකාබද්ධ අරමුදල හරහා ප්‍රදාන ලබා දේ.

2022 ජනවාරි සිට 2023 ජූනි දක්වා කාලය තුළ පර්යේෂණ ඒකකය විසින් සිදු කරන ලදි.
ක්‍රියාකාරකම්

ක්‍රියාකාරකමේ නම	විස්තරය	සටහන්
1. සෞඛ්‍ය සේවකයින් සඳහා 'පර්යේෂණ ක්‍රමවේදය' පිළිබඳ මාර්ගගත ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන	අන්තර්ගත සංවර්ධිත සහ සම්පත් පුද්ගලයින් හඳුනාගෙන ඇත	2023 ඔක්තෝම්බර් මාසයේදී පවත්වනු ලැබේ.
2. සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආචාර ධර්ම සමාලෝචන කමිටු ඇගයීම්	දත්ත රැස්කිරීමේ ආකෘතිය සකස් කර අදාළ ERC වලින් දත්ත රැස් කිරීම සඳහා අදාළ ERC වෙත යවන ලදී	ක්‍රියාවලියේ පවති
3. සෞඛ්‍ය සම්බන්ධ පර්යේෂණ සඳහා පරිපාලක අවසරය ලබා දීම	පර්යේෂණ 15ක් සඳහා පරිපාලන ක්ලැරන්ස් ලබා දී ඇත	
4. ජාතික සෞඛ්‍ය පර්යේෂණ ප්‍රමුඛතාවය හඳුනා ගැනීම	මෙම ක්‍රියාකාරකම සඳහා සූදානම් වීම සඳහා ප්‍රදේශයට අදාළ දැනට පවතින ලේඛන සමාලෝචනය කිරීම ආරම්භ කර ඇත	ක්‍රියාවලියේ පවති
5. ආයතනික මට්ටමින් ERC ස්ථාපිත කිරීම සඳහා පවතින ජාතික මාර්ගෝපදේශ සංශෝධන කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම.	මූලික සාකච්ඡා ආරම්භ විය	ක්‍රියාවලියේ පවති
6. ERC සාමාජිකයින් සඳහා මාර්ගගත ධාරිතාව ගොඩනැගීමේ පුහුණු වැඩසටහන	ERC සාමාජිකයින් සඳහා පවත්වනු ලබන දින 08 වැඩමුළුව	වාර්ෂිකව පවත්වනු ලැබේ
7. ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම් සමඟ පර්යේෂණ යෝජනා අනුමත කිරීම සඳහා මාර්ගයක් සංවර්ධනය කිරීම		සම්පූර්ණ කරන ලදි.
8. වෛද්‍ය නිලධාරීන් සඳහා මාර්ගගත පර්යේෂණ ක්‍රමවේද වැඩසටහන	2024 දී මෙම වැඩසටහන පැවැත්වීමට සූදානම් වෙමින් පවතී	දියත් කිරීමට බලා සිටී.

පර්යේෂණ දීමනාව ගෙවීම

2011 වසරේ අයවැය යෝජනාවට අනුව ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සඳහා පර්යේෂණ දීමනාව ගෙවීම 2011 වසරේ ආරම්භ කරන ලදී.

ගෙවන පර්යේෂණ දීමනාව - 2022				ගෙවන පර්යේෂණ දීමනාව - 2023 පුනි දක්වා			
අනුමත කළ දිනය	නව යෝජනා ගණන	ප්‍රගති වාර්තා සංඛ්‍යාව	ප්‍රකාශන සංඛ්‍යාව	අනුමත කළ දිනය	නව යෝජනා සංඛ්‍යාව	ප්‍රගති වාර්තා සංඛ්‍යාව	ප්‍රකාශන සංඛ්‍යාව
23.02.2022	11	09	09	27.01.2023	01	04	03
30.03.2022	08	04	08	24.03.2023	03	05	09
28.04.2022	05	-	-	25.04.2023	06	-	03
01.07.2022	01	-	-	31.05.2023	-	07	-
05.08.2022	09	6	10	28.06.2023	-	03	-
26.09.2022	06	9	05				
15.11.2022	08	9	04				
20.12.2022	05	5	04				
Total	**53**	**42**	**40**		**10**	**19**	**15**

පසුගිය වසර 5 කාර්ය සාධන ප්‍රවණතාවය

අංකය	දර්ශකය	2018	2019	2020	2021	2022
1.	මූලික පුහුණුව සඳහා ලියාපදිංචි වූ අංකය	2757	835	4489	-	1664
2.	සාර්ථකව නිම කළ අභ්‍යාසලාභීන් සංඛ්‍යාව	3951	2541	1853	812	1170
3.	පශ්චාත් මූලික හෙද පුහුණුව සම්පූර්ණ කරන ලද අභ්‍යාසලාභීන් සංඛ්‍යාව	1011	173	751	952	1198
4.	පවත්වන ලද සේවා අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	Group Tr.596 Indivi. Tr.-386 Langua Tr.115	Group Tr - 708 Indivi. Tr - 358 Langue Tr.110	Gro. Tr.- 1017 Indivi. Tr - 143 Lang Tr.16	Gro. Tr.- 603 Indivi. Tr - 155 Lang Tr.4	Gro. Tr.- 5859 Indivi. Tr - 115 Lang Tr. 201
5.	පර්යේෂණ දීමනා ගෙවීම සඳහා ලැබුණු පර්යේෂණ යෝජනා ගණන	259	114	29	97	135

7 සංස්ථා මණ්ඩල කළමනාකරණ ආයතන

7.1 ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

ආයතනය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC) 1957 අංක 49 දරන කාර්මික සංස්ථා පනත යටතේ 1987 වර්ෂයේදී පිහිටුවන ලදී. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව 2021 වර්ෂයේදී ශ්‍රී ලංකා ජනගහනයේ සෞඛ්‍ය උපස්ථානය සඳහා වාණිජමය වශයෙන් අත්‍යවශ්‍ය ඖෂධ නිපදවීමෙහි 34 වසරක් සපුරා තිබේ. ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව එම සංස්ථාව විසින්ම සංවර්ධනය කරන ලද වට්ටෝරු 88 ක් ඖෂධීය නාමයෙන් සියළු ඖෂධීය කලාපයන් ආවරණය වන පරිදි නිපදවයි.

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ

1. තමා විසින්ම හෝ බද්ධ ව්‍යාපාරයකට, රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයට හෝ වෙනත් සමාන ගිවිසුමකට ඇතුලත් වී ඖෂධ නිෂ්පාදනය කිරීම, සැකසීම, ගබඩා කිරීම, ඇසුරුම් කිරීම හෝ නැවත ඇසුරුම් කිරීම
2. පාලිත සමාගම් නිර්මාණය කිරීම
3. අනාගත ආයෝජකයන් සමඟ ජාත්‍යන්තර ගිවිසුම් වලට ඇතුළත් වීම
4. ඖෂධ නිෂ්පාදනය කිරීම සහ සැකසීම සඳහා තාක්ෂණික සහය ලබා දීම
5. ඖෂධ විද්‍යාව පිළිබඳ සහ ඖෂධ ද්‍රව්‍ය පිළිබඳ පර්යේෂණ කිරීම සහ ඖෂධ ප්‍රමිතිකරණය කිරීම සහ
6. සංස්ථාව විසින්ම හෝ බද්ධ ව්‍යාපාර මගින් හෝ වෙනත් එවැනි ගිවිසුම් මගින් නිපදවන ලද ඖෂධීය නිෂ්පාදන අලෙවි කිරීම

වෙළඳපල වෙත මුදා හරිනු ලබන සියලුම නිෂ්පාදන බ්‍රිතාන්‍ය ෆාමකෝපියා (BP) හා එක්සත් ජනපද ෆාමකෝපියා (USP) නියමයන්ට අමතරව අපගේම (SPMC) පිරිවිතරයන්ට අනුකූලව නිපදවේ. "යහපත් නිෂ්පාදන පිළිවෙත්" (GMP) රෙගුලාසි සහ ක්‍රියාවලියන් නිතරම අභ්‍යන්තරික තත්ව විගණන සහ කර්මාන්තශාලාව සුපරික්ෂා කිරීම් මගින් සිදුකරයි.

එමෙන්ම ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) විසින් නියම කරනු ලැබ ඇති "යහපත් නිෂ්පාදන පිළිවෙත්" (GMP) නියමයන්ද පිළිපදී.

වර්ෂය තුළ සපයන ලද සේවාවන් පිළිබඳ කෙටි විස්තරයක්

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව අඛණ්ඩව ගුණාත්මක, ක්‍රියාකාරී, සණ මාත්‍රා ස්වරූප නිෂ්පාදනය කොට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය, ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සෘජු බෙදාහරින්නන් වෙත අලෙවි කිරීම සිදු කර ඇත.

මානව සම්පත් සංවර්ධනය 2021 දෙසැම්බර් 31 වන දින දක්වා

සේවක ප්‍රභේදය	සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්	21
කණිෂ්ඨ කළමනාකරුවන්	44
තාක්ෂණික කාර්ය මණ්ඩලය	146
ලිපිකාර හා ආශ්‍රිත ශ්‍රේණි	26
සුළු කාර්ය මණ්ඩලය	87
පුහුණුවන	10
කොන්ත්‍රාත් පදනමින්	03
එකතුව	337

ප්‍රධාන ජයග්‍රහණ

විකිණීම් හා කාර්යසාධනය 2021 දෙසැම්බර් 31 වන දින දක්වා

විකිණීම්	රු. 16,620,184,659.00
මෙහෙයුම් ලාභය	රු. 2,061,140,119.00
බද්දට පෙර ශුද්ධ ලාභය	රු. 1,586,213,049.00
බද්දට පසු ශුද්ධ ලාභය	රු. 965,472,451.00

වාර්ෂික පිරිවැටුම **2013 - 2022**



❖ **2022 වර්ෂය සඳහා නිෂ්පාදන නිමැවුම - පෙති හා කරල් ඒකක මිලියන 3302**

විකිණීමේ මාර්ග 2021 දෙසැම්බර් 31 වන දින දක්වා

විකිණීම් සංයුතිය	වටිණාකම (රුපියල් මිලියන)	%
සෞඛ්‍ය සේවා දෙපාර්මේන්තුව	13,935.30	84
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සෘජු බෙදාහැරීම් ජාලය	2,583.98	15
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	108.41	1

එකතුව	16,627.69	100%



Figure 1 Sales Comparison of SPMC

සංවර්ධන කාර්යය

- ලෝටස් ෆාමා ව්‍යාපෘතිය - 2022 ජනවාරි 12 වැනි දින හොරණ මිල්ලෑව ප්‍රදේශයෙන් අක්කර 65 ක ඉඩමක් ලබා ගැනීම සඳහා UDA සමඟ 99 අවුරුදු බදු ගිවිසුමක් අත්සන් කරන ලදී.

Figure 2 Signing 99 years lease agreement with UDA

- 2022 මාර්තු 07 වන දින ඉන්දියාවේ Meridian Engineers Consultancy Services අයතනය SPMC ලෝටස් ෆාමා ව්‍යාපෘතියෙහි ස්වාධීන උපදේශකයා ලෙස පත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දෙන ලදි.
- 2022 ජූලි 06 වන දින රාජ්‍ය ඖෂධ සංස්ථාව සහ ලෝටස් ෆාමා ව්‍යාපෘතියෙහි ස්වාධීන උපදේශකයා ලෙස පත්වූ Meridian Engineers Consultancy Services අයතනය අතර ගිවිසුම අත්සන් කරන ලදි.

Figure 3 Agreement signing between SPMC and Consultant

- හොරණ මිල්ලෑව ප්‍රදේශයෙන්, අති නවීන නිෂ්පාදනාගාර ඉදිකිරීම සඳහා, බදු ගිවිසුම යටතේ නාගරික සංවර්ධන අධිකාරියෙන් නව ඉඩමක් ලබා ගැනීම.

නව නිෂ්පාදන හඳුන්වා දීම 2021

01. Prednisolone Tablets BP 1mg
02. Mefenamic Acid Tablets BP 500mg.
03. Flucloxacillin Capsules BP 250mg.
04. Loratadine Tablets USP 10mg.
05. Bisoprolol Tablets BP 5mg.
06. Aspirin GR Tablets BP 75mg.
07. Rosuvastatin Tablets IP 10mg.
08. Losartan Potassium Tablets BP 25mg.
09. Sitagliptin Tablets BP 50mg

2023 මැයි 31 දක්වා කාර්යසාධනය

මානව සම්පත් සංවර්ධනය

සේවක ප්‍රභේදය	සේවක සංඛ්‍යාව
ජේෂ්ඨ කළමනාකරුවන්	19
කණිෂ්ඨ කළමනාකරුවන්	43
තාක්ෂණික කාර්ය මණ්ඩලය	146
ලිපිකාර හා ආශ්‍රිත ශ්‍රේණි	26
සුළු කාර්ය මණ්ඩලය	85
පුහුණුවන	20
කොන්ත්‍රාත් පදනමින්	03
එකතුව	**342**

ප්‍රධාන ජයග්‍රහණ

2022 වර්ෂයේ ජනවාරි සිට ජූනි 30 දක්වා කාලපරිච්ඡේදය සඳහා කාර්යසාධනය

මාර්තු 30 දක්වා විකිණීම්	රු. **5,980,903,842.00**
මාර්තු 31 දක්වා මෙහෙයුම් ලාභය	රු. 538,003,471.00

මාර්තු 31 දක්වා බද්දට පෙර ලාභය	රු. 784,465,277.00
මාර්තු 31 දක්වා බද්දෙන් පසු ලාභය	**රු. 513,815,687.00**

2023 වර්ෂයේ ජනවාරි සිට මැයි 31 දින දිනට සම්පූර්ණ නිෂ්පාදනය පෙති හා කරල් ඒකක මිලියන1395.077 කි.

විකිණීමේ මාර්ග 2023 වර්ෂයේ ජනවාරි සිට 2023 මැයි 31 දක්වා කාලපරිච්ඡේදය

විකිණීම් සංයුතිය	වටිනාකම (රුපියල් මිලියන)	%
සෞඛ්‍ය සේවා දෙපාර්මේන්තුව	10,080.39	90
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ සෘජු බෙදාහැරීම් ජාලය	1,061.83	10
ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ සංස්ථාව	-	-
එකතුව	**11,142.22**	**100%**



Figure 4 Sales Comparison of SPMC

2024 වර්ෂය සඳහා සැලසුම්කර ඇති විශේෂ සංවර්ධන කාර්යයන්

1. පෙති හා කරල් නිෂ්පාදනය කිරීමට අති නවීන නිෂ්පාදන කම්හලක් හොරණ මිල්ලැව ප්‍රදේශයේ ඉදිකිරීමට සැලසුම් කිරීම.
2. ශ්‍රී ලංකා COVID-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සුදානම් කිරීමේ ව්‍යාපෘතිය (CERHSP) යටතේ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි පෙනිසිලින් කලාපය සංවර්ධනය කිරීම. මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව වසින් රුපියල් මිලියන 630 ක අරමුදලක් ලබා දීමට අනුමැතිය ලබා දී ඇත.
3. ඖෂධ නිෂ්පාදන සංස්ථාවෙහි ප්‍රමිති තත්ත්ව කළමනාකරණ පද්ධතියක් ස්ථාපිතය කර ක්‍රියාත්මක කිරීම.
4. ඖෂධ බෙදා හැරීම ප්‍රශස්ත කිරීම සඳහා නිෂ්පාදනය අවසන් කර ඇති ඖෂධ ගබඩා කිරීම සඳහා නව දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.
5. ඇසුරුම් අංශයේ ධාරිතාව පුළුල් කිරීම සඳහා Blister ඇසුරුම් යන්ත්‍ර 02ක් මිලදී ගැනීම.

7.2 ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව 1971 වර්ෂයේදී ආරක්ෂාකාරී ප්‍රත්‍යක්ෂ සහ තත්ත්වය සහතික කළ ඖෂධ සහ ශල්‍ය පාරිභෝජන ද්‍රව්‍ය සාධාරණ මිලකට ලබාදීම සඳහා පිහිටුවන ලදි.
2022-2023 (ජුනි දක්වා) කාල වකවානු තුළ රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව ජනතාවට සුවිශේෂ සේවාවක් ඉටුකරමින් නව අරමුණු සහ ඉලක්ක සපුරා ගැනීමට සමත් වී ඇත. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ දී රුපියල් මිලියන 50,919 ක පිරිවැටුමක් වාර්තා කර ඇති අතර, එය 2021 වර්ෂයේදී වාර්තා කළ රුපියල් මිලියන 80,300 ට සාපේක්ෂව වැඩිවීමක් පෙන්නුම් කරයි.

ඉහත පිරිවැටුම සාක්ෂාත් කර ගැනීම මඟින් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව බදු ගෙවීමට පෙර ලාභය වශයෙන් රුපියල් මිලියන 854 ක් ද, බදු ගෙවීමෙන් පසු ලාභය වශයෙන් රුපියල් මිලියන 645 ක්ද වාර්තා කර ඇත. රජයේ වෛද්‍ය සැපයුම් අංශය සඳහා රුපියල් බිලියන 41 ක ඖෂධ හා ශල්‍ය පාරිභෝජනය ද්‍රව්‍ය සැපයීමට අමතරව පෞද්ගලික වෙළෙඳපොල තුළද වාර්තා ගත රුපියල් බිලියන 9.9 ක විකුණුම් ප්‍රමාණයක් වාර්තා කර ඇත. විකුණුම්වල වර්ධනය පෙර වර්ෂයට සාපේක්ෂව සලකා බැලීමේදී 5.3 ක වර්ධනයකි. 2022 වර්ෂයේ එක් ඔසුසලක් විවෘත කළ අතර 2023 වර්ෂයේ නව ඔසුසල් 02 ක් විවෘත කිරීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව මුලු ඔසුසල් ගණන 53 කි.

7.3 විජය කුමාරතුංග අනුස්මරණ රෝහල

විජය කුමාරතුංග අනුස්මරණ රෝහල ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 1999 අංක 38 දරණ විජය කුමාරතුංග මණ්ඩල පනත ලෙස හඳුන්වන පාර්ලිමේන්තු පණතක් මගින් ස්ථාපිත කර ඇත.

විජය කුමාරතුංග මහතා සිහිවීම පිණිස විජය කුමාරතුංග රෝහල ස්ථාපිත කරන ලද අතර සීදුව පිහිටි අක්කර තුනක ඉඩමක රෝහල ඉදිකෙරිනි.එවකට ජනාධිපති අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය විසින් 1999 ඔක්තොම්බර් 9 දින රෝහල නිල වශයෙන් විවෘත කරන ලදී.

ආරම්භයේ වාට්ටු 2 කින් හා බාහිර රෝගී අංශයක් සහිත වූ ප්‍රාථමික සෞඛ්‍යාරක්ෂණ ඒකකයක් ලෙස ආරම්භ කරන ලදී.රෝහලේ කළමනාකාරිත්වය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් දරණ අතර ,අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති හා සාමාජිකයින් 6 දෙනෙකගෙන් සමන්විතය. රෝහල මගින් ප්‍රධාන වශයෙන් සීදුව , ජාඇල ,කටුනායක සහ ආයෝජන මණ්ඩල කලාපයේ ජනතාව වෙනුවෙන් සේවා සපයනු ලබයි.

2022 වසර වන විට රෝහල බාහිර රෝගී අංශයකින් , ප්‍රාථමික සත්කාර ඒකකයකින් ,දන්ත ඒකකය , අක්ෂි ඒකකයකින් ,ශල්‍ය ඒකකයකින් ,කායික වෛද්‍ය ඒකකයකින් සමන්විත විනි. ඊට අමතරව එන්ඩොක්‍රයිනි සායනයක් හා සුවනාරි සායනයක් විශේෂ සායන ලෙස පැවැත්විනි.

ප්‍රයෝජනය සහ පහසුකම් විස්තර			
	වාට්ටු ගණන	05 Wards	
	ඇඳන් ගණන	137	
	පවතින විශේෂඥයින් ගණන	3	ස්ථිර පදනම මත උපදේශකයින් උපදේශක වෛද්‍ය), උපදේශක ශල්‍ය වෛද්‍ය, උපදේශක අක්ෂි ශල්‍ය වෛද්‍ය(
		1	අමාත්‍යාංශයෙන් අනුයුක්ත උපදේශකයින් – (උපදේශක නිර්වින්දන වෛද්‍ය)
		1	පැමිණීමේ පදනම මත උපදේශකයින් - (උපදේශක අන්තරාසර්ග විද්‍යාඥයින්

මානව සම්පත් විස්තර

	තනතුර	2022 දෙසැම්බර් 31 දිනට
1	අධ්‍යක්ෂ	01
2	විශේෂඥ වෛද්‍යවරු-ස්ථිර	03
3	විශේෂඥ වෛද්‍යවරු-අනුයුක්ත කිරීම්	01
4		
5	විශේෂඥ වෛද්‍යවරු-බාහිර	01
6	ප්‍රධාන වෛද්‍ය නිලධාරී	01
7	ගණකාධිකාරී	01
8	අභ්‍යන්තර විගණක	01
9	වෛද්‍ය නිලධාරී	18
10	දන්ත වෛද්‍ය නිලධාරී	-
11	ලියාපදිංචි වෛද්‍ය නිලධාරී	03
12	පරිපාලන නිලධාරී	01
13	විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී	-
14	හෙද සොයුරි	02
15	හෙද නිලධාරී	78
16	වෛද්‍ය රසායනාගාර කාර් මික විද්‍යාඥ	4+1
17	ඖ!ෂධවේදී	06
18	විකිරණශිල්පී	01
19	අක්ෂි තාක්ෂණවේදී	03
20	ඊ සී ජී රෙකෝඩිස්ට්	01
21	ඖෂධ සංයෝජක	02
22	ලිපිකරු හා ආශිත ශ්‍රේණී	10
23	වෙනත් කාර්ය මණ්ඩල	16
Total		**218+1+1**

1- විශේෂඥ වෛද්‍යවරු -බාහිර
1- වැටුප් රහිත වෛද්‍ය රසායනාගාර කාර්මික විද්‍යාඥ

උපයෝගිතා විස්තර පිළිබඳ විස්තර

2022 වසර තුල සපයන ලද සේවාවන්

	Service Rendered	Total No of Patients
1	අක්ෂි ශල්‍යකර්ම-ප්‍රධාන	5,366
2	අක්ෂි ශල්‍යකර්ම -සුලු	457
3	සාමාන්‍ය ශල්‍යකර් ම -ප්‍රධාන	695
4	සාමාන්‍ය ශල්‍යකර්ම - සුලු	208
5	බාහිර රෝගී අංශය-වෛද්‍ය ප්‍රතිකාර සේවා	82,565
6	බාහිර රෝගී අංශය-එන්නත්	1,072
7	බාහිර රෝගී අංශය-සැරහුම්	5,312
8	හදිසි ප්‍රතිකාර රෝගීන්	15,438
වාට්ටු ඇතුලත්කිරීම්		**10,298**
	සායනික රෝගීන්	
1	අක්ෂි සායන	31,893
2	අක්ෂි සායන-ග්ලූකෝමා	321
3	අක්ෂි සායන-දියවැඩියා	275
4	ලේසර් ප්‍රතිකාර	873
5	දන්ත සායන	4610
6	වෛද්‍ය සායන	36,160
7	ශල්‍ය සායන	-
8	ළමා රෝග සායන	6545
9	මානසික රෝග සායනය	-
10	VP Referral OPD	1,898
11	පවුල් වෛද්‍ය සායනය	357
12	සුවනාරි සායනය	6013
13	පවුල් සැලසුම් සායනය	687
14	තුවාල සත්කාර සායනය	54
15	බෝ නොවන රෝග සායනය	11,035
16	Endocrine	555
17	අක්ෂි සායන	7659
මුලු සායනික එකතුව		**108,935**
	පරීක්ෂණ	
1	රසායනාගාර පරීක්ෂණ	55,696
2	එක්ස් රේ පරීක්ෂණ	1,963
3	ඊසීජී පරීක්ෂණ	4,045
4	Endoscopy පරීක්ෂණ	430
5	Refraction පරීක්ෂණ	9638
6	OCT පරීක්ෂණ	1769

2022 වසරෙහි සහ 2023 මුල් අවධියෙහි ප්‍රධාන සිදුවීම්

නවෝත්පාදන, නව ස්ථාපිත කිරීම් සහ සිදුවීම්

- 2022-03-13 දින ග්ලූකෝමා දින වැඩසටහන අක්ෂි ඒකකය මගින් සංවිධානය කර ඇත.
- කොවිඩ් වසංගත තත්වයේදී අවම මරණ සංඛ්‍යාවක් සහිතව සිදුව බ්‍රැන්ඩික්ස් අතරමැදි ප්‍රතිකාර මධ්‍යස්ථානය තුල පසුගිය මාස 7 ක කාලයක් කැපවීමෙන් සේවාව ලබා දුන් සෞඛ්‍ය කාර්ය මණ්ඩලය අයගමින් සහතික පත් බෙදා දීම වෙනුවෙන් වැඩසටහනක් බ්‍රැන්ඩික්ස් මධ්‍යස්ථානයේදී පැවැත්වීම
- 2022-09-25 දින වනාතවිල්ලුව ප්‍රදේශයේදී අක්ෂි කදවුරක් පැවැත්වීම
- රෝහල් සංවත්සරයට සමගාමීව 2022 ඔක්තොම්බර් 9 වන දින ඉහත කදවුරෙන් තෝරා ගත් රෝගීන් 37 දෙනෙකුට අක්ෂි ශල්‍යකර්ම සිදු කිරීම
- 2022 ජුනි 17 දින හෙද සොයුරියන් දෙදෙනා පුහුණුවෙන් පසුව නව පත්වීම් ලබා ගැනීම
- රෝහලේ 23 වෙනි සංවත්සරයට සමගාමීව වසර 20 ක් සේවය සපුරන ලද කාර්ය මණ්ඩලයට තිලිණපත් සහ සහතිකපත් බෙදා දීම
- 2022/11/19 දින දියවැඩියා දින වැඩසටහන එන්ඩොක්‍රයිනි සායනය මගින් පැවැත්වීම
- සියලු පහසුකම් වලින් සම්පූර්ණ ඖෂධ ගබඩාවක් ස්ථාපිත කිරීම

1. වෛද්‍ය උපකරණ මිලදී ගැනීම
   සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීමට වෛද්‍ය උපකරණ මිලදී ගැනීම

කාඩියැක් මොනිටර් යන්ත්‍ර 2	Rs. Mn	1.42
ඉන්*යුෂන් පම්ප් යන්ත්‍ර 4	Rs. Mn	0.50
ඊ සී ජී යන්ත්‍ර 1	Rs. Mn.	0.25
පල්ස් ඔක්සිමීටර් යන්ත්‍ර	Rs. Mn	0.16

2. ගොඩනැගිලි අලුත්වැඩියා
   පීසීයූ , ඩ්‍රසින්, ඩිස්පෙන්සරි ප්‍රදේශ වල රැහැන් ඇද සවි කිරීම — Rs. 2.6 Mn
   ගබඩාවට යන මාර්ගයට ඉන්ටලොක් සවි කිරීම — Rs. 0.78 Mn

3. ලී බඩු උපකරණ හා පරිගණක උපාංග
   පරිගණක උපකරණ මිලදී ගැනීම — Rs. 1.47 Mn
   ලී බඩු සහ සවිකුරු — Rs. 1.86 Mn
4. පසුගිය අවුරුදු 5 තුල කාර්ය සාධනය

සංඛ්‍යාලේඛණ තොරතුරු

Section/Year	Total No. of Patients Treated				
	2018	2019	2020	2021	2022
බාහිර රෝගී අංශය	103,420	109,102	71,212	47,514	82,565
ඕපී.ඩී එන්නත්			1,102	1,126	1,072
ඕපී.ඩී. සැරහුම්	-	-	8,703	6,395	5,312
ප්‍රාථමික සත්කාර ඒකකය	21,718	22,435	15,134	11,256	15,438
දන්ත ඒකකය	8,756	6,711	4,757	3,671	4,610

වෛද්‍ය ඒකකය

Section/Year	Total No. of Patients attended the clinic				
	2018	2019	2020	2021	2022
වෛද්‍ය සායනය-කායික වෛද්‍ය	40,695	42,436	34,012	30,212	36,160

Section/Year	Total no . of patients admitted to the ward				
	2018	2019	2020	2021	2022
වෛද්‍ය වාට්ටු අංක 1 - පිරිමි	1,509	1,140	731	619	749
වෛද්‍ය වාට්ටු අංක 2 - ගැහැණු	2,238	1,555	1,046	851	1,009

බාහිර සායන

Section/Year	Total No. of Patients attended the clinic				
	2018	2019	2020	2021	2022
දියවැඩියා අධිරුධිර පීඩන සායනය	3,548	3,897	5,413	2,960	-
ළමා රෝග සායනය	904	532	182	-	-
මානසික රෝග සායනය	2,344	1,915	1,895	1,601	1,898
උගුර කණ නාසය සායනය		339	135	-	-
අන්තරාසර් ග රෝග සායනය				1,659	7,659

වෙනත් විශේෂ සායන

Section/Year	Total No. of Patients attended the clinic				
	2018	2019	2020	2021	2022
පවුල් වෛද්‍ය සායනය	2,123	5,336	6,929	5,275	6,013
බෝ නොවන රෝග සායනය	484	523	279	426	555
සුවනාරි සායනය	74	58	15	439	687
පවුල් සැලසුම් සායනය				16	54

අක්ෂි ඒකකය

Section/Year	Total No. of Patients				
	2018	2019	2020	2021	2022
අක්ෂි සායනය	47,570	47,854	30,078	27,603	31,893
අක්ෂි ශල්‍යකර්ම	1,336	2,849	3,724	5,521	5,823
අක්ෂි වාට්ටුව අංක 3 - පිරිමි හා ගැහුණු	1,863	3,747	4,410	5,679	5,941
Laser ප්‍රතිකාර	1,648	988	723	1,072	873
Refractive පරීක්ෂණ	8,622	2,197	5,602	5,549	9,638

ශල්‍ය ඒකකය

Section/Year	Total No. of Patients				
	2018	2019	2020	2021	2022
ශල්‍ය සායනය	4,494	4,427	3,261	4,829	6,545
එන්ඩොස් කොපිරීක්ෂණ	950	1,085	748	566	430
සාමාන්‍ය ශල්‍යකර්ම	1,023	1,047	675	767	903
ශල්‍ය වාට්ටු 6 - ගැහැණු සහ පිරිමි	3,541	3,512	2,544	2,284	2,496
තුවාල සත්කාර ඒකකය	15,556	16,745	11,179	9,316	11,035
වාට්ටු 5 - තුවාල සත්කාර වාට්ටුව - ගැහැණු සහ පිරිමි	358	279	119	119	176

සහයක සේවා

Section/Year	Total No. of Patients				
	2018	2019	2020	2021	2022
රසායනාගාර පරීක්ෂණ	111,620	101,066	69,697	53,177	55,696
එක්ස් රේපරීක්ෂණ	4,728	3,791	1,929	1,816	1,963
ECG පරීක්ෂණ	7,776	8,882	5,409	3,869	4,045

Glaucoma Day Programme

Certificates for COVID Intermediate Care Centre Staff IN COVID Center

Brandix Intermediate Care Centre –Seeduwa

Diabetic Day Programme

Appointments for Two Sisters at WKMH

23rd Anniversary of WKMH

2023 සඳහා සැලසුම් කර ඇති සංවර්ධන ව්‍යාපෘති

අක්ෂි , ශල්‍ය හා වෛද්‍ය යන අංශ වල රෝගී සත්කාර සේවාවන් දියුණු කිරීම සඳහා අවශ්‍ය වෛද්‍ය උපකරණ මිලදී ගැනීම

රෝගීන් සඳහා වු සේවා දියුණුකිරීමට යටිතල පහසුකම් දියුණු කිරීම

7.4 ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල

හැඳින්වීම

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල, 1983 අංක 54 දරණ ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල පාර්ලිමේන්තු පනතින් බලාත්මක කොට 1984 සැප්තැම්බර් මස 17 වෙනි දින උත්සවාකාරයෙන් ආරම්භ කරන ලද අතර, 2019 වර්ෂය වනවිට එය සිය ජයග්‍රාහී සහ විශිෂ්ඨ ගමනෙහි 35 වෙනි වර්ෂය සම්පූර්ණ කළේ ය. මෙම රෝහල පිහිටුවනු ලැබුවේ ශ්‍රී ලංකාව තුළ සෞඛ්‍ය සත්කාරක සේවා සැපයීම සහ, වෛද්‍ය උපාධි අපේක්ෂකයින්ට සහ පශ්චාත් වෛද්‍ය උපාධි අපේක්ෂකයින්ට සහ අනිකුත් සෞඛ්‍ය සත්කාරක සේවාවන්හි පුද්ගලයන්ට සිය පුහුණු කාලසීමාව තුළ දී සහාය දැක්වීම අරමුණුකොට ගෙන ය. මෙම රෝහලෙහි රෝගී සත්කාරක සහ අනිකුත් කාර්යයන් සඳහා ඉහළ සුදුසකම් සහිත, පළපුරුද්ද සහ කාර්යක්ෂම වෛද්‍ය, සාත්තු සේවා සහ තාක්ෂණික කාර්යමණ්ඩලයක් යොදවා ඇත.

මෙම රෝහල ශ්‍රී ලාංකික ජනතාව වෙත ජපන් රජයෙන් ප්‍රදානය කරන ලද ත්‍යාගයකි. ඉතා හොඳින් නිර්මාණය කරන ලද ගොඩනැගිලි සංකීර්ණයක් එය සතුව තිබෙන අතර, ඒවා අනාගත අවශ්‍යතා සපුරාලීම සඳහා තවදුරටත් පුළුල් කළ හැකි පරිදි ඉදිකර ඇත. මෙම රෝහල සඳහා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රමාණවත් මූල්‍ය දායකත්වයද සපයනු ලබයි.

මහජනතාවගේ වාර්තමාන අවශ්‍යතා සපුරාලිය හැකිවන පරිදි රෝහල මගින් සපයනු ලබන සේවාවන් පුළුල් කරන ලෙස කෙරෙන ඉල්ලීම්ද වැඩිවෙමින් පවතී.

දැක්ම

2030 වසර වන විට දකුණු ආසියාවේවිශිෂ්ඨ ප්‍රමුඛතම තෘතීයික සෞඛ්‍ය සත්කාර සපයන්නා බවට පත්වීම

මෙහෙවර

“නවීන තාක්ෂණය සමගින් පිරිවැය ඵලදායී සෞඛ්‍ය සත්කාර විසඳුම් ලබා දීමට කැපවෙමින් විශේෂිත, සුරක්ෂිත, අචාරධර්මානුකූල සහ ගුණාත්මක සම්මතයන් පවත්වාගැනීමට සහ සෞඛ්‍ය සහ සමසෞඛ්‍ය විද්‍යාවන් පිළිබඳ පූර්ව සහ පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා දීම ”

විශේෂඥ වෛද්‍ය සේවා සපයනු ලබන ඒකක

- කායික රෝග
- සාමාන්‍ය ශල්‍ය
- ප්‍රසව සහ නාරිවේද
- ළමා රෝග
- නිර්වින්දන
- නව්‍යසූති
- අක්ෂි රෝග
- උගුර, කණ සහ නාසය පිළිබඳ

- ස්නායු රෝග
- චර්ම රෝග
- හෘත් විද්‍යුත් භෞතවේද (cardio Electro physiology)
- ස්නායු ශල්‍ය
- හෘද රෝග
- හෘද උරස් ශල්‍ය
- විකලාංග
- වකුගඩු රෝග
- මෞත්‍රලිංගිකරෝගසහවකුගඩුබද්ධකිරීමේ
- වාතරක්තවේද සහ පුනරුත්ථාපන
- අන්තරාසර්ගවේද
- පටක ව්‍යාධිවේද
- ක්ෂුද්‍රජීවවේද
- රක්තවේද
- රසායනික ව්‍යාධිවේද
- ලේ බැංකුව හා රුධිර පාරවිලයන
- විකිරණවේද

පහසුකම් සහ තොරතුරු භාවිතා කිරීම 2022

උපයෝජන හා පහසුකම් විස්තර	2022
1. රෝගීන් සඳහා වූ ඇඳන් ගණන	1,008
2.ඇතුළත් කරන ලද මුළු රෝගීන් ගණන	42,633
3. සේවයේ සිටින විශේෂඥ වෛද්‍යවරුන් ගණන	43
4.දැඩි සත්කාර ඒකකයන්ට කරන ලද ඇතුළත් කිරීම් ගණන	686
5.හදිසි ප්‍රතිකාර ඒකකය තුළින් කරන ලද ඇතුළත් කිරීම් ගණන	21,262
6.මාතෘත්ව ඇතුළත් කිරීම්	2,553
7.නැවතී සිටීමේ කාලයේ සාමාන්‍යය (දින)	4.6
8. රෝහලෙහි ඇඳන් භාවිතය (%)	54.74%
a. සාමාන්‍ය වාට්ටුවල ඇඳන් භාවිතය (%)	54.03%
b. ගෙවන වාට්ටුවල ඇඳන් භාවිතය (%)	61.73%
9. බාහිර රෝගී අංශයට පැමිණි රෝගින් ගණන	19,537
10. හදිසි ප්‍රතිකාර අංශයට පැහිණි රෝගීන් ගණන	28,576

11. සිදුකරන ලද සැරහුම් ගණන	9,464
12. පවත්වන ලද සායන ගණන	4,310
13. සායනවලට සහභාගි වූ මුළු රෝගීන් ගණන	153,143
14. මුළු රුධිර එක්රැස් කිරීම් ගණන	4,525
15. සිදුවූ මුළු මරණ සංඛ්‍යාව	721

2022 වර්ෂය තුළ සිදුකරන ලද මුළු ක්‍රියාකාරකම් ගණන

දර්ශකය	2022
1.සිදුකරන ලද මුළු ශල්‍යකර්ම ගණන	12436
2. සිදුකරන ලද මුළු හෘද් කන්තුක ශල්‍යකර්ම ගණන	664
3.සිදුකරන ලද මුළු **CABG** (බයි-පාස්) ශල්‍යකර්ම ගණන	224
4.සිදුකරන ලද මුළු වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්ම ගණන	33
5.සිදුකරන ලද රුධිර කාන්දු පෙරීම් **(Dialysis)**ගණන	5278
6.සිදුකරන ලද වෘක්ක වාණු **(Renal Biopsy)** පරීක්ෂණ	122
7.සිදුකරන ලද ප්‍රතිධ්වනිත කන්තුක රේඛ**(Echo)** පරීක්ෂණ	12081
8. සිදුකරන ලද කිරීටක වාහිනී **(Coronary**	1200
9. සිදුකරන ලද **Stress** පරීක්ෂණ ගණන	1053
10. සිදුකරන ලද හොල්ටර් නිරීක්ෂණ පරීක්ෂා **(Holter**	981
11. සිදුකරන ලද විද්‍යුත් කන්තුක රේඛ පරීක්ෂණ **(ECG**	40059
12. ගනු ලැබූ ඊඑම්ජී **(EMG)** ගණන	1043
13. ගනු ලැබූ ඊඊජී **(EEG)** ගණන	885
14. සිදුකරනු ලැබූ සැරහුම් ගණන	9464
15. විකිරණශීලී**(Radiology)** සේවාවන් ගණන	81876
16.CT අධ්‍යයන ගණන	10966
17. සිදුකරනු ලැබූ මැමෝග්‍රෑම් **(Mammograms)** ගණන	551
18. සිදුකරනු ලැබූ අතිධ්වනික පරිලෝකන **(Ultrasound**	10945
19. භෞත චිකිත්සක **(Physiotherapy)** සේවාවන් ගණන	35068
20. පෙනහළු ක්‍රියාකාරිත්ව පරීක්ෂණ ගණන	236
21. මෞත්‍රගතික **(Urodynamic)** පරීක්ෂණ ගණන	44
22. චැනල් සේවාවන් ලබාගැනීමට පැමිණි රෝගීන් ගණන	7633
23. සිදුකරන ලද **Refraction** පරීක්ෂණ	554
24. ජෛවමිතීන් ගණන	4453
26. දෙන ලද පෝෂණ උපදෙස් ගණන	1580
27.සිදුකරන ලද කථන ප්‍රතිකාර **(Speech Therapies)**	819
28. ශ්‍රව්‍ය රේඛ **(Audiograms)** ගණන	1809
29. කර්ණ පටහපටල පරීක්ෂා **(Tympanograms)** ගණන	1197
30. වෛද්‍ය පරීක්ෂණ ගණන	5515

31. සිදුකරන ලද මනෝවිද්‍යා උපදේශන ප්‍රතිකාර ගණන	1756
32. සිදුකරන ලද ව්‍යාධිවේදී පරීක්ෂණ ගණන	1053566
33. මුළු එන්ඩස්කොපි **(Endoscopy)** පරීක්ෂණ ගණන	1531
34. ජීවී උපත් ගණන	2161
35.ප්‍රසව සහ නාරිවේදපරිලෝකන **(Gyn&Obs scans)**	9254

ජයග්‍රහණයන් - 2022 සහ 2023 මුල් භාගය (2023 ජූනි 30 දක්වා)

සේවා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම්

- ප්‍රාථමික සත්කාර ඒකකයක් ඇරඹීම (මූලික කාර්යයන්)
- පරීක්ෂණාගාර සේවාවන් ව්‍යාප්ත කිරීම
- පීසීආර් හා රැපිඩ් ඇන්ටිජන් පරීක්ෂාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම
- කෝවිඩ් 19 පැවතිය දී සාමාන්‍ය රෝගී සත්කාරක සේවාවන් අඛණ්ඩව පවත්වාගෙන යාම
- හදිසි සත්කාර නිසි පිළිවෙලකට සැකසීම
- එන්වීකියු4ට සමාන්තරව සත්කාර සපයන්නන් පුහුණු කිරීමේ වැඩසටහන
- රේවට රෝපණ ශල්‍යකර්මයන්හි උසස් කාර්ය සාධනය (ENT)
- වෘක්ක බද්ධ කිරීම් හා හෘද ශල්‍යකර්මයන් හි ඉහළ කාර්ය සාධනය සාර්ථක ව පවත්වාගෙන යාම
- රෝහලේ ජලය රඳවා ගැනීමේ ධාරිතාව ඉහළ නැංවීම
- සනීපාරක්ෂක පහසුකම්වල භෞතික තත්ත්වය වැඩිදියුණු කිරීම
- (ගොඩනැගිලි අළුත්වැඩියාවට හා නැවත සකස් කිරීමට පියවරෙන් පියවර යන සැලසුමක් සැකසීමට කළමනාකාරිත්වයට හැකි විය. මෙම බරැරුම් කාර්යය දැනට ක්‍රියාත්මක ව පවතී. මෙම නවීකරණයෙන් පසු ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලට පෞද්ගලික අංශයේ නවීන සෞඛ්‍ය පහසුකම් සමඟ තරග කිරීමේ දී ප්‍රමුඛතාව ලැබෙනු ඇත.)
- 2021 වසර තුළ දී සහ මේ දක්වා කාර්ය මණ්ඩලයේ සියළු අංශයන් ආවරණය වන පරිදි නව පුහුණු කිරීම් හා සංවර්ධන වැඩසටහන් හඳුන්වා දී පවත්වාගෙන යන ලදි.
- රෝහලේ තොරතුරු කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කෙරෙමින් පවතී.
- බෙහෙත්, සැරහුම්, ශල්‍ය සහ අනෙකුත් ද්‍රව්‍යයන් කළමනාකරණය කඩදාසි භාවිතයෙන් තොර ව තොග පාලන පද්ධතිය මඟින් කළමනාකරණය කළ හැකි වනු පිණිස රෝහලේ තොරතුරු තාක්ෂණ පද්ධතිය වැඩිදුරටත් ව්‍යාප්ත කරන ලදි.
- 2021 - 2022 වසර සඳහා නව වෛද්‍ය ආම්පන්න මිලට ගැනීම
- ගොඩනැගිලි පින්තාරු කිරීම.

2021/2022ජයග්‍රහණ/විශේෂ අවස්ථා

නව පීසීආර් පරීක්ෂණාගාරය

පසුගිය වසර 5 තුළ කාර්ය සාධනය


















CT studies
15000
10000
5000
0
13428
13031
10551
9740
10966
2018
2019
2020
2021
2022
Yea


Psychological counseling done
2500
2000
1500
1000
500
0
2095
2035
1687
1431
1758
2018
2019
2020
2021
2022
Yea


Medical Check-ups
6000
5000
4000
3000
2000
1000
0
3659
3766
2144
1740
5515
2018
2019
2020
2021
2022
Year


Pathological tests
1600000
1400000
1200000
1000000
800000
600000
400000
200000
0
1272727
1427043
1061864
1076751
1053566
2018
2019
2020
2021
2022
Yea


Endoscopy tests done
7000
6000
5000
4000
3000
2000
1000
0
6122
6298
4830
4434
5239
2018
2019
2020
2021
2022
Yea


Nutritional Consultation
5000
4000
3000
2000
1000
0
3994
3330
2398
1744
1580
2018
2019
2020
2021
2022
Year


Total Number of Surgeries
16000
14000
12000
10000
8000
6000
4000
2000
0
14601
14619
11804
10493
12436
2018
2019
2020
2021
2022
Yea


Total Number of Heart Surgeries
800
700
600
500
400
300
200
100
0
630
728
584
616
664
2018
2019
2020
2021
2022
Year

8. පෞද්ගලික සෞඛ්‍ය අංශ සංවර්ධනය

දැක්ම

ගුණාත්මක රෝගී සත්කාර සේවා සපයන විශිෂ්ට පෞද්ගලික සෞඛ්‍ය සේවා පද්ධතියක්

මෙහෙවර

ගුණාත්මක සෞඛ්‍ය සේවාවක් සැපයීමේදී ප්‍රමිතීන් නියාමනය කිරීම, අධීක්ෂණය කිරීම සහ ඇගයීම මගින් විශිෂ්ට පෞද්ගලික සෞඛ්‍ය සේවා පද්ධතියක් සංවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම.

ඉලක්ක

ගුණාත්මකභාවය සහ රෝගීන්ගේ ආරක්ෂාව සහතික කිරීම මගින් පුද්ගලික සෞඛ්‍ය සේවා වැඩිදියුණු කිරීම.

අරමුණු

- ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වාගෙන යා යුතු ප්‍රමිතීන් සංවර්ධනය කිරීම සහ අධීක්ෂණය කිරීම.
- එවැනි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රමිතීන් ඇගයීමේ ක්‍රමය.
- බඳවා ගැනීම් සඳහා අවම සුදුසුකම් සහ පිරිස් පුහුණු කිරීමේ අවම ප්‍රමිතීන් සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සම්මත කර ඇති බව සහතික කිරීම.
- එවැනි පෞද්ගලික වෛද්‍ය ආයතන මගින් සපයනු ලබන හෝ සපයනු ලබන රෝගී සත්කාර සේවාවල ගුණාත්මක බව සහතික කිරීම

පුද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාවල කාර්ය සාධනය

1. **කාණ්ඩ 11 යටතේ ශ්‍රී ලංකාවේ සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීම සහ අලුත් කිරීම.**
   - පුද්ගලික රෝහල් සහ සාත්තු නිවාස සහ මාතෘ නිවාස
   - වෛද්‍ය මධ්‍යස්ථාන/ පරීක්ෂණ මධ්‍යස්ථාන/ දිවා සුරැකුම් වෛද්‍ය මධ්‍යස්ථාන/ නාලිකා උපදේශන
   - වෛද්‍ය රසායනාගාර
   - පෞද්ගලික ගිලන්රථ සේවා
   - පූර්ණ කාලීන දන්ත ශල්‍යකර්ම
   - පූර්ණ කාලීන සාමාන්‍ය පිළිවෙත්/ බෙහෙත් ශාලා/ වෛද්‍ය සායන
   - පූර්ණ කාලීන වෛද්‍ය විශේෂඥ පරිචයන්
   - අර්ධකාලීන දන්ත සැත්කම්
   - අර්ධකාලීන සාමාන්‍ය පිළිවෙත්/ බෙහෙත් ශාලා/ වෛද්‍ය සායන
   - අර්ධකාලීන වෛද්‍ය විශේෂඥ පරිචයන්
   - වෙනත් පෞද්ගලික වෛද්‍ය ආයතන
2. ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් පවත්වාගෙන යායුතු ප්‍රමිතීන් සංවර්ධනය කිරීම

   සහ අධීක්ෂණය කිරීම සහ එවැනි පෞද්ගලික වෛද්‍ය ආයතන පවත්වාගෙන යනු ලබන

ප්‍රමිතීන් ඇගයීමේ ක්‍රමයක් ලෙස ද ක්‍රියා කරයි.

3. බඳවා ගැනීම් සඳහා අවම සුදුසුකම් සහතික කිරීම සඳහා පුහුණු පහසුකම් සැපයීම සහ පිරිස් පුහුණු කිරීමේ අවම ප්‍රමිතීන් සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සම්මත කර ගැනීම.

4. රෝග නිවාරණ, පුනරුත්ථාපන සහ සහන සත්කාර සඳහා පහසුකම් සැලසීම සඳහා රෝගී සත්කාර සැපයීම සඳහා මග පෙන්වීම

5. අවසන් අදියරේ සිටින වකුගඩු රෝගීන් සඳහා පෞද්ගලික රෝහල්වල වකුගඩු බද්ධ කිරීමේ ශල්‍යකර්ම සඳහා අවසර ලබාදීමට කටයුතු කිරීම.

6. පුද්ගලික වෛද්‍ය ආයතන මගින් සපයනු ලබන සේවාවන්හි ගුණාත්මක භාවය වර්ධනය කිරීම; රෝග නිවාරණ සේවා පැවැත්වීමේදී ජාතික මාර්ගෝපදේශ හා ප්‍රමිතීන් වෙනුවෙන් පෙනී සිටීම සහ ඒවාට අනුකූලව කටයුතු කිරීම සහ අදාළ තොරතුරු වසංගත රෝග විද්‍යා අංශය වෙත පැවරීම. උදා: ඩෙංගු වැළැක්වීම.
7. ජාතික පිළිකා පාලන ප්‍රතිපත්ති මගින් හඳුනාගෙන ඇති පරිදි පිළිකා ප්‍රතිකාර මධ්‍යස්ථාන සහ රෝග විනිශ්චය රසායනාගාර ලෙස ක්‍රියා කරන පෞද්ගලික රෝහල් මගින් ජාතික පිළිකා ලේඛනාගාරයට තොරතුරු සැපයීමට දායක වීම.

PHSRC හි ලියාපදිංචි පෞද්ගලික වෛද්‍ය ආයතන සංඛ්‍යාව

(2023/07/31 දිනට දත්ත සමුදාය)

වර්ගය	2023 ජූලි 31 දිනට ලියාපදිංචි කිරීම් ගණන	නව ලියාපදිංචි කිරීම් ගණන
පෞද්ගලික ගිලන්රථ සේවා	12	00
පූර්ණ කාලීන දන්ත සැත්කම්	26	04
පූර්ණ කාලීන සාමාන්‍ය පිළිවෙත්/ බෙහෙත් ශාලා/ වෛද්‍ය සායන	118	20
පූර්ණ කාලීන වෛද්‍ය විශේෂඥ පරිචයන්	03	00
වෛද්‍ය රසායනාගාර	634	99
වෛද්‍ය මධ්‍යස්ථාන/ පරීක්ෂණ මධ්‍යස්ථාන/ දිවා සුරැකුම් වෛද්‍ය මධ්‍යස්ථාන/ නාලිකා උපදේශන	245	60
වෙනත් පෞද්ගලික වෛද්‍ය ආයතන	155	33
අර්ධකාලීන දන්ත සැත්කම්	34	25
අර්ධකාලීන සාමාන්‍ය පිළිවෙත්/ බෙහෙත් ශාලා/ වෛද්‍ය සායන	313	99

අර්ධකාලීන වෛද්‍ය විශේෂඥ පිළිවෙත්	06	0
පුද්ගලික රෝහල් සහ සාත්තු නිවාස සහ මාතෘ නිවාස	175	05
මුළු පුද්ගලික වෛද්‍ය ආයතන	1721	345

පෞද්ගලික රෝහල්වල රෝගී ඇඳන් සම්පූර්ණ කිරීම

වර්ගය	
මුළු පුද්ගලික රෝහල් සංඛ්‍යාව	198
මුළු ඇඳන් සංඛ්‍යාව	5568

ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන අංශය

9. ඖෂධ නිෂ්පාදනය, සැපයීම් හා නියාමන අංශය

දැක්ම

උසස් ගුණාත්මක බවින් යුත් ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය තුලින් සෞඛ්‍ය සම්පන්න ජාතියක් බිහි කිරීම.

මෙහෙවර

ඖෂධ නිෂ්පාදනය සහ සැපයීම ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා සැලසුම් සකස් කිරීම මෙන්ම ඖෂධවල ගුණාත්මක බව නියාමනය කිරීම සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ආයතන සඳහා නිසි කලට ඖෂධ සැපයීම මගින් ඉහල සෞඛ්‍ය මට්ටමකට ළඟා වීම.

අරමුණු

සෞඛ්‍ය සම්පන්න ජනතාවක් බිහි කිරීම සඳහා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය වන්නා වූ ගුණාත්මක හා ප්‍රමිතිගත ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමනය සිදු කිරීම ඖෂධ නිෂ්පාදනය හා සැපයීම් අංශයේ ප්‍රධාන වගකීම වේ. නිසි ප්‍රමිතියෙන් තොර බාල ඖෂධ ලංකාවට ආනයන කිරීම සම්පූර්ණයෙන් තහනම් කිරීමට පියවර ගැනීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රට තුළ නිෂ්පාදනය කළ හැකි සියලුම ඖෂධ හා ඒ ආශ්‍රිත උපකරණ මෙරට තුළම නිෂ්පාදනය කිරීමට අවශ්‍ය පියවර ගැනීම මෙම අංශයේ ප්‍රමුඛ වගකීමක් වේ. ඒ අනුව දේශීය හා විදේශීය ආයෝජකයන් දිරිගැන්වීම හරහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රට තුළ නිෂ්පාදනය කල හැකි සියලුම ඖෂධ ශ්‍රී ලංකාව තුළම නිෂ්පාදනය කර ඖෂධ ආනයනය සඳහා වැය වන විදේශ විනිමය අවම කර ප්‍රමිතියෙන් උසස් ඖෂධ සහනදායි මිලට ජනතාවට ලබා දීමේ ක්‍රමෝපායක් ලෙස "ඖෂධ නිෂ්පාදන කලාප" මෙරට පිහිටුවීමට දැනටමත් කටයුතු ආරම්භ කර ඇත. ඒ තුලින් වර්ෂ 2025 වනවිට මෙරට ඖෂධ අවශ්‍යතාවයෙන් 60% ක් මෙරට තුළදීම නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

ප්‍රධාන කාර්යයන්

- ඖෂධවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශවලට යටත්ව රසායනාගාර පහසුකම් පුළුල් කිරීම.
- ප්‍රමිතියෙන් යුත් ඖෂධ නිෂ්පාදනය, ආනයනය හා වෙළඳපළ තුල පාරිභෝගික සුරක්ෂිතතාව ආරක්ෂා වන පරිදි මිල ගණන් ක්‍රියාත්මක කරවීමත්, ඖෂධ වෙළඳපළ ඒකාධිකාරය වැලැක්වීම සඳහා සහ ප්‍රමිතියෙන් යුත් ඖෂධ සැල් ප්‍රවර්ධනය සඳහා නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම.
- ඖෂධ නිෂ්පාදනය සඳහා දේශීය ව්‍යාපාරිකයන් හා ආයෝජන දිරිගැන්වීමේ ක්‍රමෝපායන් සකස් කිරීම.

අංශයේ කාර්ය සාධනය

- **ඖෂධ නිෂ්පාදන කලාප පිහිටු වීම**

ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රට තුළ නිෂ්පාදනය කළ හැකි සියලුම ඖෂධ ශ්‍රී ලංකාව තුළම නිෂ්පාදනය කර ඖෂධ ආනයනය සඳහා වැය වන විදේශ විනිමය අඩු කර තත්ත්වයෙන් උසස් ඖෂධ සාධාරණ මිලට ජනතාවට ලබා දීම සඳහා දේශීය ව්‍යාපාරිකයන් හා ආයෝජකයන් දිරි ගැන්වීමේ ක්‍රමෝපායක් ලෙස දේශීය වශයෙන් පවත්නා ඖෂධ ඉල්ලුම සපුරා ගැනීමට ඖෂධ නිෂ්පාදනය සඳහා වෙන් වූ "ඖෂධ නිෂ්පාදන කලාප" පිහිටුවීමේ වැඩසටහන යටතේ අනුරාධපුර ඔයාමඩුව, හොරණ මිල්ලැව හා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරුබොක්ක යන ප්‍රදේශයන්හි ඖෂධ නිෂ්පාදන කලාප ඉදිකිරීමට කටයුතු ආරම්භ කර ඇත.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආරුබොක්ක ප්‍රදේශයෙහි ස්ථාපිත කිරීමට යෝජිත ඖෂධ නිෂ්පාදන කලාපය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් මූලික වශයෙන්

ඉලක්ක කරනුයේ විදේශ වෙළඳපළයි. හොරණ මිල්ලෑව ස්ථාපිත කරනු ලබන ඖෂධ නිෂ්පාදන කලාපය ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීමට අපේක්ෂා කර ඇත.

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඔයාමඩුව ප්‍රදේශයේ ඖෂධ නිෂ්පාදන කලාපයක් ස්ථාපිත කිරීමට කටයුතු ආරම්භ කළ අතර ඒ සඳහා අක්කර 80 ක භූමි ප්‍රමාණයක් මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබා දෙන ලදී. ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2020.11.26 දින ලබාගැනීමෙන් පසු ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් හරහා 2021.01.10 දින මෙම ව්‍යාපෘතිය සඳහා දේශීය ආයෝජකයන්ගෙන් අභිලාෂ යෝජනා කැඳවීම (EOI) සිදුකරන ලදී. ඒ යටතේ ව්‍යාපෘති යෝජනා 31ක් ලැබුණු අතර එම ව්‍යාපෘති යෝජනා සියල්ලම මේ සඳහා විශේෂයෙන් පත් කරන ලද

විශේෂඥ කමිටුවකට යොමුකර ඔවුන්ගෙන් නිර්දේශ ලබා ගන්නා ලදී. ඒ අනුව අවසාන වශයෙන් දේශීය ආයෝජකයින් 20 දෙනකු මෙම ව්‍යාපෘතිය සඳහා තෝරා ගන්නා ලදී. තවද කලාප සංවර්ධන (ZONE Development) කටයුතු සඳහා ව්‍යාපෘති යෝජනා 3 ක් ලැබී තිබුණු අතර එම යෝජනා ඇගයීම් සඳහා පත්කළ කමිටුව විසින් Spectrum Pharma Tec Lanka ආයතනය තෝරා ගන්නා ලදී. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2021.03.23 වන දින හිමි විය. එසේම පාරිසරික තක්සේරු වාර්තාව මධ්‍යම පාරිසරික අධිකාරිය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පාරිසරික අනුමැතිය 2021.07.15 දින හිමි විය.තෝරාගත් කලාප සංවර්ධන ආයෝජකයා සහ සෞඛ්‍ය අමාත්‍යාංශය අතර සංවර්ධනය හා කළමනාකරණ ගිවිසුම අත්සන් කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2021.08.26 දින ලැබුණ අතර 2021.08.30 වන දින එම ගිවිසුම අත්සන් කරන ලදී. තෝරාගත් ආයෝජකයන් සඳහා බදු පදනම මත ඉඩම් භුක්තිය ලබා දීම 2021.12.15 දින සිදු කරන ලදී. කලාප සංවර්ධන ආයෝජක විසින් ඖෂධ නිෂ්පාදන කලාපයේ මූලික සංවර්ධන කටයුතු මෙන්ම තෝරාගත් ආයෝජකයන් විසින් ඖෂධ නිෂ්පාදනාගාර ඉදිකිරීම් කටයුතුද ආරම්භ කර ඇත. ලංකා විදුලිබල මණ්ඩලය විසින් කලාපය සඳහා අවශ්‍ය විදුලිබල සැපයුම මේ වනවිට ලබා දී අවසන්ව ඇත.



තෝරාගත් ආයෝජකයන්ගේ ආයෝජන සඳහා ප්‍රතිලාභ සහතික කිරීමට රුකුලක් වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඔවුන් සමග පසු මිලදී ගැනුම් ගිවිසුම් වලට එළඹුණි. මෙම ව්‍යාපෘතිය සඳහා වන සමස්ත ආයෝජනය රුපියල් මිලියන 28,200 පමණ වන අතර එකී සමස්ත ආයෝජනය, තෝරා ගනු ලැබූ ආයෝජකයින් විසින්ම දරනු ලබයි. එසේම මෙම ව්‍යාපෘතිය හරහා ඍජු රැකියා අවස්ථා 2,000 පමණ හා වක්‍ර රැකියා 5,000 පමණ ජනිත වනු ඇත. තවද, මෙම ඖෂධ නිෂ්පාදන කලාපය මගින් ඖෂධ නිෂ්පාදනය දේශීය අවශ්‍යතාවයෙන් 60% දක්වා ඉහල නැංවීමට සැලසුම් කර ඇත.

- **"ස්වස්ථ" වෛද්‍ය සැපයුම් කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය.**

ශ්‍රී ලංකාවේ සියලුම රෝහල් සහ සෞඛ්‍ය ආයතන වල ඖෂධ, ශල්‍ය පරිභෝජ්‍ය ද්‍රව්‍ය සහ රසායනාගාර අයිතම මිලදී ගැනීම් කළමනාකරණය කිරීම සඳහා තොරතුරු කළමනාකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් 2008 වර්ෂයේ සිට ආරම්භ කර ඇති අතර ශ්‍රී ලංකාවේ රෝහල් 1159 අතරින් 256 ක් පමණ එම පද්ධතිය (MSMIS) මගින් ආවරණය කර ඇත. එම ව්‍යාපෘතියේ සැපයුම්කරු සමග අත්සන් කර තිබූ ගිවිසුම් කාලය අවසන්වීමත් සමග ඖෂධ මිලදී ගැනීම් සහ බෙදාහැරීමේ කටයුතු හා සම්බන්ධ ඖෂධවේදීන්, වෛද්‍යවරුන් සහ අනෙකුත් සෞඛ්‍ය නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රයෝගික ගැටළු සහ යෝජනා මත, මේ පිළිබඳ පරිගණක විශේෂඥ මතය විමසූ අතර එහිදී යෝජනා වූ නව තොරතුරු කළමනාකරණ පද්ධතිය වන "ස්වස්ථ" සඳහා 2022 ජනවාරි 10 වන දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබිණි.

"ස්වස්ථ" ව්‍යාපෘතිය මගින් ශ්‍රී ලංකාවේ සියලුම රෝහල් සහ සෞඛ්‍ය ආයතන ආවරණය වන පරිදි සේම රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සහ ජාතික ඖෂධ නියාමන අධිකාරිය යන ආයතනද එකිනෙකට සම්බන්ධ වන අයුරින් නිර්මාණය කිරීම අවසන් අරමුණ වේ. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයට සම්පූර්ණ අයිතිය හිමි, වඩාත් කාර්යක්ෂම, පිරිවැය සඵලදායි සහ සත්‍ය හා තත්‍ය තොරතුරු නිවැරදිව අධීක්ෂණය කළ හැකි තොරතුරු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍ය විය.

ස්වස්ථ
ස්වස්ත SWASTHA

ඒ සඳහා යෝජනා කැඳවීම 2022 ජනවාරි මාසයේ සිදු කල අතර ඉන් තේරීපත් වූ සැපයුම්කරු වෙත එම පද්ධතිය නිර්මාණය කිරීම සඳහා 2022 මාර්තු මාසයේදී භාරදෙන ලදී. පරිගණක මෘදුකාංගය නිර්මාණය කිරීම, පරිගණක ජාලගත කිරීම සහ ඒවාට අන්තර්ජාල සබඳතා ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස් ත්‍රිත්වය වේ. රු.මිලියන 76 ක වියදමකට යටත්ව මෙම

ව්‍යාපෘතිය නිර්මාණය කිරීම සිදු වේ. මේ වන විට නිර්මාණය කරන ලද මෘදුකාංගය නියමු ව්‍යාපෘතියක් ලෙස මහනුවර ප්‍රදේශයේ තෝරාගත් රෝහල් 5ක් අතර සාර්ථක ලෙස ක්‍රියාත්මක කර ඇත.

මේ වන විට අදාල පාර්ශවකරුවන්ගේ යෝජනා සහ අදහස් පදනම් කරගනිමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් තෝරාගත් මෘදුකාංග සංවර්ධන ආයතනය විසින් මෘදුකාංගය නිර්මාණය කිරීමේ වැඩ කටයුතු අවසන් කර ඇත. තවද, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු සහ කලාපීය මට්ටමේ පුහුණු වැඩසටහන් ද සාර්ථක ලෙස අවසන් කර ඇත.

මේ අනුව 130 දෙනෙකුගෙන් සමන්විත ප්‍රධාන ඖෂධවේදීන්, ඖෂධවේදීන් සහ වෛද්‍ය නිලධාරීන් පුහුණුකරුවන් පුහුණු කරන්නන් ලෙස පුහුණුව ලබා දී ඇත. ප්‍රාදේශීය මට්ටමේ පුහුණු වැඩමුළු සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි රාජ්‍ය විශ්වවිද්‍යාල කේන්ද්‍රකොට පැවැත්වූ අතර සමස්ථයක් ලෙස නිලධාරීන් 1000 ක් පමණ පුහුණු කර ඇත. මෙම සියලු ප්‍රාදේශීය පුහුණු වැඩමුළු පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වරුන්ගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කරන ලදී. එහි විස්තර පහත සඳහන් පරිදි වේ;

දිනය	පළාත	සහභාගී වූ නිලධාරීන් ගණන
27.12.2022	උතුරු පළාත	112
18.01.2023	මධ්‍යම පළාත	80
19.01.2023	වයඹ පළාත	102
20.01.2023	උතුරුමැද පළාත	73
25.01.2023	දකුණු පළාත	130
27.01.2023	නැගෙනහිර පළාත	102
08.02.2023	සබරගමුව පළාත	57
10.02.2023	ඌව පළාත	52
24.03.2023	බස්නාහිර පළාත අදියර I	54
01.06.2023	බස්නාහිර පළාත අදියර II	51
06.06.2023	බස්නාහිර පළාත අදියර III	44

මීට අමතරව, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විවිධ කාණ්ඩවලට අයත් නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් සම්පූර්ණ කරන ලදී. එහි විස්තර පහත සඳහන් පරිදි වේ;

දිනය	ශ්‍රේණිය	සහභාගී වූ ගණන
20.04.2023	වෛද්‍ය සැපයීම් සහකාර	44
07.06.2023	වෛද්‍ය රසායනාගාර තාක්ෂණවේදී	50
13.06.2023	චිකිරණ ශිල්පීන්	50

එසේම, වෛද්‍ය සැපයීම් අංශයේ අදාල නිලධාරීන් සහ අනෙකුත් නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් පරිශීලකයන්ගේ පිළිගැනීමේ පරීක්ෂණ (User Acceptance Testing - UAT) සාර්ථකව අවසන් කරන ලදී.

“ස්වස්ථ” වෛද්‍ය සැපයුම් කළමනාකරණ පද්ධතියේ වෙබ් දිගුවේ නාමය ලෙස https://swastha.health.gov.lk/ ලෙස ලියාපදිංචි කර ඇති අතර 2023 ජූනි මස 09 වන දින සිට ස්වස්ථ පද්ධතිය වෛද්‍ය සැපයීම් අංශය, ප්‍රදේශීය වෛද්‍ය සැපයීම් අංශ හා රෝහල් තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.

දේශීය වෛද්‍ය අංශය

දේශීය වෛද්‍ය අංශය

හැඳින්වීම

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් මේ වන විට යොමුව ඇති අතර සුව කිරීමට අසීරු බොහෝ රෝගාබාධ දේශීය වෛද්‍ය ක්‍රමය තුළින් සුව කිරීමඅතුරු ආබාධ අවම , වීම සහ පිරිවැය සාපේක්ෂව අඩු වීම වැනි කරුණු මේ සඳහා පාදක වී ඇති බව පෙනේ.

පැවති Covid-19 වසංගත රෝග තත්ත්වය හමුවේ දේශීය වෙදකම් ආශ්‍රයෙන් සිදු කරන ලද ප්‍රතිකර්ම ඉතා සාර්ථක වූ අතර ඒ සඳහා පිළිගැනීමක්ද ලැබුණි ."සුව ධරණී" වැනි ප්‍රතිශක්තිජනක ඖෂධ හඳුන්වා දීම තුළින් ජනතාවගේ ප්‍රතිශක්තිකරණය වර්ධනය වූ අතර ආයුර්වේද රෝහල් පද්ධතිය තුළින් රෝගීන් මියයාමට හෝ සංකූලතාවයන් ඇති නොවීමට වග බලා ගන්නා ලදී.

පාරම්පරිකව පැවත එන දේශීය වෙදකම මෙන්ම ආයුර්වේදමයන් මෙරට ක්‍රසිද්ධ හා යුනානි වෛද්‍ය , සංරක්ෂණයට හා රෝග නිවාරණ කටථමික සෞඛ්‍යප්‍රායුතු සඳහා විශාල දායකත්වයක් ලබා දෙමින් සිටීමයද මේ වන විට ජනතාව අතර ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රඑසේම විකල්ප වෛද්‍ය . .පිළිගැනීමට ලක්ව ඇත

කෙසේ වෙතත් තවදුරටත් සිදු කෙරෙන පර්යේෂණ හා නවෝත්පාදන ක්ෂේත්‍රයේ ප්‍රගමනයට ඉතා අවශ්‍ය වන අතර ඒ සඳහා තවදුරටත් ආයෝජන කළ යුතුව ඇත.

රටෙහි පවතින පෝෂණ අවශ්‍යතා සහ විදේශ විනිමය ගැටළු සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය ආශ්‍රයෙන් තිරසර විසඳුම් ලබා දීමට හැකි අතර අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය මේ වන විටත් ඒ සඳහා කටයුතු කරමින් පවතී.

වස විසෙන් තොර පෝෂණීය දේශීය ආහාර පාන ජනතාව අතර ප්‍රචලිත කිරීම සහ ඒ සම්බන්ධයෙන් ප්‍රමාණික දැනුමක් ජනතාවට ලබා දීම අවශ්‍ය කෙරේ බොහෝ දේශීය ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය . 350 - 300.මි.විදේශයන්ගෙන් ආනයනය කිරීම සිදු වන අතර ඒ සඳහා රු ව්‍යඅමුද්‍රපමණ විදේශ විනිමයක් වාර්ෂිකව විදේශයන් වෙත ඇදී යයිඑබැවින් මෙරට වගා කළ හැකි සි .යළු ඖෂධ ක්‍රමානුකූලව මෙරට වගා කර විදේශ විනිමය ඉතිරි කර ගැනීමට මෙන්ම නව රැකියා උත්පාදනය සඳහාද කටයුතු කරමින් පවතී.

එසේම විදේශිකයින් ඉලක්ක කර ගනිමින් සුව සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කරමින් මෙම ක්ෂේත්‍රයේ රැකියා නියුක්තිය ඉහළ නැංවීමටත් දේශීය වෛද්‍ය ක්‍රමය විදේශයන්හි ප්‍රවර්ධනය කිරීම වැනි විදේශ විනිමය වැඩි වශයෙන් උපයා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට සංවිධානය කර ඇත.

දේශීය ඖෂධ අපනයනය සඳහා පැවති ආයතනික හා නීතිමය බාධාවන් ඉවත් කර කඩිනමින් මෙම ඖෂධ අපනයනයට අවශ්‍ය නව නීති හා රෙගුලාසි සම්පාදනයට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.

දේශීය වෙදකම නව තාක්ෂණය මුසු කරමින් තව දුරටත් ඉදිරියට යා යුතු අතර ඒ තුළින් ඉදිරියේදී දේශීය වෙදකමින් අපගේ ධරණී තලයම සුවපත් කරලීමට හැකිවනු ඇත .

දැක්ම

හෙළ වෙදකමින් සැමට සුවසෙත

මෙහෙවර

ශ්‍රී ලාංකීය අනන්‍යතාවය රැකෙන අයුරින් පර්යේෂණ සහ නවීන තාක්ෂණය උපයෝගී කර ගනිමින් සමස්ත ප්‍රජාවට සුවසෙත සලසා මානව ශක්තීන් වර්ධනය කිරීම තුළින් ඔවුන් ජාතික ආර්ථික හා තිරසාර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා දායක කරවීම

කාර්යයන් හා කර්තව්‍යයන්

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම

1. පාරම්පරික වෛද්‍ය ක්‍රම සංරක්ෂණය සහ වැඩිදියුණු කිරීමට පියවර ගැනීම
2. ආයුර්වේද, සිද්ධ, යුනානි සහ හෝමියෝපති වෛද්‍ය ක්‍රම සංවර්ධනය හා නියාමනය කිරීම ක්‍රියාත්මක කිරීම
3. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති ඖෂධ නිෂ්පාදනය
4. ආයුර්වේද, සිද්ධ, යුනානි හා හෝමියෝපති වෛද්‍ය ක්‍රමවලට අවශ්‍ය අමු හා නිෂ්පාදිත ඖෂධ ආනයනය, විකිණීම හා බෙදාහැරීම
5. ආයුර්වේද, සිද්ධ, යුනානි ආදී දේශීය වෛද්‍ය ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා අදාළ රෝහල්, පර්යේෂණ හා පුහුනු ආයතන සහ ඖෂධ වෙළඳසැල් පිහිටුවීම හා කළමනාකරණය
6. ඖෂධ පැලෑටි හා සකස් කළ ආයුර්වේද, සිද්ධ හා යුනානි ඖෂධ අපනයනය නියාමනය කිරීම
7. ආයුර්වේද ඖෂධ නිෂ්පාදනයන් නියාමනය කිරීම
8. ඖෂධ පලෑටි වගාව ප්‍රවර්ධනය කිරීම හා දේශීය ඖෂධ වර්ග වැඩිදියුණු කිරීම ආශ්‍රිත ව්‍යාපෘති අදාළ ආයතන සම්බන්ධීකරණය කරමින් ඉටු කිරීම
9. ආයුර්වේද නිෂ්පාදකයන්, ආයුර්වේද වෛද්‍ය වාත්තිකයන් හා ආයුර්වේද අතුරු වෛද්‍ය සේවක පිරිස් ලියාපදිංචි කිරීම
10. ආයුර්වේද රෝහල්, ආයුර්වේද පර්යේෂණ ආයතන, පුහුණු ආයතන සහ ඔසුසල් පිහිටුවීම, මෙහෙයවීම සහ ප්‍රවර්ධනය
11. සංචාරකයින් සඳහා ප්‍රතිකාර කිරීමට දේශීය පාරම්පරික හා ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් සංචාරක මණ්ඩලයේ සම්බන්ධීකරණය හා නියාමනය තුළ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම
12. දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළ ඖෂධ සහ ප්‍රතිකාර ක්‍රම පිළිබඳව පර්යේෂණ පැවැත්වීම දිරිගැන්වීම
13. දේශීය වෛද්‍ය සේවයේ පරිපාලනය සහ පිරිස් කළමනාකරණ කටයුතු

දේශීය වෛද්‍ය අංශය යටතේ ඇති ආයතන



දේශීය වෛද්‍ය අංශයේ ආයතනික කාර්යයන්

අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් සාක්ෂාත් කර ගත හැකි නීති රාමුවක් සකස් කිරීම

- 2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමට අදාළ නියෝග ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ අංක 2294/55 හා 2022.08.26 දිනැතිව ගැසට් කර ඇත.
- 1961 අංක 31 දරණ ආයුර්වේද පනත කාලීන වශයෙන් වැදගත් වන කරුණු එක් කර සංශෝධනය කිරීම අවශ්‍යව පවතී. මෙම පනත 1962 අංක 05, 1969 අංක 09, 1977 අංක 07 සහ 1978 අංක 06 යන පනත් මඟින් සංශෝධනයට ලක්ව ඇති අතර 1978න් පසු සංශෝධනය වී නැත. ආයුර්වේද දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට මෙන්ම එම සේවාවන් පුළුල් කර වඩා වැඩි සේවාවක් සැපයීම සඳහා වන සංශෝධන සිදු කිරීම සඳහා ගරු අමාත්‍යතුමාගේ උපදෙස් මත පත් කරන ලද කමිටුවක් මඟින් අදාළ නිර්දේශ ඉදිරිපත් කර ඇති අතර මේ වන විට සකස් කර ඇති කෙටුම්පත නැවත සංශෝධනය කිරීමේ කාර්යයන් සිදු කරගෙන යනු ලබයි.
- ආයුර්වේද නීති සංග්‍රහය සකස් කොට නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇති අතර එය මේ වන විට අවසාන අදියරේ පවතී.
- පෞද්ගලික ආයුර්වේද ආරෝග්‍යශාලා බෙහෙත් ශාලා සහ ආයුර්වේද ස්වස්ථ සංරක්ෂණ මධ්‍යස්ථාන, අධීක්ෂණය සහ නියාමන කටයුතු සඳහා වූ නියෝග නීති කෙටුම්පත් සම්පාදක වෙත යොමු කර ඇත.

ධාරිතා සංවර්ධන වැඩසටහන්

2022 වර්ෂය තුළ සහ 2023.05.31 දක්වා ක්‍රියාත්මක කළ පුහුණු පාඨමාලා

අනු අංකය	දිනය	පැවැත්වුණු පුහුණු පාඨමාලා	සහභාගී වූ නිලධාරීන්	සංඛ්‍යාව	වැය කළ මුදල රු.
.01	29.04.2022	පෞද්ගලික ලිපි ගොනු කළමනාකරණය	සංස.කළ.සෞ.රා/නි.ස	03	-
.02	26.05.2022	පරිගණක පුහුණු පාඨමාලාව	සංස.කළ.සෞ.රා/නි.ස	02	-
.03	15.06.2022	ආයතන ඵලදායීත්වය ඉහළ නැංවීමේ වැඩසටහන	සංස.කළ.සෞ.රා/නි.ස	26	-
.04	16.06.2022	ආයතන ඵලදායීත්වය ඉහළ නැංවීමේ වැඩසටහන	සංස.කළ.සෞ.රා/නි.ස	19	-
.05	17.06.2022	ආයතන ඵලදායීත්වය ඉහළ නැංවීමේ වැඩසටහන	සංස.කළ.සෞ.රා/නි.ස	17	-
.06	01.07.2022	පරිගණක පුහුණු පාඨමාලාව	සංස.කළ.සෞ.රා/නි.ස	02	-
.07	04.11.2022	කාබනික ඔසු වගා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන හා ක්ෂේත්‍ර චාරිකාව	සංස.කළ.සෞ.රා/නි.ස.කා.කා/රයදුරු/.ස	25	30,000.00
08.	15.11.2022	කාර්යාල ක්‍රමමුදල් , මානසික සෞඛ්‍ය ,රෙගුලාසි	සංස.කළ.සෞ.රා/නි.ස	17	27,700.00
.09	17.11.2022	කාර්යාල ක්‍රමමුදල් , මානසික සෞඛ්‍ය ,රෙගුලාසි	සංස.කළ.සෞ.රා/නි.ස	17	27,700.00
.10	28.11.2022	අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම	සංස.කළ.සෞ.රා/නි.ස	02	10,000.00

.11	,28 29.11.2022	රාජ්‍ය ගිණුම්කරණ ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීම සහ අවසාන ගිණුම් පිළියෙල කිරීම	සංස.කළ.සෞ.රා/නි. .හ	02	15,000.00
.12	05,06.12.2022	රියදුරන් හා කාර්යාල කාර්ය සහායකයින් සඳහා විනය හා කාර්යාලයීය ආචාර විධි	රියදුරන්.ස.කා.කා/	04	36,000.00
.13	28 29.12.2022,	ගබඩා කළමනාකරණ , , පාලනයඉන්වෙන්ට්‍රි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය හා වත්කම් අපහරණය	සංස.කළ.සෞ.රා/නි. .හ	02	18,000.00
14.	31.03.2023	කාර්ය පටිපාටික නීති සම්බන්ධයෙන් පැවුත්වුණු පුහුණු පාඨමාලාව.	පාලන අංශයේ මාණ්ඩලික නිලධාරීන්	12	8,450.00
15.	09.02.2023)first day(	රාජ්‍ය භාෂා ප්‍රවීනතාව - දෙමළ භාෂා පුහුණු (150 පැය)පාඨමාලාව	සංස.කළ.සෞ.රා/නි. .හ	30	112,500.00

සංවර්ධන අංශයේ දායකත්වය

❖ දේශීය වෛද්‍ය ප්‍රතිපත්ති සම්පාදනය

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ (NASFEC) සහ ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) සහාය ඇතිව දේශීය වෛද්‍ය ප්‍රතිපත්තිය සකස් කිරීමට අදාළ කටයුතු මේ වන විට අවසන් අදියරේ පවතින අතර කෙටුම්පත අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

❖ (BIMSTEC)

බහු ආංශික තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බෙංගාල බොක්ක ප්‍රවේශය (BIMSTEC)

මෙහි පස් වන සමුළුව 2023 ජුනි මස 25 සිට 29 දක්වා තායිලන්තයේදී පැවැත්වීමට නියමිතව ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

❖ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත පදනම් වූ හිංසනයන් පිටු දැකීම

ලෝක ජනගහන අරමුදල සහ කාන්තා කටයුතු අමාත්‍යාංශයේ දායකත්වයෙන් ස්ත්‍රී - පුරුෂ සමාජභාවය හා ලිංගිකත්වය මත පදනම් වූ හිංසනයන් පිටුදැකීම සඳහා පූර්ව කොන්දේසි හඳුනාගෙන ඒ සඳහා ඉලක්කයන් සකස් කර ගැනීමත්, අදාළ ඉලක්කයන් ළඟාකර ගැනීම සඳහා උපාය මාර්ග සකස් කිරීමත් මේ වන විට සිදු කර ඇත. ඒ අනුව මේ සඳහා දේශීය වෛද්‍ය අංශයේ කැපවීම පෙන්නුම් කරන ක්‍රියාකාරී සැලැස්ම මේ වන විට සකස් කරමින් පවතී.

දේශීය වෛද්‍ය අංශය යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති/වැඩසටහන්වල ප්‍රගතිය

I. සංරක්ෂණ සහා සවිබල ගැන්වීම

පාරම්පරික වෛද්‍ය ක්‍රමය සංරක්ෂණය කරමින්, පාරම්පරික වෛද්‍යවරයාගේ ජීවන තත්ත්වය නගා සිටුවීමත්, ස්වකීය වෛද්‍ය වෘත්තියේ අනන්‍යතාවය සුරකිමින් පාරම්පරික වෛද්‍ය ක්‍රමයේ ප්‍රගමනයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පාරම්පරික වෛද්‍යවරුන් දායක කර ගැනීම සඳහා ආයුර්වේද සංරක්ෂණ සහා ක්‍රියාත්මක කෙරේ.

ඒ අනුව 2023.06.30 දින වන විට ත්‍රිකුණාමලය, අම්පාර, මඩකලපුව හා ගම්පහ දිස්ත්‍රික්කයන්හි සංරක්ෂණ සහා බලගැන්වීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් පවත්වා ඇති අතර ඒ යටතේ ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 562කි. මෙම වැඩසටහන් සඳහා රු. 519,955.00ක පිරිවැයක් දරා ඇත.

මිනුවන්ගොඩ ආයුර්වේද සංරක්ෂණ සහාව සවිබලගැන්වීම හා දැනුවත් කිරීම

II. පෝෂණ මන්දිර ස්ථාපිත කිරීම

වස විසෙන් තොර පෝෂණීය දේශීය ආහාර ජනතාව අතර ප්‍රචලිත කිරීම තුළින් බෝ නොවන රෝග වැළැක්වීමේ අරමුණින් පෝෂණ මන්දිර වැඩසටහන ක්‍රියාත්මක වේ. ඒ අනුව 2022 වර්ෂයේදී කැඳසල් 02ක් ස්ථාපිත කිරීමට කටයුතු කරන ලදී. 2023 වර්ෂය සඳහා රු.මි. 2.5ක ප්‍රතිපාදන මේ සඳහා වෙන් කර ඇති අතර මෙම ප්‍රතිපාදන මඟින් යක්කල යෝජිත ආයුර්වේද කලාපය තුළ පෝෂණීය ගුණයෙන් යුත් දේශීය ආහාර අලවිසැලක් ඉදි කිරීමට කටයුතු කරමින් සිටී.

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ සැපයීම

නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා සඳහා ඖෂධ සැපයීම වෙනුවෙන් 2023 වර්ෂය සඳහා රු.මි. 55.7ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2023.06.30 දින වට විට ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව මඟින් නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා වෙත නිකුත් කර ඇති ඖෂධවල වටිනාකම රු.මි. 18.35කි.

පළාත් අනුව 2023.06.30 දිනට ප්‍රගතිය

පළාත	2023 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය	2023.06.30 දින වන විට ලබා දී ඇති ප්‍රතිපාදන
බස්නාහිර පළාත	10,000,000.00	3,925,000.00
මධ්‍යම පළාත	8,200,000.00	3,200,000.00
දකුණු පළාත	6,500,000.00	3,000,000.00
උතුරු පළාත	12,000,000.00	1,150,000.00
නැගෙනහිර පළාත	3,500,000.00	1,750,000.00
වයඹ පළාත	4,500,000.00	1,950,000.00
උතුරු මැද පළාත	2,500,000.00	1,250,000.00
ඌව පළාත	2,500,000.00	1,125,000.00
සබරගමු පළාත	6,000,000.00	1,007,206.18
එකතුව	**55,700,000.00**	**18,357,206.18**

සෞඛ්‍ය අමාත්‍යාංශය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

ආයුර්වේද සමඟ සහයෝගී සත්කාර වැඩසටහන

හඳුනාගත් රෝහල් කිහිපයක තෝරා ගත් රෝග සඳහා ඇලෝපති හා ආයුර්වේද වෛද්‍ය කර්මය අනුව ඒකාබද්ධ ප්‍රවේශයකින් රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමේ ආරම්භක වැඩපිළිවෙලකි. මේ යටතේ ආඝාතය, සන්ධි රෝග, සන්ධි/අස්ථි භග්න හා චිරකාලීන ව්‍රණ (Chronic wounds) පිළිකා, දියවැඩියා ආදී රෝග සඳහා පළමු අදියර යටතේ ඒකාබද්ධ ප්‍රවේශයකින් ප්‍රතිකාර ලබා දීමට සැලසුම් කර ඇත. මේ සඳහා පළාත් ආයුර්වේද රෝහල් 03ක් තෝරාගෙන අවශ්‍ය සූදානම් කිරීම් (අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු) වලට අදාළ මූලික කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. එසේම ඉහත දක්වන ලද රෝග සඳහා හඳුනාගත් රෝහල් තුළ සත්කාර සේවා කළමනාකරණයට අදාළ ප්‍රමිතීන්/මාර්ගෝපදේශ හා පටිපාටීන් හා සායනික සත්කාර සැලසුම් මේ වන විට සකස් කරමින් පවතී.

මේ සඳහා රු.මි. 10.0ක ප්‍රතිපාදන ප්‍රමාණයක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙතින් දේශීය වෛද්‍ය අංශය වෙත ලැබී ඇති අතර මෙම කටයුතු ආයුර්වේද දෙපාර්තමේන්තුව මඟින් සෘජුව සිදු වන බැවින් ප්‍රතිපාදන එම දෙපාර්තමේන්තුව වෙත පවරා දීම සිදු කර ඇත.

බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම

බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය සඳහා දේශීය වෛද්‍ය දැනුම හා එහි ජීවන දර්ශනය ප්‍රායෝගිකව භාවිතා කිරීම පිණිස ජනතාව පෙළඹවීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. එහිදී බෝ නොවන රෝග පාලනය සඳහා දේශීය වෛද්‍ය ජීවන චර්යා, යෝග අභ්‍යාස, වස විසෙන් තොර පෝෂණීය දේශීය ආහාර භාවිතය, දේශීය පාරම්පරික ආහාර වට්ටෝරු හා ආහාර සංස්කරණ විධි පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම, ආනයනික හා විරල ඖෂධීය අමුද්‍රව්‍ය සඳහා දේශීය හා සුලබ ප්‍රතිනිධි හඳුනාගැනීම සහ ඔසු වගාව සඳහා ජනතාව යොමු කිරීම, පාසල් සිසුන්ගේ දැනුම ප්‍රවර්ධන වැඩසටහන් හා ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් දේශීය වෛද්‍ය විද්‍යා දැනුම ව්‍යාප්ත කිරීම වැනි ක්‍රියාකාරකම් මේ යටතේ මේ වන විට සිදු කරමින් පවතී. එසේම "සුවධරණී" ඔසු ගොවි ගම්මාන වැඩසටහනද මෙයට අනුබද්ධව ක්‍රියාත්මක කරමින් පවතී. ඒ ඔස්සේ ඔසු වගා කිරීමට උනන්දුවක් දක්වන ප්‍රජාව සඳහා ඔසු පැල ලබාදීම, තාක්ෂණය හා උපදේශනය සැපයීම සාර්ථකව සිදු කෙරේ.

"සුව ධරණී - සිසු නැණ දිරිය" වැඩසටහනේ අවස්ථා කිහිපයක්

ගරු රාජ්‍ය අමාත්‍යතුමාගේ මැදිහත්වීම මත සිදු කරන ලද විශේෂ වැඩසටහන්

- ❖ "වෙදවරු" ජංගම දුරකථන යෙදවුම එළි දැක්වීම

දේශීය වෙදකම ජාත්‍යන්තරය වෙත රැගෙනයාමේ අරමුණ පෙරදැරිව දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ පර්යේෂණාත්මක ප්‍රකාශන සහිත ආයුර්වේද සමීක්ෂා ශාස්ත්‍රීය ග්‍රන්ථය එළි දැක්වීමත්, ආයුර්වේද ඖෂධ සංග්‍රහය ආයුර්වේද වෙබ් අඩවියට එක් කිරීම සහ පාරම්පරික වෙදකමත් ආයුර්වේද වෙදකමත් ජාත්‍යන්තරය වෙත ඩිජිටල්කරණය තුළින් සමීප කරලීම වෙනුවෙන් "වෙදවරු" ජංගම දුරකථන යෙදවුම. (https://www.wedawaru.lk/#/mobile-download) එළි දැක්වීම 2023.01.10 දින ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේදී සිදු කරන ලදී.

❖ බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල වෙත නවීන වෛද්‍ය උපකරණ ලබාදීම

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ගනු ලබන ක්‍රියාමාර්ග හඳුනා ගනිමින් ස්වීඩනයේ Serve Now Sri Lanka සංවිධානය මගින් බොරැල්ල ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල වෙත රුපියල් මිලියන 213 ක වටිනාකමින් යුත් නවීන තාක්ෂණික පහසුකම් වලින් යුත් ඇඳන් ඇතුළු නවීන වෛද්‍ය තාක්ෂණික උපකරණ රැසක් පරිත්‍යාග කිරීම 2023.02.02 දින සිදු කර ඇත.

❖ හෝමියෝපති ශිෂ්‍යත්ව පිරිනැමීම

ඉන්දියාවේදී හෝමියෝපති වෛද්‍ය උපාධිය හැදෑරීම උදෙසා ශ්‍රී ලාංකික සිසු සිසුවියන් දස දෙනෙකු සඳහා ශිෂ්‍යත්ව සහ ගුවන් ටිකට්පත් ප්‍රදානය කිරීම ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් 2023.02.09 දින සිදු කරන ලදී.

❖ සුවධරණී සුව දැක්ම දේශීය වෛද්‍ය ප්‍රදර්ශනය

දේශීය වෛද්‍ය දැනුම ජනගත කිරීමට හා දේශීය ඖෂධ නිෂ්පාදන හා සේවාවන් පහසු මිලට ජනතාව වෙත ලබා දීමේ අරමුණින් ''සුවධරණී සුව දැක්ම''දේශීය වෛද්‍ය ප්‍රදර්ශනය 2023.02.22 හා 23 දෙදින තුළ බත්තරමුල්ල දියත උයනේදී පැවැත්වීමට කටයුතු කරන ලදී. රාජ්‍ය මුදල් භාවිතා නොකරමින් පෞද්ගලික අංශයේ දායකත්වය ඇතිව මෙම ප්‍රදර්ශනය ඉතා සාර්ථකව පැවැත්වීමට කටයුතු කරන ලදී.

❖ බහුකාර්ය සංවර්ධන නිලධාරීන් 322 දෙනෙකු සඳහා ආයුර්වේද සේවා සහායක පත්වීම්

සේවක හිඟය නිසා බරපතල අර්බුධ රැසකට මුහුණ පා තිබූ ආයුර්වේද සේවා සහායක හිඟය මග හරවාලමින් බහුකාර්ය සංවර්ධන නිලධාරීන් 322 දෙනෙකු සඳහා III ශ්‍රේණියේ ආයුර්වේද සේවා සහායක පත්වීම් ප්‍රදානය දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය නීතිඥ සිසිර ජයකොඩි මහතාගේ ප්‍රධානත්වයෙන් 2023.03.23 දින රාජගිරියේ පිහිටි කොළඹ විශ්ව විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේදී සිදු කෙරිණ.

❖ කුරුණෑගල ආයුර්වේද රෝහල තුළ අංග සම්පූර්ණ භික්ෂු වාට්ටුවක් ඉදි කිරීම

ආරණ්‍යගතව, භාවනායෝගීව වැඩ වාසය කරන භික්ෂූන් වහන්සේලා උදෙසා කුරුණෑගල ආයුර්වේද රෝහල් පරිශ්‍රය තුළ අංග සම්පූර්ණ භික්ෂු වාට්ටු සංකීර්ණයක් ඉදි කිරීමට අදාළ මූලික කටයුතු පිළිබඳ සාකච්ඡාව වයඹ පළාත් ආණ්ඩුකාර කාර්යාලයේදී 2023.03.30 දින පැවැත්විණ. කුරුණෑගල මහා විහාර ගිලන් භික්ෂු භාරකාර

මණ්ඩලය, දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යාංශය වයඹ පළාත් සභාව, වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව ඒකාබද්ධව මෙම ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවෙන අතර රජයට වැය බරක් නොවන ලෙස කුරුණෑගල මහා විහාර ගිලන් භික්ෂු බාරකාර මණ්ඩලය මේ සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වනු ලැබේ.

❖ ආයුර්වේද සම්බාහන ශිල්පය ප්‍රමිතිකරණය

නිපුණතාවය සහිත සම්බාහන ශිල්පීන් බිහි කිරීම, ආයුර්වේද සම්බාහන ශිල්පය ප්‍රමිතිකරණය තුළින් දේශීය හා විදේශීය රැකියා අවස්ථා බිහි කිරීම, වෛද්‍ය හා සුව සංචාරක කර්මාන්තය වැඩි දියුණු කිරීම, ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය හා ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් ලොව පිළිගත් වෘත්තීය අධ්‍යාපනයකින් සමන්විත වෘත්තිය ආයුර්වේද සම්බාහන ශිල්පීන් බිහි කරලීම උදෙසා ජාතික වෘත්තීය නිපුණතා මට්ටම 04 (NVQ - 04) සඳහා ජාතික නිපුණතා සම්මතයන් සහ නිපුණතා පදනම් වූ විෂය නිර්දේශය එළි දැක්වීම 2023.04.04 දින නාවින්න දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේදී සිදු කෙරිණ. ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ ඇති දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය, ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සහ තෘතිය සහ වෘත්තීය අධ්‍යාපන කොමිසම එක්ව ආයුර්වේද සම්බාහන ශිල්පී ජාතික නිපුණතා මට්ටම සඳහා වූ ජාතික නිපුණතා සම්මතයන් සහ නිපුණතා පදනම් වූ විෂය නිර්දේශය මෙලෙස අන්තර්ජාලය වෙත නිකුත් කෙරිණ.

❖ විශේෂ කුසලතා සහිත පාරම්පරික වෛද්‍යවරුන්ට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය

ගරු දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.04.07 බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේදී දින සර්වාංග, කැඩුම් බිඳුම්, චර්ම රෝග, සර්ෂ විෂ, ගෙඩිවන හා අක්ෂි රෝග යන කාණ්ඩ යටතේ සුදුසුකම් ලත් පාරම්පරික වෛද්‍යවරුන් 47 දෙනෙකු සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය පිරිනැමීම සිදු කර ඇත. එසේම 2023.06.12 දින නාවින්න දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේදී ඉහත කාණ්ඩ යටතේම විශේෂ කුසලතා සහිත පාරම්පරික වෛද්‍යවරුන් 105ක් සඳහාද ලියාපදිංචිය ලබා දී ඇත.

❖ විදේශයන්හි ඇති දේශීය පාරම්පරික වෛද්‍ය දැනුම නැවත මෙරටට ලබා ගැනීම

දේශීය දැනුම් සම්භාරයන්ගෙන් සපිරි පුස්කොළ පොත් ඇතුළු පෞරාණික උරුමයන් රැසක් විදේශයන්හී පිහිටි

පුස්තකාළ සහ කෞතුකාගාර තුළ පවතී. ඒ අතර ලන්ඩනයේ යූස්ටන්හි පිහිටි බ්‍රිතාන්‍ය පුස්තකාලයේද දැනට දිවයිනේ වෙනත් පුස්තකාලයකින් සොයා ගත නොහැකි අපගේ පාරම්පරික වෛද්‍ය ක්‍රම හා බැඳුණු දුර්ලභ ගණයේ පුස්කොළ පොත් විශාල සංඛ්‍යාවක් තිබෙන බැවින්, ඒවා නැවත විද්‍යුත් ප්‍රතිමුද්‍රණ වශයෙන් දිවයිනට ගෙන්වා ගැනීම පිළිබඳ විශේෂ සාකච්ඡාවක් දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය නීතිඥ සිසිර ජයකොඩි මහතා ඇතුළු ලන්ඩනයේ, යූස්ටන්හි පිහිටි බ්‍රිතාන්‍ය පුස්තකාලයේ පාලනාධිකාරිය සමඟ එම පුස්තකාලයේදී 2023.05.15 දින පවත්වා ඇත.

- **පොළොන්නරුව නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව හා හෝමියෝපති සායනය ජනතා අයිතියට පත් කිරීම**

2021 වර්ෂයේ මූල්‍යමය ප්‍රතිපාදන සහ මහා නගර සභා අරමුදලින් නවීකරණය කරන ලද පොළොන්නරුව නිදහස් ආයුර්වේදය සහ අභිනවයෙන් ආරම්භ කරනු ලැබූ හෝමියෝපති වෛද්‍ය සායනය 2023.06.09 ජනතා අයිතියට පත් කරන ලදී.

- **දේශීය ඖෂධ මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීම**

දේශීය ඖෂධ සහ ආයුර්වේද ආශ්‍රිත නිෂ්පාදනයන්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය වෙනුවෙන් වාර්ෂිකව අති විශාල මුදලක් විදේශයන් වෙත ඇදී යන අතර එම මුදල දේශීයව රැක ගනිමින් ආර්ථිකය ශක්තිමත් කරලීමේ අරමුණ පෙරදැරිව, දීප ව්‍යාප්තව දේශීය ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩපිළිවෙල යටතේ රජරට කලාපයේ ගොවි ජනතාවගේ ඔසු වගාවන්හී අස්වැන්න මිලදී ගැනීම උදෙසා අනුරාධපුර නව නගරයේ මෛත්‍රීපාල සේනානායක මාවතේ පිහිට වූ දේශීය ඖෂධ අමුද්‍රව්‍ය මිලදී ගැනීමේ මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ හෙළ ඔසුසල විවෘත කිරීම 2023.06.15 දින සිදු විය.

ජාත්‍යන්තර යෝග දිනය

එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් ජූනි මස 21 දින ජාත්‍යන්තර යෝග දිනය ලෙස ප්‍රකාශයට පත් කොට ඇති අතර, එම දිනය සමරමින් විශේෂ සැමරුම් උත්සවයක් 2023.06.17 දින කොළඹ නිදහස් චත්‍රරස්‍රයේදී පැවැත්විණ. ජනතාවගේ කායික මානසික නීරෝගී සුවය උදෙසා ඉවහල් වන අභ්‍යාසවලින් සමන්විත ප්‍රදර්ශනාත්මක මෙන්ම ප්‍රායෝගික අභ්‍යාස වලින් යුක්තව මෙම විශේෂ සැමරුම් උත්සවය පැවැත්විය. ඉන්දියානු මහා කොමසාරිස් කාර්යාලය, දේශීය වෛද්‍ය අංශය, සෞඛ්‍ය අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ රැසක දායකත්වයෙන් මෙය සිදු කෙරිණ.

"වෙදැදුරු අභිමන් - 2023"

දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය සඳහා සිදු කළ ඉමහත් මෙහෙය වෙනුවෙන් පාරම්පරික, සිද්ධ, යුනානි, වෛද්‍යවරුන් 62ක් සහ උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරුන් 62ක් සඳහා ජනාධිපති සම්මාන ප්‍රදානය කිරීමේ "වෙදැදුරු අභිමන් - 2023" ජනාධිපති වෛද්‍ය සූරී සම්මාන ප්‍රණාම උළෙල 2023.06.20 දින කොළඹ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

විදේශයන් තුළ ශ්‍රී ලංකාවේ ආයුර්වේදය ප්‍රවර්ධනය

විදේශයන් තුළ ආයුර්වේදය ප්‍රවර්ධනය කිරීමේ වැඩපිළිවෙලක් ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) සහ සමඟ සම්බන්ධ වී සිදු කිරීමට සැලසුම් කර ඇති අතර ඒ පිළිබඳ මූලික සාකච්ඡාවක් JICA ආයතනය සහ ගරු දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය නිතීඥ සිසිර ජයකොඩි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023.06.26 දින සිදු කරන ලදී. මෙහිදී ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාවේ නිෂ්පාදන විදේශයන් වෙත අපනයනය කිරීම, ඒ සඳහා අවශ්‍ය තාක්ෂණය, යන්ත්‍රෝපකරණ සහ වෙළඳපොළ පවතින ගැටළු සඳහා අවශ්‍ය සහයෝගය JICA ආයතනය විසින් සහයෝගය ලබා දීමට එකඟතාවය පළ කර ඇත.

දේශීය වෛද්‍ය අංශයේ මූල්‍ය ප්‍රගතිය

2023.07.31 දිනට

වැය විෂයය	ප්‍රතිපාදනය (රු.)	වියදම (රු.)	වියදම් ප්‍රතිශතය (%)
දේශීය වෛද්‍ය අංශය			
පුනරාවර්තන	360,000,000.00	190,170,240.33	52.83
සාමාන්‍ය පරිපාලනය/වෙනත් වැඩසටහන්	308,000,000.00	160,872,662.58	52.23
ආයතන සේවා රාජ්‍ය ආයතන			
හෝමියෝපති වෛද්‍ය සභාව	30,000,000.00	18,105,155.40	60.35
හෝමියෝපති රෝහල	22,000,000.00	11,192,422.35	50.87
ප්‍රාග්ධන	**14,000,000.00**	**3,198,094.96**	**22.84**
සාමාන්‍ය පරිපාලනය විශේෂ වැඩසටහන්	5,000,000.00	2,578,809.96	51.58
සංරක්ෂණ සභා	3,000,000.00	619,285.00	20.64
හෝමියෝපති කවුන්සලය	1,000,000.00	-	-

හෝමියෝපති ක්‍රම සංවර්ධනය	2,500,000.00	-	-
පෝෂණ මන්දිර ස්ථාපනය කිරීම	2,500,000.00	-	-
එකතුව	**374,000,000.00**	**193,368,335.29**	**51.70**
වෙනත්	ප්‍රතිපාදනය (රු.)	වියදම (රු.)	වියදම් ප්‍රතිශතය (%)
ආයුර්වේද සමඟින් සහයෝගී සත්කාර	10,000,000.00	-	-
බෝ නොවන රෝග	10,000,000.00	368,637.00	3.69
මුළු එකතුව	**394,000,000.00**	**193,736,972.29**	**49.17**

ආයුර්වේද දෙපාර්තමේන්තුව
ආයතනික කාර්යයන්

බඳවාගැනීම් හා උසස් කිරීම්

අනු අංකය	කාර්යය	සේවක ගණය
01.	බඳවාගැනීම්	- ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධාරී ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරු 62ක්(2022.12.31 දිනට විශ්‍රාම වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්) සඳහා බඳවාගැනීම් සිදු කිරීමට අනුමැතිය ලබා ගැනීම. - Pl-01 තනතුරු පුරප්පාඩු 491ක් සහ රියදුරු පුරප්පාඩු 14ක් ඇතුළුව තනතුරු 505ක් බඳවාගැනීම සඳහා අනුමැතිය ලබා ගැනීම.
02.	උසස් කිරීම්	- ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ විශේෂඥ ශ්‍රේණියට උසස්වීම් ලබාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම - 2020.10.27 දින සිට ක්‍රියාත්මක වන නව සේවා ව්‍යවස්ථාවට අනුව ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් 1 ශ්‍රේණියට උසස් කිරීමට කටයුතු කිරීම - ඉහත සඳහන් උසස්වීම්වලට අමතරව පෞද්ගලික ලිපි ගොනුව මඟින් ලබාදෙන ශ්‍රේණි උසස් කිරීම් යනාදිය අදාළ කාලසීමාවන් තුළදී ලබා දී ඇත.
03.	අනුමත කාර්යමණ්ඩල සංශෝධනය	ආයුර්වේද දෙපාර්තමේන්තුව හා ඊට අනුබද්ධ ආයතනයන්ට අනුමතව පැවති ආශ්‍රිත සේවයට අයත් නිලධාරීන් 40 දෙනෙකුගේ තනතුරු නාමය සංවර්ධන නිලධාරී ලෙස සංශෝධනය කිරීම
04.	වෙනත්	- සියළු බඳවාගැනීම් තාවකාලිකව අත්හිටුවීම මැයෙන් නිකුත් කර ඇති 20220.02.21 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/202 සහ මුදල් අමාත්‍යාංශ භාණ්ඩාගාර ලේකම්ගේ අංක DMS/policy/Recruitments සහ 2019.11.20 දිනැති ලිපිය අනුව නව බඳවාගැනීම් සිදු කිරීමට මෙතෙක් අනුමැතියක් ලැබී නොමැත. - තවද, කළමනාකරණ සේවා චක්‍රලේඛ 02/2020 මඟින් 01/2020 චක්‍රලේඛයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු බව දන්වා ඇත.

මානව සම්පත් සංවර්ධනය - දේශීය පුහුණු වැඩසටහන් (2022)

වැඩසටහනේ නම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	කාල සීමාව	සමස්ථ ආයෝජනය
රජයේ නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ එක් දින වැඩමුළුව	7	2022.03.04	35,000.00
ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දෙදින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	2	2022.03-08,09	20,000.00
වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ දෙදින වැඩමුළුව - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.03.24-25	10,000.00
පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම පිළිබඳ දෙදින වැඩමුළුව - **SDFL**	4	2022.03.31, 2022.04.01	34,000.00
රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම ගිණුම පිළියෙල කිරීම පිළිබඳ එක් දින වැඩමුළුව(**Zoom** තාක්ෂණය ඔස්සේ) **SDFL**	1	2022.03.09	3,750.00
Certificate course in postgraduate Research Faculty of Medicine University of Colombo	1	2022 පෙබ - ජූලි	30,000.00
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.11.21, 2022.11.28	10,000.00
ගිණුම් ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම - ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.12.13	5,000.00
කාර්යාල සටහන් ලිවීම හා රාජකාරි ලිපි ලිවීම- ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය	1	2022.11.30	5,000.00

හිසතෙල් ගැල්වීමේ රාජ්‍ය මහෝත්සවය

හිසතෙල් ගැල්වීමේ රාජ්‍ය මහෝත්සවය 2023.04.16 වැනි ඉරු දින ඓතිහාසික හෙයියන්තුඩුව පුරාණ විහාරස්ථානයේදී ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

භෞතික සම්පත් සංවර්ධන කටයුතු හා ප්‍රගතිය

කාර්යය	ප්‍රතිපාදනය රු.	මූල්‍ය ප්‍රගතිය (රු.)	භෞතික ප්‍රගතිය
ප්‍රධාන කාර්යාලයේ එදිනෙදා ඇති සුළු අළුත්වැඩියා	100,000.00	95,000.00	100% (කටයුතු නිම කර ඇත)
ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන අළුත්වැඩියා	3,000,000.00	413,0000.00	මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඇස්තමේන්තු ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත

ආයුර්වේද ශික්ෂණ රෝහල්වල සුළු අළුත්වැඩියා	200,000.00	53,070.00	බොරැල්ල රෝහලෙහි විගණන අංශයේ ටයිල් ගලවා සවි කිරීම, මුළුතැන්ගෙය කොන්ක්‍රීට් බැම්ම කඩා ඉවත් කිරීම,ගලි වලවල් සුද්ධකිරීම
ආයුර්වේද ශික්ෂණ රෝහල්වල ප්‍රධාන අළුත්වැඩියා	20,000,000.00	-	බොරැල්ල රෝහලේ අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කෙරුණද යක්කල රෝහලේ වහලය අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට වැඩි ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු බැවින් ඒ සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කිරීම මේ වන විට සිදු කරමින් පවතී.
ආයුර්වේද පර්යේෂණ රෝහල්වල සුළු අළුත්වැඩියා	100,000.00	40,000.00	නාවින්න ආයුර්වේද පර්යේෂණායතනයේ බාහිර අංශයේ මැදින් ගලායන කාණු පද්ධතියේ පස් ඉවත් කර පිරිසිදු කිරීම, මැදවච්චිය රෝහලෙහි පිටුපස ගේට්ටුව අලුත්වැඩියා කිරීම
ආයුර්වේද පර්යේෂණ රෝහල්වල ප්‍රධාන අළුත්වැඩියා	12,000,000.00	-	මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඇස්තමේන්තු ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත
දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධාන අළුත්වැඩියා	2,000,000.00	-	මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් ඇස්තමේන්තු ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත
ඔසු උයන්වල ප්‍රධාන අළුත්වැඩියා	5,000,000.00	185,000.00	ගිරාඳුරුකෝට්ටේ ඔසු උයනෙහි අලුත්වැඩියා කටයුතු සඳහා ඇස්තමේන්තු ලබා ගැනීම සඳහා මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත
ඔසු උයන්වල භූමිය සංවර්ධනය	1,000,000.00	-	කන්නෙළිය, පින්නදූව, හල්දුම්මුල්ල හා ගිරාඳුරුකෝට්ටේ ඔසුඋයන්වල සංවර්ධනය කිරීමට ඇති භූමි ප්‍රමානයන් ප්‍රමුඛතාවය අනුව සිදු කිරීමට කටයුතු කරමින් පවතී.
එකතුව	**43,400,000.00**	**4,503,070.00**	

සමස්ථ මූල්‍යමය ප්‍රගතිය

කාණ්ඩය/වැය විෂය/අයිතමය	ප්‍රතිපාදන (රු.)	වියදම (රු.)	ප්‍රතිශතය %
පුනරාවර්තන වියදම්	1,950,000,000.00	758,734,000.00	38.91
සාමාන්‍ය පරිපාලනය	133,000,000.00	51,509,000.00	38.73
රෝහල් සේවා	1,412,800,000.00	555,009,000.00	39.28
පර්යේෂණ	292,500,000.00	108,086,000.00	36.95
අධ්‍යාපන හා පුහුණු	32,650,000.00	12,636,000.00	38.70

ඖෂධ වගාව සංරක්ෂණය හා ව්‍යාප්තිය	79,050,000.00	31,494,000.00	39.84
ප්‍රාග්ධන වියදම්	60,000,000.00	2,489,000.00	4.15
සාමාන්‍ය පරිපාලනය	6,000,000.00	1,369,000.00	22.82
රෝහල් සේවා	23,000,000.00	-	-
පර්යේෂණ	16,000,000.00	270,000.00	1.69
අධ්‍යාපන හා පුහුණු	4,000,000.00	665,000.00	16.63
ඖෂධ වගාව සංරක්ෂණය හා ව්‍යාප්තිය	11,000,000.00	185,000.00	1.68
මුළු වියදම්	2,010,000,000.00	761,223,000.00	37.87
සාමාන්‍ය පරිපාලනය	139,000,000.00	52,878,000.00	38.04
රෝහල් සේවා	1,435,800,000.00	555,009,000.00	38.66
පර්යේෂණ	308,500,000.00	108,356,000.00	35.12
අධ්‍යාපන හා පුහුණු	36,650,000.00	13,301,000.00	36.29
ඖෂධ වගාව සංරක්ෂණය හා ව්‍යාප්තිය	90,050,000.00	31,679,000.00	35.18

විභාග පැවැත්වීම

අනු අංකය	පරීක්ෂණයේ නම	කාල සීමාව	සහභාගී වූ සංඛ්‍යාව
01.	ආයුර්වේද ශාස්ත්‍රී අතිරේක පරීක්ෂණය - 2021	2022.02.18	317
02.	ලංකා සිද්ධ වෛද්‍ය විද්‍යාලයේ අවසන් වසර සිසුන් සඳහා වන පරීක්ෂණය - 2022	2022.02.21-26	19
03.	පාරම්පරික වෛද්‍යවරුන් සඳහා ලිඛිත පරීක්ෂණය	2022.03.12,13	291
04.	ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය - 2021	2022.04.08	153
05.	රජයේ ඖෂධ සංයෝජක ත්‍රෛයි මාසික පුහුණු පාඨමාලාව- දෙමළ මාධ්‍ය අවසාන ඇගයීම් පරීක්ෂණය	2022.06.24,27, 28	19
06.	පාරම්පරික වෛද්‍යවරුන් සඳහා ලිඛිත පරීක්ෂණය	2022.10.14	450
07.	ආයුර්වේද ශාස්ත්‍රී වාර්ෂික පරීක්ෂණය - 2022	2022.10.29,30 2022.11.05,06, 12	487
08.	PL 01,02 කේත අංක යටතේ බඳවාගත් තනතුරු සඳහා කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය	2022.12.01,02	76
09.	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණික ඛණ්ඩය, කාර්මික නිලධාරී(MT-01,MN-03) සඳහා වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය- 2022	2022.12.05	02
10.	ප්‍රජා සෞඛ්‍ය සංවර්ධන නිලධාරී (11) ශ්‍රේණිය සඳහා වන කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණය - 2022	2022.12.10	176

ශිල්පීය කටයුතු (බලපත්‍ර නිකුත් කිරීම)

2022 වර්ෂය තුළ කාර්යසාධනය

අනු අංකය	ඉටු කළ කාර්යයන්	අයදුම්පත් සංඛ්‍යාව	ලැබූ ආදායම (රු.මි.)
01.	ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සඳහා අයදුම්පත් නිකුත් කිරීම(සමස්ථ)	1,371	180,700.00

02.	ලියාපදිංචිය සඳහා අයදුම්පත් භාරගැනීම(සියළු කාණ්ඩ)	1,158	2,203,000.00
03.	ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම(සියළු කාණ්ඩ)	1,572	17,458,112.00
	එකතුව	**4,101**	**19,841,812.00**

2023 වර්ෂය තුළ කාර්යසාධනය

අනු අංකය	ඉටු කළ කාර්යයන්	සංඛ්‍යාව
01.	ලියාපදිංචිය සඳහා අයදුම්පත් භාරගැනීම	625
02.	ආයතන සඳහා බලපත්‍ර නිකුත් කිරීම(සියළු කාණ්ඩ)	853

- මෙම වර්ෂයේදී තාක්ෂණික කමිටුව, සූත්‍ර කමිටුව හා තීරු බදු රහිතව ඖෂධ ආනයන කමිටු ආදී කමිටු රැස්වීම් 75ක් පවත්වා ඇත.
- කංසා සඳහා නිර්දේශ ලිපි 18ක්, කංසා චූර්ණ 262kg 440g හා පරිපාක ස්ප්‍රිතු 44830L හා 500ml ප්‍රමාණයක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

I. ආයුර්වේද ශික්ෂණ රෝහල් සහ පර්යේෂණ රෝහල්

රෝගී සත්කාර සේවා

ශික්ෂණ රෝහල් - 2022/2023

රෝහල	බොරැල්ල	යක්කල	කයිතඩි	ත්‍රිකුණාමලය
2022				
බාහිර	128,249	63,392	34,376	11,787
නේවාසික	1,856	997	677	26
එකතුව	**130,105**	**64,389**	**35,053**	**11,813**
2023.05.31 දිනට				
බාහිර	61,007	32,143	15,637	8,695
නේවාසික	959	9,373	467	11
එකතුව	**61,966**	**41,516**	**16,104**	**8,706**

පර්යේෂණ රෝහල් - 2022/2023

රෝහල	නාවින්න	මැදවච්චිය	හම්බන්තොට	අම්පාර	මිහින්තලේ	මන්වන්ත ොඩායි	නින්දවූර්
2022							
බාහිර	41,237	7,247	17,536	20,349	3,113	10,504	3,578
නේවාසික	620	160	395	193	-	-	-
එකතුව	41,857	7,407	17,931	20,542	3,113	10,504	3,578
2023.05.31 දිනට							
බාහිර	20,350	2,296	12,314	5932	637	2,774	1,144
නේවාසික	581	61	337	62		-	

එකතුව	20,931	2,357	12,651	5.994	637	2774	1,144

2022 වර්ෂයේ ඖෂධ නිෂ්පාදනය - ආයුර්වේද පර්යේෂණ රෝහල්

රෝහල	අම්පාර	හම්බන්තොට	මැදවච්චිය	නාවින්න
බෝතල්				
ආසව	-	-	-	375
තෛල	201 3/4	-	11 අවුන්ස 12	641
පැණි	-	-	-	37
ක්වාථ	25	3,124	55	4,980
කෂාය	540.58	668	333	3,780
අනුපාන		85	122	-
පාන	1000	-	8	-
වෙනත් තැම්බූ වතුර	-	240	279	987.56
නේත්‍රා බිංදු	-	-	-	45.375
කිලෝ ග්‍රෑම්				
ලේප	6	-	0.7	42.28
චූර්ණ	157.75	4.3	9.7	1,511.35
පාණ්ඩ	36.3	-	-	72.31
පත්තු	-	7.95	19.63	5.8
තැවිලි	-	17.328	48.925	38.15
වර්ති	-	-	-	1,028

2022 වර්ෂයේ ඖෂධ නිෂ්පාදනය - ආයුර්වේද ශික්ෂණ රෝහල්

රෝහල	බොරැල්ල	කයිතඩි	යක්කල	ත්‍රිකුණාමලය
බෝතල්				
අරිෂ්ඨ	-	-	-	1.55
ආසව	4	-	128	-
තෛල	4,274	1,785.95	993	540
සිරප්	347	250	-	12
ක්වාථ	5,974	-	1,002	-
පාන	380	292.65	-	-
කෂාය	11,134	18.796	5,631	-
වෙනත්	3,727	-	433	-
අනුපාන(මිලි ලීටර 60)	77	13.898	-	-
නේත්‍රා බිංදු	19	-	-	-
කිලෝ ග්‍රෑම්				
ගුලි	8.23	34.27	-	-
කල්ක	240	-	98.9	-
ලේප	460	8.32	213.95	-
චූර්ණ	2,902	537.22	598.62	11.5
ක්ෂාර	2,165	-	-	-
පාණ්ඩ	198	-	1,902.85	-

පත්තු	393	416.54	132.49	-
ලේහ	-	12.48	-	-
ගුග්ගුලු	166.6	-	63.13	-
තැවිලි	48	-	423.3	-
වටී	11.2	-	-	-
වර්තා	0.91	-	-	-
කුඩු	1.1	-	-	-
රස බෙහෙත්	46.313	-	-	-
ශෝධිත ගුගුල්	86.3	-	-	-
පංචවල්කල	8,033	-	-	-
පැලැස්තර	18	-	-	-
මැල්ලුම්	14	-	-	-
වෙනත්(ක්ෂාරසූත්‍ර නූල්)	1,272	-	-	-
යුනානි ඖෂධ	-	-	15.6	-
වෙනත්	18	-	-	-

බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල

චමල් රාජපක්ෂ ආයුර්වේද පර්යේෂණ රෝහල

II. බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය

2022 වර්ෂයේ හා 2023 වර්ෂයේ මැයි 31 දක්වා කාලය තුළ සිදු කළ පර්යේෂණ හා එහි ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘතිය	ප්‍රගතිය
	ප්‍රමිතිකරණ අංශය	
02.	Quality Assessment of three Ginger varieties grown in Sri Lanka	95%
03.	Preliminary Comparative Chemical analysis of selected piper sp.	80%
04.	Comparative phyto - chemical & TLC study of Lothsumbul & Bombu	80%
05.	Standardization of Dashanga Guggulu	50%
06.	Assessment of Microbial quality of some heavily used powdered herbal drugs prepared in pharmaceutical drug manufacturing unit of BMARI	100%
07.	Comparative evaluation of microbial quality of Tripla choorna, Kwatha & their raw material	90%
08.	Determination of microbial contamination of some selected raw materials heavily used in Ayurvedic treatments	75%

09.	A Review on Antimicrobial efficacy of family Orchidacea	100%
10.	නවනරත්න කල්කය රෝගීන්ට ලබා දීම සඳහා නියමිත මාත්‍රාව සහිතව ප්‍රමිතිගත ඇසුරුමක් හඳුන්වාදීම	100%
11.	බහුලවම භාවිතා කරන තෛල වර්ග කීපයක් නව මුහුණුවරක් සහිතව රෝගීන්ට පහසුවෙන් භාවිත කළ හැකි නිෂ්පාදන ලෙස (ointment/baim)නිෂ්පාදනය කිරීම (මූලික අධ්‍යයනය)	100%
12.	තාලිසාදි චූර්ණය සැපිය හැකි (chewable) පෙත්තක් ලෙස නිෂ්පාදනය කිරීම(මූලික අධ්‍යයනය)	100%
	උද්භිද විද්‍යා අංශය	
01.	අමු ද්‍රව්‍යක් සඳහා ප්‍රමිති සැකසීම 12	90%
02.	කිද විහේෂ මානව උද්භිද විද්‍යා අධ්‍යයන් ඇසුරින් ඒවා නිවැරදිව හඳුනාගැනීම 7	60%
03.	දන්ති (Balicspermu mountanum) දැන්ත (Boehmeria niuea) පිළිබඳ වනස්පති විද්‍යාත්මක අධ්‍යයනයක්	95%
04.	රත් හඳුන් හා එහි ආදේශකයන් නිවැරදිව හඳුනාගැනීම	50%
05.	Lodra (symplocos racemosa)හා ලොත් සුඹුල් (Melaleuca leucoden) ආදේශක පිළිබඳ වනස්පති විද්‍යාත්මක අධ්‍යයනයක්	95%
06.	Solanum විහේෂවල වනස්පති විද්‍යාත්මක අධ්‍යනයක් Insanum Incanum Melongena Torvum	50%
07.	උසස් ගුණාත්මක භාවයෙන් යුතු තිප්පිලි ප්‍රභේද හඳුන්වාදීම	55%
08.	දුර්ලභ හා වඳවීමේ තර්ජනයට ලක්ව ඇති ඖෂධීය ශාක පිළිබඳ පටක රෝපණ පර්යේෂණ දුහුල්, බිංකෙහොඹ, බිනර, රත්නිටුල්, ඒකාවේරිය	70%
	සාහිත්‍ය අංශය	
01.	වටිකා ප්‍රකරණයේ සඳහන් බිංදුරාජ ගුලිය පිළිබඳ සාහිත්‍යමය විමර්ශනය	100%
02.	ආයුර්වේද සමීක්ෂා ඉතිහාසය පිළිබඳ සාහාත්‍ය පර්යේෂණ	100%
03.	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ ඉතිහාසය පිළිබඳ සාහිත්‍ය පර්යේෂණ සිදු කිරීම	75%
04.	බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයේ සිදු කළ පර්යේෂණ පිළිබඳ සාහිත්‍ය පර්යේෂණ සිදු කිරීම	75%
05.	A review of Koladawundaya Receipe and its Application	100%

බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනය යටතේ පාරම්පරික වෛද්‍ය දැනුම සංරක්ෂණ ව්‍යාපෘතිය, ඖෂධීය ශාක සංරක්ෂණය හා සංවර්ධන ව්‍යාපෘතිය, තරුණ ඔසු ගොවි ව්‍යාපෘතිය, ආයුර්වේද ඖෂධ සංග්‍රහය යාවත්කාලීන කිරීම හා පාරම්පරික ඖෂධ නිෂ්පාදනය සඳහා ඖෂධ පද්ධතියක් ස්ථාපිත කිරීම වැනි ප්‍රධාන ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් මේ වන විට සිදු කරමින් පවතී.

III. දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය

2022 හා 2023 වර්ෂයේ මැයි 31 දක්වා පවත්වාගෙන යනු ලබන දේශීය පුහුණු පාඨමාලා/වැඩසටහන්

වැඩසටහන	පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ඇස්තමේන්තුගත පිරිවැය (රු.)	සත්‍ය වියදම (රු.)
විෂය නිර්දේශ සැකසීම	03	-	53,700.00	39,120.00
විෂය නිර්දේශ යාවත්කාලීන කිරීම	1			
පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව	02	65	105,800	70,685
ජාතික ප්‍රතිපත්තියක් සැකසීම	08	-	නොමිලේ සිදු කර ඇත	
ධාරිතා සංවර්ධන වැඩසටහන	02	91	48,100.00	32,770.00
දැනුවත් කිරීම්(ගිණුම්, ප්‍රසම්පාදන හා වෙනත්)	02	135	නොමිලේ සිදු කර ඇත	
සේවාරම්භක වැඩසටහන - නවක ලියාපදිංචිය ලත් පාරම්පරික වෛද්‍යවරුන් සඳහා	02	පාරම්පරික වෛද්‍යවරු - 217	476,200.00	256,721.78
සේවාරම්භක වැඩසටහන - PL2 තනතුරට උසස් වූ සේවකයන් සඳහා	02	PL2 සේවකයන් 70	1,669.00	1,669.00
නව පාඨමාලා	1	50	නොමිලේ සිදු කර ඇත	
සැමරුම් වැඩසටහන	02	90	නොමිලේ සිදු කර ඇත	
සීමාවාසික වෛද්‍ය පුහුණුව (පළමු කණ්ඩායම 2022/2023)	03	252	146,200.00	39,875.00
සීමාවාසික වෛද්‍ය පුහුණුව(පළමු කණ්ඩායම 2023/2024)	01	64	-	-
සීමාවාසික වෛද්‍ය පුහුණුව (පළමු කණ්ඩායම 2023/2024)	05	242	71,600.00	42,230.00
සීමාවාසික වෛද්‍ය පුහුණුවට අදාළ මාර්ගෝපදේශ අත්පොත මුද්‍රණය	පොත් 400		477,710.00	477,710.00
යෝග වැඩසටහන්	03	42	920.00	-
සේවාරම්භක වැඩසටහන	01	86	352,300.00	189,164.80
එකතුව			**1,734,199.00**	**1,149,945.58**

දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනය මඟින් ක්‍රියාත්මක කරන සියලු වැඩසටහන් සම්බන්ධීකරණය කිරීමේ ක්‍රියාවලිය සහ ආයතනයේ පුහුණු සැලැස්ම සකස් කිරීම සිදු කිරීමට නියමිතව ඇත.

IV. ආයුර්වේද වෛද්‍ය සභාව

මූල්‍ය ප්‍රතිපාදනය

අයිතමය	2022 රුපියල්	2023.05.31 රුපියල්
රජයේ ප්‍රතිපාදන	7,200,000.00	3,492,000.00
උපයාගත් ආදායම	12,704,690.61	8,423,322.62
මුළු ලැබීම්	19,904,690.61	11,915,322.62
වියදම	16,609,527.77	4,956,926.53
අතිරික්තය/ඌනතාවය	3,295,162.84	6,958,396.09

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරුන්

අයිතමය	2022.12.31 දිනට	2023.05.31 දිනට	2023.05.31 දිනට මුළු වෛද්‍යවරු
සාමාන්‍ය සර්වාංග			
1. ලියාපදිංචි සංඛ්‍යාව සාමාන්‍ය(සර්වාංග)	16,351	294	16,645
උපාධිධාරීන්	3,689	236	3,925
ඩිප්ලෝමාධාරීන්	5,761	17	5,778
පාරම්පරික -සර්වාංග	6,901	41	6,942
පාරම්පරික විශේෂ			
2. මුළු ලියාපදිංචි සංඛ්‍යාව(පාරම්පරික - විශේෂ)	10,299	82	10,381
ලියාපදිංචි මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව	26,650	376	27,026
මියගොස් ඇති වෛද්‍යවරුන් සංඛ්‍යාව	3,827	17	3,844

- ආයුර්වේද වෛද්‍ය සභාව විසින් සිය සේවාදායකයන්ගේ පහසුව තකා රට පුරා ජංගම කාර්යාල පවත්වනු ලබන අතර 2023 වර්ෂයේ මේ දක්වා එවැනි ජංගම කාර්යාල 08ක් පවත්වා ඇති අතර එමඟින් වෛද්‍යවරුන් 355ක් සේවා සලසාගෙන ඇත. මෙහිදී වාචික පරීක්ෂණ සඳහා කැඳවූ සංඛ්‍යාව 143ක් වන අතර ඉන් 56 දෙනෙකු සමත් වී ඇත.
- 2023.05.31 දින වන විට සර්වාංග වෛද්‍යවරුන් 391ක් හා විශේෂ වෛද්‍යවරුන් 125ක් සිය ලියාපදිංචිය අලුත් කර ඇත.

අනෙකුත් විශේෂ කාර්යයන්

අයිතමය	2023.05.31 දිනට ප්‍රගතිය
වෛද්‍ය සහතික තහවුරු කිරීම් සිදු කළ සංඛ්‍යාව	19
ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම	472
වාහන නිල ලාංඡන නිකුත් කිරීම	52
නිකුත් කළ වෛද්‍ය සහතික පොත් සංඛ්‍යාව	784

V. පර්යේෂණ ඔසු උයන්

ඔසු උයන් සංවර්ධනය(පර්යේෂණ හා ව්‍යාප්ති සේවා ඔසු උයන්හි ප්‍රගතිය)

වාර්ෂික පැළ නිෂ්පාදනය - 2022

ඔසු උයන	නිෂ්පාදනය කළ පැළ ප්‍රමාණය	නිෂ්පාදනය කළ පැළවල වටිනාකම (රු.)	අලෙවි කළ පැළ ගණන	අලෙවි ආදායම (රු.)	නොමිලේ නිකුත් කළ පැළ සංඛ්‍යාව	නොමිලේ නිකුත් කළ පැළවල වටිනාකම (රු.)
පින්නදූව	11,862	424,180.00	5,558	214,215.00	175	5,370.00
පල්ලෙකැලේ	10,465	325,890.00	2,903	97,330.00	1,210	36,300.00
පට්ටිපොළ	6,510	234,715.00	1,601	64,610.00	710	21,300.00
හල්දුම්මුල්ල	7,200	340,640.00	5,418	246,050.00	1,646	44,750.00
නාවින්න	5,423	177,550.00	5,878	200,370.00	1,353	49,220.00
ගිරාදුරුකෝට්ටේ	25,506	815,580.00	1,534	60,530.00	2,330	75,750.00
එකතුව	**66,966**	**2,318,555.00**	**22,892**	**883,105.00**	**7,424**	**232,690.00**

වාර්ෂික පැළ නිෂ්පාදනය - (2023. 05.31 දිනට)

ඔසු උයන	නිෂ්පාදනය කළ පැළ ප්‍රමාණය	අලෙවි කළ පැළ ගණන	අලෙවි ආදායම (රු.)	නොමිලේ නිකුත් කළ පැළ සංඛ්‍යාව	නොමිලේ නිකුත් කළ පැළවල වටිනාකම (රු.)
පින්නදූව	9,350	4,541	166,940.00	100	3,000.00
පල්ලෙකැලේ	4,394	1,497	58,690.00	75	2,500.00
පට්ටිපොළ	1,899	504	19,245.00	31	1,130.00
හල්දුම්මුල්ල	1,939	1,378	71,534.00	-	-
නාවින්න	1,450	2,258	85,275.00	300	9,000.00
ගිරාදුරුකෝට්ටේ	7,601	206	9,020.00	-	-
එකතුව	**26,633**	**10,384**	**410,704.00**	**506**	**15,630.00**

ඖෂධීය රෝපණ ද්‍රව්‍ය/අමු ද්‍රව්‍ය නිෂ්පාදනය හා අමුද්‍රව්‍ය රෝහල්වලට නොමිලේ ලබා දීම

ඔසු උයන	ඖෂධීය අමුද්‍රව්‍ය වර්ගය	ප්‍රමාණය කි.ග්‍රෑම්	ආයතනය
පින්නදූව	කුරුඳු	6.3	ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල - බොරැල්ල
	මහ අරත්ත	3	
	කොල්ලන් කොළ	1.7	
	මස්බැද්ද	2.9	

පට්ටිපොල ඔසු උයන

හල්දුම්මුල්ල ඔසු උයන

VI. ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය - අනුරාධපුර

මෙම ඒකකය විසින් බෝ වන හා බෝ නොවන රෝග පාලනය හා ප්‍රාථමික සෞඛ්‍ය සංරක්ෂණය සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ආයුර්වේද සංකල්පය අනුව විවිධ වැඩසටහන් හා හා දැනුවත් කිරීම් සිදු කරමින් පවතී. පෙරපාසල්, පාසල් ඉලක්ක කර ගත් පෝෂණ වැඩසටහන් හා ළමා සෞඛ්‍ය සංරක්ෂණය, ප්‍රජා මූලික වැඩිහිටි සෞඛ්‍ය සේවාවන් සැලසීම, මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනය, මාතෘ සංරක්ෂණය, ඖෂධ පැලෑටි සංරක්ෂණය හා තිරසර භාවිතය පිළිබඳ වැඩසටහන් ඒ යටතේ විශේෂ වේ. කෙසේ වෙතත් මෙම ඒකකය සඳහා පුනරාවර්තන ප්‍රතිපාදන(සේවක වේතන සඳහා) පමණක් ලබා දී ඇති අතර අනෙකුත් කටයුතු පවත්වා ගැනීම සඳහා ප්‍රතිපාදන ලබා දීමත් සිදුව නැත.

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය

ශරීරයේ ස්වභාවික ප්‍රතිශක්තිය ඉහළ දැමීම මඟින් රෝග සුව කරන අතුරු ආබාධවලින් තොර විකල්ප වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රචලිතව ඇත. බෝ නොවන රෝග සඳහාද, ප්‍රතිජීවක ඖෂධ මඟින් මර්ධනය කළ නොහැකි වෛරස් රෝග සඳහාද හෝමියෝපති ඖෂධ වඩාත් සුදුසුය. ශාක, සත්ත්ව හා ලෝහ වැනි ස්වභාවික ද්‍රව්‍ය යොදා ගනිමින් අවම පිරිවැයකින් නිෂ්පාදනය කරන මෙම ඖෂධ භාවිතයටද පහසුය.

I. හෝමියෝපති රෝහල

වත්මන් තත්ත්වය හා ප්‍රගතිය

I. බාහිර රෝගී අංශය ක්‍රියාත්මකව පවතින අතර වාට්ටු 02කින් හා ඇඳන් 20කින් සමන්විත නේවාසික රෝගි අංශය අලුත්වැඩියා කටයුතු සඳහා තාවකාලික වසා ඇත.

II. 2023 මැයි මස දක්වා බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා දී ඇති රෝගීන් සංඛ්‍යාව 9,280 කි.

III. ඉන්දියාවේ ආයුෂ් අමාත්‍යාංශය මඟින් වාර්ෂිකව පිරිනමන ශිෂ්‍යත්ව යටතේ හෝමියෝපති වෛද්‍ය උපාධිය හැදෑරීම සඳහා ලාංකික සිසුන් 10 දෙනෙකුට අවස්ථාව ලබා දී ඇත.

IV. හෝමියෝපති වෛද්‍ය සභාව යටතේ පවතින රජයේ නිදහස් හෝමියෝපති සායන සඳහා හෝමියෝපති රෝහල මඟින් ආනයනය කරන ලද ඖෂධවල වටිනාකම රු.මි. 6.325කි.

V. හෝමියෝපති ක්‍රම සංවර්ධනය සඳහා 2023 වර්ෂය සඳහා රු.මි. 2.5ක ප්‍රතිපාදන වෙන් කර ඇත. ඉන් වැලිසර රජයේ හෝමියෝපති රෝහල නේවාසික රෝගීන්ට ප්‍රතිකාර කිරීමට සුදුසු පරිදි යථා තත්ත්වයට පත් කිරීමේ කටයුතු වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අධීක්ෂණයෙන් මේ වන විට සිදු කරමින් පවතී.

හෝමියෝපති ශිෂ්‍යත්ව පිරිනැමීම

II. හෝමියෝපති වෛද්‍ය සහාව

හෝමියෝපති සායනවල කාර්ය සාධනය

අනු අංකය	සායනය	ප්‍රතිකාර කළ රෝගීන් සංඛ්‍යාව	
		2022	2023.05.31 දිනට
01.	දෙහිවල	4,046	1,392
02.	තෝලංගමුව	3,141	1,789
03.	පරකඩුව	2,796	1,683
04.	කුරුණෑගල	12,002	3,258
05	කොත්මලේ	2,704	2,310
06.	මොණරාගල	2,994	1,294
07.	පාලමුණෛ	3,022	1,758
08.	පුත්තලම	2,635	800
09.	මාතලේ	4,171	2,094
10.	අම්බලන්ගොඩ	2,305	1,467
11.	මඩකලපුව	1,534	1,592
12.	ඉංගිරිය	1,269	813
13.	රත්ගම	4,719	1,599
එකතුව		**47,338**	**21,849**

2023 වර්ෂයේ පවත්වන ලද හෝමියෝපති ජංගම සායන හා සම්මන්ත්‍රණ (2023.05.31 දිනට)

අනු අංකය	මෙහෙයවීම	ස්ථානය	දිනය	අරමුණු	ප්‍රතිලාභීන්
01.	හෝමියෝපති වෛද්‍ය සහාව	සුවධරණී - සුව දැක්ම(දියත උයන)	2023.02.22-23 (දින 02)	හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම හා ප්‍රතිකාර කිරීම.	198
02.	ඉංගිරිය හෝමියෝපති සායනය	බටහිර රත්මල්ගොඩ, සේවා පියස	2023.05.11	හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳව මහජනතාව දැනුවත්	92

				කිරීම හා ප්‍රතිකාර කිරීම	

- 2023 වර්ෂයේ හෝමියෝපති වෛද්‍ය සභාවේ සාමාන්‍ය ලේඛනයේ හෝමියෝපති වෛද්‍යවරුන් ලෙස මෙරට ලියාපදිංචිය ලද සංඛ්‍යාව 316 කි.
- 2023 මැයි මස තෙක් ඇ.ඩොලර් 22,026.13ක් වටිනා හෝමියෝපති ඖෂධ වෛද්‍යවරුන් හා ආයතන වෙත ආනයනය කර ඇත.
- පොළොන්නරුව නව හෝමියෝපති සායනය 2023.06.10 වන දින විවෘත කරන ලදී.
- 2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 30(1) වගන්තිය යටතේ හෝමියෝපති වෘත්තිකයන් ලියාපදිංචිය වෙනුවෙන් වූ ලිඛිත පරීක්ෂණය 2023 අප්‍රේල් 24 - මැයි මස 02 දක්වා පවත්වා ඇත.

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව

වාර්ෂික නිෂ්පාදනය (නිෂ්පාදන පිරිවැය අනුව)

වාර්ෂික නිෂ්පාදනය (රු.මි.)	2020	2021	2022	2023.06.30 දිනට
සැලසුම්ගත නිෂ්පාදනය	569.11	617.40	683.45	525.66
සත්‍ය නිෂ්පාදනය	367.70	496.88	495.53	348.96
නිෂ්පාදන ඉලක්ක සපුරා ගැනීම (%)	64.65%	80.47%	72.5%	66.38%

වාර්ෂික අලෙවිය

වාර්ෂික අලෙවිය (රු.මි.)	2020	2021	2022	2023.06.30 දිනට
සැලසුම්ගත අලෙවිය	842.895	923.909	970.000	804.6
සත්‍ය අලෙවිය	676.30	800.26	947.13	621.56
අලෙවි ඉලක්කයන් සපුරා ගැනීම(%)	80.23%	86.61%	97.64%	**77.25%**

නව නිෂ්පාදන හඳුන්වාදීම

දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2022 වර්ෂයේදී නව නිෂ්පාදන 05ක් වෙළඳපොලට හඳුන්වා දෙන ලදී.

1. තිලාදි ලේපය - ග්‍රෑම් 150
2. වෙනිවැල් හැන්ඩ් සැනිටයිසර් - මි.ලී. 100
3. දාරු පර්පට පෙති - ග්‍රෑම් 30/ ග්‍රෑම් 200
4. සුදර්ශන පෙති - ග්‍රෑම් 30/200
5. රක්තචන්දන් ෆේෂ්වොෂ් - මි.ලී. 100

ප්‍රාග්ධන ව්‍යාපෘති

600 Liters Stainless Steel Machine 02, 1200 Liters Stainless Steel Machine 01

2022 වර්ෂයේ ප්‍රධාන නිෂ්පාදන ධාරිතාවය වැඩි කිරීම සඳහා මෙම යන්ත්‍ර උඳුන් අංශයට මිල දී ගෙන ඇති අතර මෙමඟින් පෙරට වඩා වැඩි ඵලදායීතාවයකින් සහ කාර්යක්ෂතාවයකින් නිෂ්පාදනය වැඩි කිරීමට හැකි වී ඇත.

ආයෝජනය කළ මුදලරු.- 20,150,000

දිස්ත්‍රික් බලයලත් අලෙවි නියෝජිත ධූර පිරිනැමීම

ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථා බෙදාහැරීම් ජාලය වඩාත් ශක්තිමත් කරමින් හා පුද්ගලික අංශය සමඟ සාර්ථක ඒකාබද්ධ වැඩසටහනක් ක්‍රියාවට නංවමින් අලෙවි කටයුතු ජනතාව අතරට ගෙනයාම සඳහා සංස්ථා ඉතිහාසයේ ප්‍රථම වතාවට දිස්ත්‍රික් බලයලත් අලෙවි නියෝජිත ධූර පිරිනැමීම 2022.10.20 දින ගරු දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය නීතිඥ සිසිර ජයකොඩි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුකරන ලදී.

2024 වර්ෂය සඳහා සැලසුම් කර ඇති සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන්

- ජාතික සෞඛ්‍ය පද්ධතිය තුළ වැඩි දායකත්වයක් ලබාදීම සඳහා ආයුර්වේද රෝහල් පද්ධතිය වැඩිදියුණු කිරීම
- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ පවතින විභවතා තුළින් රජයේ විදේශ විනිමය උත්පාදනය කිරීමට කටයුතු කිරීම
- පාරම්පරික වෛද්‍ය ක්‍රම ප්‍රවර්ධනය සහ සංරක්ෂණය
- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ නිෂ්පාදන විවිධාංගීකරණය සහ අපනයනය
- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයේ නියාමනය සවිමත් කිරීම
- දේශීය වෛද්‍ය අංශයේ පවතින පර්යේෂණ අවස්ථා පුළුල් කිරීම
- විදේශයන්ගෙන් ආනයනය කරනු ලබන ඖෂධ අධෛර්යමත් කර ඔසු වගා තුළින් විදේශයන්ට ඇදී යන විනිමය ඉතිරි කිරීම
- පර්යේෂණ ඔසු උයන් කාර්යක්ෂමව හා ඵලදායීව පවත්වා ගැනීම
- වස විසෙන් තොර පෝෂයදායී දේශීය ආහාර පාන ප්‍රවර්ධනය
- විකල්ප වෛද්‍ය ක්‍රමයක් වශයෙන් හෝමියෝපති වෛද්‍ය ක්‍රමය සංවර්ධනය කිරීම
- සහයෝගී/ ඒකාබද්ධ සත්කාර සේවාවන් පවත්වා ගැනීම
- බෝ නොවන රෝග පාලනය සහ වැළැක්වීම සඳහා දේශීය වෛද්‍ය දැනුම හා ප්‍රවේශයන් භාවිතය
- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ මානව සම්පත් සංවර්ධන අස්ථාවන් පුළුල් කිරීම සහ කාලීන පාඨමාලාවන් හඳුන්වාදීම

- දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ ජාත්‍යන්තර සහයෝගීතාව ප්‍රවර්ධනය හා දැනුම හුවමරු කර ගැනීම
- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව සතු ඔසු උයන්වලින් ඖෂධ නිෂ්පාදනය සඳහා වැඩි දායකත්වයක් ලබාගැනීම

2024 මූල ධන ආයෝජනය

දේශීය වෛද්‍ය අංශය

අනු අංකය	වැඩසටහන	යෙදවීමට අපේක්ෂිත මුදල (රු.)
01.	සංරක්ෂණ සහා සවිබල ගැන්වීම	5.0
02.	පෝෂණ මන්දිර ස්ථාපිත කිරීම	5.0
03.	හෝමියෝපති ක්‍රම සංවර්ධනය	15.5
04.	හෝමියෝපති වෛද්‍ය සභාව	2.0
05.	මෙහෙයුම් ක්‍රියාකාරකම්	15.0
06.	ධාරිතා සංවර්ධනය	1.5
07.	ආයුර්වේද සමඟ සහයෝගී සත්කාර	15.0
08.	බෝනොව රෝග පාලනය හා වළක්වාගැනීම සඳහා දේශීය වෛද්‍ය ප්‍රවේශයක්	20.0
	එකතුව	**79.0**

ආයුර්වේද දෙපාර්තමේන්තුව

අනු අංකය	වැඩසටහන	යෙදවීමට අපේක්ෂිත මුදල (රු.)
01.	ප්‍රධාන කාර්යාලයේ එදිනෙදා සුළු අළුත්වැඩියා	2.0
02.	ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන අළුත්වැඩියා	45.0
03.	ආයුර්වේද ශික්ෂණ රෝහල්වල සුළු අළුත්වැඩියා	2.0
04.	ආයුර්වේද ශික්ෂණ රෝහල්වල ප්‍රධාන අළුත්වැඩියා	42.1
05.	ආයුර්වේද ශික්ෂණ රෝහල්වල නව ඉදිකිරීම්	915.26
06.	ආයුර්වේද පර්යේෂණ රෝහල්වල සුළු අළුත්වැඩියා	1.0
07.	ආයුර්වේද පර්යේෂණ රෝහල්වල ප්‍රධාන අළුත්වැඩියා	38.5
08.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ සුළු අළුත්වැඩියා	1.0
09.	දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ආයතනයේ ප්‍රධාන අළුත්වැඩියා	1.50
10.	ඔසු උයන්වල සුළු අළුත්වැඩියා	1.0
11.	ඔසු උයන්වල ප්‍රධාන අළුත්වැඩියා	10.87
12.	ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සේවය, අනුරාධපුර	1.0
	එකතුව	**1,061.23**

කළමනාකරණ සංවර්ධන සහ සැලසුම් ඒකකය